# බස්නාහිර පළාතේ පළාත් සභාව
# மேல் மாகாண மாகாண சபை
WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2016 දෙසැම්බර් 06 වන අඟහරුවාදා**
2016 மார்கழி 06 செவ்வாய்க் கிழமை
Tuesday 06th December 2016

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභා ගොඩනැඟිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல .இல ,டென்சில் கொப்பேகடுவ மாவத்தை ,ஸ்ரீ ஜயவர்த்தனபுர , 204இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.00 ට පළාත් සභාව රැස් විය.**
*மு.ப. 09.00 க்கு சபை கூடியது*
*The Provincial Council met at 09.00 a.m.*

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**
*திரு .தவிசாளர் [ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

# නිවේදනය
ANNOUNCEMENT

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අද දින සිට ඉදිරියට දින 06 ක පමණ කාලයක් තිස්සේ පැවැත්වෙන 2017 වර්ෂයේ මුදල් ප්‍රකාශය පිළිබඳ විවාදය, සෑම දිනකම පෙ.ව. 9.00 ට ආරම්භ වන බවත්, එම විවාදය පැවැත්වෙන කාලය තුළදී සභාවේ ගණපූරණය පවත්වා ගැනීම පිළිබඳව සැලකිලිමත් වන ලෙසත් ගරු මන්ත්‍රීවරුන් වෙත කාරුණිකව දැනුම් දෙනවා. ඒ පිළිබඳව තම අවධානය යොමු කරන මෙන් ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමන්ගෙන්ද, විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාගෙන්ද කාරුණිකව ඉල්ලීමක් කරනවා.

# කාරක සභා වාර්තා
COMMITTEE REPORTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

2016.11.23 දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව මම ඉදිරිපත් කරනවා.

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
ORAL ANSWERS TO QUESTIONS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පළමුවෙන්ම අංක 01 යටතේ ඕ. ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමාගේ නමින් ඇති ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**01.**

**ඕ. ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/VI(1)/16/103)**

අ. බේරුවල ප්‍රාදේශීය සභාවේ වර්තමාන ලේකම්වරිය 2015.01.01 දිනට ක්‍රියාත්මක වන සේ අවිධිමත් පත්වීම් ලබා දුන් බව ඔබතුමා දන්නවාද?

ආ. මේ පිළිබඳව සිදු කළ විමර්ශනයේ වාර්තාව ඔබතුමා වෙත ලැබුණාද?

ඇ. එසේනම්, දී ඇති පත්වීම් ප්‍රමාණය හා තනතුරු මොනවාද?

ඈ. ඒවා ලබා දී ඇත්තේ කුමන පදනමකින්ද?

ඉ. එම පත්වීම් සඳහා වැටුප් ගෙවීමට සභාවෙන් මාසිකව වැය වන මුදල කොපමණද? එම වැටුප් පළාත් සභාවෙන් ප්‍රතිපූර්ණය කරනවාද?

ඊ. චක්‍රලේඛවල උපදෙස්වලට බාහිරව පත්වීම් ලබා දීමට ලේකම්ට ඇති බලය කුමක්ද?

උ. ලේකම්ගේ එම ක්‍රියාවලීන් ඔබතුමා අනුමත කරන්නේද?

**ගරු ඉසුර දේවප්‍රිය** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Isura Devapriya (Chief Minister and Minister of Finance and Planning, Engineering Services, Law and Order, Local Government and Provincial Administration, Economic Promotion, Electricity and Energy, Environmental Affairs, Water Supplies and Drainage and Tourism Affairs)

අ. ඔව්.

ආ. ඔව්.

ඇ. පත්වීම් ප්‍රමාණය 08 යි. තනතුර - සෞඛ්‍ය කම්කරු

ඈ. ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත පදනමින්.

ඉ. රු. 256,320.00 කි. පළාත් සභාවෙන් ප්‍රතිපූරණය සිදු කිරීමක් නොකරයි.

ඊ. එවැනි බලයක් නොමැත.

උ. අනුමත නොකරමි. දැනටමත් ඊට අදාළ මූලික විමර්ශන සිදු කරමින් පවතී.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

ගරු සභාපතිතුමනි, අතුරු ප්‍රශ්නයක් තිබෙනවා. මෙම ප්‍රශ්නය සඳහා නිවැරදි පිළිතුරු ලබා දීලා නැහැයි කියන එක තමයි මට කියන්න තිබෙන්නේ.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

දැන් මේකට ඔව් කියලා කියන්නේ නැතිව නැහැයි කියලාද කියන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා මොකක්ද බලාපොරොත්තු වෙන්නේ?

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

නැහැ. මම කියන්නේ ගරු මහ ඇමතිතුමා මේ පිළිබඳව සොයා බලන්න. මේකේ දීලා තිබෙන සමහර පිළිතුරු නිවැරදි නැහැ. අසත්‍ය තොරතුරු ලබා දීලා තිබෙන්නේ.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඒ කියන්නේ ඔව් කියන්නේ නැතිව නැහැයි කියන්නද ඕනෑ. මම අහන්නේ, බේරුවල ප්‍රාදේශීය සභාවේ වර්තමාන ලේකම්වරිය 2015.01.01 දිනට ක්‍රියාත්මක වන සේ අවිධිමත් ලෙස පත් වීම් ලබා දුන් බව ඔබතුමා පිළිගන්නවාද? කියන එකට ඔව් කියන්නේ නැතිව නැහැයි කියන්නද ඕනෑ.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

ඒක නොවෙයි ගරු මහ ඇමතිතුමා. මෙතැන සභාවෙන් ඔබතුමාට දීලා තිබෙන පිළිතුරු නිවැරදි නැහැයි කියන එක තමයි මම කියන්නේ. අසත්‍ය තොරතුරු ලබා දීලා තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විවාදයකට යන්න මට කාලය දෙන්න බැහැ. ඔබතුමාට ගැටළුවක් තිබෙන එක අහන්න.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

පත්වීම් 08 ක් කියලා තිබෙනවා. ඒක බොරුවක්. පත්වීම් 08 ට වැඩියි.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

අපෙන් අහලා තිබෙනවා, බේරුවල ප්‍රාදේශීය සභාවේ වර්තමාන ලේකම්වරිය 2015.01.01 දිනට අවිධිමත් ලෙස පත්වීම් ලබා දුන් බව ඔබතුමා පිළිගන්නවාද? එතකොට ඔව් කියලයි කියන්නේ. මම මේක නැහැයි කිව්වා නම් තමයි ඔබතුමාට ප්‍රශ්නයක් තිබෙන්නේ. පැහැදිලිද?

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

ඔව්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අංක 02 යටතේ ඇති ප්‍රශ්නයත් එතුමාගේමයි. ගරු ප්‍රධාන අමාත්‍යතුමාට යොමු වෙන්නේ.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**02.**

**ඕ. ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/VI(1)/16/104)**

අ. i. බේරුවල ප්‍රාදේශීය සභාවේ සේවකයින් වෙත රාජකාරී ලැයිස්තු ලබා දී තිබේද?

ii. රියැදුරන් සඳහා වාහන භාර දී වැඩ පැවරීම් කර තිබේද?

iii. වාහන සඳහා ඉන්ධන ලබා දීමේදී සිදු කරන අක්‍රමිකතා ඔබතුමා දන්නවාද?

iv. සමහර රියැදුරන් සභාවේ කොන්ත්‍රාත් කටයුතුවල නිරත වන බව ඔබතුමා දන්නවාද?

v. රාජකාරී වේලාවට අමතරව මේ අයට අතිකාල හා වෙනත් දීමනා ලැබෙන බව ඔබතුමා දන්නවාද?

ආ. i. සභාවේ ලේකම්වරිය විසින් සේවකයින්ගේ රාජකාරී වේලාව තුළ පෞද්ගලික වැඩ කරවා ගන්නා බව ඔබතුමා දන්නවාද?

ii. කොම්පෝස්ට් මධ්‍යස්ථානයේ සිටින සේවකයින් ලේකම්වරියගේ කොප්පරා පොල් වේලීමේ යෙදී සිටියදී කළුතර සහකාර කොමසාරිස් කාර්යාලයේ විමර්ශන නිලධාරීන් විසින් අල්ලා ගත් බව ඔබ දන්නවාද?

iii. කොම්පෝස්ට් අංගනයේ සේවකයින් ලවා ලේකම්වරියගේ නිවසේ පෞද්ගලික දේපළවල වැඩ කර ගැනීම ඔබතුමා දන්නෙහිද?

iv. මේවා කරන්නේ කාගේ උපදෙස් මතද?

v. මෙම බාහිර වැඩ නිසා පොහොර නිපදවීම අඩාල වූ බව ඔබතුමා දන්නවාද?

vi. මේ නිසා සභාවට ආදායම අඩු වූ බව දන්නෙහිද?

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

අ. i. සමස්ත කාර්ය මණ්ඩලයෙන් 37 පමණකට රාජකාරී ලැයිස්තු ලබා දී ඇත.

ii. ඔව්.

iii. පූර්ව අවස්ථා තුළ ඉන්ධන අක්‍රමිකතා සිදු වීමට හේතු වන පසුබිමක් තිබූ බවත්, එම තත්ත්වය නිවැරදි කිරීමට පියවර ගෙන ඇති බවටත් වාර්තා වී ඇත.

iv. අනාවරණය නොවේ.

v. සේවයේ අවශ්‍යතාවය මත අතිකාල ලබා දීම සිදු කර ඇත.

ආ. i. එවැනි එක් අවස්ථාවක් පිළිබඳ කරුණු අනාවරණය වී ඇත.

ii. ඔව්.

iii. නිවසේ පෞද්ගලික දේපළවල වැඩ කර ගන්නා බවට කරුණු අනාවරණය නොවේ.

iv. නිශ්චිතව තහවුරු කළ නොහැක.

v. අනාවරණය නොවේ.

vi. අනාවරණය නොවේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අංක 03 ප්‍රශ්නයත් එතුමාගේමයි. ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ඇසීමට.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**03.**

**ඕ. ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/VI(1)/16/105)**

අ. අලුත්ගම කන්දේ විහාර කුණු දමන ස්ථානයට පස් දමා තුනී කිරීම ව්‍යාපෘතියෙහි අධීක්ෂණ නිලධාරියා කවුද?

ආ. දිනකට දමන පස් කියුබ් ප්‍රමාණය (සත්‍ය ශේෂය) කොපමණද?

ඇ. දිනපතා එම ස්ථානයට පස් දමා තුනී කරන්නේද?

ඈ. ගෙවීම් කිරීමේදී නිර්දේශ ලබා දෙන නිලධාරියා කවුද?

ඉ. මෙම වවුචර් පරීක්ෂා කරන්නේ සියලු වාර්තා සහිතවද?

ඊ. මේ පිළිබඳව විමර්ශන කළාද?

උ. විමර්ශන වාර්තා සභාගත කිරීමට හැකිද?

ඌ. ලේකම්ගේ කැමැත්ත පරිදි කටයුතු කිරීමට විශේෂ බලයක් ඇයට පවරා තිබේද?

එ. මහජන මුදල් අවභාවිතා කිරීමක් මෙහිදී සිදු වන බව ඔබතුමාට නොදැනේද?

ඒ. මහජන මුදල් මෙලෙස අවභාවිත කිරීම සම්බන්ධව ඔබතුමා ගන්නා වූ ඉදිරි පියවර මොනවාද?

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

අ. බේරුවල ප්‍රාදේශීය සභාවේ සෞඛ්‍ය පරිපාලක පී. සුරාජ් තරංග සිල්වා යන අය.

ආ. දිනකට බැහැර කරන කසළ ප්‍රමාණය මත, දිනකට යොදන පස් ප්‍රමාණය වෙනස් වේ.

ඇ. කසළ බැහැර කරන සෑම දිනකම පස් දමා තුනී කිරීම සිදු කරයි.

ඈ. බේරුවල ප්‍රාදේශීය සභාවෙහි සෞඛ්‍ය පරිපාලක පී. සුරාජ් තරංග සිල්වා යන අය.

ඉ. සෞඛ්‍ය පරිපාලක විසින් ඉදිරිපත් කරන වාර්තා මත ගෙවීම් වවුචර් පරීක්ෂා කිරීම සිදු කරයි.

ඊ. විමර්ශන සිදු කරමින් පවතී.

උ. මෙතෙක් විමර්ශන අවසන් වී නැත.

ඌ. නැත.

එ. විමර්ශන අවසන් වීමෙන් පසු නිගමනය කරමි.

ඒ. විමර්ශන අවසන් වීමෙන් පසු නිගමනය කරමි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට අංක 04 යටතේ නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව. එතුමා සභාවේ නැහැ. ගරු ඇමතිතුමා, පිළිතුරු තිබෙනවා නම් සභාගත කරන්න.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

පිළිතුර සභාගත කරනවා.

***[සභාගත කරන ලද පිළිතුර]***
*[Tabled Answer]*

***ප්‍රශ්නය :***

*අ. කොළඹ මහ නගර සභා බල ප්‍රදේශය තුළ දිනකට එකතු වන කැළි කසල ප්‍රමාණය ටොන්වලින් කොපමණද?*

***පිළිතුර :***

*අ. මෙට්‍රික් ටොන් 750 – 800 අතර ප්‍රමාණයකි.*

***ප්‍රශ්නය :***

*ආ. කොළඹ දිස්ත්‍රික්කය තුළ දිනකට එකතු වන කැළි කසළ ප්‍රමාණය ටොන්වලින් කොපමණද?*

***පිළිතුර :***

*ආ. මෙට්‍රික් ටොන් 1500 – 1600 අතර ප්‍රමාණයකි.*

**ප්‍රශ්නය :**

ඇ. කළුතර සහ ගම්පහ දිස්ත්‍රික්කවල එකතු වන කැළි කසළ ප්‍රමාණය ටොන්වලින් කොපමණද?

**පිළිතුර :**

ඇ. ගම්පහ - දිනකට මෙට්‍රික් ටොන් 450 – 500 අතර ප්‍රමාණයකි.

කළුතර - දිනකට මෙට්‍රික් ටොන් 175 – 200 අතර ප්‍රමාණයකි.

**ප්‍රශ්නය :**

ඈ. කොළඹ මහ නගර සභා බල ප්‍රදේශය හා කොළඹ දිස්ත්‍රික්කයේ සෙසු ප්‍රදේශවල කැළි කසළ බැහැර කරන්නේ කවර ස්ථානයකටද?

**පිළිතුර :**

ඈ. කරදියාන - ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව, මොරටුව මහ නගර සභාව, දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව, කැස්බෑව නගර සභාව, බොරලැස්ගමුව නගර සභාව, මහරගම නගර සභාව, හෝමාගම ප්‍රාදේශීය සභාව.

මීතොටමුල්ල - කොළඹ මහ නගර සභාව, කොලොන්නාව නගර සභාව,

කොට්කාවත්ත කනත්ත අසල ඉඩම - කොට්කාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව.

උක්වත්ත කසළ අපහරණ භූමිය - සීතාවකපුර නගර සභාව.

කඩුවෙල වෙලේ හන්දිය - කඩුවෙල මහ නගර සභාව.

**ප්‍රශ්නය :**

ඉ. කළුතර සහ ගම්පහ දිස්ත්‍රික්කවල කසළ බැහැර කරන ස්ථාන මොනවාද?

**පිළිතුර :**

ඉ. **කළුතර දිස්ත්‍රික්කය - ප්‍රධාන කසළ අපහරන ස්ථාන**

නාගොඩ පොහොරවත්ත - කළුතර නගර සභාව, කළුතර ප්‍රාදේශීය සභාව.

බේරුවල වෙත්තිමරාජපුර ඉඩම - බේරුවල නගර සභාව.

බේරුවල කන්දේ විහාර/දර්ගා නගරය - බේරුවල ප්‍රාදේශීය සභාව.

බේරුවල බෝඹුවල අධිවේගී මාර්ගය අසල - දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව

මීට අමතරව අනෙකුත් පළාත් පාලන ආයතනවල අපද්‍රව්‍ය දිනකට මෙට්‍රික් ටොන් 1 ක් හෝ ඊට අඩු වන අතර එම අපද්‍රව්‍ය අදාළ පළාත් පාලන ආයතනයන් මෙහෙයවනු ලබන කොම්පෝස්ට් අංගනයන්ට යාබදව බැහැර කරනු ලබයි.

**ගම්පහ දිස්ත්‍රික්කය - ප්‍රධාන කසළ අපහරන ස්ථාන**

වේයන්ගොඩ දඹුවත්ත ඉඩම - ගම්පහ මහ නගර සභාව, ගම්පහ ප්‍රාදේශීය සභාව, බියගම ප්‍රාදේශීය සභාව, අත්තනගල්ල ප්‍රාදේශීය සභාව.

සීදූව - කටුනායක අම්බලම්මුල්ල ඉඩම - කටුනායක සීදූව නගර සභාව.

මීගමුව කොච්චිකඩේ ඉඩම - මීගමුව මහ නගර සභාව

දොම්පේ සනීපාරක්ෂක බිම් පිරවීම - දොම්පේ ප්‍රාදේශීය සභාව

දුටුගැමුණු මාවත (අධිවේගී මාර්ගය අසළ) – පෑලියගොඩ නගර සභාව

මාබෝල ෆාතිමා පාර - වත්තල නගර සභාව

මානෙල්ගම - කැලණිය ප්‍රාදේශීය සභාව

සුදුවැල්ල ඉඩම - ජා ඇල නගර සභාව

**ප්‍රශ්නය :**

ඊ. කසළ ටොන් 1 ක් ඉවත් කිරීම සඳහා කොතරම් මුදලක් ගෙවනවාද?

**පිළිතුර :**

ඊ. මෙට්‍රික් ටොන් 1 ක් සඳහා රු. 1,000.00 ත් රු. 3,000.00 ත් අතර මුදලකි.

**ප්‍රශ්නය :**

උ. කසළ කොම්පෝස්ට් කිරීම, නොදිරන ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීම හෝ බලශක්ති නිෂ්පාදනය කරන ස්ථාන තිබේද? ඒ කවර ස්ථානද?

**පිළිතුර :**

උ. කොම්පෝස්ට් කරන ස්ථාන

i. පළාත් පාලන ආයතන මට්ටමින් කොම්පෝස්ට් කරන ස්ථාන 25 ක් ඇත. (ඇමුණුම 1) [1]

[1] පිළිතුර අවසානයේ පළ කර ඇත.

*ii අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය මැදිහත් වීමෙන් කොම්පෝස්ට් කරන ස්ථාන 3 ක් ඇත.*

*පොහොරවත්ත(කළුතර), කරදියාන, දික්ඕවිට.*

***ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථාන***

*බස්නාහිර පළාතේ සෑම පළාත් පාලන ආයතනයකටම ප්‍රතිචක්‍රීකරණය කරන අපද්‍රව්‍ය රැස් කරන, ගබඩා කරන මධ්‍යස්ථාන, "සම්පත් කේන්ද්‍ර" ස්ථාපනය කර දී ඇත.*

***අපද්‍රව්‍ය මගින් බල ශක්තිය ජනනය කිරීම***

*එවැනි ස්ථාන නැත.*

***ප්‍රශ්නය :***

*ඌ. කසළ කොම්පෝස්ට් කිරීම, ප්‍රතිචක්‍රීකරණය කිරීම අදාළ විදේශීය සමාගම් සමඟ සෘජු ගිවිසුම්වලට පැමිණීමට පළාත් සභාවට හා විෂය භාර අමාත්‍යවරයාට බලයක් තිබේද?*

***පිළිතුර :***

*ඌ. විදේශීය ආයෝජකයන් විසින් දේශීයව ස්ථාපනය කරන ලද දේශීය සමාගම් සමඟ ගිවිසුම්ගත වීමේ බලය ඇත.*

***ප්‍රශ්නය :***

*එ. තිබේනම් ඊට අදාළ නෛතික ප්‍රතිපාදන කවරේද?*

***පිළිතුර :***

*එ. 2007 අංක 1 දරන අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රඥප්තියෙන් උක්ත ගිවිසුම්වලට එළැඹීමට බලය ලැබී ඇත.*

**ඇමුණුම 01**

**<u>බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන මගින් සහ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය මගින් මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබන කොම්පෝස්ට් ව්‍යාපෘති සහ එහි ධාරිතාවය</u>**

| අංකය | අපද්‍රව්‍ය කළමනාකරණ කලාප | පළාත් පාලන ආයතනය | ආරම්භ කළ වර්ෂය | දිරන අපද්‍රව්‍ය ධාරිතාවය දිනකට මෙ.ටොන්. | දැනට ක්‍රියාත්මක ධාරිතාවය දිනකට මෙ.ටොන් |
|---|---|---|---|---|---|
| 01 | ගම්පහ | අත්තනගල්ල ප්‍රාදේශීය සභාව | 2005 | 10 | 8 |
| 02 | | මීරිගම ප්‍රාදේශීය සභාව | 2009 | 7 | 7 |
| 03 | | ජා ඇල ප්‍රාදේශීය සභාව | 2009 | 8 | 8 |
| 04 | | ජා ඇල නගර සභාව | 2013 | 5 | 4 |
| 05 | කෝට්ටේ | කඩුවෙල මහ නගර සභාව | 2006 | 20 | 20 |
| 06 | | කොට්කාවත්ත ප්‍රාදේශීය සභාව | 2009 | 5.5 | 5 |
| 07 | දෙහිවල | සීතාවකපුර නගර සභාව | 2009 | 5.5 | 4.5 |
| 08 | | සීතාවක ප්‍රාදේශීය සභාව | 2010 | 1.5 | 2.5 |
| 09 | | කරදියාන ව්‍යාපෘතිය | 2004 | 50 | 50 |
| 10 | මොරටුව | බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව | 2006 | 9 | 9 |
| 11 | | හොරණ ප්‍රාදේශීය සභාව | 2008 | 6 | 6 |
| 12 | | මොරටුව ප්‍රාදේශීය සභාව | 2009 | 1.5 | 1 |
| 13 | මීගමුව | කටාන ප්‍රාදේශීය සභාව | 2007 | 6 | 4 |
| 14 | | මීගමුව නගර සභාව | 2007 | 10 | 7 |
| 15 | | දිවුලපිටිය ප්‍රාදේශීය සභාව | 2010 | 8 | 5 |
| 16 | කළුතර | මතුගම ප්‍රාදේශීය සභාව | 2007 | 4 | 4.5 |
| 17 | | අගලවත්ත ප්‍රාදේශීය සභාව | 2007 | 3 | 4 |
| 18 | | බුලත්සිංහල ප්‍රාදේශීය සභාව | 2007 | 3.5 | 1.5 |
| 19 | | බේරුවල ප්‍රාදේශීය සභාව | 2009 | 5 | 5 |
| 20 | | වලල්ලාවිට ප්‍රාදේශීය සභාව | 2009 | 1 | 1 |
| 21 | | මදුරාවල ප්‍රාදේශීය සභාව | 2011 | 2 | 2.5 |
| 22 | | පාලින්දනුවර ප්‍රාදේශීය සභාව | 2012 | 2 | 2 |
| 23 | | පොහොරවත්ත ව්‍යාපෘතිය | 2011 | 20 | 15 |
| 24 | කොළඹ | කැළණිය ප්‍රාදේශීය සභාව | 2000 | 9 | 9 |
| 25 | | දික්ඕවිට ව්‍යාපෘතිය | 2011 | 7 | 7 |
| **එකතුව** | | | | 159.5 | 142.5 |

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අංක 05 යටතේ සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමාගේ නමින් ඇති ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**05.**

**සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :**

**(ප්‍ර/VI(1)/16/107)**

අ. කෝට්ටේ, තලවතුගොඩ පාරේ, අංක 94 දරන ස්ථානයේ පිහිටි ගොඩනැගිල්ලේ හිමිකරු වන කීර්ත දිසානායක යන අය විසින් එම ලිපිනයෙහි ඉදි කර ඇති ගොඩනැගිල්ල සඳහා අනුමැතිය ගෙන ඇත්තේ ව. අ. 2400 ක දෙමහල් ගොඩනැගිල්ලකට බව ඔබතුමා දන්නේද?

ආ. බස්නාහිර පළාත් සංචාරක මණ්ඩලයේ සභාපති ධූරය දරන්නේ ඔහුද?

ඇ. ඔහුට අයත් ඉහත සඳහන් ගොඩනැගිල්ල දිගින් අඩි 85 ක් පළලින් අඩි 44 ක් උසින් අඩි 80 ක් සහිත වර්ග අඩි 20,000 ක පස් මහල් ගොඩනැගිල්ලක් බවට පසුව වෙනස් කර ඉදි කළ බව ඔබතුමා දන්නේද?

ඈ. එම වෙනස්කම් සිදු කිරීමේදී කෝට්ටේ මහ නගර සභාව, නාගරික සංවර්ධන අධිකාරිය සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව අනුමැතිය දී තිබේද?

ඉ. එම ලිපි ලේඛන සභාගත කළ හැකිද? නොහැකි නම් ඒ මන්ද?

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

අ. වර්ග අඩි 4333 වන බිම් මහලින් හා පළමු මහලින් යුත් ගොඩනැගිල්ලක් සඳහා අනුමැතිය ලබා දී ඇත.

ආ. ඔව්.

ඇ. පස් මහල් ගොඩනැගිල්ලක් ඉදි කර ඇති බව දනිමි.

ඈ. අනුමැතිය දී නැත.

ඉ. පැන නොනගී.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු සභාපතිතුමනි, දැන් අනුමැතියක් දීලා නැත්නම් කොහොමද මේ ගොඩනැගිල්ලක් ඉදි කරලා ඒක පවත්වාගෙන යන්නේ කියන ප්‍රශ්නය පළමුවන අතුරු ප්‍රශ්නය විධියට තිබෙනවා. දෙවැනි ප්‍රශ්නය හැටියට, දැන් මෙතුමා සංචාරක අමාත්‍යාංශයේ සභාපතිතුමා. එතකොට එතුමා වංචනිකයෙක් කියලා මේකෙන් පැහැදිලි වෙනවා. අනුමත ලිපි ලේඛනයක් නැතිව පස් මහල් ගොඩනැගිල්ලක් සෑදීම සම්බන්ධයෙන්. එතකොට එවැනි වංචනිකයෙක් අපේ ආයතනයක සභාපතිවරයෙක් හැටියට කටයුතු කරන්නේ කොහොමද කියන ප්‍රශ්නය දෙවැනි ප්‍රශ්නය හැටියට ඉදිරිපත් කරනවා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමාගේ අවසරය මත තුන්වන අතුරු ප්‍රශ්නය අහනවා. ගරු මහ ඇමතිතුමා කියනවා නම්, අනුමැතිය රහිතව ගොඩනැගිල්ලක් ඉදි කරලා තිබෙනවාය කියලා, ඊට අදාළ ඉදිරි නීතිමය ක්‍රියාමාර්ග ගන්නවාද කියලා ගරු මහ ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඒ පිළිබඳව මම බලන්න ඕනෑ. මට එකවර පිළිතුරු දෙන්න අමාරුයි. මෙතැන දීලා තිබෙන උත්තර මටත් එවලා තිබෙන උත්තර නේ? පරීක්ෂා කර බලා දැනුම් දෙන්නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ඊළඟ සභාවට ඒ ගැන පැහැදිලි පිළිතුරක් ලබා දෙන්න.

මීළඟට අංක 06 යටතේ එම්. ප්‍රසන්න සම්පත් ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව. එතුමා සභාවේ නැහැ. ගරු ප්‍රධාන අමාත්‍යතුමා, පිළිතුරු තිබෙනවා නම්, සභාගත කරන්න.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

පිළිතුර සභාගත කරනවා.

*** [සභාගත කරන ලද පිළිතුර]**
*[Tabled Answer]*

***ප්‍රශ්නය :***

*අ. බියගම ප්‍රාදේශීය සභාව ස්ථාපිත කර ඇත්තේ කුමන වර්ෂයේද?*

***පිළිතුර :***

*අ. 1995 වර්ෂයේදී.*

***ප්‍රශ්නය :***

*ආ. බියගම ප්‍රාදේශීය සභාවේ දෙල්ගොඩ මාකොළ, කඩවත උප කාර්යාලවල නිල අයිතිය (ඔප්පු) බියගම ප්‍රාදේශීය සභාවට ඇත්ද?*

***පිළිතුර :***

*ආ. දෙල්ගොඩ හා මාකොළ උප කාර්යාල පිහිටි දේපල සම්බන්ධයෙන් පැවරුම් ලේඛන මෙතෙක් ලැබී නැත.*

***ප්‍රශ්නය :***

*ඇ. එසේ නොමැති නම් ඒ සඳහා ඔබතුමා ගන්නා ක්‍රියාමාර්ග මොනවාද?*

***පිළිතුර :***

*ඇ. බියගම ප්‍රාදේශීය සභාව සංස්ථාපන නියමයට අදාළ පූර්වගාමී ආයතනය සතු වූ සියලු ඉඩම්වල අයිතිය බියගම ප්‍රාදේශීය සභාව වෙත නිරවුල් කර ගැනීමට උපදෙස් දෙමි.*

***ප්‍රශ්නය :***

*ඈ. බියගම ප්‍රාදේශීය සභාවේ සමස්ත කාර්ය මණ්ඩලය කොපමණද?*

***පිළිතුර :***

*ඈ. සමස්ත කාර්ය මණ්ඩලය - 208*

***ප්‍රශ්නය :***

*ඉ. වර්තමානයේදී බියගම ප්‍රාදේශීය සභාව මාර්ග සංවර්ධනය කිරීමේදී සහ අනෙකුත් කටයුතුවලදී ප්‍රතිපාදන වෙන් කරන්නේ කෙසේද?*

***පිළිතුර :***

*ඉ. 2016 වර්ෂයට අදාළ අයවැය ලේඛනයට ඇතුළත්ව ඇති මාර්ග සහ මහජන ඉල්ලීම් සම්බන්ධයෙන් දිය යුතු ප්‍රමුඛතාවයන් මත.*

***ප්‍රශ්නය :***

*ඊ. බියගම ප්‍රාදේශීය සභාව විසින් ජනතා සේවය ඉටු කිරීමේදී විශාල ගැටළු මතු වී ඇති අතර ඒ සඳහා ඔබතුමා ගන්නා ක්‍රියාමාර්ග මොනවාද?*

***පිළිතුර :***

*ඊ. වියිමත් ජනතා සේවයක් සැලසෙන පරිදි ක්‍රියා කිරීමට බියගම ප්‍රාදේශීය සභාවේ ලේකම් වෙත උපදෙස් ලබා දෙමි. එසේ නොවන අවස්ථා සම්බන්ධයෙන් නිශ්චිතව වාර්තා වුවහොත් ඊට අදාළව පරීක්ෂණ පවත්වා ගත යුතු ක්‍රියාමාර්ග තීරණය කරමි.*

***ප්‍රශ්නය :***

*උ. ප්‍රාදේශීය සභාවේ ඉඩම් වෙනත් ආයතනවලට සහ පුද්ගලයන්ට සභා තීරණ මත ලබා දිය හැකිද?*

***පිළිතුර :***

*උ. සභා තීරණයක් මත ලබා දීමේ හැකියාවක් නැත.*

***ප්‍රශ්නය :***

*ඌ. එසේ දී ඇත්නම්, ඒ සඳහා ඔබතුමා ගන්නා ක්‍රියාමාර්ග මොනවාද?*

***පිළිතුර :***

*ඌ. එසේ ලබා දී තිබේද යන්න පිළිබඳව පූර්ණ පරීක්ෂණයක් සිදු කර ඉන් අනතුරුව ගත යුතු ක්‍රියාමාර්ග තීරණය කරමි.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට අංක 07 යටතේ කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමාගේ නමින් ඇති ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව. එතුමා සභාවේ නැහැ. ගරු ප්‍රධාන අමාත්‍යතුමා, පිළිතුරු තිබෙනවා නම්, සභාගත කරන්න.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

පිළිතුර සභාගත කරනවා.

**** [සභාගත කරන ලද පිළිතුර]***
*[Tabled Answer]*

***ප්‍රශ්නය :***

*අ. බස්නාහිර පළාතේ ඝන අපද්‍රව්‍ය අධිකාරිය යටතේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථාන කීයක් තිබේද?*

***පිළිතුර :***

*අ. තුනක් තිබේ.*

***ප්‍රශ්නය :***

*ආ. ඒවායේ වැඩ කරන නිලධාරීන් සහ සේවක මණ්ඩලය කොපමණද?*

***පිළිතුර :***

*ආ. කරදියාන - 32*
*පොහොරවත්ත - 21*
*දික්ඕවිට - 06*

***ප්‍රශ්නය :***

*ඇ. ඔවුන් පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයින් ලෙස බඳවා ගෙන තිබේද?*

***පිළිතුර :***

*ඇ. නැත.*

***ප්‍රශ්නය :***

*ඈ. එසේ නොමැති නම් පළාත් රාජ්‍ය සේවයට බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු කළ හැකිද?*

***පිළිතුර :***

*ඈ. අත්‍යවශ්‍ය තනතුරු සඳහා පමණක් බඳවා ගැනීමේ හැකියාව පවතී.*

***ප්‍රශ්නය :***

*ඉ. එසේ නොමැති නම් එය දීර්ඝ කාලයක් තිස්සේ පළාත් ආයතනයක සේවය කරන පුද්ගලයින්ට සිදු වන අසාධාරණයක් නොවන්නේද?*

***පිළිතුර :***

*ඉ. අත්‍යවශ්‍ය තනතුරු ස්ථිර කිරීමට හැකි සෑම උත්සාහයක්ම දරමින් කටයුතු කෙරේ.*

***ප්‍රශ්නය :***

*ඊ. එය අසාධාරණයක් නම්, ඔවුන් ස්ථිර කිරීමට ගන්නා ක්‍රියාමාර්ග මොනවාද?*

***පිළිතුර :***

*ඊ. දැනට සියලුම ව්‍යාපෘතිවල මූ.රෙ. 71 සහ බඳවා ගැනීමේ පටිපාටිය කෙටුම්පත් කරමින් පවතී.*

***ප්‍රශ්නය :***

*උ. එසේ නොමැති නම්, ඒ මන්ද?*

***පිළිතුර :***

*උ. අදාළ නොවේ.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට අංක 08 යටතේ ලලිත් වර්ණකුමාර ගරු මන්ත්‍රීතුමාගේ නමින් ඇති ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**08.**

**ලලිත් වර්ණකුමාර ගරු මන්ත්‍රීතුමා විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :**

**(ප්‍ර/VI(1)/16/111)**

අ. i. 2014, 2015, 2016 වර්ෂවලදී පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරියට අයත් හොරණ විධායක ඉංජිනේරු කාර්යාලය මගින් එම කාර්යාල බල ප්‍රදේශය තුළ සිදු කරනු ලැබ ඇති අළුත්වැඩියා කිරීම් හා නව සංවර්ධන ව්‍යාපෘතීන් වෙන් වෙන්ව මොනවාද?

ii. එම ව්‍යාපෘති සඳහා යෝජනා ඉදිරිපත් වූ ආකාරය හා ඒ සඳහා නිර්දේශය ලබා දෙන ලද්දේ කවුරුන් විසින්ද?

iii. එම ව්‍යාපෘතීන්හි වටිනාකම් වෙන වෙනම සඳහන් කළ හැකිද?

iv. එසේ නම් ඒ මොනවාද?

ආ. i. එම ව්‍යාපෘති සඳහා ගිවිසුම්ගත වූ සමිති සහ කොන්ත්‍රාත්කරුවන් වෙන් වෙන්ව සඳහන් කළ හැකිද?

ii. එසේ නම් ඒ මොනවාද?

iii. 2016 වර්ෂයෙහි ක්‍රියාත්මක කළ ව්‍යාපෘතීන්හි ප්‍රගතිය කුමක්ද?

ඇ. i. පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරිය මගින් වගකීම් දරන යාල - නාරගල මාර්ගය වසර කිහිපයක් සංවර්ධනය නොකිරීම හේතුවෙන් ඉතාමත් අබලන් තත්ත්වයට පත්ව ඇති බව දන්නෙහිද?

ii. ඒසඳහා ගත් ක්‍රියාමාර්ග මොනවාද?

ඈ. i. පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරිය මත වගකීම ඇති මාහේන - බැල්ලපිටිය මාර්ගයේ අවිධිමත් බෝක්කු ඇති බව ඔබතුමා දන්නෙහිද?

ii. එසේ නම් ඒ සඳහා ගත් ක්‍රියාමාර්ග මොනවාද?

**ගරු ලලිත් වනිගරත්න** (මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා)

Hon. Lalith Wanigarathne (Minister of Roads, Transport, Cooperative Development and Trade, Housing and Construction, Estate Sector Infrastructure Facilities, Industries and Rural Development)

අ. i. ඇමුණුම 01[2] මගින් දක්වා ඇත.

ii. එම ඇමුණුමෙහි දක්වා ඇත.

iii. ඔව්.

iv. එම ඇමුණුමෙහි දක්වා ඇත.

ආ. i. ඔව්.

ii. ඇමුණුම 01 හි දක්වා ඇත.

iii. ඇමුණුම 01 හි 2016 වර්ෂයට අදාළ කොටසේ දක්වා ඇත.

ඇ. i. ඔව්.

ii. මාර්ග සංවර්ධන අධිකාරිය මගින් ක්‍රියාත්මක කිරීම යෝජිත අයි-ප්‍රොජෙක්ට් (I – Project) වැඩ සටහනේ ව්‍යාපෘතියක් ලෙස ඇතුළත් කොට සංවර්ධනය කිරීමට නියමිතය.

ඈ. i. ඔව්.

ii. අවිධිමත් බෝක්කු ඇත්තේ එකක් පමණි. ඉහළ ප්‍රදේශයෙන් පැමිණෙන වැසි ජලය බැස යාමට සකස් කර ඇති බෝක්කුව අසළ අවිධිමත් ලෙස ගොඩනැගිල්ලක් ඉදි කිරීම හේතුවෙන් ජල බස්නාව පිළිසකර කිරීමට උත්සාහ කළ ද, ඉඩම් ගැටළුවක් හේතුවෙන් තාවකාලිකව නතර කිරීමට සිදු විය. 2017 දී PSDG යටතේ පැති බැම්මක් බැඳ, බෝක්කුවේ ජල බස්නාව සකස් කිරීමට යෝජනා කර ඇත.

**ගරු ලලිත් වර්ණකුමාර**

Hon. Lalith Warna Kumara

ගරු සභාපතිතුමනි, ඇමුණුම කිව්වාම මට තේරුණේ නැහැ. ඒක සභාගත කරනවාද?

[2] පිළිතුර අවසානයේ පළ කර ඇත.

**ගරු ලලිත් වනිගරත්න - අමාත්‍යතුමා**
Hon. Lalith Wanigaratna - Minister

මේ ඔක්කොම සභාගත කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි ඔබතුමාට පිටපතක් දෙන්නම්.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

තව ප්‍රශ්නයක් තිබෙනවා. මේ යාල - නාරගල මාර්ගය I Road වලට පවරා ගෙන තිබෙනවා නම්, දැන් හරකෙකුටවත් යන්න බැරි තත්ත්වයක් තිබෙන්නේ. කොයි කාලයේ සිද්ධ වෙනවාද කියන එක දැන ගන්න ඕනෑ. මොකද, දැන් අවුරුදු දෙකක් තිස්සේම ඒ පාරේ මනුස්සයෙකුට තියා සතෙකුටවත් යන්න බැරි ක්‍රමයක් තිබෙන්නේ.

**ගරු ලලිත් වනිගරත්න - අමාත්‍යතුමා**
Hon. Lalith Wanigaratna - Minister

වෙන් කරලා තිබෙනවා.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

I Road වෙන්නේ නැත්නම් අපේ පාර අපි සංවර්ධනය කරන්න එපැයි. ඒ පාරේ යන්න බැහැ නේ.

**ගරු ලලිත් වනිගරත්න - අමාත්‍යතුමා**
Hon. Lalith Wanigaratna - Minister

2017 වර්ෂයේ ජනවාරි මාසයේ තමයි මේක I Road පටන් ගන්නේ.

ඇමුණුම 01

**2014 වර්ෂය**

| ප්‍රතිපාදන වර්ගය | ව්‍යාපෘතිය | ඇස්තමේන්තු මුදල | කොන්ත්‍රාත් මුදල | කොන්ත්‍රාත්කරු | යෝජනා ලබාගත් ආකාරය |
|---|---|---|---|---|---|
| PCRG | කටුගහහේනවත්ත මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 1250000 | 934,142.90 | හල්තොටගහවත්ත ග්‍රාම සංවර්ධන සමිතිය | පළාත් සභා මන්ත්‍රී යසපාල කෝරලගේ මන්ත්‍රීතුමාගේ ඉල්ලීම පරිදි. |
| PCRG | දික්හේනපුර මාර්ගය ඉන්ටර්ලොක් ගල් ඇල්ලීම | 3000000 | 2,288,349.36 | සහන් ඉංජිනියරින් පුද් සමාගම , ගම්පහ | සභාපතිතුමා |
| PCRG | කඳුබොඩහේනවත්ත මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 1400000 | 1,087,418.00 | මීදෙල්ලමුලහේනවත්ත ගොවි සංවිධානය | පළාත් සභා මන්ත්‍රී යසපාල කෝරලගේ මන්ත්‍රීතුමාගේ ඉල්ලීම පරිදි. |
| PCRG | කඳුබොඩහේනවත්ත මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 1400000 | 1,087,418.00 | පරාක්‍රම ගොවි සංවිධානය | එම |
| PCRG | හල්ගහවත්ත මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 1000000 | 766,377.50 | දික්හේනාගම සමෘද්ධි සංවිධානය | එම |
| PCRG | පාළුවත්ත මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 1400000 | 10,254.92 | පරාක්‍රම ගොවි සංවිධානය | එම |
| PD/ID B | වවුල්ලගල කාර්මික ජනපදය ඇතුලත මාර්ග සංවර්ධනය කිරීම | 5000000 | 1,528,798.11 | සිංහ ගොවි සංවිධානය. වෑවල නැගෙනහිර | විශේෂ ව්‍යාපෘති යටතේ කාර්මික සංවර්ධන මණ්ඩලය |
| DDGG | මිරිස්වත්ත කහවපිටිය මාර්ගයේ 1/1 පෙට්ටි බෝක්කුව සෑදීම | 1000000 | 779,355.67 | 614 මහ ගොවි සංවිධානය | හොරණ ප්‍රාදේශීය ලේකම්ගේ ප්‍රතිපාදන |
| PSDG | දික්හේනපුර මාර්ගය ඇස්ෆෝල්ට් කිරීම | | 17,347,111.40 | ස්ටාර් කන්ස්ට්‍රක්ෂන් | සභාපතිතුමා |
| PSDG | දික්හේනාගම අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 1700000 | 1,367,254.90 | 615D හල්කොටියාවත්ත ග්‍රාම සංවර්ධන සමිතිය | සභාපතිතුමා |
| PSDG | ඔලබොඩුවකලගල කොන්ක්‍රීට් කානු ඉදිකිරීම | 600000 | 466,381.40 | 614 B මහ උඩුව ගොවි සංවිධානය මහ උඩුව | වි.ඉ. තුමා |

| ප්‍රතිපාදන වර්ගය | ව්‍යාපෘතිය | ඇස්තමේන්තු මුදල | කොන්ත්‍රාත් මුදල | කොන්ත්‍රාත්කරු | යෝජනා ලබාගත් ආකාරය |
|---|---|---|---|---|---|
| PSDG | බැල්ලපිටිය මාහේන මාර්ගයේ ඇස්ෆෝල්ට් කිරීම | 3600000 | | සෘජු ශ්‍රමය මඟින් | ඩී.ඉ. කුමා |
| PSDG | පලන්තොරුව කහවපිටිය මාර්ගයේ 2/3 පාලම පළල් කිරීම | 1400000 | 1,067,012.40 | 614බී මහලඹුව ගොවි සංවිධානය | ඩී.ඉ. කුමා |
| PSDG | අරකාවිල ගනිල්ලකොට මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 500000 | 394,539.70 | කහපිටිය එක්සත් ගොවි සංවිධානය | පළාත් සභා මන්ත්‍රී යසපාල කෝරලගේ මන්ත්‍රීතුමාගේ ඉල්ලීම පරිදි. |
| PSDG | කුළපන මලබොඩුව 2/2 පාලම පුළුල් කිරීම | 2000000 | 1,619,773.35 | 614බී මහලඹුව ගොවි සංවිධානය | විදුර වික්‍රමනායක මන්ත්‍රී තුමා |
| PSDG | රත්මල්ගොඩ හඳපාන්ගොඩ ¼ පෙට්ටි බෝක්කුව හා කාණු ඉදිකිරීම | 2000000 | 1,429,493.36 | 15 කොරකොටුව සමෘද්ධි සංවිධානය | අබේරත්න මන්ත්‍රී තුමා |
| PSDG | බැල්ලපිටිය මාහේන මාර්ගයේ පැති බැම්ම ඉදිකිරීම | 2000000 | 1,476,008.35 | දිරිය ගොවි සංවිධානය | ඩී.ඉ. කුමා |
| PSDG | හාන්දුපැල්පොල කහාන්විල 1/3 බෝක්කුව ඉදිකිරීම | 1000000 | 811,474.81 | 614බී මහලඹුව ගොවි සංවිධානය | ඩී.ඉ. කුමා |

2015 වර්ෂය

| ප්‍රතිපාදන වර්ගය | ව්‍යාපෘතිය | ඇස්තමේන්තු මුදල | කොන්ත්‍රාත් මුදල | කොන්ත්‍රාත්කරු | යෝජනා ලබාගත් ආකාරය |
|---|---|---|---|---|---|
| PSD | සල්ගස්මාවත පැති බැම්ම ඉදිකිරීම | 2400000 | 1,814,879.43 | 816 වරකාගොඩ බටහිර ග්‍රාම සංවර්ධන සමිතිය | කිත්සිරි කහටපිටිය මන්ත්‍රී තුමා |
| PSD | සල්ගස්මාවත කොන්ක්‍රීට් කිරීම | 2400000 | 1,830,364.62 | වේරගොඩ සමෘද්ධි සමිතිය | එම |
| 100 | සිරිනිකේතනාරාමය 1 වන අධියර කොන්ක්‍රීට් කිරීම | 1200000 | 968,290.83 | ඉංගිරිය බටහිර මාවත ගොවි සංවිධානය | එම |
| 100 | සිරිනිකේතනාරාමය 2 වන අධියර කොන්ක්‍රීට් කිරීම | 1000000 | 786,744.40 | කැකුලලිය ගොවි සංවිධානය | එම |
| PSD | මාකාන පෝරුවදන්ඩ ඇස්ෆෝල්ට් කිරීම | 8150000 | 1,564,073.54 | මහගෙදර ගොවි සංවිධානය | එම |
| PSDG | බැල්ලම්පිටිය මාහේන කොන්ක්‍රීට් කිරීම පැති බැම්ම ඉදිකිරීම | 2600000 | 1,701,621.97 | දිරිය ගොවි සංවිධානය | ඩී.ඉ. කුමා |
| PSDG | පොකුණුවිට වැලිකල ඇස්ෆෝල්ට් කිරීම | 5000000 | 1,178,361.84 | කහාන්විල උතුර ගොවි සංවිධානය | ඩී.ඉ. කුමා |
| PSDG | අගලවත්ත කුඩලිගම වරකාමඩ පැති බැම්ම ඉදිකිරීම | 2000000 | 1,592,193.10 | ජන උදාන පදනම 75 අගලවත්ත | ගරු ලලිත් වර්ණකුමාර මන්ත්‍රීතුමා |
| PSDG | අගලවත්ත කුඩලිගම වරකාමඩ පෙට්ටි බෝක්කුව ඉදිකිරීම | 1000000 | 685,578.16 | පහල කුඩලගම ග්‍රාම සංවර්ධන සමිතිය | ගරු ලලිත් වර්ණකුමාර මන්ත්‍රීතු |

| | | | | | |
|---|---|---|---|---|---|
| PSDG | මහගම ගල්අත්ත කොන්ක්‍රීට් කිරීම | 700000 | 495,091.64 | පහල කුඩලුගම ග්‍රාම සංවර්ධන සමිතිය | ගරු ලලිත් වර්ණකුමාර මන්ත්‍රීතුමා |
| PSDG | 2/2 පොකුණුවිට වැලිකල පෙට්ටි බෝක්කුව ඉදිකිරීම | 3000000 | 811,602.72 | 615 හල්කොටියාවත්ත ග්‍රාම සංවර්ධන සමිතිය | වි.ශු. කුමා |
| PSDG | මලබොටුව කොන්ක්‍රීට් කාණු ඉදිකිරීම | 2000000 | 1,556,195.40 | පැරකුම් ගොවි සංවිධානය | වි.ශු. කුමා |
| PSDG | හදපාන්ගොඩ මෙතෝරිගම 4/2 4/3 පාලම ඉදිකිරීම | 5000000 | 3,721,277.22 | වර්ල්ඩ් ස්කෑන් ප්‍රයිවට් ලිමිටඩ් | වි.ශු. කුමා |
| PSDG | වැවල යාලගල 1 වන කිලෝමීටරයේ කොන්ක්‍රීට් කාණු ඉදිකිරීම | 3400000 | 2,008,021.37 | තරුෂ කන්ස්ට්‍රක්ෂන්ස් | සභාපතිතුමා |

2016 වර්ෂය

| ප්‍රතිපාදන වර්ගය | ව්‍යාපෘතිය | ඇස්තමේන්තු මුදල | කොන්ත්‍රාත් මුදල | කොන්ත්‍රාත්කරු | යෝජනා ලබාගත් ආකාරය හා ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| PSDG | රත්මල්ගොඩ හදපාන්ගොඩ බෝක්කු සෑදීම සහ ඇස්ෆෝල්ට් කිරීම | 20000000 | 6,920,409.56 | ඒ.එස්.ඒ බිල්ඩර්ස් | පළාත් සභා මන්ත්‍රී යසපාල කෝරලගේ මන්ත්‍රීතුමාගේ ඉල්ලීම පරිදි. 40% |
| PSDG | වැකර විදාගම 2/2 පාලම ප්‍රතිසංස්කරණය | 5000000 | 2,774,236.20 | ෂෙපර්ඩ් ඉන්ටර්නැෂනල් පුද්. සමාගම | පළාත් සභා මන්ත්‍රී යසපාල කෝරලගේ මන්ත්‍රීතුමාගේ ඉල්ලීම පරිදි. 90% |
| PSDG | වැකර විදාගම 5.70කිමී පැතිබැම්ම ඉදි කිරීම | 3850000 | 2,394,036.40 | ශෙලිනා කන්ස්ට්‍රක්ෂන් | පළාත් සභා මන්ත්‍රී යසපාල කෝරලගේ මන්ත්‍රීතුමාගේ ඉල්ලීම පරිදි. 90% |
| PSDG | අගලවත්ත කුඩලිගම පැතිබැම්ම ඉදිකිරීම | 5000000 | 2,295,430.00 | දිනුශ කන්ස්ට්‍රක්ෂන් | 1 කිත්සිරි කහවපිටිය මන්ත්‍රී තුමා 100% |
| PCRG | කිත්සිරිමෙවන් රජමහා විහාරය ඉදිරිපිට පැතිබැම්ම ඉදිකිරීම | 1250000 | 921,686.20 | 614බී මහඋඩුව ගොවි සංවිධානය | වි.ශු. කුමා 100% |
| LGD | සුදේරිස් සිල්වා මාවත ඇස්ෆෝල්ට් කිරීම | 4000000 | 873,677.00 | 615 සී හල්කොටියාවත්ත ග්‍රාම සංවර්ධන සමිතිය | හොරණ නාගරික ලේකම්ගේ ප්‍රතිපාදන |

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට අංක 09 යටතේ ලලිත් වර්ණකුමාර මන්ත්‍රීතුමාගේ නමින් ඇති ප්‍රශ්නය ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ඉදිරිපත් කිරීමට අවස්ථාව.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, මට එහෙම එකක් ඇවිල්ලා නැහැ නේ. කෙසේ වෙතත් ඒ සඳහා පිළිතුරු ලබා දීමට මම සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට අංක 10 යටතේ ඇති ප්‍රශ්නයත් එතුමාගේමයි. ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ඉදිරිපත් කිරීමට අවස්ථාව.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, ඒකත් ඇවිල්ලා නැහැ. ඒ සඳහා පිළිතුරු ලබා දීමට සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට අංක 11 යටතේ එම්. ප්‍රසන්න සම්පත් මන්ත්‍රීතුමා නමින් ඇති ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව. එතුමා සභාවේ නැහැ. ගරු අමාත්‍යතුමා පිළිතුරු තිබෙනවා නම් සභාගත කරන්න.

**ගරු ගාමිණී තිලකසිරි** (කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Gamini Thilakasiri (Minister of Agriculture, Land, Irrigation, Fisheries Animal Production and Health and Agrarian Development.)

ගරු සභාපතිතුමනි, පිළිතුර සභාගත කරනවා.

*** [*සභාගත කරන ලද පිළිතුර*]**
*[Tabled Answer]*

***ප්‍රශ්නය :***

*අ. බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පළාත් සභාවට අයත් ඉඩම් කොපමණ තිබේද?*

***පිළිතුර :***

*අ. බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පළාත් සභාවට අයිති ඉඩම් නොමැත.*

***ප්‍රශ්නය :***

*ආ. ඒ මොනවාද?*

***පිළිතුර :***

*ආ. අදාළ නොවේ.*

***ප්‍රශ්නය :***

*ඇ. මීට පෙර එම ඉඩම් පුද්ගලයන්ට හෝ ආයතනවලට බදු දී තිබේද?*

***පිළිතුර :***

*ඇ. අදාළ නොවේ.*

***ප්‍රශ්නය :***

*ඈ. බස්නාහිර පළාතේ ඉඩම් ගොඩ කිරීම ඔබ අමාත්‍යාංශය මගින් නැවැත්විය හැකිද?*

***පිළිතුර :***

*ඈ. නොහැකියි.*

***ප්‍රශ්නය :***

*ඉ. නොහැකි නම් ඊට හේතු මොනවාද?*

***පිළිතුර :***

*ඉ. 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතින් ඉඩම් ගොඩ කිරීම හා සම්බන්ධ බලතල පැවරී ඇත්තේ ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්වරයා වෙතය.*

*ප්‍රශ්නය :*

*ඊ. ඉඩම් ගොඩ කිරීම නැවැත්වීමට ඔබතුමා ගන්නා ඉදිරි ක්‍රියාමාර්ග මොනවාද?*

*පිළිතුර :*

*ඊ. අදාළ නොවේ.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට අංක 12 යටතේ නන්දන පත්මකුමාර ගරු මන්ත්‍රීතුමා නමින් ඇති ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව. එතුමා සභාවේ නැහැ. ගරු අමාත්‍යතුමා පිළිතුරු තිබෙනවා නම් සභාගත කරන්න.

**ගරු ලලිත් වනිගරත්න** - අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

ගරු සභාපතිතුමනි, පිළිතුර සභාගත කරනවා.

*** *[සභාගත කරන ලද පිළිතුර]***
*[Tabled Answer]*

*ප්‍රශ්නය :*

*අ. විවිධ සේවා සමූපකාර සමිතිවලට අනුබද්ධ ග්‍රාමීය බැංකු ශාඛාවල ස්ථිර තැන්පතු භාර ගන්නේද?*

*පිළිතුර :*

*අ. ඔව්. සමූපකාර ග්‍රාමීය බැංකු කාර්ය රීති සංග්‍රහයේ 3 :1 : 2 : 7 වගන්තිය අනුව*

*ප්‍රශ්නය :*

*ආ. එම අනුබද්ධ ශාඛාවල තැන්පතුවලට පූර්ණ වගකීම දරනුයේ කවුරුන් විසින්ද?*

*පිළිතුර :*

*ආ. අදාළ විවිධ සේවා සමූපකාර සමිති විසින්*

*ප්‍රශ්නය :*

*ඇ. අනුබද්ධ ශාඛාවල ස්ථිර තැන්පතු හවුල් ගිණුම් ලෙස භාර ගන්නේද?*

*පිළිතුර :*

*ඇ. ඔව්. සමූපකාර ග්‍රාමීය බැංකු කාර්ය රීති සංග්‍රහයේ 3 :1 : 2 : 11 වගන්තිය අනුව*

*ප්‍රශ්නය :*

*ඈ. එම හවුල් ගිණුමක් ලෙස ආරම්භ කළ ස්ථිර තැන්පතුවක මුදල් තනි ගිණුම් හිමියෙකුට ලබා ගත හැකිද?*

*පිළිතුර :*

*ඈ. අවස්ථානුකූලව හැකියාව ඇත.*

*ප්‍රශ්නය :*

*ඉ. ඒ කුමන ආකාරයෙන්ද?*

*පිළිතුර :*

*ඉ. තනි ගිණුම් හිමියෙකුට මුදල් ලබා ගත හැක්කේ අදාළ හවුල් ගිණුම ආරම්භ කරන අවස්ථාවේදී එකඟ වූ කොන්දේසි අනුවයි.*

*ප්‍රශ්නය :*

*ඊ. ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛන කවරේද?*

*පිළිතුර :*

*ඊ. බැංකු ගනුදෙනු පාස් පොත*
*අනන්‍යතාවය තහවුරු කර ගැනීමට ජාතික හැඳුනුම්පත් හෝ අදාළ ලියවිල්ලක්*
*ස්ථිර තැන්පතු කුවිතාන්සිය*
*ගෙවීම් වවුචරය*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට අංක 13 යටතේ පී.ඩී. අබේරත්න ගරු මන්ත්‍රීතුමා නමින් ඇති ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව. එතුමාත් සභාවේ නැහැ. ගරු අමාත්‍යතුමා පිළිතුරු තිබෙනවා නම් සභාගත කරන්න.

**ගරු රංජිත් සෝමවංශ** (අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Ranjith Somawansa (Minister of Education, Cultural and Arts Affairs, Sports and Youth Affairs and Information Technology.)

ගරු සභාපතිතුමනි, පිළිතුර සභාගත කරනවා.

*** [සභාගත කරන ලද පිළිතුර]**
*[Tabled Answer]*

**ප්‍රශ්නය :**

*අ. අගලවත්ත මැතිවරණ කොට්ඨාශයේ තිබෙන පාසල් ගණන කොපමණද? එම පාසල්වල ශ්‍රේණිධාරී විදුහල්පතිවරුන් කී දෙනෙකු සිටීද?*

**පිළිතුර :**

*අ. පාසල් ගණන - 83*

**ප්‍රශ්නය :**

*ආ. ඉහත (අ) හි සඳහන් පාසල් හා විදුහල්පතිවරුන් සංඛ්‍යාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ අනුව කොපමණද?*

**පිළිතුර :**

*ආ.*

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | පාසල් ගණන | ශ්‍රේණිධාරී විදුහල්පතිවරු ගණන |
|---|---|---|
| අගලවත්ත | 25 | 20 |
| පාලින්දනුවර | 28 | 21 |
| වලල්ලාවිට | 30 | 16 |
| එකතුව | 83 | 57 |

**ප්‍රශ්නය :**

*ඇ. දැනට වැඩ බලන විදුහල්පතිවරු කී දෙනෙකු සිටීද?*

**පිළිතුර :**

*ඇ. 26 කි.*

**ප්‍රශ්නය :**

*ඈ. ශ්‍රේණිධාරී විදුහල්පතිවරුන් සියලු දෙනාට විදුහල්පති පත්වීම් ලබා දී ඇත්ද? එසේ නොවන්නේ නම් ඊට හේතුව කුමක්ද?*

**පිළිතුර :**

*ඈ. ශ්‍රේණිධාරී විදුහල්පතිවරු සියලු දෙනාට විදුහල්පති හෝ නියෝජ්‍ය/සහකාර විදුහල්පති පත්වීම් ලබා දී ඇත.*

**ප්‍රශ්නය :**

*ඉ. වැඩ බලන විදුහල්පතිවරයෙකු වෙනත් පාසලකට විදුහල්පති ලෙස පත් කිරීම නීත්‍යානුකූලද? එසේ පත්වීම් කර ඇත්ද? එසේ පත්වීම් දී ඇත්නම්, ඒ සඳහා ඔබතුමා ගන්නා පියවර කුමක්ද?*

**පිළිතුර :**

*ඉ. වැඩබලන විදුහල්පතිවරයෙකු විදුහල්පති සේවයේ විධිමත් පත්වීමක් ලැබ නොමැති විට වෙනත් පාසලක විදුහල්පති ලෙස පත් කිරීම නීත්‍යානුකූල නැත.*
*එසේ පත්වීම් ලබා දී නැත.*
*වහාම නිවැරැදි කිරීමට පියවර ගනිමි.*

**ප්‍රශ්නය :**

*ඊ. විදුහල්පති ශ්‍රේණිධාරී සියලු දෙනාම පුරප්පාඩු සඳහා පත් කරන්නේද? නොඑසේ නම් ඒ මන්ද?*

**පිළිතුර :**

*ඊ. විදුහල්පති ශ්‍රේණිධාරී සියලු දෙනා මේ වන විට විදුහල්පති, නියෝජ්‍ය/සහකාර විදුහල්පති පුරප්පාඩු සඳහා පත් කර ඇත.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට අංක 14 යටතේ ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාගේ නමින් ඇති ප්‍රශ්නය ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ඉදිරිපත් කිරීමට අවස්ථාව.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, ඒ සඳහාත් පිළිතුරු ලබා දීමට සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට අංක 15 යටතේ මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා නමින් ඇති ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව. එතුමාත් සභාවේ නැහැ. ගරු අමාත්‍යතුමා පිළිතුරු තිබෙනවා නම් සභාගත කරන්න.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, පිළිතුර සභාගත කරනවා.

***[සභාගත කරන ලද පිළිතුර]***
*[Tabled Answer]*

***ප්‍රශ්නය :***

*අ. i. මීගමුව කලාපයේ කටුවපිටිය ශාන්ත සෙබස්තියන් මහා විද්‍යාලයේ මේ වන විට සිසුන් කී දෙනෙකු ඉගෙනුම ලබන්නේද?*

***පිළිතුර :***

*අ. i. 301 යි.*

***ප්‍රශ්නය :***

*ii. එම පාසලේ දැනට වැඩ බලන විදුහල්පතිවරියක යටතේ පාලනය වන බව ඔබ දන්නේද?*

***පිළිතුර :***

*ii. ඔව්.*

***ප්‍රශ්නය :***

*iii. ඇය පාසලට වැඩ බැලීමට පත් කරන ලද්දේ කවදා සිටද?*

***පිළිතුර :***

*iii. 2015.03.30*

***ප්‍රශ්නය :***

*ආ. i. ඇය වැඩ බැලීමට පත් වූ පසු අ.පො.ස (සා.පෙළ) හා ශිෂ්‍යත්ව සමතුන්ගේ ප්‍රතිඵල මේ සභාවට ඉදිරිපත් කරන්නේද?*

***පිළිතුර :***

*ආ. i. ඔව්.*

| *වර්ෂය* | *අ.පො.ස. විභාගය* | *(සා.පෙළ)* | | *ශිෂ්‍යත්ව විභාගය* | | |
|---|---|---|---|---|---|---|
| | *පෙනී සිටි ගණන* | *සුදුසුකම් ලද ගණන* | *ප්‍රතිශතය* | *පෙනී සිටි ගණන* | *සමත් සිසුන් ගණන* | *ප්‍රතිශතය* |
| *2015* | *19* | *1* | *5%* | *23* | *0* | *0%* |
| *2016* | *-* | | | *20* | *0* | *0%* |

***ප්‍රශ්නය :***

*ii. ඇය වැඩ බැලීමට පත් වීමට පෙර වසර 05 ක ප්‍රතිඵල මේ සභාවට ඉදිරිපත් කරන්නේද?*

***පිළිතුර :***

*ii. ඔව්.*

| ***වර්ෂය*** | ***අ.පො.ස. (සා.පෙළ) විභාගය*** | | | ***ශිෂ්‍යත්ව විභාගය*** | | |
|---|---|---|---|---|---|---|
| | *පෙනී සිටි ගණන* | *උසස් පෙළ සඳහා සුදුසුකම් ලද ගණන* | *ප්‍රතිශතය* | *පෙනී සිටි ගණන* | *සමත් සිසුන් ගණන* | *ප්‍රතිශතය* |
| *2010* | *35* | *10* | *28%* | *23* | *0* | *0%* |
| *2011* | *27* | *3* | *11%* | *18* | *0* | *0%* |
| *2012* | *23* | *9* | *39%* | *22* | *1* | *5%* |
| *2013* | *13* | *4* | *31%* | *32* | *0* | *0%* |
| *2014* | *17* | *3* | *18%* | *15* | *0* | *0%* |

***ප්‍රශ්නය :***

*ඇ. i. ඇය පාසලේ වැඩ බැලීමට පත් වූ පසු පාසලේ පරිපාලනය හා අධ්‍යාපනය පහත වැටී ඇති බව ඔබතුමා පිළිගන්නේද?*

***පිළිතුර :***

*ඇ. i. විභාග ප්‍රතිඵල අනුව අධ්‍යාපන මට්ටම පහත වැටී ඇති බව පිළිගනිමි.*

***ප්‍රශ්නය :***

*ii. ඒ සඳහා ගනු ලබන පියවර කවරේද?*

***පිළිතුර :***

*ii. දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ මට්ටමින් විමර්ශනයක් සිදු කිරීමට පියවර ගනිමි.*

***ප්‍රශ්නය :***

*iii. පාසලේ ආදි ශිෂ්‍ය සංගමය විසින් දිගින් දිගටම ඉහත තත්ත්වය පිළිබඳ අදාළ බලධාරීන් දැනුවත් කර ඇති බව ඔබතුමා දන්නේද?*

***පිළිතුර :***

*iii. ඔව්.*

***ප්‍රශ්නය :***

*iv. මේ සම්බන්ධව ඔබතුමා නිසි පියවර ගන්නේද?*

***පිළිතුර :***

*iv. ඔව්. විමර්ශන වාර්තාවේ නිර්දේශ අනුව ඉදිරියේදී පියවර ගැනීමට කටයුතු කරමි.*

***ප්‍රශ්නය :***

*iv. නොඑසේනම් ඒ මන්ද?*

***පිළිතුර :***

*iv. අදාළ නොවේ.*

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. මගේ ප්‍රශ්න දෙක යොමු කළාම ඇවිල්ලා නැහැයි කිව්වේ, අපේ සභා කටයුතු එකෙන් ගිහිල්ලා නැද්ද? එහෙම නැත්නම් එතුමාට ඒ ප්‍රශ්නයට පිළිතුරු ඇවිල්ලා නැද්ද කියන එක තමයි මම හිතුවේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සාමාන්‍යයෙන් සභා කටයුතු කාරක සභාවේ අපි එදාට හෝ පහුවෙනිදාට ඒ අදාළ අමාත්‍යාංශයේ ලේකම්තුමාට අපි ප්‍රශ්න යොමු කරනවා.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

කාලීන අවශ්‍යතාවයක් වුණාම අපි -

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

මගෙන්ද අහන්නේ?

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ඔව්.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

ඇවිල්ලා නැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සාමාන්‍යයෙන් අපි යවනවා. ඒක තියා ගන්නේ නැහැ. දැන් එතුමා සති දෙකක් කල් ඉල්ලා ගත්තා නේ?

# පළාත් සභාවේ රැස්වීම
PROVINCIAL COUNCIL MEETING

**ගරු සුමිත් ලාල් මැන්දිස්** (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමා රක්ෂණ සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Sumith Lal Mendis (Minister of Health, Indigenous Medicine, Social Welfare, Probation and Child Care Services, Women's Affairs and Council Affairs.)

ගරු සභාපතිතුමනි, *"2016 දෙසැම්බර් මස 15 වන දිනට නියමිත වැඩ කටයුතු අවසන්ව විසිර යෑමෙන් අනතුරුව මෙම පළාත් සභාව 2017 ජනවාරි මස 03 වන දින පෙ.ව. 9.30 ට රැස් විය යුතුය"* යන යෝජනාව ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# පළාත් සභාවේ කටයුතු
PROVINCIAL COUNCIL AFFAIRS

**ගරු සුමිත් ලාල් මැන්දිස්** - අමාත්‍යතුමා
Hon. Sumith Lal Mendis - Minister

ගරු සභාපතිතුමනි, *"2017 වර්ෂයේ මුදල් ප්‍රකාශය පිළිබඳ විවාදය හා ඒ හා සම්බන්ධ වැඩ කටයුතු සඳහා වෙන් කළ දිනයන්හි වැඩ කටයුතුවලදී රීති අංක 15(1) හි සඳහන් විධිවිධානයන්ගෙන් කිසිදු බාධාවක් සිදු නොවිය යුතුය."* යන යෝජනාව ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# වාර්ෂික මුදල් ප්‍රකාශය - 2017
ANNUAL FINANCIAL STATMENT - 2017

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, *"2017 වර්ෂය වෙනුවෙන් පිළියෙල කරන ලද වාර්ෂික මුදල් ප්‍රකාශය අනුමත කළ යුතුය."*

***ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.***
*Question proposed again*

# පොදු සාකච්ඡාව
COMMON DISCUSSION

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පළමුවෙන්ම මුදල් ප්‍රකාශය පිළිබඳ පොදු සාකච්ඡාව අද දින ආරම්භ කරන අතර, එම පොදු සාකච්ඡාව සමස්ථයක් වශයෙන් මුදල් ප්‍රකාශය සම්බන්ධව හා ඒ හා බැඳුනු ප්‍රතිපත්තිමය කරුණුවලට පමණක් සීමා වන බවත් ගරු මන්ත්‍රීතුමන්ලා වෙත ඉතාමත්ම ගෞරවයෙන් සිහිපත් කරනවා. න්‍යාය පත්‍රයානුකූලව අද දින ප.ව. 5.00 ට මෙම ගරු සභාව අවසන් වෙනවා. දැන් පොදු සාකච්ඡාව ආරම්භ කිරීමට මම පළමුවෙන්ම විපක්ෂයට ආරාධනා කරනවා. පළමුවෙන්ම කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

[පූ.භා. 09.23]

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, මුලින්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු ප්‍රධාන අමාත්‍යතුමා 2017 වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබෙන මුදල් ප්‍රකාශය පිළිබඳ විවාදයේදී ගරු අමාත්‍යවරුන් හතර දෙනා ඉදිරිපත් කරලා තිබෙන කරුණු - ආණ්ඩුකාරතුමා ඇතුළු අපේ සියලුම අමාත්‍යවරුන්ටත්, ඒ වාගේම පළාත් රාජ්‍ය සේවාවේ ප්‍රධාන ලේකම්තුමා ඇතුළු නිලධාරීන්ටත් මම මුලින්ම අපේ ස්තූතිය පුද කරන්න කැමැතියි.

ගරු සභාපතිතුමනි, 2017 වර්ෂය සඳහා ඇස්තමේන්තුගත මුළු වියදම රුපියල් බිලියන 61,276 ක පෙන්නුම් කිරීමක් මේ නිලධාරී මහත්වරු විසින් අපට ඉදිරිපත් කරලා තිබෙනවා. ඒකෙන් රජයෙන් ලැබීමට අපේක්ෂිත ප්‍රදාන දිහා අරගෙන බැලුවාම පුනරාවර්ථන වියදම් සඳහා රුපියල් මිලියන 14,866,857 ක් ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා. පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන සඳහා මිලියන 764 යි. විශේෂ ව්‍යාපෘති යටතේ ප්‍රදාන රුපියල් මිලියන 630 යි. උපමාන පාදක මිලියන 254 ක් අපි රජයෙන් ලැබීමට අපේක්ෂිත මුදල් ප්‍රමාණය පිළිබඳව මේකේ සටහනක් ලබා දීලා තිබෙනවා. ඒ වාගේම ආදායම් රැස් කිරීම පිළිබඳව මේ ප්‍රකාශයේ සඳහන් කරලා තිබෙනවා. පළාත් සභාව රැස් කිරීමට බලාපොරොත්තු වන ආදායම,

[ ගරු කිත්සිරි කහටපිටිය ]

රජයෙන් ලැබීමට අපේක්ෂිත ජාතිය ගොඩ නැගීමේ බද්ද හා මුද්දර ගාස්තු ඇතුළුව පෙර ඉතිරි මුදලුත් සමඟ මිලියන 61,276.378 ක් ඇස්තමේන්තු ගත කරලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, මම ඉතාමත්ම සතුටින් ප්‍රකාශ කරන්න ඕනෑ. යහපාලන රජය බිහි කර ගෙන, පළාත් සභාවේ මූල්‍ය ප්‍රතිපාදන පිළිබඳව වර්ධනයක් ලබා ගැනීමට ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු අපේ කණ්ඩායම සමත් වෙලා තිබෙනවා. පළාතේ ආදායම වැඩි කර ගෙන ඒ කටයුත්ත ක්‍රියාත්මක කරන්න. ඒත් එක්කම අපට කනගාටුවෙන් වුණත් ප්‍රකාශ කරන්න ඕනෑ. රජයෙන් ලබා දීමට යන මූල්‍ය ප්‍රතිපාදන දිහා අරගෙන බැලුවාම අපට වෙනදාට ලබා දෙනවාට වැඩිය අඩු මුදල් ප්‍රමාණයක් ලබා දෙන්න රජය කටයුතු කරලා තිබෙනවා. එහෙම නම් ගරු සභාපතිතුමනි, අපි ඉතාමත්ම ආඩම්බරයෙන් ප්‍රකාශ කරන්නට ඕනෑ. රජය මුදල් ප්‍රතිපාදන පිළිබඳ අමාරු බවක් කියලා අපට අඩුවෙන් මුදල් ලබා දුන්නත්, පළාත් සභාවක් හැටියට අපි අපේ ආදායම වැඩි කර ගැනීම තුළින් රජය බංකොලොත් භාවයට වැටිලා තිබෙනවාය කියන එක පෙන්වන්න අපි දක්ෂ වෙලා තිබෙනවා. පළාත් සභාවක් හැටියට ආදායම වැඩියෙන් එක් රැස් කරලා රජයට පෙන්වන්න, ගිය අවුරුද්දට වැඩිය අපි මූල්‍ය ප්‍රතිපාදනවලින් අපේ ආදායම වැඩි කර ගෙන තිබෙනවාය කියලා.

ගරු සභාපතිතුමනි, අපේ ආදායම් එකතු කිරීම පිළිබඳව මෙහි සටහන් කරලා තිබෙනවා. විශේෂයෙන්ම 1 -30 දක්වා රා, තැබෑරුම්, රේන්ද බද්ද කියලා ආරම්භ කරනවා. අවසන් කරනවා විවිධ ප්‍රාග්ධන වත්කම් විකිණීම කියන එකෙන්. 1 – 30 ට අපි ආදායම් එකතු කිරීමේ ක්‍රමවේදය පිළිබඳව 2017 රුපියල් මිලියන 42,260,265 ක එකතු කිරීමක් පෙන්වනවා.

ගරු සභාපතිතුමනි, මේ පළාත් සභාවට වැඩියෙන්ම ආදායමක් ලැබෙන තැපැල් හා උසාවි දඩ කරුණු පිළිබඳව, ගිවිසුම් ගත ගාස්තු ඇතුළු මුද්දර ගාස්තු තමයි මිලියන 12,500 ක් පිළිබඳව අපට මේ සටහනේ සටහන් කරලා තිබෙන්නේ. ඒත් එක්කම ජාතිය ගොඩ නැගීමේ බද්ද පිළිබඳව මිලියන 10 ක පෙන්නුම් කිරීමක් කරනවා. ඊළඟට අපි වැඩියෙන්ම ආදායම එක්කහු කර ගන්න යන්නේ, මෝටර් වාහන බලපත්‍ර ගාස්තුවලින්. එය විශේෂ ආදායමක් හැටියට පෙන්වනවා. 19 යටතේ පෙන්වනවා, මෝටර් රථ ප්‍රවාහන පනත යටතේ අය කරන ගාස්තු හා අනෙකුත් ගාස්තු පිළිබඳව. මෙන්න මේ කරුණු කාරණාත් එක්ක මේ විෂයයන් 30 ඇතුළත අපට ලබා දී තිබෙන බලතල එක්ක මේ මූල්‍ය ප්‍රතිපාදන රැස් කර ගන්න අපි දක්ෂ වෙලා තිබෙනවා.

එහෙම නම් ගරු සභාපතිතුමනි, අපි මේ පොදු සාකච්ඡාව දිහා අරගෙන බලන කොට ගරු අමාත්‍යතුමා, ප්‍රධාන අමාත්‍යතුමා පෙන්නුම් කරනවා, අධ්‍යාපනය පිළිබඳව. ශ්‍රී ලංකාවේ වර්තමාන පාසල් පද්ධතිය තුළ අධ්‍යාපනයේ සම අවස්ථා නොමැති වීම ප්‍රධාන ගැටළුවක් ලෙස වාර්තා වන බවක් රජය දැන ගෙන සිටියා. ඒ නිසා තමයි අපි දැනුමෙන් බල ගැන්වූ සුපිරි සිසු පරපුරක් බිහි කිරීමට ළඟම පාසල හොඳම පාසල හැටියට සංකල්පයක් අරගෙන, අතිගරු ජනාධිපතිතුමාත්, ගරු අග්‍රාමාත්‍යතුමාත්, ඒ වාගේම අධ්‍යාපන අමාත්‍ය අකිල විරාජ් කාරියවසම් අමාත්‍යතුමාත් එක්කහු කරලා මේ අධ්‍යාපනය දියුණු කරන්න හදන්නේ. බස්නාහිර පළාතේ පාසල් ගුරු සංඛ්‍යාව දිහා අරගෙන බැලුවාම අපට පෙන්වනවා, බස්නාහිර පළාත තුළ පාසල් 1289 ක්. ඒ වාගේම සිසුන් සංඛ්‍යාව 741,934 ක්. ගුරුවරු අරන් බැලුවාම 35,432 ක් තුළින් මේ අපේ පළාත තුළ අධ්‍යාපන සේවාව ක්‍රියාත්මක කරන්න කටයුතු කරනවාය කියන එක සඳහන් කරලා තිබෙනවා. එහෙම නම් ගරු සභාපතිතුමනි, මේ ළඟම පාසල හොඳම පාසල පිළිබඳව මධ්‍යම රජය අපට 2016 වසරේ බස්නාහිර පළාතට ලබා දී තිබෙන මුදල රුපියල් මිලියන 7057 ක් වෙනවා. ඒ අනුව මේ යටතේ පාසල් 1200 කට ව්‍යාපෘති 3356 ක් ක්‍රියාත්මක වන වැඩ සටහනක් පිළිබඳව මේ නිලධාරී මහත්වරු අපේ අධ්‍යාපන අමාත්‍යතුමා, මහ ඇමතිතුමා ඉදිරිපත් කරපු මුදල් ප්‍රකාශයේ සඳහන් කරලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, මේ අනුව බස්නාහිර පළාතට රුපියල් මිලියන 7057 ක් ලබා දෙන කොට මේ පාසල් 1280 ව්‍යාපෘති 3356 ක් ක්‍රියාත්මක කරනවා. ඉතින් අධ්‍යාපනය පිළිබඳව යහපාලන රජය විසින් පළාත් සභාවලට වෙන් කරන මූල්‍ය ප්‍රතිපාදන දිහා අරගෙන බැලුවාම, වැඩිම මුදල් ප්‍රමාණයක් අපේ පළාත් සභාවට මධ්‍යම රජයෙන් ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා. ඒ අනුව අපේ අධ්‍යාපන අමාත්‍යතුමාට විශාල වශයෙන් වැඩ කටයුතු රාශියක් ක්‍රියාත්මක කරන්න තිබෙනවා. අධ්‍යාපනය පිළිබඳව සැලසුම් ක්‍රියාත්මක කරවීමේදී, එතුමාගේ අමාත්‍යාංශ

ලේකම්තුමාත් සමඟ සම්බන්ධකම් ඇති කර ගෙන මේ කලාප කාර්යාල සඳහා අධ්‍යාපනයේ ගුණාත්මක භාවයක් ගොඩ නගා ගැනීම සඳහා ඉතාමත්ම දක්ෂ ලෙස වැඩ කටයුතු කරමින්, මේ ව්‍යාපෘති තුන් දහස් ගණන අපි ක්‍රියාත්මක කරන්නේ කොයි ආකාරයෙන්ද කියලා බැලුවාම 2016 දී ආරම්භ කරලා, 20120 වන තෙක් මේ ව්‍යාපෘති ටික ක්‍රියාත්මක කරන්න අපට මධ්‍යම රජයෙන් අවස්ථාව ලබා දීලා තිබෙනවා. එහෙම නම් ඒ පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශයේ වැඩ කටයුතු ක්‍රියාත්මක කරන ගමන්ම විශේෂයෙන් මේ මුදල් ප්‍රකාශයේ සඳහන් කරලා තිබෙනවා. අපේ සෞඛ්‍ය අමාත්‍යතුමාගේ කාර්යභාරය පිළිබඳව කටයුතු ක්‍රියාත්මක කරන්න.

ගරු සභාපතිතුමනි, සෞඛ්‍ය පැත්ත අරගෙන බැලුවාම අපට දැවැන්ත සංවර්ධනයක් බස්නාහිර පළාතට ගෙනැල්ලා දෙන්න පුළුවන්. මොකද, මධ්‍යම රජයේ අමාත්‍යතුමාත් ලෙස නියෝජනය කරන්නේ අපේ කළුතර දිස්ත්‍රික්කයේ රාජිත සේනාරත්න අමාත්‍යතුමා. ඊට පස්සේ අපේ සුමිත් ලාල් මෙන්ඩිස් අමාත්‍යතුමා මේ සෞඛ්‍ය අමාත්‍යධුරය ලබා ගත්තාට පස්සේ එතුමා සැලසුම් සහගත ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරලා, එතුමා රෝහල වෙත යන ලෙඩාව කොයි ආකාරයෙන්ද - 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ බලතලත් එක්ක පළාතේ මේ ලෙඩාගේ ආරක්ෂාව, බෙහෙත් ටික ලබා දීම, රෝහල් සංවර්ධනය කිරීම දැවැන්ත වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කටයුතු කරනවා. ඒ අනුව ගරු සභාපතිතුමනි, මම ඉතාමත් සතුටින් ප්‍රකාශ කරන්න ඕනෑ. අර ඕනෑම ගමක ඕනෑම දුප්පත් මිනිහෙකුට ඉන්දියාවෙන් ලැබුණු ගිලන් රථ සේවාව ක්‍රියාත්මක කරවීමේදී, කළුතර දිස්ත්‍රික්කයට විදේශ කටයුතු අමාත්‍යාංශයේ හර්ෂ ද සිල්වා ගරු අමාත්‍යතුමාගේ යටතේ අපේ කළුතර දිස්ත්‍රික්කයට ගිලන් රථ 23 ක් අපට ලබා ගන්න පුළුවන් වුණා. ඒ වාගේම ගම්පහ, කොළඹ දිස්ත්‍රික්වලත් මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙනවා. අද බස්නාහිර පළාතේ ජීවත් වන ජනතාව ඉතාමත් දුෂ්කර ප්‍රදේශවල දුප්පත් ජනතාවට, ද්‍රවිඩ වතු කම්කරු ජනතාවට හදිසියේ ලෙඩක් හැදුනාම මේ සේවාව ලබා දීම තුළින් එතුමන්ලාට නොමිලයේ රෝහලකට යන්න, ඒ වාගේම ආරක්ෂාව ගෙදරින් ලබා ගත්තාට පස්සේ ඒ ගිලන් රථයට ඒ සෞඛ්‍ය සේවාව ලබා දෙන්න දැවැන්ත වැඩ පිළිවෙළක් යහපාලන ආණ්ඩුව තුළ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හා එක්සත් ජාතික පක්ෂය එකතු වීම තුළ ජනතාවට සේවාවක් ලබා දෙන්න පුළුවන්කම ඇති වුණාය කියන එක මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න ඕනෑ.

ඒ වාගේම තමයි අපි ඊළඟ අමාත්‍යාංශය කෘෂිකර්ම අමාත්‍යාංශය අරගෙන බැලුවාම, මම ඉතාමත්ම සතුටු වෙනවා. දීර්ඝ කාලයකට පස්සේ හොඳ අමාත්‍යවරයෙක් - අපේ ගාමිණී තිලකසිරි අමාත්‍යතුමා මේ කෘෂිකර්මාන්තය සඳහා බස්නාහිර පළාතට පත් වෙලා තිබෙනවා.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ඇළවල් කීයක් ලැබුණාද?

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මට මතකයි, ඉස්සර මේ සභාවේ ඔය අමාත්‍යාංශය භාරව වැඩ කටයුතු කළේ, ඇල්මන් පීරිස් මැතිතුමා. අපි ඒ කාලයේ දැක්කා, ඇල්මන් පීරිස් හිටපු අමාත්‍යතුමා කෘෂිකර්මාන්තයට අදාළ පළාත් සභා බලතලත් උපයෝගී කර ගෙන එදා මධ්‍යම ආණ්ඩුව ගොවි ජන සේවා අරගත්තාට පස්සේ, සමගාමී ලැයිස්තුවේ බලයත් උපයෝගී කරලා, එතුමා සටනක් දියත් කළා, මේ පළාත නාගරික පළාතක් වුණාට, කෘෂිකර්මාන්තයේ තිබෙන බිම් ප්‍රමාණය සංවර්ධනය කරන්න. අද ගරු ගාමිණී තිලකසිරි අමාත්‍යතුමා ඉතාමත් ලස්සන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරලා විශේෂයෙන්ම එතුමාගේ අමාත්‍යාංශ ලේකම්තුමා එදා ජනාධිපතිතුමාව හෝමාගමට ගෙන්වලා අපේ ගම්මානවල හැංගිලා හිටපු කිරි ගොවීන්ව ඉදිරියට අරගෙන ඇවිල්ලා, ශ්‍රී ලංකාවේ වැඩිම ආර්ථිකයක් - විදේශ විනිමය අපට පිරටරවල්වලට යොදවන්න වෙලා තිබෙන්නේ උදේ පාන්දර අපේ ශ්‍රී ලංකාවේ ජනතාව පිටි කිරි දිය කර ගෙන බොන නිසා. විශාල මුදල් ප්‍රමාණයක් අපි විදේශ රටවල්වලට යවනවා. අන්න ඒ වැඩ පිළිවෙළ තේරුම් ගත් අමාත්‍යවරයෙක් හැටියට, අමාත්‍යාංශ ලේකම්තුමා හැටියට පශු වෛද්‍ය වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරපු අයුරු මම දැක්කා. එදා ඒ ප්‍රදර්ශනයේදී. කිරි දෙනුන් ගෙනැල්ලා එය ජනතාවට ප්‍රදර්ශනය කිරීම තුළින් අවශ්‍ය සංවර්ධනය අද පළාතේ ජනතාවට ලබා ගන්න පුළුවන්කම ඇති වෙලා තිබෙනවාය කියන එක මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න ඕනෑ.

[ගරු කිත්සිරි කහටපිටිය]

ගරු සභාපතිතුමනි, මේ කෘෂිකර්මාන්තයේ තවත් පැත්තක් අපි දකිනවා. ජනාධිපතිතුමා, අගමැතිතුමා එකතු වෙලා ජාතික ආහාර නිෂ්පාදන වැඩ සටහන මෙතුමන්ලාගේ අමාත්‍යාංශයත් සම්බන්ධ කර ගෙන, වසර තුනක සැලසුමක් ඇති කර ගෙන, ශ්‍රී ලංකාවේ හැම පළාතකම ගොවියාට තමන්ගේ හැකියාව අනුව තමන් ජීවත් වන පොළොව උපයෝගී කර ගෙන, ඒකේ වගා කර ගෙන - වී ගොවිතැන වෙන්න පුළුවන්. වෙනත් වගාවන් වෙන්න පුළුවන්. දැවැන්ත ආදායමක් උපයා ගැනීමේ වැඩ පිළිවෙළ ඒ ජාතික ආහාර නිෂ්පාදන වැඩ සටහනෙන් ක්‍රියාත්මක වෙනවා. ඒ සඳහා පළාත් සභාවේ ගාමිණී තිලකසිරි අමාත්‍යතුමාට ලබා දී තිබෙන ධනය, බලතල ප්‍රකාරව ඒ ව්‍යාපෘති ඉතාමත් හොඳට ක්‍රියාත්මක කරලා - අපේ පළාත් සභාව වෙනදා අපි බෙදිලා වැඩ කරපු ප්‍රධාන පක්ෂ දෙක එකතු වෙලා වැඩ කිරීම තුළ ඒ ජනතාවට සේවාවක් ලබා ගන්න හැකියාවක් තිබෙනවාය කියන එකත් මම මේ අවස්ථාවේදී ඔබතුමා මාර්ගයෙන් මතක් කරන්න ඕනෑ.

ඊළඟට මම කථා කරන්න ඕනෑ, අපේ පළාත් මාර්ග පිළිබඳ අමාත්‍යතුමාගේ වැඩ සටහන තිබෙනවා. ඒ වාගේම අපේ ගාමිණී තිලකසිරි අමාත්‍යතුමාට මම මේ අවස්ථාවේදී ඔබතුමාගේ මාර්ගයෙන් යෝජනාවක් කරන්න කැමැතියි. වාරිමාර්ග පිළිබඳව. මේ මධ්‍යම ආණ්ඩුව එතුමන්ලාගේ වාරිමාර්ග අමාත්‍යාංශය තිබුණාට අපේ දිස්ත්‍රික්කවල ප්‍රධාන ගංගාවල් විතරයි එතුමන්ලාට මුදල් ප්‍රතිපාදන යොදවලා සංවර්ධනය කරන්න පුළුවන් වෙන්නේ. මම ඔබතුමාට කියන්න කැමැතියි. ගාමිණී තිලකසිරි අමාත්‍යතුමා කෘෂිකර්මාන්තය සඳහා පළාත් සභාවේ සුළු වාරිමාර්ග සංවර්ධනය කරන්න යන්ත්‍ර උපකරණ ගණනාවක් ලබා ගෙන එතුමා මේ අවුරුද්දේ අපට ඒවා ලබා දීලා තිබෙනවා. එහෙම නම් මේ වාරිමාර්ග පිළිබඳව අපි කථා කරන කොට අපේ ලලිත් වර්ණකුමාර ගරු මන්ත්‍රීතුමා කිව්වා, ඇළවල් කීයක් ලැබුණාද කියලා. ඇළවල් තිබෙන ප්‍රමාණය අරගෙන බැලුවාම ගරු මන්ත්‍රීතුමා, ඔබත් මමත් නියෝජනය කරන ආසනය දිහා අරගෙන බැලුවාම, අද මම සතුටින් ප්‍රකාශ කරන්න කැමැතියි. අගමැතිතුමා අපට කිව්වේ, තමුන්නාන්සේලා නියෝජනය කරන ගම ඉස්සෙල්ලා හදා ගන්න. ඒ ගම හදා ගන්න තරමට තමයි අපට රට හදන්න පුළුවන් මිනිස්සු කවුද කියලා සොයා ගන්න පුළුවන් වෙන්නේ.

ඒ නිසා ගරු සභාපතිතුමනි, මම නියෝජනය කරන්නේත්, ලලිත් වර්ණකුමාර ගරු මන්ත්‍රීතුමා නියෝජනය කරන්නේත් එකම ආසනය. එතුමන්ලා මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ කාලයේ අපේ ආසනය තුළ දැවැන්ත සංවර්ධනයක් ඇති කළා. නිර්මල කොතලාවල ඇමතිතුමා හිටියා. මාර්ග පිළිබඳව කථා කරනවා නම්, ලංකා ඉතිහාසයේ කවදාවත් නොවුණු සංවර්ධනයක් එදා ගැමි පාරවල්, ප්‍රධාන පාරවල්, ඒ වාගේ නොයෙකුත් දේවල් තුළ ඇති කළා. එහෙම නම් මෙන්න මේ වාරිමාර්ගය පිළිබඳව මම ඔබතුමාගේ මාර්ගයෙන් ගරු ඇමතිතුමාට යොමු කරන්න කැමැතියි. ගරු අමාත්‍යතුමනි, මේ ඉදි කිරීම් වැඩ කටයුතු ක්‍රියාත්මක කරවීමේදී, මුදල් ප්‍රතිපාදන - අපි කියමු ඇළක් කපන්න හරි, ගොඩනැගිල්ලක් හදන්න හරි, ඇළවේලිවල කොන්ක්‍රීට් දාන්න හරි ඉදි කිරීම් කටයුතුවලදී අපට ලබා දී තිබෙන ඇස්තමේන්තුගත මුදල දිහා අරගෙන බැලුවාම, කොන්ත්‍රාත්කරුවා වැඩ කරන්නේ 2013 බඩු මුට්ටුවල ගණන්වලට අනුව ලබා දුන් මුදල්වලින්. ඒ වාගේම බාසුන්නැහැලාට ගෙවන ගණන්, කම්කරුවාට ගෙවන ගණන් ඒ ඇස්තමේන්තුවේ හදලා තිබෙන්නේ 2013 අවුරුද්දේ ඒ තිබෙන මිල ගණන් අනුවයි. අද සිමෙන්ති කොට්ටය වැඩි වෙලා. බාසුන්නැහැ කෙනෙක් වැඩ කරන මුදල වැඩි කරලා. ඒ වාගේම වැලි ටික ගොඩ දාන ප්‍රමාණය - වැලි ටික ගන්න ගියාම ඒ මුදල වැඩි වෙලා. ඉතින් අපි කොන්ත්‍රාත්කරුවාට කියනවා, ප්‍රමිතියට අනුව වැඩ කරන්නය කියලා. ඒ කොන්ත්‍රාත්කරුවන්ට නිලධාරීන් ගිහිල්ලා, TO මහත්වරු, ඒ වාගේම නොයෙකුත් අය ගිහිල්ලා වැඩ කටයුතු කරන්න ගණන් හිලව් හදලා බැලුවාම කොන්ත්‍රාත් එක දාලා යන්න හිතෙනවා. මොකද, කියුබික් මීටරයට රු. 10,000 ක් දෙනවා කියමුකෝ. ඒ රු. 10,000 ට අරගන්න තිබෙන බඩු ටික බැලුවාම රු. 12,000 ක් රු. 13,000 ක් විතර තැනට බඩු මිල වැඩි වීම තුළ ඒ වියදම් දරා ගන්න බැරිකමක් ඇති වෙලා තිබෙනවා. අන්න ඒ වැඩ පිළිවෙළ පිළිබඳව අලුත් මිල සංශෝධන සියලුම අමාත්‍යවරු හතර දෙනාට ප්‍රධාන අමාත්‍යතුමාට ඒ අපේ පළාතේ සංවර්ධනය පිළිබඳව ඔබතුමන්ලාගේ මාර්ගයෙන් මම දැනුම් දෙන්න කැමැතියි. ගරු සභාපතිතුමා මාර්ගයෙන් ගරු ඇමතිතුමන්ලාට කියනවා ඒ පිළිබඳව සොයා බලන්න කියලා.

ඊළඟට අපේ ප්‍රධාන අමාත්‍යතුමා. ප්‍රධාන අමාත්‍යතුමා මේ ප්‍රධාන අමාත්‍ය ධූරය භාර ගත්තේ ඉතාමත් වාසනාවන්ත

කාලයක. මම එහෙම කියන්න හේතුව වුණේ, ගරු ජනාධිපතිතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් ජනාධිපති වෙලා තිබෙනවා. ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහත්තයා අගමැති වෙලා තිබෙනවා, රටේ ජනතාවගේ ඡන්දයෙන්. මේ දෙක එකතු කරලා යහපාලන ආණ්ඩුවක් හදලා තිබෙනවා. ඉසුර දේවප්‍රිය ගරු ප්‍රධාන අමාත්‍යතුමා තමන්ගේ වැඩ කටයුතු ක්‍රියාත්මක කරවීමේදී අලුත් යහපාලන ආණ්ඩුවත් එක්ක යන ගමනේදී පැටලිලි රාශියක් තිබෙනවා. අන්න ඒවා බේරා ගන්න ප්‍රධාන අමාත්‍යතුමා හැටියට එතුමා ඉතාමත් කැප වීමෙන්, උනන්දුවෙන් වැඩ කටයුතු කරලා, ඒ ගරු අමාත්‍යවරුන්ගේ ගෞරවය රකින්න - ඒ වාගේම මන්ත්‍රීවරුන්ගේ ගෞරවය රකින්න, නිලධාරීන්ගේ ගෞරවය රකින්න ආණ්ඩුකාරතුමා ප්‍රමුඛ මේ කණ්ඩායම - නිලධාරීන් පැත්තෙන් ඉන්නවා ආණ්ඩුකාරතුමා. දේශපාලඥයින් පැත්තෙන් ඉන්නවා අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා.

ගරු සභාපතිතුමනි, මම ඔබතුමාගේ මාර්ගයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාට මතක් කරන්න කැමැතියි. මේ සභාවේ ඉන්න මන්ත්‍රීවරු 104 දෙනා ඔබතුමා අනික් අමාත්‍යවරුන්ට වැඩියෙන් කල්පනා කරලා, හිතලා, අර යහපාලන රජයේ තිබෙන කරුණුත් එක්ක - මම ඔබතුමා වාසනාවන්තයි කිව්වේ මේ දෙගොල්ලෝ එක මතයකට ගේන්න එතුමාට පුළුවන්කමක් ඇති වෙලා තිබෙනවා. ඒ එක මතයට ගෙනැල්ලා වැඩ කටයුතු කරන කොට අර්බුද ගණනාවක් මතු වෙනවා. මතු වෙලත් තිබෙනවා. නමුත් මේවා උගත්කමයි, බුද්ධිමත්කමයි දෙකට ගැලපෙන නායකත්වයක් තිබෙන කොට ගරු සභාපතිතුමනි, මේවා සාකච්ඡා මාර්ගයෙන් විසඳගන්න පුළුවන්කමක් ඇති වෙනවා. එහෙම නම් ගරු සභාපතිතුමා, ඒ වාගේම ගරු ප්‍රධාන අමාත්‍යතුමා සහ අනෙක් අමාත්‍යවරු හතර දෙනා එක්ක අපි මේ වැඩ කටයුතු කරන්නේ කොහොමද? මේ පොදු සාකච්ඡාවෙන් කරලා දෙන්නේ මොකක්ද කියන එක ගරු ප්‍රධාන අමාත්‍යතුමා තේරුම් අරගෙන ප්‍රධාන ලේකම්තුමාගේ නායකත්වයෙන් නිලධාරීන්ව රැස් කර ගෙන මේ පොදු සාකච්ඡාව, ඇස්තමේන්තුව අපට ඉදිරිපත් කරලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, මම ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ඔබතුමාගේ මාර්ගයෙන් මතක් කරලා දෙන්න කැමැතියි. මේ පළාත් සභාව අපි දැන් අරන් තිබෙන ශක්තිය, මේ ආදායම වැඩි කර ගැනීමේ ශක්තිය පිළිබඳව අපේ නිලධාරීන්ව ඇගයීමකට, ස්තුතිය ප්‍රකාශ කිරීමට සම්බන්ධ කරන්න ඕනෑ. මොකද, මේ මධ්‍යම ආණ්ඩුවෙන් ආර්ථික අර්බුදයක් තිබෙනවා කියලා කපලා දාන කොට අපි එකතු කරන්න යන ආදායම රුපියල් මිලියන 37,859 කින් වැඩි කරලා තිබෙනවා. එහෙම නම් ගරු ප්‍රධාන අමාත්‍යතුමා අර දෙකම තිබෙන මනුස්සයෙක් හැටියට උගත්කමයි, බුද්ධිමත්කමයි එකට උපයෝගී කර ගෙන කරන ක්‍රියාකලාපය තුළ නිලධාරීන් දක්ෂ වෙලා තිබෙනවා, රුපියල් මිලියන 37,859 ලබා ගෙන අපේ ආදායම වැඩි කරන්න.

එහෙම නම් ගරු සභාපතිතුමනි, මේ ගරු මන්ත්‍රීවරුන්ගේ තිබෙන වරප්‍රසාද පිළිබඳව දැවැන්ත ගැටළුවක් තිබෙනවා. ඔබතුමා දන්නවා. අපේ සභා ලේකම්තුමා දන්නවා. මධ්‍යම ආණ්ඩුව මේ ගැටළුවට විසඳුමක් දෙන්න, ඒ මන්ත්‍රීවරුන්ට දෙන දීමනාව මහජනතාව වෙනුවෙන් - බත් කන්න, ගෙදරට බඩු ගන්න නොවෙයි. මහජනතාව වෙනුවෙන් ඒ දිස්ත්‍රික්කයේ වැඩ කටයුතු කරන්න රුපියල් ලක්ෂයක දීමනාවක් මධ්‍යම ආණ්ඩුවෙන් ඒ මන්ත්‍රීවරුන්ට ලබා දෙන්න බලාපොරොත්තු වෙනවා, ජනතාවගේ බදු මුදල්වලින්. එහෙම නම් අපි ඇයි පළාත් සභාව - අපේ පළාත් සභාවට අයත් නීතියක් තිබෙනවා. පනතක් තිබෙනවා. අපට ලොකු බැංකුවක් තිබෙනවා. සමූපකාර බැංකුව. මම එදා මේ සාකච්ඡාවක් කරලා මේ මන්ත්‍රීවරුන්ගේ පහසුකම් - මේ ජනතාවට ලබා දෙන්න යන වැඩ කටයුත්තේදී අපට තිබෙන අපහසුකම් මොනවාද? මේ අපහසුකම් දිහා අරගෙන බැලුවාම මේ මන්ත්‍රීවරුන්ට යන්න එන්න හරියට වාහනයක් නොමැතිකම දැඩිව තිබෙනවා. එහෙම නම් ගරු ප්‍රධාන අමාත්‍යතුමා අපි ඔක්කොම සාකච්ඡා කරලා මේකට ක්‍රමවේදයක් සැලසුම් කරන්න පුළුවන් නීතියක් තිබෙනවා, මේ පළාත් සභාවේ. අනික් පළාත් සභා අරගෙන බැලුවාම සබරගමුව පළාත් සභාවේ හැම මන්ත්‍රීවරයෙකුටම රියදුරෙකු, කැබ් රථයක් සහ ඉන්ධන දීමනාවක් දීලා තිබෙනවා. මඟුල් ගෙවල්වල කොහේවත් යන්න නොවෙයි. ඒ ගරු මන්ත්‍රීවරුන්ට ජනතා සේවයට ඒ පළාතේ වැඩ කටයුතු කරන්න තමයි ඒ පහසුකම දීලා තිබෙන්නේ. එහෙම නම් ඇයි අපේ පළාත් සභාවට බැරි? අපට පුළුවන්කමක් තිබෙනවා ගරු ප්‍රධාන අමාත්‍යතුමනි. අමාත්‍යාංශ හරහා වැඩ පිළිවෙළ ක්‍රියාත්මක

[ගරු කිත්සිරි කහටපිටිය]

කරන්න. මම එදා මලික් සමරවික්‍රම මහත්මයායි, තවත් කට්ටියක් සාකච්ඡාවක ඉන්න කොට මම ඒ මන්ත්‍රීවරුන්ගෙන් ඇහුවා, පාර්ලිමේන්තුවේ වරප්‍රසාද හදා ගත්තේ කොහොමද කියලා. එතුමා දුන්න උත්තරය තමයි, අපටත් තිබෙනවා සමූපකාර බැංකුවක්. ඒකෙන් ණය පහසුකම් හරි, ණය නැතිව හරි මොන ක්‍රමයකට හරි සාකච්ඡා කරලා ඒ පහසුකම් අපේ මන්ත්‍රීවරුන්ට, අපේ නිලධාරීන්ට අපේ බැංකුව හරහා ලබා දෙන්න පුළුවන්කම තිබෙනවා. ඒ බලය තිබෙන්නේ අපට. අපි මේවා ගැන හිතලා නැහැ, ගරු ප්‍රධාන අමාත්‍යතුමනි. එහෙම නම් මේ අයවැය විවාදය ඉතාමත් සාර්ථකව, බෙදීමක් නැතිව තමුන්නාන්සේට සහ මේ අමාත්‍යවරු හතර දෙනාට සහාය පළ කරන්නේ මේ ජනතාවගේ යහපත සඳහා.

13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් අපට පැවරී තිබෙන බලතල තුළින් මධ්‍යම ආණ්ඩුවට වැඩිය වැඩක් අපේ පළාත් සභාවෙන් අපට කරන්න පුළුවන්. මුළු ලංකාවේම පළාත්වල ජනතාව අපේ පළාත් සභාවේ භූමියට ඇතුළු වන පුද්ගලයෝ පුරවැසියෝ ඉන්නවා. එහෙම නම් මේ කරුණු කාරණා පිළිබඳව අපේ නිලධාරීන් එකතු කර ගෙන, දේශපාලන වශයෙන් අපේ ප්‍රධාන පක්ෂ දෙක දැන් එකතු කරන්න අපට පුළුවන්කම තිබෙනවා. වෙනදාට අපි ඔය පැත්තට ගිහිල්ලා වැඩ කළා නම් විනය පරීක්ෂණ තියනවා. මේ පළාත් සභාවේ මම විපක්ෂ නායක ධූරය දරන කාලයේ මේ සියලු බාධාවලින් ඉවත් කරලා එදා රෙජිනෝල්ඩ් කුරේ හිටපු ගරු ප්‍රධාන අමාත්‍යතුමාත් එක්ක අපි කටයුතු කළා. යහපාලන ආණ්ඩුව එදා මධ්‍යම රජයේ තිබුණේ නැහැ. නමුත් එදා අපි අපේ පළාත් සභාවේ එය ඇති කර ගෙන දැවැන්ත වැඩ පිළිවෙළක් අපි කළා. අද එහෙම නම් ජාතික ආණ්ඩුවත් යහපාලනයට ගිහිල්ලා තිබෙනවා. පළාත් ආණ්ඩුව අපි උගත්කම, බුද්ධිමත්කම දෙක එකතු කරලා හදාපු බෙහෙත් පෙත්ත උපයෝගී කර ගෙන මේ පළාත් සභාවේ පක්ෂ ගණනාවක ඉන්න මහජන නියෝජිතයින්ගේ මතය එකට අරගෙන - 2017 වසර දිළිඳුකම තුරන් කිරීමේ වසරක් හැටියට මධ්‍යම ආණ්ඩුව නම් කරලා තිබෙනවා. අපිත් මේ පළාත් සභාව එවැනිම වැඩ පිළිවෙළකින් ක්‍රියාත්මක කරලා වැඩ කටයුතු කරන්න ඔබතුමා ප්‍රමුඛ අමාත්‍යවරුන්ටත්, නිලධාරීන්ටත් ශක්තිය ධෛර්යය ලැබෙන්නය කියලා ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම සියලුම ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා, නියමිත කාලයටම තමන්ගේ කථාව අවසන් කරන්න. නැත්නම් අනික් මන්ත්‍රීවරුන්ට අසාධාරණයක් සිද්ධ වෙනවා. මීළඟට ආණ්ඩු පක්ෂය වෙනුවෙන් මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා. ඔබතුමාට විනාඩි 15 ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 09.49]

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, 2017 අයවැය සම්බන්ධව මුලින් කථා කිරීමට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා එතුමාගේ කථාවේදී කිව්වේ, සමහර දේවල් යහපාලන ආණ්ඩුව තුළ මේ පළාත් සභාවට ලැබුණු විධියට. නමුත් අපි එතුමාට මතක් කරලා දෙන්න ඕනෑ, 2017 අයවැයට පෙර 2016 අයවැයට අපි අපේක්ෂිත ප්‍රාග්ධන ප්‍රධාන හැටියට රුපියල් මිලියන 7162 ක් බලාපොරොත්තු වුණා. PSDG වලට රුපියල් මිලියන 2894 කුත්, ඒ වාගේම විශේෂ ව්‍යාපෘති යටතේ රුපියල් මිලියන 746 කුත්, ඒ වාගේම උපමාන පාදක හැටියට රුපියල් මිලියන 460 කුත් වශයෙන් රුපියල් මිලියන 4100 ක් බලාපොරොත්තු වුණා. නමුත් මේ වන කොට ලැබිලා තිබෙන්නේ, රුපියල් මිලියන 1329 යි. මධ්‍යම රජයෙන් 2016 වසරට රුපියල් මිලියන 2771 ක් තවමත් ලබා දීලා නැහැයි කියන එක මේ වෙලාවේ ප්‍රකාශ කරනවා. අපි ප්‍රතිශතයක් හැටියට ගත්තොත් අපට පොරොන්දු වුණු මුදලින් ලැබිලා තිබෙන්නේ 32% යි. 68% ක් ම තවම ලැබිලා නැහැ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඒක තමයි ගරු මන්ත්‍රීතුමා මම ස්තුති කළේ. අපේ නිලධාරීන් අපේ ආදායම වැඩි කරලා තිබෙනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මධ්‍යම රජයේ මුදල් ලැබෙන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, මීට ඉහත මේ පළාත් සභාව තුළම, ගිය ආණ්ඩුව කාලයේ පිරිවැටුම් බද්ද අය කිරීම අපි මධ්‍යම රජයට ලබා දුන්නා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

අන්න එතැන තමයි -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඒ ලබා දීමේදී දුන් පොරොන්දුවක් මත. මීට ඉහත සෑම වසරකම මුදල් ලබා දීමේදී ප්‍රතිශතයක් හැටියට ගත්තොත් පොරොන්දු වූ මුදල ලබා දීලා තිබෙනවා. උදාහරණයක් වශයෙන් කියන්න පුළුවන් අපට 2015 වසරේදී පළාත් නිශ්චිත අරමුදල්වලින් රුපියල් මිලියන 1452 ක් පොරොන්දු වුණා. ඒ වාගේම විශේෂ ව්‍යාපෘති යටතේ රුපියල් මිලියන 525 ක් පොරොන්දු වුණා. රුපියල් මිලියන 1977 න් 2016 වසරේ අපි අයවැය ඉදිරිපත් කරන කොට රුපියල් මිලියන 1376 න් මිලියන 601 ක් ඉතිරි තිබුණා. නමුත් රුපියල් මිලියන 601 ම ඒ අවුරුද්දේදී ලබා දුන්නා. නමුත් මේ වන කොට 2016 වසරට රුපියල් මිලියන 7160 න් රුපියල් මිලියන 4100 ක් ම තිබෙන්නේ, මධ්‍යම රජයෙන් ලබා දෙන ව්‍යාපෘතිවලට. ඉන් රුපියල් මිලියන 1360 ක් ලැබීමෙන් රුපියල් මිලියන 2771 ක් ම ලැබිලා නැහැ. ඒ වාගේම පුනරාවර්ථන වියදම් හැටියට ඒ ප්‍රදාන අපට ලබා දෙන්න පොරොන්දු වෙලා තිබෙනවා. අපේක්ෂිත ප්‍රදාන හැටියට රුපියල් මිලියන 21,743 ක්. ඒ මුදලිනුත් අපට ලැබිලා තිබෙන්නේ 86% යි. ඒ කියන්නේ, රුපියල් මිලියන 18,721 ක් විතරයි ලැබිලා තිබෙන්නේ. රුපියල් මිලියන 3022 ක් ලැබිලා නැහැ. 24% ක් ලැබිලා නැහැ. මුළු මුදල බැලුවොත්, අපට මේ මධ්‍යම රජයෙන් ලැබෙන්න ඕනෑ මුදල රුපියල් මිලියන 25,843 යි.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

2016 දී.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

2016 දී. ඒ වාගේම රුපියල් මිලියන 20,050 යි අපට ලැබිලා තිබෙන්නේ. රුපියල් මිලියන 5783 ක් ලැබිලා නැහැ. ඒ වාගේම ගරු ප්‍රධාන අමාත්‍යතුමා පරිපූරක ඇස්තමේන්තුවක් දැම්මා. මේ පළාත් සභාවට රුපියල් මිලියන 605 ක්. ඒ වාගේම 2016 වසරේදී පළාත් සංවර්ධන මුදල්වලින් අපට රුපියල් මිලියන 1230 ක් ප්‍රාග්ධනවලට වෙන් කරලා තිබුණා. ආයතනික ප්‍රදාන හැටියට රුපියල් මිලියන 1832 ක් වෙන් කරලා තිබුණා. ඒ රුපියල් මිලියන 1832 න් පළාත් සභා ගොඩනැගිල්ලට තමයි රුපියල් මිලියන 1000 ක් ම වෙන් කරලා තිබුණේ. මොකද, පළාත් සභා ගොඩනැගිල්ලට ඇස්තමේන්තුගත මුදල රුපියල් මිලියන 7200 යි. පසුගිය රජය කැබිනට් අමාත්‍ය මණ්ඩලය අනුමත කරලා, පොරොන්දුවක් වෙලා තිබුණා, මේ ගොඩනැගිල්ලට ඒ රුපියල් මිලියන 7200 න් 50% ක මුදලක් මේ පළාත් සභාවට ලබා දෙනවාය කියලා. මම ගියවර අයවැය කථාවේදී ඒ සම්බන්ධ ලිපියක් සභාගත කළා. නමුත් 2014 වසරේ රුපියල් මිලියන 300 කුත්, 2015 වසරේ රුපියල් මිලියන 500 කුත් වශයෙන් මේ වන තෙක් ලබා දී තිබෙන්නේ රුපියල් මිලියන 800 ක් පමණයි. රුපියල් මිලියන 7200 න් මේ වන කොට වියදම් වෙලා තිබෙනවා, රුපියල් මිලියන 2500 ක් මේ ගොඩනැගිල්ලට. ඒ රුපියල් මිලියන 2500 න් 1700 ක් වියදම් කරලා තිබෙන්නේ පළාත් සභාව. මධ්‍යම රජයෙන් ලැබිලා තිබෙන්නේ රුපියල් මිලියන 800 යි.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

පළාත් සභාවට මධ්‍යම රජයෙන් ලැබුණාම ඒවා අය කර ගන්න ඕනෑ. පළාත් සභාව ගෙවලා තිබෙන ඒවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ අවුරුද්දේ වෙන් කරපු රුපියල් මිලියන 1000 නුත් මේ වන කොට වියදම් කරලා තිබෙන්නේ රුපියල් මිලියන 300 යි. තවත් රුපියල් මිලියන 700 ක් ඉතිරි වෙලා තිබෙනවා. ඒ වාගේම ආයතනික ප්‍රදාන හැටියට පළාත් නිශ්චිතවලින් ඒ මුදල් වියදම් කිරීම තුළ වියදම් කරලා තිබෙන්නේ, රුපියල් මිලියන 250 යි. රුපියල් මිලියන 832 න් රුපියල් මිලියන 250 යි. රුපියල් මිලියන 550 යි. රුපියල් මිලියන 879 ක් ඉතිරි වෙලා තිබෙනවා. ඒ නිසා අපි මතක් කරන්න ඕනෑ. විශේෂයෙන්ම කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා කිව්වා, අධ්‍යාපන අමාත්‍යාංශයේ "ළඟම පාසල හොඳම පාසල" වෙනුවෙන් මුදල් වෙන් කරලා තිබෙනවාය කියලා. රුපියල් මිලියන 7057 ක් වෙන් කරලා තිබෙනවා කියලා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

2020 වන තෙක්.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

නමුත් මේ වන කොට ලබා දීලා තිබෙන්නේ රුපියල් මිලියන 333 යි. රුපියල් මිලියන 6724 ක් තවම පළාත් සභාවට ලබා දීලා නැහැ. 4.7% යි තවම ලබා දීලා තිබෙන්නේ. ඒ වාගේම -

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඒ මුළු මුදලින්.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මේ වසරේ අධ්‍යාපනයට වෙන් කරලා තිබුණු මුදල බැලුවොත් එහෙම, පළාත් නිශ්චිතවලින් අපට, 2017 වසරට බැලුවොත් එහෙම, පුනරාවර්තන වියදම්වලට ලබා දීලා තිබෙන්නේ, රුපියල් මිලියන 14,866 යි. එතකොට මේ වසරේ පුනරාවර්තන වියදම්වලින් රුපියල් මිලියන 6877 ක් අඩු කරලා. ඒ වාගේම විශේෂ ව්‍යාපෘති යටතේ රුපියල් මිලියන 630 යි. රුපියල් මිලියන 116 ක් අඩු කරලා. මේ අවුරුද්දේ උපමාන පාදක හැටියට ලැබිලා තිබෙන්නේ, රුපියල් මිලියන 460 න් රුපියල් මිලියන 200 යි. නමුත් ලබන අවුරුද්දට ලබා දීලා තිබෙන්නේ, රුපියල් මිලියන 254 යි. රුපියල් මිලියන 206 ක් අඩු කරලා.

ඒ වාගේම පළාත් නිශ්චිත හැටියට මේ අවුරුද්දේ රුපියල් මිලියන 2894 ක් ලබා දෙනවාය කියලා පොරොන්දු වුණා. රුපියල් මිලියන 800 යි ලබා දීලා තිබෙන්නේ. නමුත් ලබන වසරේ අපට පොරොන්දු වෙලා තිබෙන්නේ, රුපියල් මිලියන 764 යි. රුපියල් මිලියන 2130 ක් අඩු කරලා. මේ අවුරුද්දට පමණක් අපට එක පැත්තකින් පොරොන්දු වුණු මුදලින් රුපියල් මිලියන 5793 ක් අඩු කරනවා වාගේම, ලබන අවුරුද්දටත් රුපියල් මිලියන 9329 ක් අඩු කරලා.

ගරු සභාපතිතුමනි, ඔබතුමා මගින් කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමාට පැහැදිලි කරන්න ඕනෑ. ලබන වසරට රුපියල් මිලියන 9329 ක් අඩු කරනවා විතරක් නොවෙයි, මේ අවුරුද්දටත් රුපියල් මිලියන 5703 ක් අඩු කිරීමෙන් මිලියන 15,000 ක් මේ පළාත් සභාවට ලැබිලා නැහැ. ලබන අවුරුද්දටයි මේ අවුරුද්දයි එකතු කළාම. එතකොට මේවා අපට ලැබෙන්න තිබෙන මුදල්, පොරොන්දු වුණු මුදල්. ඒ වාගේම රුපියල් මිලියන 7057 ක් "ළඟම පාසල හොඳම පාසල" වැඩ සටහනට මේ වන කොට හය දහස් අටසිය ගණනක් ලැබිලා නැත්නම්, රුපියල් මිලියන 21,000 කට ආසන්න මුදලක් මේ තුළ තිබෙනවා. මොකද, අපි පරිපූරකයක් ගෙනැල්ලා පරිපූරකයේ රුපියල් මිලියන 7000 ක් මේකේ අනුමත කළා. ප්‍රධාන ලේකම්තුමිය අධ්‍යාපන අමාත්‍යාංශයත් එක්ක අවබෝධතා ගිවිසුමක් අත්සන් කළා. ඒ අවබෝධතා ගිවිසුම අනුව තමයි ඉංජිනේරු කාර්යාලයෙන් ඇස්තමේන්තු හදලා, මේ පළාතේ තිබෙන පාසල් 1280 න් පාසල් තෝරා ගෙන, ඒ වාගේම A, B, C, D කියලා වර්ගීකරණය කරලා, වෙන් වෙන් වශයෙන් තෝරා ගෙන ව්‍යාපෘති හැදුවේ. ඒ ව්‍යාපෘති හදලා අද මුදල් ටික නැහැ. අද ටෙන්ඩර් කරලා වැඩ භාර ගන්න කවුරුවත් නැහැ. ඒ මුදල් නැති නිසා. දැන් කියනවා, 2020 දක්වා තමයි මුදල් වෙන් කරලා තිබෙන්නේ. 2020 වන කොට තමයි මේ වැඩ සටහන ක්‍රියාත්මක වෙන්නේ කියලා. ගරු සභාපතිතුමනි, 2020 ට නම් තව අවුරුදු කීයක් තිබෙනවාද? තව අවුරුදු හතරක් තිබෙනවා. ඒ අවුරුදු හතර තුළ රුපියල් මිලියන 7000 බෙදුවොත් මොකක්ද තත්ත්වය. එතකොට කීයද අපට ලැබිලා තිබෙන්නේ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

නැහැ. එහෙම දෙන්නේ නැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

එහෙම තමයි ප්‍රකාශ කරලා තිබෙන්නේ. (බාධා කිරීමක්) ඒ වාගේම තමයි ගරු සභාපතිතුමනි, අමාත්‍යාංශ මට්ටමින් ගත්තොත්, ප්‍රධාන අමාත්‍යතුමාට මේ වසරේ 2016 වසරේ රුපියල් මිලියන 262 ක් ලැබුණා. මේ වසරේ තිබෙන්නේ රුපියල් මිලියන 80 යි. පළාත් නිශ්චිතවලින් රුපියල් මිලියන 173 ක් අඩු කරලා. සෞඛ්‍ය අමාත්‍යාංශයට රුපියල් මිලියන 794 ක් ලැබුණා. රුපියල් මිලියන 634 යි ලැබෙන්නේ. 2017 වර්ෂයට රුපියල් මිලියන 160 ක් අඩු

කරලා. ඒ වාගේම කෘෂිකර්ම අමාත්‍යාංශයට රුපියල් මිලියන 244 ක් ලැබුණා. රුපියල් මිලියන 209 යි ලැබෙන්නේ. රුපියල් මිලියන 41 යි ලබා දීලා තිබෙන්නේ. කිත්සිරි කටහපිටිය ගරු මන්ත්‍රීතුමා කෘෂිකර්ම අමාත්‍යාංශය වර්ණනා කළා. ගාමිණී තිලකසිරි ඇමතිතුමා, ඔබතුමා ඇහුම්කන් දෙන්න. ඔබතුමාට කිව්වා. හෝමාගමට ගියා. ජනාධිපතිතුමා ආවා. උත්සව පැවැත්වුවා. හොඳ වැඩ සටහන් කළා කියලා. ඒ වැඩ සටහන් කිරීම තුළින් මොකද වෙලා තිබෙන්නේ? රුපියල් මිලියන 244 ක්, මේ වසරට වෙන් කරපු මුදලින් රුපියල් මිලියන 209 ක් කපලා. රුපියල් මිලියන 41 යි තිබෙන්නේ. මෙන්න වැඩ කිරීම තුළ රජය සලකලා තිබෙන විධිය. එතකොට මාර්ග අමාත්‍යාංශයට රුපියල් මිලියන 384 යි. ඒකෙන් රුපියල් මිලියන 186 යි තිබෙන්නේ. රුපියල් මිලියන 192 ක් කපලා. ඒ වාගේම අධ්‍යාපන අමාත්‍යාංශයට. 2016 ට රුපියල් මිලියන 1120 ක් වෙන් කරලා තිබුණා. රුපියල් මිලියන 930 ක් කපලා. රුපියල් මිලියන 190 යි. රුපියල් මිලියන 930 ක් කපලා. ගරු සභාපතිතුමනි, මේ ලැබෙන මුදල් ටික සම්පූර්ණයෙන්ම කපලා, රජයෙන් මුදල් ලබා දුන්නා කියලා කියන්නේ කොහොමද? සම්පූර්ණ මුදල බැලුවොත් මිලියන ගණනාවක්. මිලියන 2130 යි. හත් දහස් එකසිය ගණනෙන් බැලුවොත් මිලියන 15,000 කට 20,000 කට වැඩි ප්‍රමාණයක් අඩු කරලා තිබෙනවා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු මන්ත්‍රීතුමා, බස්නාහිර පළාතේ මාර්ග කිලෝ මීටර් 3649 යි තිබෙන්නේ. අපට අයිති 1952 ක් තිබෙනවා. ඒ ඔක්කොම අයි ව්‍යාපෘති යටතේ -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු මන්ත්‍රීතුමා, මීට ඉහත ලැබුණු මුදල්වලින් පළාත් සභාවට මේ වසරේ මුදලුත්, ලබන වසරේ මුදලුත් සැලකූ විට රුපියල් මිලියන 20,000 කට ආසන්න සංඛ්‍යාවක් මුදල් අඩු කරලා. ඒ තුළ අධ්‍යාපනය, සෞඛ්‍ය, කෘෂිකර්මය කියන අමාත්‍යාංශවලට අදාළව මිලියන ගණනාවක් අඩු කරලා තිබෙනවා. මොකක්ද හේතුව? පළාත් නිශ්චිතවලට ව්‍යාපෘති හදලා, මේ අමාත්‍යාංශ මට්ටමින් - දැන් 2014, 2016 වසරේ තමයි මධ්‍යම රජයෙන් පළාත් නිශ්චිත ව්‍යාපෘතිවලට ඇස්තමේන්තු ඉල්ල ගන්නේ. ව්‍යාපෘති ඉල්ල ගන්නේ. එතකොට කවදාවත් එහෙම අඩු කරලා, මුදල් ලබා දීලා නැහැ. මේ විධියට මුදල් අඩු කරලා ලබා දීලා නැහැ. මේක හිතාමතාම මේ පළාත් සභාවට - මෙතුමා කියනවා යහපාලන ආණ්ඩුව එකතු වෙලා හොඳට මුදල් ලබා දුන්නාය කියලා. යහපාලන ආණ්ඩුවෙන් තමයි පළාත් සභාවට දෙන සම්පූර්ණ මුදල් කපා හැරලා තිබෙන්නේ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

නැහැ. යහපාලන ආණ්ඩුවේ උගත්කමයි බුද්ධිමත්කමයි හින්දා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

උගත්කමයි, බුද්ධිමත්කමයි එකතු වෙලා තමයි මුදල් කපලා තිබෙන්නේ. හොඳට තිබෙනවා.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ඊට අමතරව හොරකමත් තිබෙනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, මෙතුමා කියන එක හරියටම හරි. උගත්කමයි බුද්ධිමත්කමයි එකතු කරලා තමයි යහපාලන ආණ්ඩුව සම්පූර්ණයෙන්ම පළාත් සභාවේ මුදල් කපලා දාලා තිබෙන්නේ. අන්න ඒක හරි. ඒක අපට පිළිගන්න පුළුවන්. අනික් එක එතුමා තවත් කථාවක් කිව්වා. මහජනතාවගේ ඡන්දයෙන් තමයි මෛත්‍රීපාල ජනාධිපතිතුමා පත් වුණේ. හැබැයි, 2015 දී එතුමා දිවුරුම් දෙන කොට අගමැති හැටියට රනිල් වික්‍රමසිංහ මහත්තයා පත් වුණේ, මහජනතාවගේ ඡන්දයෙන් නොවෙයි. පාර්ලිමේන්තුවේ හිටියේ 47 යි.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, මම පොඩි උත්තරයක් දෙන්න කැමැතියි. අගමැතිතුමාව පත් කරන්නේ, ජනාධිපතිතුමා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

එහෙම උත්තර දෙන්න බැහැ. ඔබතුමා ඉන්න. ගරු සභාපතිතුමනි, අපි මෙතුමාට බාධා කළේ නැහැ. මෙතුමාගේ කථාව හොඳට අහගෙන හිටියා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර වාඩිවෙන්න. ගරු මන්ත්‍රීතුමා, බාධා කිරීම් කරන්න එපා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, ඒ වාගේම තමයි 2015 අගෝස්තු 17 වැනිදා නැවත පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වුවාට පස්සේ ඔබතුමන්ලාට හම්බ වුණේ, මන්ත්‍රීවරු 106 යි. ආණ්ඩුව පිහිටුවන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. 106 ට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපතිවරයා වර්තමාන ජනාධිපතිවරයා එකතු කර ගෙන පක්ෂ දෙක එකතු වීමෙන් තමයි නැවතත් අගමැති වුණේ. නැතිව අගමැති කෙනෙක් පත් කරන්න ඡන්දයක් ලැබුණේ නැහැයි කියන එක හොඳට මතක තියා ගන්න.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මහජනතාව පත් කරපු මන්ත්‍රීවරුන්ගෙන් අගමැති පත් කරන්නේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මෙහෙමයි. ඔබතුමා යහපාලනය හදලා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, සාකච්ඡාවට අදාළ දේවල් කථා කරන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, මෙතුමා නොමග යවන්න එක එක කාරණා කිව්වාම, ඒවාට උත්තර දෙන්නත් වෙනවා නේ? මොකද, එතුමා අයවැය පොදු සාකච්ඡාවේදී සමහර දේවල් - හොඳම පාසල ළඟම පාසල ගැන සහ, කෘෂිකර්ම අමාත්‍යතුමාව හොඳට වර්ණනා කරලා කථා කළා. නමුත් වුණු අසාධාරණය. මිලියන 209 ක් කපලා. අන්න ඒ නිසා අපි එතුමාට කියනවා. ඒ සම්බන්ධව මීට වඩා කථා කරන්නේ නැහැ.

ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ මාර්ගයෙන් අපි ප්‍රධාන ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. එකක් තමයි මේ වැඩ සටහන් කිරීමේදී අපට පළාත් සංවර්ධන මුදල් - ගරු මහ ඇමතිතුමා, ඔබතුමාට මේ ගැන අවධානය යොමු කරන්නය කියලා ඉල්ලා සිටිනවා. ගියවරත් පළාත් සංවර්ධන මුදල් ලෙස මිලියන 3062 ක් වෙන් කළා. මේ 2016 වසරට. නමුත් මිලියන 879 යි වැඩ කරලා තිබෙන්නේ. දහවැනි මාසේ තිස් එක් වැනිදා වන කොට මාස දහයක් තුළ මිලියන 2183 ක් වියදම් කරලා නැහැ. ඒ වාගේම නැවතත් 2017 වසරට රුපියල් මිලියන 5464 ක් වෙන් කරලා තිබෙන්නේ, අපේ පළාත් සංවර්ධන මුදල්. එක පැත්තකින් පළාත් සංවර්ධන ව්‍යාපෘතිවලට 2379 ක්. ඒ වාගේම ආයතනික ප්‍රදාන හැටියට 3085 ක්. ඒ නිසා අපි ඉල්ලීමක් කරනවා. ත්‍රිකුණාමලයේ ගිහිල්ලා අයවැය සම්බන්ධව සාකච්ඡාවක් පවත්වන කොට අපි එතුමාගෙන් ඉල්ලීමක් කළා. අපි දැක්කා, එතුමා අයවැය පොතට ඒ කථාව ඇතුළත් කරලා තිබුණා. මොකද, වසර මුල, අපි මුල් මාස හය තුළ මේ ව්‍යාපෘති අනුමත කරලා, වැඩ සටහන් කරලා, ව්‍යාපෘති ඉවර කරන්නය කියන එක යෝජනා කළා. ඒ වාගේම මිල ගණන් කැඳවලා සැපයුම්කරුවන්ගේ මිල ගණන් වෙන් වෙන් වශයෙන් කැඳවන්නය කියලා එතුමා ඒ පොතට ඇතුළත් කරලා තිබුණා. ඒ වාගේම තවත් එක අත්‍යවශ්‍යම කාරණයක්. ඉංජිනේරු කාර්යාංශය හරහා - ඉංජිනේරු කාර්යාංශය භාර දීලා තිබෙන ලේකම්තුමා හරහා අපි ඉල්ලීමක් කළා. ඇස්තමේන්තු නැතිව මුදල් වෙන් කරන්න එපා. ඒ මුදල් වෙන් කරලා, ඇස්තමේන්තු හදලා සැලසුම් කරන්න ගියාම යන කාල සීමාව අපරාධයක්. ඒ නිසා ඇස්තමේන්තු නොකර මුදල් වෙන් කරන්න එපාය කියලා ඉල්ලීමක් කළා. ඒ වාගේම තමයි අමාත්‍යාංශ මට්ටමින් ව්‍යාපෘති අනුමත කරන්නය කියලා. ප්‍රධාන සැලසුමට නැතිව මූල්‍ය සීමාවක් දාලා හරි කමක් නැහැ, අමාත්‍යාංශ මට්ටමින් ව්‍යාපෘති අනුමත කරලා දෙන්න. ඒ මේ මුල් මාස හයේ වැඩ කරන්න පුළුවන් නිසා. ඒ වාගේම පළාත් සංවර්ධන මුදල් ව්‍යාපෘති මාසයක් තුළ නිම කරන්න නියමිත දිනයක් නම් කරන්නය කියලා. ඒ වාගේම අමාත්‍යාංශ සංවර්ධන ප්‍රගතිය බලන්න

මන්ත්‍රීවරුන්ගෙන් කමිටුවක් පත් කරලා, මාස හතරක් ඇතුළත මේ ප්‍රගතිය බලන්න අවස්ථාවක් ලබා දෙන්නය කියලා. මොකද එතකොට මේ වැඩ සටහන ක්‍රියාත්මක කරන්න පුළුවන් නිසා.

ඒ වාගේම තවත් විශේෂ කරුණක් තිබෙනවා. ගරු ප්‍රධාන අමාත්‍යතුමාට තවත් අත්‍යවශ්‍ය කරුණක් අවධානයට යොමු කරනවා. මොකද, මේක පළාත් පාලන ආයතනයට තිබෙන ප්‍රශ්නයක්. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014 යටතේ සේවකයන් ස්ථිර කිරීම. 2014.10.28 දිනැතිව දින 180 ට වැඩිය වැඩ කළ අය, අනිවාර්යෙන්ම ඒ සුදුසුකම් තිබෙන අය තනතුරට පත් කරන්නය කියලා චක්‍රලේඛයක් නිකුත් කළා. ගරු සභාපතිතුමනි, පළාත් පාලන ආයතනවල සේවකයින්ගේ ප්‍රශ්නයක් තිබෙන්නේ. මේක 2014.10.28 වැනිදා මේ චක්‍රලේඛය නිකුත් කළා. ගම්පහට ඉන්නවා පළාත් පාලන ආයතනවල සේවකයෝ 688 ක්. කළුතර 346 ක් ඉන්නවා. කොළඹ 611 ක් ඉන්නවා. මුළු පළාතේම 1645 ක් ඉන්නවා. මේ සේවකයින්ව තාවකාලික, අනියම් හැටියට තමයි බඳවාගෙන සිටියේ. වැටුප් ගෙවීවේ මිලියන 278 යි. නමුත් මේ වන තෙක් අවුරුදු දෙක පුරාම මේ වැටුප් ප්‍රතිපූරණය කරන්න ලබා දීලා නැහැ. ඒ නිසා පළාත් පාලන ආයතන ගණනාවකට ප්‍රශ්නයක් තිබෙනවා. සංවර්ධනයට, ප්‍රාග්ධනයට ගෙවන මුදල් ටික වසරින් වසර අඩු වෙනවා. අඩු වෙන්න ප්‍රධාන හේතුව තමයි මේ අයට මුදල් ප්‍රතිපූරණය නොවීම. ඒ නිසා ගරු ප්‍රධාන ඇමතිතුමාට කියනවා, මේක කථා කරලා, සාකච්ඡා කරලා මේ මුදල් ටික පළාත් පාලන ආයතනවලට ලබා දෙන්න කියලා. දැන් එහෙම නැති වුණොත්, අවුරුදු දෙකක් වෙනවා. තවත් අවුරුද්දක් දෙකක් ඉස්සරහාට ගියොත් එහෙම පළාත් පාලන ආයතනවලට මේ එන මුදල් සංඛ්‍යාව අඩු වෙනවා. ඒ අඩු වෙනවාය කියන්නේ, ඒ ප්‍රදේශයේ වියදම් කරලා සංවර්ධනයට තිබෙන මුදල් ප්‍රමාණය වසරින් වසර මේ නිසා අඩු වෙනවා. ඒ නිසා මේක අවශ්‍යම කරන වැඩක්. මොකද, ගරු ප්‍රධාන අමාත්‍යතුමා මැදිහත් වෙලා තමයි මේක කරන්න ඕනෑ. මිලියන 525 ක්. මේ වන කොට පළාත් පාලන ආයතන 48 ම සේවකයින් වෙනුවෙන් ප්‍රතිපූරණය නොවන මුදලක් සභා අරමුදලින් ගෙවනවා. ගරු සභාපතිතුමනි, ඒක ලොකු ප්‍රශ්නයක්. මේක අත්‍යවශ්‍යම දෙයක්. ඒ නිසා මේ ගැන අවධානය යොමු කරන්නය කියලා ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා කිව්වා, මධ්‍යම ආණ්ඩුවේ නම් යහපාලනය තිබෙන එක හරි. නමුත් පළාත් සභාව පිහිටෙව්වේ 2014 දී. 2014 දී පළාත් සභාව පිහිටෙව්වාට පස්සේ අපි, යහපාලනය නොවෙයි. අපි, ආණ්ඩු පක්ෂය හැටියට 61 දෙනෙක් ඉන්නවා. සන්ධානයෙන් පත් වෙලා 56 දෙනෙක් ඉන්නවා. ඒ වාගේම උදව් උපකාර කරන පක්ෂත් එක්ක එකතු වුණාම අපි 61 දෙනෙකු ඉන්නවා. අපේ යහපාලන ආණ්ඩුවක් නැහැ. අපි පළාත් සභාව තුළ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හැටියට, සන්ධානය හැටියට, අනෙකුත් පක්ෂ හැටියට ප්‍රධාන ඇමතිතුමා පත් වුණු දවසේ සිට, අමාත්‍ය මණ්ඩලය පත් වුණු දවසේ ඉඳලා දෙන්න පුළුවන් හැම සහයෝගයක්, දෙන්න පුළුවන් උපරිම සහයෝගයක් අපි ලබා දීලා තිබෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔබතුමාගේ නායකයා කියන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඔබතුමාගේ නායකයා කවුද කිව්වොත් කියන්න පුළුවන්.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

61 න් යහපාලනයට සහයෝගය නොදෙන මන්ත්‍රීවරු වෙන් වෙන්න කෝ? ඊට පස්සේ මොකද වෙන්නේ කියලා බලන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මධ්‍යම ආණ්ඩුවේ නොවෙයි අපි ඉන්නේ. අපි ඉන්නේ පළාත් සභාවේ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඒක තමයි. යහපාලනයට සහයෝගය නොදෙන කණ්ඩායම තමයි අපට සොයා ගන්න ඕනෑ. ඒක අපි හෙට අනිද්දා වෙන කොට බලමු.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

පොහොට්ටු පෙන්වන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

අපි පළාත් සභාවට ආවේ 2014 දී. යහපාලන ආණ්ඩුව ආවේ 2015 දී. 2014 දී අපි ආණ්ඩු පක්ෂයට පත් වුණු 56 දෙනෙක් ඉන්නවා. සහයෝගය දෙන පක්ෂ පහත් එක්ක 61 දෙනෙකු ඉන්නවා. ඒ නිසා අපට යහපාලන ආණ්ඩුවක් ඕනෑ නැහැ. අපි 2014 සිට ක්‍රියාත්මක වන ආණ්ඩු පක්ෂයක් විධියට අපි ආණ්ඩු පක්ෂයේ ඉන්නවා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

යහපාලනයට සහයෝග දෙන අය වෙන් කර ගන්න කෝ?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, ඒකත් කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමාට මතක් කරලා දෙනවා. පළාත් සභාව තුළ යහපාලන ආණ්ඩුවක් නැහැ. ආණ්ඩු පක්ෂයක් ඉන්නවා. 61 දෙනෙකු ඉන්නවා. ඒක ශක්තිමත්. විපක්ෂයත් එක්ක එකතු වෙලා වැඩ කරනවා. ඒක වෙනම කථාවක්. ඒක මතක් කරලා දෙනවා. බොහොම ස්තූතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාට විනාඩි 15 ක කාලයක් තිබෙනවා. ඔබතුමාට කාලය පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවාද?

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

කාලය පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාගෙන් ඉල්ලා සිටියේ ඊට වැඩි ප්‍රමාණයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පක්ෂ නායකයෙක් නිසා අනිවාර්යෙන්ම ඔබතුමාට දෙන්න ඕනෑ.

[පූ.භා. 10.10]

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, පළාත් සභා හා පළාත් පාලන විෂය යටතේ දැන් මේ සභාවේදී පොදු සාකච්ඡාව ආරම්භ වීමේදීම මතු වුණා, පළාත් සභාවලට මුදල් කප්පාදු කිරීම සම්බන්ධව. ඇත්තටම එහෙම කප්පාදුවක් සිද්ධ වෙලා තිබෙනවා. මුළු රටේම පළාත් සභා නවයක් තිබෙනවා. මේ පළාත් සභා නවයට රුපියල් මිලියන 237,934 ක් 2016 දී වෙන් වුණා. නමුත් ඒක 2017 දී රුපියල් මිලියන 214,123 යි. ඒ කියන්නේ රටට, පළාත් සභාවලට රුපියල් මිලියන 23,811 ක් අඩු කරලා තිබෙනවා. ඒ රටේම ගත්තොත් එහෙම. ඒ වාගේම බස්නාහිර පළාත් සභාව ගත්තොත් මෙතුමන්ලා කියන කාරණය හරි. ඇත්තටම වෙන් වෙන මුදල් ටිකත් ලැබෙන්නේ නැහැ. ඒ නිසා තමයි නිලධාරීන්ට සිද්ධ වුණේ, සභා කටයුතු කාරක සභාවට ඇවිල්ලා මේ අයවැය හදන්න ඉස්සෙල්ලා සාකච්ඡා කරන්න. කොහොමද විසර්ජන ප්‍රඥප්තිය එවන්නේ කියලා. ඒ අනුව බිලයන 54 ක්, 2015 සත්‍ය වියදම හැටියට මේ ඉදිරිපත් කරලා තිබෙන අයවැයේ තිබෙනවා. 2016 ඇස්තමේන්තුව බිලියන 67 යි. ඒකෙන් ඉතාම සොච්චමක් තමයි දැන් මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා කියන විධියට ලැබුණේ. 2017 දී ඒක බිලියන 61 කට අඩු කරලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, මේ පළාත් සභාවලට මුදල් අඩු කළාය කියලා කියන්න සිද්ධ වෙලා තිබෙන්නේ, ඇත්ත වශයෙන්ම පළාත් සභා ගේන කොට විරුද්ධ වුණු අපටම තමයි. මේක දෛවයේ සරදමක්. දැන් අපටම තමයි කථා කරන්න වෙලා තිබෙන්නේ. ඇත්තටම එහෙම වෙලා තිබෙන්නේ, වෙන මොකුත් නිසා නොවෙයි. දැන් අපි කැමැති වුණත්, අකමැති වුණත් ජනතාවගේ දරුවන්ගේ පාසල් අධ්‍යාපනය තිබෙන්නේ පළාත් සභා යටතේ. ජාතික පාසල් ටික ඇරුණාම වැඩිම ප්‍රමාණයක් තිබෙන්නේ පළාත් සභාව යටතේ. ඒ වාගේම ජාතික රෝහල් ටික ඇරුණාට පස්සේ පළාත් සෞඛ්‍ය තිබෙන්නේ පළාත් සභා යටතේ. ඒ වාගේම මාර්ග විශාල ප්‍රමාණයක් තිබෙන්නේ පළාත් සභා යටතේ. පළාත් පාලන ආයතනත් එක්ක. ඒ වාගේම ක්‍රීඩාව සංස්කෘතිය ගත්තොත් හැම දෙයක්ම මේ සමගාමී ලැයිස්තුව ඇතුළේ පළාත් සභාවට කළ යුතු කාර්යභාරයක් තිබෙනවා. ඒ නිසා කවුරු මොන විධියට මේකේ මුදල් කැපුවත් අන්තිමේදී කපලා තිබෙන්නේ ජනතාවගේ මුදල්. ඒක

තමයි මේකේ ප්‍රශ්නය. ඒ නිසා මේකට හේතුව හැටියට අපි දකිනවා. එකක් තමයි දේශපාලන අර්බුදය. ඒ දේශපාලන අර්බුදය තමයි මේ දෙපැත්තෙන් පිළිඹිබු වෙන්නේ. ඒක තමයි දේශපාලන අර්බුදය.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

යහපාලනය.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒ දේශපාලන අර්බුදයට යහපාලනය කියනවා නම් හරි ෂෝක්. අනික් එක තමයි පොදු ආර්ථික බිඳ වැටීම. ඒ නිසා මුදල් ඇමතිතුමා හේතු දැක්වූවා. පළාත් සභාවට මුදල් කපපු හේතුව මොකක්ද කියලා ඇහුවාම, මේ විදේශ සංචාර යනවා. හරි වැරැද්දක් කරනවා පළාත් සභා. පළාත් සභා මන්ත්‍රීවරු විදේශ සංචාර යනවා. ඒ නිසා තමයි අපි මුදල් කැපුවේ කියලා මුදල් ඇමති රවී කරුණානායක මැතිතුමා කිව්වා. එතුමා කොහොම මේක කිව්වාද දන්නේ නැහැ. කිසිම ලැජ්ජාවක් නැතිව එතුමා ඒක කිව්වා. මේක හරියට ළමයෙක් මොකක් හරි වැරැද්දක් කළාම - වැරැද්ද කළාට පස්සේ මොකුත් නැහැ බෙල්ල කරකවලා දැම්මා වාගේ වැඩක්. ඒ ජාතියේ කථාවක් මේ කියන්නේ. ඒ වාගේ කථාවක් තමයි කිව්වේ. ඔන්න ඕක තමයි තත්ත්වය. ගරු සභාපතිතුමනි, ඇත්තටම මේ පළාත් සභාවලට මොකක්ද මේ වෙලා තිබෙන්නේ? මොකක්ද මේ තත්ත්වය කියන එක පොඩ්ඩක් විග්‍රහ කරද්දී මට දැනුනා මෙන්න මෙහෙම එකක්.

ගරු සභාපතිතුමනි, ඇන්ටන් චෙකොෆ්ගේ කෙටි කථාවක කියනවා. මේ අපි කවුරුත් පළඳිනවා. මමත් අවශ්‍ය වෙලාවන්හිදී දානවා. මේ ටයි එක සම්බන්ධව. ඒ කෙටි කථාවේ එක්කෙනෙක් අහනවා, ඔය ටයි එකේ තිබෙන තේරුම මොකක්ද? මේ ටයි එක පළඳින එකේ ප්‍රයෝජනය මොකක්ද? කියලා අහනවා. අනික් එක්කෙනා කියනවා, මේ ටයි එක දා ගෙන ඉඳලා ගැලෙව්වාට පස්සේ මාර සනීපයක් තිබෙනවාය කියලා. ඒක තමයි ටයි එකේ ප්‍රයෝජනය. ටයි දාන හැමෝටම මේකේ අත්දැකීම තිබෙනවා. මේක උදේ ඉඳන් දා ගෙන ඉඳලා හවසට ගැලෙව්වාට පස්සේ තමයි හරි සනීපයක් තිබෙන්නේ. හරි සැහැල්ලුවක් තිබෙනවා. ඒක තමයි මේ ටයි එකේ තිබෙන ප්‍රයෝජනය. මට හිතෙනවා, දැන් ජනතාවගේ පැත්තෙනුත් මේක තිබෙනවා. මේ පළාත් සභා නැති කළොත් තමයි ජනතාවට හම්බ වෙන සැහැල්ලුව. ඒක තමයි දැන් තිබෙන තත්ත්වය. ඒ නිසා ඇත්තටම අද පළාත් සභා ගෙනාපු අයට පළාත් සභා ඕනෑ නැහැ. ඒ නිසා ඒගොල්ලෝ ඉන්නේ දේශපාලන අර්බුදයක. දැන් එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවට තිබෙන ප්‍රශ්නයක් තමයි - මේක මුකුත් නොවෙයි, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක්. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සපෝට් එක හම්බ වෙලා තිබෙනවා. ජනාධිපතිතුමා ඉන්නවා. ඒක හරි. ඇත්තටම රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා හිතන්නේ, මේක අපේ ආණ්ඩුවක්, 2020 වන කොටවත් මේක සර්ව සම්පූර්ණයෙන්ම කර ගන්න ඕනෑය කියලා. එහෙම තමයි හිතන්නේ. ඒක තමයි දේශපාලන අර්බුදය. ආණ්ඩුවට අවශ්‍යතාවයක් නැහැ. පළාත් සභාවලට මේ ඉන්න කට්ටියට සල්ලි දෙන්න. ඒක එකක්. ඒක තමයි ප්‍රධානම එක. ඒ නිසා අපට මතකයි, ගරු මහ ඇමතිතුමා එදා අයවැය ඉදිරිපත් කරලා, මෙතැන හිටියෙත් නැහැ. මහ ඇමතිතුමා දිව්වා. මහ ඇමතිතුමා කිව්වා, ජනාධිපතිතුමාව හමු වෙන්න තිබෙනවා. මේ මුදල් ප්‍රතිපාදන කපලා කියලා. මට නිකම් දැනුනේ, අර අඬන ළමයි රැවටීමට ටොෆි ගේන්න කඩේ යන්නේ. ඒ විධියට යනවා වාගේ. මට දැනුනේ ඒ විධියට යනවා වාගේ. අනික් පැත්තට සල්ලි ටික ගේන්න පුළුවන් වෙයිද කියලා - මොකද, මහ ඇමතිතුමා විශ්වාසය බිඳ ගෙන තිබෙන්නේ. මොකද, එතුමා ගිය අවුරුද්දේ අපට කිව්වා, ස්වයං රැකියා දීම සඳහා ඒකේ 50% යි. ඒක අපට සම්පූර්ණ කරලා දෙනවා. ඒ විධියට අපට දුන්නා ප්‍රතිපාදන වෙන් කිරීමේදී තිබුණු ගැටළු ටිකක්. එතුමා කිව්වා ඒක මම කරනවාය කියලා. නමුත් ඒක වුණේ නැහැ. මට ඒ නිසාම තමයි අර විධියට දැනුනේ. දැන් කොහොම හරි අපි දන්නවා, දැන් මේක මධ්‍යම ආණ්ඩුවේ අයවැයත් එක්ක සම්බන්ධයි ගරු සභාපතිතුමනි. ඇත්තටම එතැනින් වෙන් කරලා ගන්න බැහැ. ඒ නිසා ආණ්ඩුව කරන්නෙත් මධ්‍යම ආණ්ඩුවේ අයවැය ගෙනැල්ලා තමන්ගේ අර්බුදවලට උත්තර සපයා ගැනීමයි. දැන් උදාහරණයක් විධියට කිව්වොත් එහෙම අපි දන්නවා, හිටපු ආණ්ඩුව තමයි පළාත් සභාවලට හිමි විය යුතු අර පිරිවැටුම් බද්ද ගත්තේ. ඒගොල්ලෝ ඒක ගත්තා. ඒගොල්ලෝ ඒක ඒකාබද්ධ අරමුදලට දා ගත්තා. ඒ නිසා පළාත් සභා සල්ලි ටිකත් ඒගොල්ලෝ ගත්තා. හරි. දැන් ආණ්ඩුව මොකද කරන්න ඕනෑ? දැන් එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව මොකක්ද කරන්න ඕනෑ? දැන් එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව හරි නම්, ඒක ආපහු දෙන්න ඕනෑ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

දෙනවා දෙනවා. ඒවා දෙනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

දෙනවාය කිව්වාට හරියන්නේ නැහැ. ඒක ගන්න ඕනෑ. ඒක ගන්නේ නැතිව කියනවා, මේ ප්‍රශ්නය වුණේ, ගිය ආණ්ඩුව පිරිවැටුම් බද්ද ගත්ත නිසාය කියලා. තවමත් ඒක කිය කියා ඉන්නවා. දැන් අවුරුදු එකහාමාරකටත් වැඩියි. ඇයි ආපහු නොගන්නේ? ගරු සභාපතිතුමනි, ආපහු ගන්නේ නැහැ. රවී කරුණානායක මුදල් ඇමතිතුමාට තව මොකක් හරි මේකෙන් ගන්න පුළුවන් නම් ඒකත් ගන්නවා. ඒ විධියට තමයි ආණ්ඩුව පවත්වාගෙන යන්නේ. ඔන්න ඔය අර්බුදයට තමයි අපි මුහුණ පාලා තිබෙන්නේ. මේක තමයි ඇත්ත අර්බුදය.

ඒ නිසා ඇත්තටම රවී කරුණානායක මුදල් ඇමතිතුමාට කරන්න පුළුවන්, එතුමා සාමාන්‍යයෙන් අපි දකින අර ටයි කෝට් ඇඳුම පැත්තකට දාලා, අර රොෂානී ද මැල් මහත්තයා ඇඳපු අර ඇඳුම ඇඳගෙන ඇවිල්ලා, ඒ විධියට ඇවිල්ලා පාර්ලිමේන්තුවේ රඟ පානවා ඇරෙන්න, වෙන කරන්න දෙයක් නැහැ. ඒක තමයි අපි දැක්කේ. ඉතින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙරුනු ඒ ආශ්‍රයෙන් තමයි අපේ මහ ඇමතිතුමාටත් මේ අයවැය ඉදිරිපත් කරන්න තිබෙන්නේ. අපි දැක්කා පාර්ලිමේන්තුවේදී රවී කරුණානායක ඇමතිතුමා අයවැය ඉදිරිපත් කරනවා වාගේම ලක්ෂණ අපේ අයවැයේත් තිබුණා. නේද? අපි දැක්කා මහ ඇමතිතුමා අවස්ථා ගණනාවකදීම ඉංග්‍රීසි භාෂාවෙන් අයවැය ඉදිරිපත් කරමින්, අපට පොඩි අභිමානයක් ගෙනාවා. රවී කරුණානායක ඇමතිතුමා පාර්ලිමේන්තුවේ ගේනවා වාගේම අපටත් ගෙනාවා. සුසිල් මුණසිංහ ඇමතිතුමා හිටියා. සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා හිටියා. රෙජිනෝල්ඩ් කුරේ ඇමතිතුමා හිටියා. ප්‍රසන්න රණතුංග මහ ඇමතිතුමා හිටියා. එතුමන්ලාට කරන්න බැරි වුණු දෙයකුත් එතුමා කළා. අපේ පළාත් සභාව ඇතුළේ පොඩි වෙනසක් කර ගන්න. ඒ විධියට වැඩේ කළා. එතකොට පළාත් සභාවට වෙන් කළ මුදල් අඩු ද වැඩි ද කියන කාරණය මේකේ සාකච්ඡා කරනවා වාගේම අපට කාරණයක් තිබෙනවා. අපට ලැබෙන මුදල් ටික අපි හරියට මේ පළාත් සභාවේ ප්‍රයෝජනයට ගන්නවාද? අපට ලැබෙන දෙයින් අපි හරියට කරලා තිබෙනවාද? හරියට කරනවාද? ඔන්න ඕක තමයි ඊට ප්සසේ අපට සාකච්ඡා කරන්න තිබෙන අනික් කාරණය.

ගරු සභාපතිතුමනි, ඒ නිසා ඒ පැත්තෙන් ගත්තොත් හරිම කනගාටුයි, මේ පළාත් සභාව සම්බන්ධයෙන්. හරිම කනගාටුවක් තිබෙන්නේ. මම උදාහරණයක් හැටියට කියන්නම්. එකක් තමයි අපේ ගරු ඇමතිවරු. මේ ඇමතිවරු පස් දෙනාම ඉස්සරහා තියා ගෙන මේ කියන්නේ. එතුමන්ලාට මාත් එක්කවත්, මම මේ ඉදිරිපත් කරන කාරණය සම්බන්ධවත් පුද්ගලික ප්‍රශ්නයක් ඇති කර ගන්න දෙයක් නැහැ. මම මහජනතාව නියෝජනය කරමින් මට දැනෙන දේ. මොකද, මම මහජනතාව නියෝජනය කරමින් ඇවිල්ලා තමයි මෙතැන කටයුතු කරන්නේ. ඒ නිසා මට දැනෙන දේ මම කියන්න ඕනෑ. ඒ නිසා මට දැනෙන දේ තමයි, ඔය කොහොම කිව්වත්, තමුන්නාන්සේලා මේ පළාත් සභාව ගෙනියන්න හරිම අකාර්යක්ෂම වෙලා තිබෙනවා. හරිම දුර්වල වෙලා තිබෙනවා. මම ඒකයි කියන්නේ ඔබතුමන්ලා මේක පුද්ගලිකව ගන්න එපා. පුද්ගලිකව ගත්තොත් අපට වරදිනවා. පුද්ගලිකව ගන්නේ නැතිව. ඇත්ත, මේක බොරු නොවෙයිද කියලා හිතන්න. ඔබතුමන්ලාගෙන් ප්‍රශ්නයක් ඇහුවාට ඔබතුමන්ලා ප්‍රශ්නයට හරියට උත්තරයක් දෙන්නේ නැහැ. මොකක්ද ඒකේ ඇති වැඩේ? අපි ප්‍රශ්නයක් අහනවා නම්, ඒ ප්‍රශ්නයෙන් ඔබතුමන්ලාටමයි ඒකෙන් වාසිය තිබෙන්නේ. සමහර දේවල් අපි ප්‍රශ්න කළාට පස්සේ, එතකොටයි තමුන්නාන්සේලා දන්නේ. ගිණුම් කාරක සභාවේ අපේ සාමාජික මන්ත්‍රීතුමන්ලා කිව්වා, ආණ්ඩුකාරතුමා හමු වෙන්න ගියාට පස්සේ එතුමා බොහොම ප්‍රශංසාත්මකව කථා කළාය කියලා, මේ පළාත් සභාවේ මන්ත්‍රීවරු හොඳ ප්‍රශ්න අහනවාය කියලා. එහෙම කියලා ඉවර වෙලා එතුමා කිව්වාලු, හැබැයි මේවාට කොහොම උත්තර දෙනවාද කියලා නම් මම දන්නේ නැහැයි කියලා. එතුමා ඒක දන්නේ නැහැ. අහන ප්‍රශ්න මොනවාද කියලා දන්නවා. එතුමා ප්‍රශංසාවෙන් ඒක කියලා තිබෙනවා. එතුමා හමු වෙන්න ගිය මන්ත්‍රීවරු කිහිප දෙනෙක්ම මට ඒක කිව්වා.

ඇත්තටම අපි අහන ප්‍රශ්නවලට හරියට උත්තර ඔබතුමන්ලා ගන්න ඕනෑ නිලධාරීන්ගෙන්. හැබැයි,

ඔබතුමන්ලා මොකක්ද කරන්නේ. මෙතැනට ඇවිල්ලා මොකක් හරි කියලා ෂේප් වෙලා යන්න හදන්නේ. මොකක් හරි උත්තරයක් දීලා යන්න හදන්නේ. මම උදාහරණයක් වශයෙන් ගත්තොත් එහෙම, ගිය පළාත් සභාවේදී මම එක්තරා නිලධාරියෙකු සම්බන්ධව ප්‍රශ්නයක් ඇහුවා. පළාත් සභාවේ මෙපමණ කාලයක් සහකාර අධ්‍යක්ෂවරයෙකු හැටියට සිටියත් පළාත් අධ්‍යක්ෂවරයාගේ කාර්යභාරය කරලා තිබෙනවා. එතකොට විගණන පරීක්ෂණයේදී අහු වෙලා තිබෙනවා ඒක විධිමත් නැහැ. ඒ පත් කර ගෙන සිටීම වැරදියි කියලා. මම ඇහුවා, මේ අහවල් නිලධාරියාගේ තිබෙන වෘත්තීය සුදුසුකම් මොනවාද? අධ්‍යාපන සුදුසුකම් මොනවාද? ඒවා තිබෙනවාද කියලා මම ප්‍රශ්නයක් ඇහුවා. ඔබතුමා කිව්වා ඔව් තිබෙනවා. ඊට පස්සේ මම ඇහුවා, එහෙම නම් ඒ එයාට තිබෙන සුදුසුකම් මොනවාද කියලා. ඔබතුමා කියන්න දන්නේ නැහැ. හත් දෙයියනේ නිලධාරියා එවනවා නම් - මම එපමණ තමයි අහලා තිබෙන්නේ. හරි නම් උත්තරය දෙන්න ඕනෑ, ඔව්. එයාට සුදුසු කම් තිබෙනවා. ඒ සුදුසුකම් මෙන්න මේවා. ඒ නිසා තමයි එතුමාව තියාගෙන ඉඳලා තිබෙන්නේ. හැබැයි, නිලධාරියා දෙන උත්තරේ ඒක දීලා නැත්නම්, ඔබතුමා ඇවිල්ලා මෙතැන උත්තර දෙන්න ඉස්සෙල්ලා එය නිලධාරීන්ගෙන් අහන්න ඕනෑ. දැන් අනිවාර්යයෙන්ම ඔය මන්ත්‍රීවරයා අහනවා, ඒ සුදුසුකම් මොනවාද කියලා. මට කියන්න ඉස්සෙල්ලා ඔබතුමා ඒක ඉස්සෙල්ලාම දැන ගෙන ඉන්න ඕනෑ. ඔබතුමා දැන ගෙන ඉන්න ඕනෑ, ඒ උත්තරේ දෙන්න. නැත්නම් ඔබතුමා අපහසුතාවයට පත් වෙනවා. හැබැයි, ඔබතුමා මට කියනවා, මම ඊළඟ සැරේ අහලා කියන්නම්. මොකක්ද මේකේ තේරුම? ඔබතුමා කියනවා නම්, එතුමාට සුදුසුකම් තිබෙනවාය කියලා. මම දැන ගන්න ඉස්සෙල්ලා ඔබතුමා දැන ගන්න එපැයි ඒ තිබුණු සුදුසුකම් මොනවාද කියලා. මට කියන්න ඉස්සෙල්ලා. හැබැයි ඒක දන්නේ නැහැ. ඒ නිසා තමන්ගේ පැත්තෙන් හිතන්න ඕනෑ. තමන්ගේ කාර්යභාරය හරියට කරන්නේ නැහැ.

මම දන්නේ නැහැ නිලධාරීන් හිතනවාද කියලා. මේ මම කියන එක නොවෙයි. නිලධාරීන් හිතනවාද කියලා, අපේ ඇමතිවරු ගොන්නු. ඒ නිසා අපි මේක ලියලා යැව්වාම ඒක ඉවරයි කියලා හිතනවා ඇති කියලා. මම කියන්නේ නැහැ, ඔය හැම නිලධාරියෙක්ම එහෙම හිතනවාය කියලා. එහෙම හිතන කවුරු හරි නිලධාරියෙක් ඉන්නවා නම්, අපි කියන්න ඕනෑ. ඔබතුමන්ලා හිතුවාට ඔබතුමන්ලාගේ ඇමතිතුමා ගොනා කියලා අපි ගොන්නු නොවෙයි. පළාත් සභාවේ ඉන්න හැමෝම ගොන්නු නොවෙයි. ඒ නිසා ප්‍රශ්නයට හරියට උත්තරේ එවන්න ඕනෑ. ඔබතුමාට දෙන්න ඕනෑ, පසුබිම් වාර්තාවක්. මේ හරහා පැන නැගෙන්න පුළුවන් අතුරු ප්‍රශ්න මෙන්න මේවා. ඒ නිසා තමයි පසුබිම් වාර්තාවක් කියලා එකක් එවන්නේ. ඒක සම්පූර්ණ කරලා එවන්න ඕනෑ. මොකක්ද අරගොල්ලෝ කරන්නේ? ඔව්, නැහැ කියලා මොකක් හරි උත්තරයක් එවනවා. ඒක ඔබතුමන්ලා මෙතැනට කියන්න ඇවිල්ලා අපහසුතාවයට පත් වෙනවා. ඔන්න ඕක තමයි තත්ත්වය. ඒ නිසා අපට ඒ අවශ්‍ය පිළිතුරක් ලැබෙන්නේ නැහැ.

ඒ වාගේම තමයි ඊළඟ කාරණය. අමාත්‍යාංශයේ වගකීම් පැහැර හැරීම. ගරු සභාපතිතුමනි, මම සභාවේදි ප්‍රශ්න කළා, අර සණස සමිතියට සිද්ධ වුණු කාරණය සම්බන්ධව. ඒක පාර්ලිමේන්තුවෙන් අහන්න ඕනෑ එකක් නම්, මම පාර්ලිමේන්තුවෙන් අහනවා. ඒ සඳහා අපට හැකියාව තිබෙනවා. හැබැයි, මේක විෂයය සොයලා බැලුවාට පස්සේ, අපට මේකේ වගකීමක් තිබෙනවා. ඒ වගකීම තිබෙන නිසා තමයි ඒ ප්‍රශ්නය අරගෙන ආවේ. ඒ මිනිස්සුත්, කියන්න ඕනෑ හැම තැනටම ගිහිල්ලා, අවසාන වශයෙන් තමයි මෙතැනට ආවේ. හැබැයි, අඩුම ගණනේ ඔබතුමන්ලා ඒ සම්බන්ධව සාකච්ඡාව මෙතැනට ගන්න දුන්නේ නැහැ. අපි අමාත්‍යාංශයක් හැටියට පළාත් සභාවට තිබෙන, තමන්ට තිබෙන විෂයට අයිති කාරණයක් හැටියට අඩුම ගණනේ, මේ හොරකමට වගකිවයුතු පුද්ගලයන්ට ආරක්ෂාව නොදී, අපි අපේ පැත්තෙන් වගකීම ඉෂ්ට කරන්න ඕනෑ. නමුත් ඒ වගකීම ඉෂ්ට කළේ නැහැ.

ගරු සභාපතිතුමනි, දැන් මේ මොහොත වන කොට අපි සොයාගෙන තිබෙනවා, ඒ සණස සමිතියේ හිටපු නිලධාරීන් කාගේ කවුද? කොහොම සම්බන්ධකම් ද තිබෙන්නේ කියන තොරතුරු දැන් අපි කලින්ට වඩා සොයා ගෙන තිබෙන්නේ. ඒ Documents මගේ ළඟ තිබෙනවා. ඒ බැංකුවේ මුදල් තැන්පත් කරපු මිනිස්සු මේ සම්බන්ධව මුදල් ඇමතිතුමාට යැව්වා. ඒ මිනිස්සු ලියන්න ඕනෑ හැම තැනටම ලියනවා. මේ තිබෙන්නේ මගේ අතේ. මම මේක සභාගත කරන්නම් ගරු සභාපතිතුමනි. රවී කරුණානායක මැතිතුමා මුදල් ඇමති හැටියට එවපු ඒ ලිපිය මේ තිබෙන්නේ. ඔවුන් කියනවා මෙන්න මෙහෙම. තමුන්නාන්සේලා කියනවා කිසි ප්‍රශ්නයක් නැහැ. අපි හවුල්

[ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි]

ආණ්ඩුවක්. ඒකාබද්ධ ආණ්ඩුවක් තිබෙන්නේ කියලා. මෙන්න ඒකට එතුමා එවන පිළිතුර.

*"දැනට ලංකාව පුරා සමූපකාර ග්‍රාමීය බැංකු 2450 ක් සහ සණස බැංකු 5217 ක් පවතී. එම ආයතනවල මූල්‍ය සුරක්ෂිතභාවය ඉතා අවම මට්ටමක පවතින බව වත්තේගෙදර සණස මූල්‍ය වංචා මගින් පෙනී යයි. වර්තමානයේ එම ආයතනවල මුදල් ආරක්ෂාව පිළිබඳ වගකීම දරනුයේ අදාළ සමිතියේ සභාපති, ලේකම් හා සාමාන්‍යාධිකාරී වන අතර ඔවුන් විසින් දේශපාලන පක්ෂයක රැකවරණය ලබමින් මහජනතාවගේ මුදල් වංචා කරමින් සිටී."*

මොකක්ද මේ දේශපාලන පක්ෂය. මම මේක සභාගත කරනවා.[3] දේශපාලන පක්ෂයක රැකවරණය ලබමින් මහජන මුදල් වංචා කරමින් සිටී. මෙන්න එතුමාගේ උත්තරේ. රවී කරුණානායක මුදල් ඇමතිතුමාගේ. මම ඒක සභාගත කරනවා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

නැහැ. ඒක -

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මම දන්නේ නැහැ. ඒවා ඔබතුමන්ලාම අහන්න. ඔය කියන විධියට හවුල් ආණ්ඩුවක් නේ? ඔබතුමන්ලාම අහන්න. මොකක්ද ඒ පක්ෂය? අපිද? එක්සත් ජාතික පක්ෂයද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

පක්ෂය නොවෙයි. යම් යම් පුද්ගලයෝ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මුදල් ඇමතිවරයා එවන ලිපිය මම මේ සභාගත කරන්නේ. ඔන්න ඔහොමයි ජනතාවට වගකියන්නේ. එක පැත්තකින් පළාත් සභාව ඒ සම්බන්ධව වගකීම දරන්නේ නැහැ. ඒ නිසා මම බලාපොරොත්තු වෙනවා -

**ගරු ලලන්ත ගුණසේකර**
Hon. Lalantha Gunasekera

ඔය හවුල කන්න ලාම්පු අල්ලන්නේ ඔබතුමන්ලා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

විපක්ෂයෙන් මේ පොදු සාකච්ඡාව කරන්න මම පැය භාගයක් ඉල්ලුවා. ඒ පැය භාගය ඉල්ලුවේ වෙන මොකුත් සඳහා නොවෙයි. මෙන්න මේ කාරණය මට කථා කරන්න බැරි වුණු එක, මේ පොදු සාකච්ඡාවේදී කථා කරන්න. මොකද, මේක විෂයට අදාළයි. ඒ නිසා මගේ ළඟ Documents ටික ඔක්කොම තිබෙනවා. ඒ නිසා මම බලාපොරොත්තු වෙනවා, ඉස්සරහාට මේ පළාත් සභාවේ සියලු දේ ඇදලා දාන්න. මට කරන්න දෙයක් නැහැ. මේකට වගකියන්න ඕනෑ අය, දේශපාලන වශයෙන් මේකට උදව් කරපු අය කවුද කියන එක සියල්ල මේ පළාත් සභාව ඇතුළේ හෙළිදරව් කිරීම සඳහා මම මේ පළාත් සභාවේ අවස්ථාව ගන්නවා. (බාධා කිරීමක්) ඒ සඳහා අවස්ථාව ගන්න බව ප්‍රකාශ කරමින්, මෙන්න මේ තත්ත්වය තේරුම් අරගෙන අපට අපේ පළාත් සභාවේ කාර්යභාරය ඉෂ්ට කරන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා විශේෂයෙන්ම මම ගිණුම් කාරක සභාවේ ඉන්න නිසා දන්නවා. මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ඒකේ වැඩ බලන සභාපති ධූරය දරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා, ඔබතුමාට මෙතුමාට තවත් කාලය දෙන්න පුළුවන්ද? මෙතුමා කාලය ඉල්ලනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

විනාඩි පහක් ලබා දෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට තව විනාඩි පහක කාලයක් දෙනවා.

[3] අද දින වැඩ කටයුතු අවසානයේ පළ කර ඇත.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

එතකොට මෙන්න මේක. මේ සම්බන්ධව රුපියල් මිලියන 180 ක මුදලක් හිටපු ලේකම් හා හිටපු සභාපතිවරයාගේ පුතා කිරිවැල්ලගේ ප්‍රියංග නිශාන්ත කුමාර හා සුමින්ද ස්නේහක විනෝදහේවා විසින් ලබා ගෙන ඇත. මිලියන 180 ක්. ඇත්තටම මේකට වංචා ජාලයක් තිබෙනවා. මේ පළාත් සභාව යටතේ ලියාපදිංචි කරලා තිබෙන, මේ සණස සමිති. මේ වංචාවට විශාල ජාලයක් තිබෙනවා. මේකේ කටයුතු කරලා තිබෙන අය. මේකේ කෝටි 75 ක් දැනට සොයාගෙන තිබෙනවා වංචාවේ ප්‍රමාණය. මුදල් වංචා කරලා තිබෙන ප්‍රමාණය.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

කොමසාරිස්තුමා වගකියන්න ඕනෑ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

වගකියන්න ඕනෑ. ඒක මේකේ තිබෙනවා. කොමසාරිස් විතරක් නොවෙයි, මේකේ නිලධාරිනියක් ඉන්නවා. මම කියන්නම්. මේ සණස සමිතියේ මූල්‍ය කටයුතු විමර්ශනය සඳහා ඒ වෙලාවේ, 2015 දී ආවා සමුපකාර දෙපාර්තමේන්තුවේ කේ.එස්. චන්ද්‍රිකා පෙරේරා කියලා නිලධාරිනියක්. එතකොට මේ පළාත් සභාව වෙනුවෙන් වගකියන්න ඕනෑ කෙනා. මෙයා තමයි බොහොම වංචනික විධියට මේ අධ්‍යක්ෂවරු එක්ක කටයුතු කරන්නේ. මෙයා උපදෙස් දෙනවා. මේගොල්ලෝ සත පහක්වත් අරන් තිබුණේ, ඒකේ කිසිම දේපළක් තියලා නොවෙයි. මෙයා උපදෙස් දෙනවා, Documents ටික හදාගෙන ගිවිසුමක් ගහන්න. ගිවිසුමක් ගහලා ආයතනයක් ලියාපදිංචි කරන්න. අන්න ඒ ආයතනය ලියාපදිංචි කරලා තමයි මේගොල්ලෝ මුදල් ගන්නේ. ගිවිසුමක් ගහනවා. මේ Documents මගේ අතේ තිබෙනවා. මම මේකත් සභාගත කරනවා.[4] එතකොට මේ විධියට තමයි මේක පටන් ගන්නේ. එතකොට මේ නිලධාරිනිය කෙළින්ම මේකට උපදෙස් දෙනවා, මේ වංචාව වහන්න. ඒ කියන්නේ, හෙළිදරව් කර ගැනීමේ පැත්තෙන් නොවෙයි. වංචාව වැසීම පැත්තෙන් තමයි මේ නිලධාරිනිය කටයුතු කරන්නේ. ඒ කියන්නේ මේ පළාත් සභාවට වගකියන්න ඕනෑ නිලධාරිනියයි මෙහෙම කරන්නේ. එතකොට හිටපු ඇමතිවරු මේ සම්බන්ධව සොයා බැලුවේ නැද්ද? හිටපු ඇමතිවරයා සොයා බැලුවේ නැද්ද? නැහැ. සොයා බැලුවේ නැහැ. මට හිතාගන්න බැහැ උපාලි කොඩිකාර වාගේ ඇමතිවරයෙකුගෙන් ඒ කටයුතු කෙරෙයිද කියලා. ඒක වෙනම වැඩක්. නමුත් ඒක තමයි මම කියන්නේ. අපට පුද්ගලයෝ නොවෙයි මේකේ ප්‍රශ්නය. අපට උපාලි කොඩිකාර ඇමතිතුමා කිව්වාට පස්සේ, මට නම් මැවෙන චිත්‍රයක් තිබෙනවා. නමුත් මේක මහජනතාවගේ පැත්තෙන් අදාළ නැහැ. එතකොට මේ මුළු බැංකු ජාලයම තිබෙන්නේ, මේකත් එක්ක. ඒකේ ඇමති උපාලි කොඩිකාර තමයි. හැබැයි, උපාලි කොඩිකාර කියන පුද්ගලයා නොවෙයි, මේකේ ප්‍රශ්නය. මේවා ඔක්කොමත් එක්ක තමයි මේ ජාලයත් තිබෙන්නේ.

අන්න ඒක තමයි ගරු ඇමතිතුමා, ඔබතුමන්ලාගේ පැත්තෙන් පුංචි අඩුපාඩුවක් වුණොත් ඒකෙන් වන්දි විඳින්න වෙන මිනිස්සු කොපමණද? අද මේ මොහොත වන කොට ඉන්නවා - මගේ ළඟට ඇවිල්ලා ඇඬුවා. Navy එකේ වැඩ කරන්නේ. මහ ලොකුවට රණවිරුවෝ කියලා කියනවා. නේවි එකේ වැඩ කරලා එයාට ලැබුණු ඔක්කොම මුදල් ටික ගිහිල්ලා දැම්මේ, මේ බැංකුවේ. ඇයි දාන්නේ? පොළිය නිසා. අපි ඒගොල්ලන්ට දොස් කිව්වා. ඔයගොල්ලෝ කිසි දෙයක් සොයලා බලන්නේ නැහැ. ඔයගොල්ලන්ට 1% ක් 2% ක් පොළිය වැඩියි නම් ඔයගොල්ලෝ ගිහිල්ලා සල්ලි දානවා. අපි ඒගොල්ලන්ට කිව්වා. මේවායෙන් පාඩම් ඉගෙන ගන්න කියලා. තිබෙන සේසත දැම්මාට පස්සේ තව පාඩම් ඉගෙන ගන්න දෙයක් නැහැ. ආපහු කොහේ දාන්නද? එතකොට ඒ තමන්ට ලැබුණු මුදල කාටවත් කිව්වේ නැහැ. ගිහිල්ලා මේ බැංකුවේ දැම්මා. පස්සේ මේ ප්‍රශ්නය වුණාට පස්සේ තමයි, අද බිරිඳ දාලා ගිහිල්ලා. කරගන්න දෙයක් නැහැ. දරුවෝ වෙනත් තැනක. දැන් මුළු පවුල් සංස්ථාවම බිඳිලා තිබෙන්නේ. ගරු සභාපතිතුමනි, මේවා අපරාධ. දැන් මොකක්ද කරන්නේ? සිකියුරිටි ජොබ් එකක් කරනවා. ඒක කරමින් තමයි අපිව හම්බ වෙන්න එන්නේ. ඒ මිනිස්සු වෙනුවෙන් තමයි අපි එදා මැදිහත් වුණේ. නැතිව වෙන දෙයකට මැදිහත් වුණා නොවෙයි. අපට පුද්ගලිකව තමුන්නාන්සේලාත් එක්ක දේශපාලන ආරෝවක් ඇති කර ගන්න නම් අපට ඔයිට වඩා කාරණා තිබෙනවා.

[4] අද දින වැඩ කටයුතු අවසානයේ පළ කර ඇත.

[ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි]

ගරු සභාපතිතුමනි, අපට ප්‍රතිපත්තියක් තිබෙනවා. අපට ප්‍රතිපත්තියක් තිබෙනවා වාගේම, අපට දේශපාලනයේ විරුද්ධව කවුරු හරි ඉන්නවා නම්, එයා සම්බන්ධවත් අපට ප්‍රතිපත්තියක් තිබෙනවා. ඒ නිසා අපි නිකම් අනවශ්‍ය විධියට, සවුත්තු විධියට, පුද්ගලික ජීවිතයේ දේවල් ඇදලා අරගෙන, ඒවා මේ දේශපාලනයට සම්බන්ධ කරන්නේ නැහැ. හැබැයි, තමුන්නාන්සේලා තේරුම් ගත්තේ එහෙම නොවෙයි. ඒ මිනිස්සු ඇවිල්ලා මේ සම්බන්ධව උද්ඝෝෂණය කරන කොට තමුන්නාන්සේලා තේරුම් ගත්තේ, අන්න ජේවීපී එකෙන් අරගේ එළියට ගෙනැල්ලා, දැන් මෙහෙන් වැඩේ කථා කරන්න හදනවාය කියලා. අපි එහෙම දෙයක් කරන්න ගියේ නැහැ. ඒක තමයි ඇත්ත කාරණය. ඒ විතරක් නොවෙයි. දැන් ඒගොල්ලෝ මොකද කළේ? ඒගොල්ලෝ අනෙකුත් සමිතිවලට ගියා. අනිකුත් සමිතිවලට ගිහිල්ලා කිව්වා, අපට කට්ටිය එවන්න. සමහර සණස සමිතිවල මුදල් දාන්න ගියාට පස්සේ, ඒ සණසෙන් කියනවා, ඔයගොල්ලෝ මෙහේ දාන්න එපා. යන්න වත්තෙගෙදරට. ඒ සණසේ කට්ටිය කියනවා, අපරාදේ මෙහේ දාන්න එපා. දාන්න අරහේ. ඒගොල්ලන්ටත් කොමිස් එකක් යනවා. මෙහෙම ජාලයක් තිබුණේ. ඒ නිසා ඒ ජාලය ඇතුළේ තමයි මේ අපරාධය කළේ. ඒ නිසා තමයි මම කිව්වේ, අපට අපේ අමාත්‍යාංශය, අපේ දෙපාර්තමේන්තුව කරන්න ඕනෑ වගකීම හරියට කරලා නැහැ. ඒ නිසා මෙන්න මේ තත්ත්වය අවබෝධ කර ගෙන, අපි අපේ පළාත් සභාවේ කාර්යභාරය පළාත් සභාව තිබෙන කල් කරන්න ඕනෑය කියන යෝජනාව කරමින් මගේ වචන කිහිපය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. එතුමා බොහොම බරපතළ ප්‍රකාශයක් කළේ. සණස බැංකුව පිළිබඳව. මහජන මුදල් කෝටි ගණනන් වංචා කර තිබෙනවා. චන්ද්‍රිකා කියලා නිලධාරිනියකගේ නමත් කිව්වා. එයා තවම දෙපාර්තමේන්තුවේ ඉන්නවා නම් ගරු ඇමතිතුමා වහාම කොමසාරිස්තුමාට නියෝගයක් දෙන්න. මොකද, පළාත් සභාවට අපකීර්තියක්. ගරු ඇමතිතුමා වහාම මේ ගැන තීන්දුවක් ගන්න. මුළු පළාත් සභාවටම ප්‍රශ්නයක් තිබෙන්නේ. මේ මහජන මුදල්. මීළඟට රජිත හපුආරච්චි ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව. ඔබතුමාට විනාඩි 08 ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 10.34]

**ගරු රජිත හපුආරච්චිගේ**
Hon. Rajitha Hapuarachchige

ගරු සභාපතිතුමනි, 2017 අයවැය සඳහා මේ අයවැය විවාදයේ ආරම්භක අවස්ථාවේදී කථාවක් වෙන් කිරීම සම්බන්ධයෙන් ප්‍රථමයෙන්ම ස්තුතිවන්ත වෙනවා. ගරු සභාපතිතුමනි, අපි පළාත් සභාවේ අයවැය ගැන කථා කරන්න කලින් අපි අද රටක් විධියට ගත්තාම මධ්‍යම රජයේ අයවැයේ විශාල අර්බුදයක් තිබෙනවා. ඒ විශාල අර්බුදයේ අතුරු ප්‍රතිඵල තමයි අද අපට ලැබෙමින් පවතින්නේ. ඒ නිසා මධ්‍යම රජයේ තිබෙන මේ ආර්ථික අර්බුදය සමහර අය ලඝු කරන්න උත්සාහ කරනවා.

ගරු සභාපතිතුමනි, ඇතැම් කණ්ඩායම් ලඝු කරන්න උත්සාහ කරනවා. පසුගිය රජයේ ක්‍රියාත්මක කරපු මෙගා ව්‍යාපෘති සඳහා ලබා ගත් ණය මුදල් එක්ක තමයි මේ වන කොට වර්තමාන රජය අයවැය අර්බුදයකට, එහෙම නැත්නම් ආර්ථික අර්බුදයකට මුහුණ පාලා තිබෙන්නේ කියලා. ඒ නිසා මම පළාත් සභාවේ අයවැය සම්බන්ධයෙන් මේ වර්ෂයේ අපට ලොකු අර්බුදයක් තිබෙනවා. හැමෝම කථා කරන්න පටන් අරගෙන තිබෙනවා, 2017 වර්ෂය සඳහා පළාත් සභාවට රජයෙන් ලැබුණු අරමුදල් අඩු කරලා තිබෙනවාය කියලා. ඒ අනුව ඒ අර්බුදය ගැන කථා කරන්න කලින් අපි ඇත්තටම තේරුම් බේරුම් කර ගන්න ඕනෑ මේකේ ඇත්ත කොහේද තිබෙන්නේ කියලා. මේකේ මුල කොහේද තිබෙන්නේ කියලා. ඒ නිසා ගරු සභාපතිතුමනි, මම පුංචි විශ්ලේෂණයක් කරලා බැලුවා. ඇත්තටම මේකේ අර්බුදය කොහේද තිබෙන්නේ කියලා. ප්‍රධාන වශයෙන් ගත්තාම ගරු සභාපතිතුමනි, අපේ පළාත් සභාව මගින් වැටුප් ගෙවන සේවකයෝ 85,000 කට ආසන්න ප්‍රමාණයක් ඉන්නවා. එතකොට ඒ 85,000 කට ආසන්න ප්‍රමාණයට වැටුප් ගෙවීම සඳහා විශේෂයෙන්ම, වැටුප් වර්ධකය ගෙවීම සඳහා, මේ ආණ්ඩුව මගින් ලබා දුන්න වැටුප් වර්ධකය ගෙවීම සඳහා රු. 10,000 බැගින් වර්ෂයක් සඳහා රුපියල් මිලියන 10,200 ක මුදලක් වැය කරන්න සිද්ධ වෙලා තිබෙනවා, පළාත් සභාවට ලැබෙන අරමුදල්වලින්. එතකොට ඒ අනුව කල්පනා කරලා බැලුවාම අපේ පළාත් සභාවට රුපියල් බිලියන 9.3 ක මුදලක් කපලා තිබෙනවා. එතකොට මේ රුපියල් බිලියන 9.3 යි, මේ රුපියල් බිලියන 10.2 යි අතර තිබෙන මේ හේතුව නිසා තමයි මේ පළාත් සභාවට මේ වර්ෂයේ මෙතරම් මුදලක් කප්පාදු කරන්න

හේතුව. මම මෙතැනදී ප්‍රකාශ කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ, විවේචනය කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ, අපේ රජයේ සේවකයින්ට ලැබුණු වැටුප් වර්ධකය වැරදියි කියලා. මම මේ වෙලාවේ ඒ විධියට අර්ථකථනය කරන්න උත්සාහ කරන්නේ නැහැ. මොකද, අපේ නිලධාරීන් මෙතැන ඉන්නවා. එතුමන්ලාත් රජයේ සේවකයෝ. ඒ නිසා මම මේ ලැබුණු වැටුප් වර්ධකය විවේචනය කරනවා නොවෙයි. නමුත් මේ ලබා දුන් වැටුප් වර්ධකය හරහා ඇත්තටම අද එතුමන්ලාට මොනවාද ලැබිලා තිබෙන්නේ?

අපි ආපස්සට හැරිලා බැලුවොත් රජයේ සේවකයෝ ලක්ෂ 15 ක් විතර ප්‍රමාණයක් ඉන්නවා. එතකොට ඒ ලක්ෂ 15 ට එක මාසයක වැටුප් වර්ධකය ලබා දෙන්න රුපියල් මිලියන 15,000 ක් ඕනෑ. ඒ කියන්නේ රුපියල් බිලයන 15 ක් අවශ්‍යයි එක මාසයකට. එතකොට සමස්ත රජයේ සේවකයන් සඳහා ඒ අවශ්‍ය කරන වැටුප් වර්ධකය ගෙවන්න රුපියල් මිලියන 180,000 ක් අවශ්‍යයි එක වර්ෂයකට. රුපියල් බිලියනවලින් ගත්තොත් රුපියල් බිලියන 180 ක්. එතකොට මේ ආණ්ඩුව බලයට ඇවිල්ලා මේ වැටුප් වර්ධකය දීලා, අපි දළ වශයෙන් ගත්තොත් එහෙම මාස 20 ක් වාගේ කාලයක් අපි හරියට බැලුවොත් එහෙම මේක රුපියල් බිලියන 300 ක්. රුපියල් බිලියන 300 ක් වාගේ මුදල් ප්‍රමාණයක් මේ වෙනුවෙන් වැය කරන්න සිද්ධ වෙලා තිබෙනවා. අතිරේක වැය බරක් රජයට දරන්න සිද්ධ වෙලා තිබෙනවා. මේ අතිරේක වැය බර මේ වැටුප් වර්ධකය වැඩි කරපු රනිල් වික්‍රමසිංහ මැතිතුමාවත්, එහෙමත් නැත්නම් මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාවත්, රවී කරුණානායක මැතිතුමාවත් ගෙදරින් ගේන්නේ නැහැ. මේ වැටුප් වර්ධකය සඳහා ඒ වැඩි කරපු සියලු මුදල් අද මහජනතාවගෙන් අය කරන්න පටන් අරගෙන තිබෙනවා. ඒ අනුව තමයි Vat එක වැඩි කරලා, ජාතිය ගොඩ නැගීමේ බද්ද වැඩි කරලා අද ජනතාව බදු බරින් තලන්න පෙළන්න පටන් අරගෙන තිබෙන්නේ.

ගරු සභාපතිතුමනි, මේ රජය කියන්න උත්සාහ කරනවා, පසුගිය රජය කරපු ඒ ව්‍යාපෘති නිසා, ඒ ණය ගැනීම් නිසා තමයි මේ ආර්ථික අර්බුදයට මුහුණ දෙන්න සිද්ධ වුණේ කියලා. හැබැයි, පසුගිය වසර ගණනාව පුරාම කරපු ඒ ව්‍යාපෘති සඳහා රජය වියදම් කරලා තිබෙන්නේ රුපියල් බිලියන 301 යි. හැබැයි, රටට අනවශ්‍ය බරක් ඇති කරපු මේ වැටුප් වර්ධකය සඳහා පමණක් මේ වන කොට රුපියල් බිලියන 300 කට ආසන්න ප්‍රමාණයක් මේ රජය දරලා තිබෙනවා. ඉතින් මම නැවත නැවතත් කියන්නේ, රජයේ සේවකයන්ට මේ වැටුප් වැඩි කරපු එක වැරදියි කියන එකටත් වඩා ඒක ආර්ථික වශයෙන් වැරදියි කියන එක. ප්‍රතිපත්තිමය වශයෙන් ගත් වැරදි තීන්දුවක්. වැටුප් වැඩි කිරීම වෙනුවට මේ රජයට කරන්න තිබුණේ, ඒ වැටුපේ මුහුර්ත වටිනාකම වැඩි කරන එකයි. ඒ වැටුපෙන් මිලදී ගැනීමට හැකියාව තිබෙන භාණ්ඩ හා සේවා ප්‍රමාණය වැඩි කරන එකයි. ඒ නිසා රජයට තිබුණා විදුලි බිල අඩු කරලා දෙන්න. රජයට තිබුණා දුරකථන බිල අඩු කරලා දෙන්න. රජයට තිබුණා ජල බිල අඩු කරලා දෙන්න. ඒ විතරක් නොවෙයි. රජයට තිබුණා රටේ බඩු මිල අඩු කරන්න. ඒ බඩු මිල අඩු කරලා ඒ වැටුපේ මුහුර්ත වටිනාකම, ඒ වැටුපේ ක්‍රය ශක්තිය වැඩි කරන්න තිබුණා. ඒ ක්‍රය ශක්තිය වැඩි කරන්නේ නැතිව, දීපු බොරු පොරොන්දු ඉෂ්ට කර ගන්න බැරිව, මේගොල්ලෝ රටේ ආර්ථිකය ගැන තීන්දු තීරණ ගන්න කණ්ඩායමක් විධියට වැරදි ආර්ථික ප්‍රතිපත්තියක ඉඳලා වැටුප වැඩි කළා. ඒ නිසා නිරපේක්ෂ වශයෙන් මම මේක විවේචනය කරන්නේ නැති වුණත්, සාපේක්ෂව මේක කල්පනා කරලා බැලුවාම, මේක වැරදි ආර්ථික තීන්දුවක්. ඒ නිසා තමයි අද රජයක් විධියට විශාල ආර්ථික අර්බුදයකට ඇවිල්ලා තිබෙන්නේ.

ඒ විතරක් නොවෙයි. අපි දන්නවා, පසුගිය කාලයේ රුපියලේ අගය ඉතාම වේගයෙන් කඩා වැටුණා. දෙසැම්බර් මාසේ දෙවැනිදා වන කොට ඩොලරයේ වටිනාකම 150.50 කට ගිහිල්ලා තිබුණා. එතකොට මේ රුපියල අව ප්‍රමාණය වීම නිසා පමණක්, රජයේ ණය ආපසු ගෙවීමේදී ඩොලර් බිලියන 3.2 ක වාගේ ප්‍රමාණයක් රජයට අහිමි වෙලා ගිහිල්ලා තිබෙනවා. පාඩු වෙලා ගිහිල්ලා තිබෙනවා. ඉතින් මේ රජයේ ආර්ථික ප්‍රතිපත්තියේ වැරදි තීන්දු තීරණ නිසා තමයි ක්‍රම ක්‍රමයෙන් අද මේ අයවැය අර්බුදයකට අපි ලක් වෙලා තිබෙන්නේ. ඒකේ අතුරු ප්‍රතිඵලයක් විධියට තමයි අද පළාත් සභාවේ මේ මුදල් කප්පාදුව කරලා තිබෙන්නේ.

අපි පළාත් සභාවේ අයවැයට යොමු වුණාට පස්සේ ගරු සභාපතිතුමනි, රුපියල් බිලියන 9.3 ක මුදලක් කප්පාදු කරලා තිබෙනවා. ඒ රුපියල් බිලියන 9.3 ක කප්පාදුවක් කරන අතරේ විශේෂයෙන්ම මූලධන වියදම් සඳහා වෙන් කරලා තිබුණු ඒ සමස්ත ප්‍රමාණය ගත්තාම සත්‍ය වශයෙන්

[ගරු රජිත හපුආරච්චිගේ]

ආයතනික ප්‍රාග්ධන වියදම් අයින් කරලා. අපි ආයතන ප්‍රාග්ධන වියදම් ගත්තාම, අපට ඒ හරහා සංවර්ධනය කියන පැත්තට යොමු කරන්න අමාරුයි. ඒ නිසා සත්‍ය වශයෙන්ම ජනතාවගේ සංවර්ධන කටයුතු වෙනුවෙන් පළාත් මාර්ග වෙන්න පුළුවන්, අධ්‍යාපනය වෙන්න පුළුවන්, වෙනත් බිම් මට්ටමේ ජනතාවගේ කටයුතු ඉෂ්ට කරන කොට රුපියල් මිලියන 1342 ක මුදලක් කප්පාදු කරලා තිබෙනවා. අපට වැඩ කරන්න තිබෙන මුදල්වලින් රුපියල් මිලියන 1342 ක ප්‍රමාණයක් පසුගිය වසරට සාපේක්ෂව කප්පාදු කරලා තිබෙනවා. එතකොට අපි උපමාන පාදක පැත්තෙන් ගත්තත් විශාල මුදල් ප්‍රමාණයක් අපට අඩු කරලා තිබෙනවා. 460ක සිට 254 දක්වා වැඩි කරලා තිබෙනවා. පළාත් සභා මන්ත්‍රීවරු විධියට අපට වැඩ කරන්න තිබෙන ඒ මුදල් ප්‍රමාණය කප්පාදු වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. මේ අඩු කරපු සමස්ත මුදල් ප්‍රමාණය ප්‍රතිපූරණය කර ගන්න පළාත් සභාව මගින් උපයන ආදායම වැඩි කරලා තිබෙනවා. පළාත් සභාව මගින් උපයන ආදායම වැඩි කරලා තිබෙනවා, රුපියල් මිලියන 4400 කින්. එක පැත්තකින් මධ්‍යම රජයෙන් බදු ගහනවා. වැට් එක වැඩි කරනවා. අනික් පැත්තෙන් පළාත් සභාවේ අයවැය පියවා ගන්න, පළාත් සභාවේ අපට සිද්ධ වෙලා තිබෙනවා, ජනතාවට බදු බර වැඩි කරන්න. ඒ අනුව උඩිනුත් ජනතාවට ගහනවා. බිමිනුත් ජනතාවට ගහනවා. ඒ නිසා විශේෂයෙන්ම අපි පළාත් සභාවක් විධියට මේ වර්ෂය තුළදී මේ අඩු කරලා තිබෙන මුදල් කප්පාදුව පිළිබඳ වැඩි කථා බහක්, වැඩි අවධානයක් යොමු කරන්න අවශ්‍යයි කියලා ගරු සභාපතිතුමනි, ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, අපි අමාත්‍යාංශ වශයෙන් ගත්තත් ඉතා විශාල මුදල් සම්භාරයක් අඩු වෙලා තිබෙනවා. සමස්ත වශයෙන් ගත්තාම පළාත් පාලන අමාත්‍යාංශය, ප්‍රධාන අමාත්‍යාංශය ගත්තාම පසුගිය වසරට සාපේක්ෂව අඩු වුණු සමස්ත මුදල් ප්‍රමාණය, ප්‍රාග්ධන මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 63 ක්. සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් රුපියල් මිලියන 619 ක් ද, කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් රුපියල් මිලියන 110 ක් ද, මාර්ග අමාත්‍යාංශයෙන් රුපියල් මිලියන 30 ක් ද, අධ්‍යාපන අමාත්‍යාංශයෙන් රුපියල් මිලියන 1128 ක් ද වශයෙන් ඉතා විශාල මුදල් සම්භාරයක් අමාත්‍යාංශවලට අඩු වෙලා තිබෙනවා. ඒ රජයෙන් ලැබුණු මුදල් සහ ඒ එක්කම අපි වෙන් කරලා තිබෙන මුදල් අඩු වෙලා තිබෙනවා. ඒ නිසා ලබන වර්ෂය ඇතුළත මේ කටයුතු ක්‍රියාත්මක කර ගෙන යන කොට අපට වැඩි අවධානයක් යොමු කරන්න සිද්ධ වෙනවා, මේ මුදල් නිසි පරිදි කළමනාකරණය කරලා අපේක්ෂිත ඉලක්ක කරා යොමු වෙන්න රටේ සංවර්ධනය වෙනුවෙන් ජනතාවගේ අවශ්‍යතා සපුරන විධියට මේක කළමනාකරණය කරන්නේ කොහොමද කියන එක පිළිබඳව අපි විශේෂ අවධානයක් යොමු කරන්න සිද්ධ වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු රජිත හපුආරච්චිගේ**
Hon. Rajitha Hapuarachchige

ගරු සභාපතිතුමනි, කථා කරන්න ගොඩක් දේවල් තිබුණා වුණත් ලබා දී තිබෙන කාලය ඉතා සීමිත නිසා මගේ කථාව සීමා කරන්න සිද්ධ වෙනවා. විශේෂයෙන්ම ඔබතුමාටත් මේ කථාව ලබා දීම සම්බන්ධයෙන් ස්තුතිය පළ කරමින් මේ අයවැය සම්බන්ධයෙන් මන්ත්‍රීවරු කථා කරන්න පටන් ගත්තා මේක හවුල් ආණ්ඩුවක් වාගේ එහෙම දෙයක් ගැන. නමුත් පුද්ගලිකව ගත්තොත් මම මේ කාටවත් බැඳුනු මන්ත්‍රීවරයෙක් නොවෙයි. ඒ නිසා මේ අයවැය සම්බන්ධයෙන් අපි කටයුතු කරන්නේ, ඒ එක් එක් අමාත්‍යාංශය කරන කටයුතු, ඒ වෙන් කරලා තිබෙන මුදල් සහ ඒ ඒ ඇමතිවරු වැඩ කටයුතු කර ගෙන යන කොට අපේ ප්‍රදේශවල ජනතාවට සහ සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කරද්දී ඒ අය අපට දක්වන සහයෝගය අනුව තමයි තීන්දු තීරණ ගන්න වෙන්නේ කියන එකත් මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ වනවා ඇත.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා ] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.***

*Accordingly the Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Lalith Ellawala M.P.C took the Chair*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මීළඟට රොඩ්නි ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමාට විනාඩි 15 ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 10.48]

**ගරු රොඩ්නි රුඩොල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ හය වැනි පළාත් සභාවේ 27 වන මුදල් ප්‍රකාශය ඉදිරිපත් කිරීම. ඇත්තටම සතුටට පත් වෙනවා, අපේ මහ ඇමතිතුමා, එතුමාගේ දෙවන අයවැය ඉදිරිපත් කිරීම පිළිබඳව. ඒ දෙවන අයවැය ඉදිරිපත් කරන කොට, ඒ වසරක් තුළ මහ ඇමතිවරයෙක් හැටියට, ඒ මහ ඇමතිවරයා ගත් ඒ අවුරුද්දක කාලයේ තිබෙන එදා පොරොන්දුත් එක්ක බැලුවාම අපි ඉතාමත් සතුටට පත් වෙනවා, අපේ වත්මන් මහ ඇමතිවරයා පිළිබඳව. එතුමා පිළිබඳව එහෙම කථා කරන්නේ ඒ - එතුමාත් එක්ක අපි නේ විරුද්ධ වෙන්න ඕනෑ. මගේ ආසනයේ මාත් එක්ක බොහෝ දුරට ගැටෙන්න ඉන්න, ගැටෙන, විපක්ෂයක් නියෝජනය කරන මහ ඇමතිවරයා. නමුත් මහ ඇමතිවරයා පත් වීමත් සමඟම අපට විශේෂයෙන් කටයුතු කිහිපයක් සිදු වුණා. ගියවර එතුමාගේ අයවැය ප්‍රකාශය යටතේ. එතුමා එතෙක් කාලයක් තිබුණු සාම්ප්‍රදායිකව පළාත් සභාව තුළ ඇති වුණු එක්තරා දෙයක් තමයි පාලක පක්ෂයේ අයට පමණක් කියන අර්ථය. මට මතකයි හිටපු මහ ඇමති ප්‍රසන්න රණතුංග මහ ඇමතිතුමා - කනගාටුයි එතුමා නැති වෙලාවේ මෙහෙම ප්‍රකාශ කරන්න ලැබීම පිළිබඳව. අපි විපක්ෂයක් හැටියට නියෝජනය කරන කොට මට නම් අංශු මාත්‍රයක සහයෝගයක් එතුමාගෙන් ලැබිලා නැහැ. එදා එහෙම සහයෝගයක් මොන විධියකින්වත් ලැබුණේ නැහැ. නමුත් අපේ මහ ඇමතිවරයාගේ සම්බන්ධ වීමත් සමඟම අපට විශාල වශයෙන් මේ දේ කර ගෙන යන්න අවස්ථාවක් ලැබුණා. අපේ දීමනාවන් වැඩි වුණා.

ඒ වාගේම තමයි මහ ඇමතිවරයා හරහා මන්ත්‍රීවරුන් අතර විශාල සම්බන්ධීකරණයක් ඇති කර ගන්න පුළුවන්කමක් ලැබුණා. මහ ඇමතිවරයා පුදුමාකාර දක්ෂතාවයකින් හෙබි පුද්ගලයෙක්. මේ අයවැය කථාව යටතේ එතුමාගේ ගුණ වැයීමකුත් එක්ක මම මේ යන්නේ. මොකද හේතුව, මේ පිදිය යුතු අවස්ථාවේ පුදන්න ඕනෑ වෙලාවක්. ඊට හේතුව තමයි එතුමාට ජනතා විමුක්ති පෙරමුණද? එහෙම නැත්නම් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයද? එක්සත් ජාතික පක්ෂයද කියලා පක්ෂයක් නැහැ. මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා මොන ආකාරයෙන් ප්‍රකාශ කළත්, එතුමා යහපාලනයෙන් බිහි වුණු මහ ඇමතිවරයා. ඒ නිසා මේක කවුරු මොනවා කිව්වත් මේ පාලනය ක්‍රියාත්මක වෙන්නෙත්, අමාත්‍යවරු ක්‍රියාත්මක වෙන්නෙත් මේ යහපාලනය යටතේම තමයි. අපි පාරවල්වල බැහැලා, කොඩි අරගෙන, වේදිකා මත ගිහිල්ලා, කෑ ගහලා ඒ ගත් ජයග්‍රහණයෙන් තමයි මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ආවේ. මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජනාධිපතිවරයා නොවෙන්නට කිසිම දවසක ඉසුර දේවප්‍රිය නමැති මහරගම නගර සභාවේ හිටපු සභාපතිවරයාට, මෙතැන මේ කුඩා පුද්ගලයෙකුට ඔය තත්ත්වයට එන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. මේ මන්ත්‍රීවරුත්, අමාත්‍යවරුත් කවුරු හරි කියනවා නම්, මේක ඇතුළේ ඉඳගෙන වෙනත් කෙනෙකුට සහයෝගය දක්වන්න ඕනෑය කියලා. ඇමතිවරුනි, මේ බිහි වෙලා තිබෙන්නේ, ඔබතුමන්ලාත් වෙන කවුරුවත් නිසා නොවෙයි. මේ ඇවිල්ලා තිබෙන්නේ ජනාධිපතිතුමාගේ පත් කිරීම මතමයි. ඒ නිසා ඇතැම් අය සමහර වෙලාවට ඒ පැත්තෙයි මේ පැත්තෙයි දෙපැත්තේම කකුල් තියා ගෙන ඉන්න පුළුවන්. නමුත් මතක තියා ගන්න ඕනෑ. අපි මේ බිහි වෙලා තිබෙන්නේ, යහපාලන ක්‍රමයක්. ඒ නිසා මහ ඇමතිතුමා ටිකක් දැන ගන්නත් ඕනෑ, යහපාලනය යටතේ සැබෑ ලෙස එකතු වන කට්ටිය කවුද කියලා. තමන්ගේ පාර්ශවයේ කට්ටිය කවුද?

ඒ වාගේම තමයි එක්සත් ජාතික පක්ෂයත්, ජනතා විමුක්ති පෙරමුණේ සහෝදර මන්ත්‍රීවරුත් එකතු වෙලා මේක සැබෑ ලෙස යහපාලනයක් ලෙස අරගෙන යන්නත් පුළුවන්. සමහර විට ඔබතුමාව අද බිත්තියට හේත්තු කරලාදෝ කියලත් සැකයක් ඇති වෙනවා. සමහර අවස්ථාවලදී ඔබතුමාට හිතෙන්න පුළුවන් යම් යම් - හැබැයි, ඉසුර දේවප්‍රිය මහ ඇමතිතුමාව මම දන්නවා. දීර්ඝ කාලයක් තිස්සේ මම ඇසුරු කරන මගේ හිතවත් මිත්‍රයෙක්. ඒ නිසා එතුමා හොඳ පන්නරය ලබපු, තෙලෙන් තෙම්පරාදු වුණු මහ ඇමතිවරයෙක්. නමුත් මට හිතෙනවා. මම පුද්ගලිකවත් ඒ දවස්වල කිව්වා. මේ අයවැය හරහා යම් යම් අයව පාලනය කර ගන්නත් පුළුවන්. මේ පොදු සාකච්ඡාව යටතේ, අපි වෙනමම එක එක අමාත්‍යාංශ පිළිබඳව

[ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්]

වෙනමම සාකච්ඡා කරමු. යම් යම් අය අර මස් රාත්තල ඉල්ලීම සඳහා කරන හොඳම න්‍යාය තමයි මේක. ඔබතුමා අපට මේ මේ වරප්‍රසාද ලබා දුන්නොත් ඔබතුමාට ඡන්දය ලබා දෙනවා. එහෙම නොවුණොත් ඔබතුමාව පරද්දනවා. ඔබතුමාගේ අමාත්‍යාංශය පරද්දලා යම් යම් වැඩ කටයුතු කර ගන්නවාය කියලා. ඒ නිසා ඔබතුමා තීරණය කර ගන්න. ඔබතුමාත් එක්ක යහපාලනය තුළ බිහි වුණු ඔබතුමාගේ පාර්ශවයකුත් ඉන්නවා. මේ පැත්තෙත් ඉන්නවා. ඒ නිසා අපට කිසි ගැටළුවක් නැහැ. මේ බස්නාහිර පළාත් සභාව පවත්වාගෙන යන කොට මහා ජවයක් තිබෙන පිරිසක් ඉන්නවා. ජනතා විමුක්ති පෙරමුණ පිළිබඳව මම දන්නේ නැහැ කොහොමද කියලා. එතුමන්ලාගේ තිබෙන්නේ දෙබිඩි පිළිවෙතක්. ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා අද, යහපාලනය යටතේ අපේ වත්මන් රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යතුමාව විවේචනය කළා. එතුමා කිව්වා, මේ සංකල්පය හැම දෙයක්ම අරගෙන යන්නේ රනිල් වික්‍රමසිංහ ගරු අග්‍රාමාත්‍යතුමාගේ අවශ්‍යතාවය මතමයි කියලා. සැබවින්ම එසේ වෙන්නත් බැරි කමක් නැහැ. මොකද, පාර්ලිමේන්තුවේ නියෝජනය වන ප්‍රධානියා අග්‍රාමාත්‍යවරයා. අග්‍රාමාත්‍යවරයාට ලෝකයේ දැක්මක් තිබෙනවා. ජනාධිපතිවරයාට වාගේම. බුද්ධිය තිබෙනවා. ලෝකයේ ඕනෑම ජන නායකයෙක් එතුමාට හරසර දක්වනවා. ඒ නිසා විශේෂයෙන්ම සතුටට පත් වෙනවා. මෙවැනි ආයතනය තුළ ඉඳගෙන හරි එහෙම කරන්න ලැබීම පිළිබඳවයි මම කථා කළේ.

ඒ වාගේම තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා පටන් ගත්ත - මගේ හිතවත් මන්ත්‍රීතුමා. එතුමා කථාව ආරම්භ කරපු අවස්ථාවේ සිටම එතුමාගේ කථාවේ කිව්වේ, අපට මධ්‍යම රජයෙන් ලබා දෙන්නා වූ මුදල් ප්‍රමාණය ඉතාම අඩුයි කියලා. ඒ වාගේම තමයි ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා එතුමාගේ කථාවේදී බොහෝ දුරට ගම්‍ය කරන්න උත්සාහ කළේ, මධ්‍යම රජයෙන් ලබා දෙන්නා වූ ප්‍රතිපාදන අද අඩු කිරීමකට ලක් වෙලා තිබෙනවාය කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ පළාත් සභාවට දැන් වයස අවුරුදු 27 යි. මේ පළාත් සභාවට අවුරුදු 27 ක් වෙනවා. මේ පළාත් සභාව තවදුරටත් යැපී සිටින්නේ මධ්‍යම රජයෙන් නම්, එතකොට අපට තනිව නැගී සිටින්න පුළුවන්කමක් නැද්ද? එක්තරා මට්ටමකට වෙන්න පුළුවන්. ඒ කියන්නේ අපි පළාත් සභාව බිහි කිරීමේ මූලික පරමාර්ථය, සමහර විට මේ ජාතික ප්‍රශ්නයට විසඳුමක් -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු මන්ත්‍රීතුමා, පිරිවැටුම් බදු අද එකතු කරන්න දුන්නා නම්, මේ කාගෙන්වත් යැපෙන්න ඕනෑ නැහැ. අපට හොඳටම ඇති.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

කවුද බන්දේසියේ තියලා දුන්නේ?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

පිරිවැටුම් බදු දුන්නාට ඒ කාලේ දුන්න එකට සල්ලි ලැබුණා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

කවුද බන්දේසියේ තියලා දුන්නේ? එපැයි කියන්න කියන්න ප්‍රසන්න රණතුංග මහ ඇමතිවරයා බන්දේසියේ තියලා දුන්නේ, මහින්ද රාජපක්ෂ මහත්තයාට. ඒ පාපය තමයි මේ ගෙවන්නේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

දෙන කොට මුදල් ලැබුණා නේ? දැන් ලැබෙන්නේ නැති හින්දා කියන්නේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

කරුණාකර බාධා කිරීම් කරන්න එපා.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු මන්ත්‍රීතුමා, BTT අපි භාර දුන්නේ නැහැ නේ? ඒ නිසා මේක ගියවර මධ්‍යම රජයට භාර දුන්නේ ඔබතුමන්ලාගේ සම්පූර්ණ කැමැත්තෙන්. ඒ නිසා නැවත ගැනීමේදී දැන් බොහෝ දුරට කරීකාවක් - ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා එතුමාගේ කථාවේදීත් කිව්වා, බොහෝ අවස්ථාවලදී මධ්‍යම රජය මේ 13 වන ව්‍යවස්ථා සංශෝධනය යටතේ බලාපොරොත්තු වුණේ -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

අපි දූන්නා අගමැති කාලේ. ඔබතුමන්ලාගේ කාලේ එහෙම නම් ඔබතුමන්ලා ඉල්ලා ගන්න.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ඒක තමයි අපි උත්සාහ කරන්නේ. ඒක ගන්නට උත්සාහ කරන්නේ. ඒ නිසා අපි දැන් ඇත්තටම මේ තත්ත්වය යටතේ, මධ්‍යම රජය යටතේම අපි රැඳී සිටීමට උත්සාහ දරනවා නම්, මධ්‍යම රජය යටතේ ඒ ආධාර මතම රැඳී සිටින්නට උත්සාහ දරනවා නම්, ඉදිරි කාලයේදී ජනතාවට ඒත්තු යන්නට පාර්ලිමේන්තුව හරහා හෝ උත්සාහ කිරීමක් කරනවා. මේ පළාත් සභාව වැඩක් නැහැයි කියලා. සුදු අලියෙක් කියලා. මොකද, අපි රඳා පවතින්නේ මධ්‍යම රජය මත නම්, මේක අවශ්‍යතාවයක් නැහැ. රටේ ජාතික ප්‍රශ්නයට විසඳුමක් හැටියට එදා බලය විමධ්‍යගත කිරීම සඳහා මේ ආකාරයෙන් කටයුතු කළත්, අපි ඇත්ත වශයෙන්ම අපේ මේ ප්‍රතිපත්තීන් හරහා එහෙම නැත්නම්, මේ අයවැය හරහා අපි උත්සාහයක් කරන්න ඕනෑ, පළාත් සභාව තුළ තිබෙන ආදායම් ප්‍රමාණය වැඩි කර ගන්න.

ගරු මහ ඇමතිතුමනි, පසුගිය කාලයත් එක්ක අපට පුළුවන් වුණාද අපේ තිබුණු ඉලක්ක කරා යන්න? අපි ලබා ගත් ආදායම්, වැඩි කර ගත් ප්‍රභවයන් මොනවාද? වැඩි කර ගත් ප්‍රභවයන් කිසි දෙයක් දකින්න ලැබෙන්නේ නැහැ. බොහෝ දුරට තිබෙන අඩු ආදායම් ප්‍රමාණයක්. හැබැයි, මෙවර අයවැය ප්‍රකාශයේ මේක ක්‍රියාත්මක වන කොට ඉතාමත් සාර්ථක තත්ත්වයට එන්න පුළුවන්. ඔබතුමා යම් යම් අවස්ථාවලදී උත්සාහ කරලා තිබෙනවා, වැඩි ප්‍රමාණයක් ගන්න. අපි ගත්තොත් එහෙම බස්නාහිර පළාත ගත්තොත් බස්නාහිර පළාතේ ජාතික ආදායමෙන් 59% ක්, වැඩිම ආදායමක් ලබා ගන්න කලාපයක්. ගරු මහ ඇමතිතුමනි, දැන් මේ ජාතික ආදායමෙන් 59% ක ප්‍රමාණයක් බස්නාහිර පළාත් සභාව ගන්න කොට, ජාතික ආදායමෙන් 59% ක් කා අතර ද බෙදිලා ගිහිල්ලා තිබෙන්නේ. අර ඔබතුමාගේ ප්‍රකාශය යටතේ ආදායම් බෙදී යාමේ විෂමතාවයක් තිබෙනවාය කියලා කිව්වා නේ? ඒක සැබවින්ම ගිහිල්ලා තිබෙනවා. බස්නාහිර පළාත තුළ ගත්තොත් එහෙම රැඳී සිටින්නා වූ මේ කුටුම්භයන් ගත්තොත් එහෙම බහුතරයක් ඉන්නේ -

දැන් ඔබතුමා දන්නවා. ඔබතුමා නියෝජනය කරන අපේ ප්‍රදේශය. මහරගම වාගේ ප්‍රදේශයක් ගත්තොත් එහෙම ඉතාමත් අඩු ආදායම්ලාභීන්ගෙන් පිරුණු ප්‍රදේශයක්. ඒ වාගේම කැස්බෑව, අනෙකුත් ප්‍රදේශ ගත්තාම ඉතාමත් අඩු ආදායම් ලබන පිරිසක් ඉන්නේ. ඒ නිසා එක පිරිසක් විතරයි. දැන් අපි ගත්තොත් එහෙම ජාතික ආදායමෙන් 59% ක වාගේ ප්‍රමාණයක් බස්නාහිර පළාත ලබා ගන්න කොට, ඒකෙන් 80% ක් පමණ ලබා ගන්නේ 20% ක විතර පිරිසක්. මේකේ ධම්මික පෙරේරලාත් ඉන්නවා. ඒ නිසා මහ ඇමතිතුමනි, ඔබතුමා ඉදිරි කාලයේදී මේ කටයුතු කර ගෙන යන කොට උත්සාහ කිරීමක් කරන්න ඕනෑ. මේ ආදායම් සමාන ආකාරයට එක් එක් පුද්ගලයින්ට බෙදී යන ආකාරයට යම් වැඩ පිළිවෙළක් කරන්න. ඒ නිසා දුප්පතා එදා ඉඳලාම එතැනමයි. දැන් බස්නාහිර පළාතේ ගත්තොත් එහෙම තවම පාසල් අතරමග නතර කරපු බහුතරයක් දරුවෝ විශාල ප්‍රමාණයක් ඉන්නවා. දරුවෝ විශාල ප්‍රමාණයක් ඉන්නවා. O/L දක්වා ඉගෙන ගන්නවා. එහෙම නැත්නම් O/L ආසන්නයට ඇවිල්ලා O/L වලින් පස්සේ උසස් පෙළ සඳහා යන්නේ නැති පිරිසක් ඉන්නවා. ඒ නිසා ඔබතුමා, ඔබතුමාගේ වචනයේදී පමණක් එදා ප්‍රකාශ කරලා තිබෙනවා, ඉදිරියේදී මේ සාමාන්‍ය පෙළ අභිබවා යන්නට, එහෙම නැත්නම් වෘත්තීමය අධ්‍යාපන කටයුතු ලබා දීමට උත්සාහ කිරීමක් කරනවාය කියලා. නමුත් අපි සමීක්ෂණයක් කරලා බැලුවොත් එහෙම, බස්නාහිර පළාතේ වැඩි දරුවන් පිරිසක් ගත්තොත් - මම අවුරුදු 25 කට වඩා වැඩි කාලයක් ගුරුවරයෙක් හැටියට සේවය කරන පුද්ගලයෙක් හැටියට, බහුතරයක් දරුවෝ අද උසස් අධ්‍යාපන කටයුතුවල නියැලෙන්නේ නැහැ. අද අතරමග නතර වුණු ප්‍රමාණයක් සිටින්නේ. ඒ නිසා මේ පාසල්වල තිබෙන කෙටි කාලයක් තුළ කෙටි දුරක් දක්වා පමණක් ඉහළට යන්නා වූ මේ අධ්‍යාපනය නතර කරන්නා වූ පිරිස වෙනුවට තවදුරටත් ඒ පිරිස ඉදිරියට අරගෙන යන්න කටයුත්තක් කරනවා නම් වඩාත් හොඳයි.

ඒ වාගේම ඔබතුමාගේ අවධානයට ලක් කිරීමක් කරනවා. ගරු මහ ඇමතිතුමනි, අද බහුතරයක් පාසල් තිබෙන්නේ පස් වන ශ්‍රේණිය දක්වා පමණයි. අපි ගත්තොත් එහෙම මේ ස්ථානයේ සිට මේ පළාත් සභාව තිබෙන තැන ඉඳන් ගත්තොත් එහෙම, පන්නිපිටිය ධර්මපාල විද්‍යාලය දක්වා ගත්තොත් එහෙම මේ අතරතුර එක පාසලයි තිබෙන්නේ සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ දක්වා අධ්‍යාපනය ලබන්න

[ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්]

පුළුවන්. ඒ අතර තුර ඔක්කොම තිබෙන්නේ පස් වන ශ්‍රේණිය දක්වා පමණයි. අපි නාගරිකකරණය වෙලා තිබුණත්, සමහර ප්‍රදේශවල දරුවෝ ඉන්නවා, වෙනත් පාසලකට යන්න, හය වැනි ශ්‍රේණියට යන්න ශක්තියෙන් හෙබි නැති. ඉතින් ඒ නිසා ඔබතුමා අඩුම තරමින් අපේ මේ සංකල්පය යටතේ මධ්‍යම රජය ගෙනැල්ලා තිබෙන "ළඟම පාසල හොඳම පාසල" සංකල්පය යටතේ එක පාසලක් හොඳ වෙන්න පුළුවන්. නමුත් සමස්ථයක් පාසල් තිබෙන්නේ හය වැනි ශ්‍රේණිය දක්වා පමණයි. හය වැනි ශ්‍රේණියෙන් පස්සේ උසස් පන්ති සඳහා එහෙම නැත්නම් ඉහළ අධ්‍යාපන කටයුතු කරන්න තවත් පාසලකට යන්න මැලිකමක් දක්වනවා. එක්කෝ ඒගොල්ලන්ගේ තිබෙන ආර්ථික අපහසුතාවයන් නිසා. ඒ නිසා ගරු මහ ඇමතිතුමනි, ඔබතුමාගේ අවධානය ඒ පිළිබඳව යොමු කිරීමක් කරන්න.

අධ්‍යාපන ඇමතිතුමා නැති වුණත්. ඔබතුමා අධ්‍යාපනය වෙනුවෙන් විශාල මෙහෙවරක් කරනවා. මම දන්නවා, අපේ ජයවර්ධනපුර කලාපය. ජයවර්ධනපුර කලාපය ලංකාවෙන් තුන් වන ස්ථානයට ඇවිල්ලා තිබෙනවා. ඒකෙන් හොඳම කලාපය බවට පත් වෙලා තිබෙනවා ඔබතුමා නියෝජනය කරන මහරගම කලාපය. ඒ නිසා අධ්‍යාපනය ඉහළ තත්ත්වයක තිබෙන්නේ. ඇත්තටම අපි ගුරුවරු හැටියට සතුටට පත් වෙනවා. සාමාන්‍ය ජීවිතයේත් ගුරුවරු හැටියට. ඇත්තටම ඔබතුමාගේ ශක්තිය තිබෙන්නේ. මහරගම අධ්‍යාපන කටයුතු පිළිබඳව ඉතාමත් සොයා බැලීමක් කරනවා. මහ ඇමතිවරයා වශයෙන් ඉඳලත් හැම වෙලාවේම ඒ තිබෙන ව්‍යුහ කමිටුවලට සහභාගී වෙනවා. ඒ වාගේම පාසල්වල තිබෙන අවශ්‍යතා සඳහා යොමු වෙනවා. ඒ නිසා පස් වන ශ්‍රේණිය දක්වා පාසල් පවත්වාගෙන යන එක තවදුරටත් ඉහළට අරගෙන යන්න. දැන් ඒකට හුඟක් ගැටළුව වෙලා තිබෙන්නේ, මේ මධ්‍යම රජයේ පාසල් සහ පළාත් සභා පාසල් අතර තිබෙන අසමඟියයි. එහෙම නැත්නම් අසමානතාවයයි. සම්පත් බෙදී යාමේ සම්බන්ධතාවයක් නැති වීමයි. අද ජාතික පාසලකට යන්න වැඩිපුර දරුවෝ උත්සාහ කිරීමක් කරන්නේ, ඒවාගෙන් ලබා ගන්න පුළුවන් හැකියාව වැඩි නිසයි. අධ්‍යාපන කටයුතු, එහෙම නැත්නම් අවස්ථා වැඩියි කියලා උපකල්පනයක් තිබෙන නිසා. අද පළාත් සභා පාසල් ගත්තාම, පළාත් සභා පාසල් ඉතාමත් දීන මට්ටමේ, නැත්නම් ඌණ මට්ටමේ තිබෙන පාසල් කියලා ළමයින්ගේ සහ දෙමව්පියන්ගේ මතයක් තිබෙනවා. ඒ නිසා ඒවා තවදුරටත් සංවර්ධනය කරන්න. දැන් මේ ළඟම පාසල හොඳම පාසල සංකල්පය එන්නේ, අකිල විරාජ් කාරියවසම් අධ්‍යාපන ඇමතිතුමාගේ සංකල්පයක් නේ? අපට පුළුවන් අපේ මහ ඇමතිතුමාගේ සංකල්පයක් හැටියට අඩුම තරමින් කලාපයක, එක් ප්‍රදේශයක එක පාසලක් අරගෙන හොඳ ශක්තිමත් පාසලක් බවට පත් කරන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තව තිබෙන ගැටළුවක් තමයි ගුරුවරයෙක් හැටියට මමත් දකිනවා. අපි පස් වන ශ්‍රේණිය සමත් කරලා දෙනවා. අපි පස් වන ශ්‍රේණිය සමත් කරලා දුන්නාට පස්සේ අපේ පාසල්වල පස් වන ශ්‍රේණියේ දරුවා රඳවා ගන්න අපට පුළුවන්කමක් නැහැ. දැන් අපට තිබෙන ගැටළුවක්. අපි ශිෂ්‍යත්වය සමත් කරලා දෙනවා. ශිෂ්‍යත්වය සමත් වුණු ගමන්ම මේ දරුවාව ගන්නවා, කොළඹ තිබෙන ලොකු පාසලක්. එතකොට අපේ පාසල් තවදුරටත් වැටෙන තත්ත්වයක් එනවා. ඒ නිසා ගරු මහ ඇමතිතුමනි, පුළුවන් තරම් ඒ අධ්‍යාපන කටයුතු පිළිබඳව අවධානයක් යොමු කිරීමක් කරන්න. තව ගොඩක් කථා කරන්න තිබෙනවා. නමුත් කාලය පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. ආදායම් උපද්දවන අවස්ථා සඳහා උත්සාහ කර ගන්න. ඔබතුමා ප්‍රකාශ කරන කොට වැඩි ආදායම් ප්‍රමාණයක් ලබා ගන්නට උත්සාහ කරනවා කියලා දාලා තිබෙනවා. ඒ නිසා මධ්‍යම රජය මතම යැපෙන්න එපා. මධ්‍යම රජයේ යටතේම යැපෙන්නට ගියොත් එහෙම, ඉදිරි කාලයේදී ජනතාව ප්‍රතික්ෂේප කරනවා, මේක වැඩක් නැහැයි කියලා. මධ්‍යම රජය විතරක්, එහෙම නැත්නම් පාර්ලිමේන්තුව පමණක් තිබුණොත් විතරක් ඇතියි කියන මතයකට එනවා. ඒ නිසා ඒකට නොයා අඩුම තරමින් ඔබතුමාගේ 2019 දක්වා කාලය තුළදීවත් මධ්‍යම රජයෙන් අපි යැපෙන්නේ නැතිව අපි අපේ මත යැපී සිටිමුයි කියන අර්ථය මත අපි උත්සාහ කළොත්, අපට හොඳ ගමනක් යන්න පුළුවන් වෙනවා. ගරු මහ ඇමතිතුමාගේ දෙවන අයවැය අවස්ථාවයි මේ. ඒ නිසා ඉතාමත් සතුටට පත් වෙනවා. මේ කටයුතුවලදී අපි උපරිම සහයෝගයක් දක්වනවා, එතුමාට සහ මේ යහපාලනය තුළ බිහි වෙලා තිබෙන්නා වූ මේ පාර්ශවය වෙනුවෙන්. මේ අවස්ථාව ලබා දීම පිළිබඳව බොහොම ස්තුතිවන්ත වෙනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා [ලලිත් එල්ලාවල]**
Hon. Presiding Member [Lalith Ellawala]

මම සභාවෙන් ඉල්ලා සිටිනවා. ඇත්තටම එතුමා ගුරුවරයෙක් හැටියට ලොකු අත්දැකීම් සම්භාරයක් එක්ක තමයි සාකච්ඡා කළේ. සමහර අය නොදන්නා කරුණු ඉදිරිපත් කළා. ඒ නිසා සභාවේ වෙනත් වෙනත් කථා කරනවාට වඩා හොඳයි ඇත්තටම ඒවා ගැන පොඩි අවධානයකින් ඇහුම්කන් දීම මුළු සභාවටම ප්‍රයෝජනවත් කියලා මතක් කරනවා.

මීළඟට ගරු ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමාට විනාඩි 08 ක කාලයක් ලබා දෙනවා.

[පූ.භා. 11.07]

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2017 අයවැය ආරම්භ කිරීමට ප්‍රථම සියලුම අමාත්‍යාංශවල සියලුම නිලධාරීන් එක්ක අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු සියලුම ඇමතිතුමන්ල, මන්ත්‍රීතුමන්ලා එකතු වෙලා අපි මේ අයවැය පිළිබඳව සාකච්ඡා කළා. 2016 වසරේදී අපට ලැබිලා තිබෙන මුදල්වලින් වැඩ කෙරුණේ නැහැයි කියලා කියන කොටස අපි හඳුනාගෙන, 2017 වසරේදී ඒ පිළිබඳව අපි සාකච්ඡා කරලා, වැඩ පිළිවෙළක් දියත් කිරීම පිළිබඳව අපි හදවතින්ම අමාත්‍යාංශවල නිලධාරීන් සියලුදෙනාට ස්තූතිය ප්‍රකාශ කරනවා. ඒ වාගේම අද දවස තුළ 2017 අයවැය විවාදය පැවැත්වීමේදී අපි ගරු ප්‍රධාන අමාත්‍යතුමා, ඒ වාගේම පළාත් පාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලපවාහන හා සංචාරක කටයුතු අමාත්‍යාංශය පිළිබඳව එතුමාගේ අමාත්‍යාංශයේ නිවේදනයේ, දැක්මෙහි සඳහන් වන්නේ, “විශිෂ්ට ජනතා සේවයක් සැලසෙන පළාත් රාජ්‍ය ආයතනය අතර ප්‍රමුඛයා බවට” තමයි කියලයි. එය මේ දැක්ම තුළින් අපට හඳුන්වලා දීලා තිබෙන්නේ. ඒ වාගේම ඒ දැක්ම තුළින් ක්‍රියාත්මක වන මෙහෙවර, නිපුණ හා සුහදශීලී මානව සම්පත් තුළින් ප්‍රශංසාත්මක ජනතා සේවයක් ඉටු කිරීමට මේ සියල්ල ලබා දීමට තමයි, කටයුතු කරන්න හදන්නේ මේ සියලු පොත්වල සඳහන් කරලා තිබෙන ආකාරයට.

අපි දන්නවා ගරු ප්‍රධාන ඇමැතිතුමනි, ඔබතුමාගේ අමාත්‍යාංශයට අයත් පළාත් පාලන ආයතන ගත්තාම, මේ වන කොට බස්නාහිර පළාත් සභාව තුළ සමහර පළාත් පාලන ආයතන සම්පූර්ණයෙන්ම මහා පරිමාණයෙන් කඩාගෙන වැටිලා තිබෙනවා. මේ පොතේ ලියලා තිබෙන සේවාව ජනතාවට ලැබෙනවාද කියන එක සම්බන්ධයෙන් මම හිතන්නේ ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා. ඒ තුළින් ජනතාව එදිනෙදා අවශ්‍යතාවයට ගියොත් එහෙම ඒ අවශ්‍යතාවය නොකෙරෙන තැනට පත් වෙලා තිබෙනවා. නිලධාරීන්ට සමහර අවස්ථාවලදී පඩිවුඩ දුන්නත්, ඒ අවශ්‍ය තොරතුරු සොයලා දුන්නත් මේ සමහර පළාත් පාලන ආයතන ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළ සම්පූර්ණයෙන්ම අවිධිමත් කියන එක මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න ඕනෑ. ඒ නිසා අපි ඔබතුමාගෙන් ඉල්ලන්නේ මෙන්න මේ ඔබතුමාගේ අමාත්‍යාංශ තුළින් ක්‍රියාත්මක වන වැඩ සටහන්වලට 2017 වසරේදී නොකෙරුණු දේවල් සොයා බලා ඔබතුමාගේ නිලධාරීන් යොදවලා හරි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියලා තමයි අපි කියන්නේ. ගරු මහ ඇමැතිතුමනි, මම ගණන් මිනුම් ගැන කථා කරන්න යන්නේ නැහැ. (බාධා කිරීම්)

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

මට අවශ්‍යතාවයක් තිබුණොත් තමුන්නාන්සේගේ කැලණිය ගැනත් කියන්න හොඳ ශක්තියක් තිබෙනවා. අපි දන්නවා, කැලණියට එනකොට තමුන්නාන්සේ පැනලා දුවන හැටිත් අපි දන්නවා. මම ගරු මහ ඇමතිතුමාට කියන්නේ, සංචාරක කලාපයක තමයි අපි ජීවත් වන්නේ. (බාධා කිරීම්)

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමාට විනාඩි 08 ක කාලයක් තිබෙන්නේ. ඒ නිසා කථා කරන්න ඉඩ දෙන්න. එතුමාට බොහොම කෙටි වෙලාවක් තිබෙන්නේ. ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

[සභාවේ සෝෂා]

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි සංචාරක ප්‍රදේශයක් තුළ ජීවත් වන්නේ. බේරුවල පයාගල ගල් කණුව සිට බෙන්තර දක්වා රත්තරං සැතපුම කියලයි නම් කරලා තිබෙන්නේ. අපි කනගාටු වෙනවා. සංචාරක කලාපයක් වන බේරුවල අද මහා පරිමාණයෙන් කඩාගෙන වැටිලා තිබෙන්නේ. හැබැයි, සංචාරක අමාත්‍යාංශයට අලුත් සභාපතිවරයෙක් පත් කරලා තිබෙනවා. අද වනතුරු අපි දැකලා නැහැ. නමුත් වැඩක් කරන්න ගියාම අපි මහා දුක් කන්දරා ගණනාවකට මුහුණපාලා තිබෙනවා. මොකද හේතුව? අද අපේ ප්‍රදේශයේ මොරගල්ල කළුවාමෝදර වෙරළ තීරය මේ වන විට මහා පරිමාණයෙන් කඩාගෙන වැටිලා. අද සංචාරය කරන කොල්ලෝ මම හිතන්නේ, මේ හැම දෙනාටම රැකියාවන් කරන්න අවස්ථාව නැති වෙලා තිබෙනවා. මොකද, හෝටල් ටික හදනවා, හදනවා කියලා කියනවා. නමුත් හෝටල් ටික හදන්නෙත් නැහැ. මේක සංචාරක අමාත්‍යාංශයෙනුත් කරන්න ඕනෑ වැඩ පිළිවෙළක්. අපි මේ පළාත් සභාව තුළ ඉඳගෙනත් ඒවාට කුමක් සිදුවෙනවාද කියලා දන්නේ නැති තත්ත්වයට අපි පත් වෙලා තිබෙනවා. ඒ නිසා අපි 2017 වසරේ මේ තුළින් ක්‍රියාත්මක වන වැඩ සටහන් ඉල්ලනවා. මේ අපි පළාත් සභා මන්ත්‍රීවරු හැටියට ඔබතුමාගේ යටතේ තිබෙන අමාත්‍යාංශයක් සම්බන්ධයෙන් අපව දැනුවත් කරන්න ඕනෑ. එහෙම නැති වුණොත් මම හිතන්නේ අපේ ප්‍රදේශ සංවර්ධනය නොවෙනවා කියන කාරණය ගැන සඳහන් කරන්න වෙනවා. අර එහා පැත්තෙන් අපේ සහෝදර ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර් ගරු මන්ත්‍රීතුමා ඉන්නවා. එතුමා දන්නවා, බේරුවල ජීවත් වන මන්ත්‍රීවරයෙක් හැටියට.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩියක කාලයක් තිබෙන්නේ.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාවට බාධා කළේ අනික් අය. ඔබතුමයි ඒ අය නවත්තලා කථා කළේ. මම හිතන්නේ විනාඩි දෙකක්වත් මම තවම කථා කළේ නැහැ. එහෙමනම් මම මෙතැනින් කථාව -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

විනාඩි 08 යි ඔබතුමාට තිබුණේ.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

ඒ නිසා මම ඉල්ලා සිටිනවා. අද මේ අමාත්‍යාංශ හතරේම ඉන්න ගරු ඇමැතිතුමන්ලා අලුතෙන් පත් වෙලා වැඩ පිළිවෙළක් කරගෙන යනවා. හැම දෙනාටම අපි ස්තූතිවන්ත වෙනවා. හැබැයි, අපේ ප්‍රදේශ තුළ මහා පරිමාණයෙන් සංවර්ධනයක් නොවුණත් කෘෂිකර්ම අමාත්‍යාංශය තුළින් අපට යම්කිසි සේවාවක් ඉෂ්ට සිද්ධ වුණා. ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අමාත්‍යාංශයෙනුත් යම් සේවාක් ඉෂ්ට සිද්ධ වුණා. ඒ වාගේම ප්‍රවාහන අමාත්‍යතුමාගේ අතිනුත් යමක් සිද්ධ වුණා. අධ්‍යාපන අමාත්‍යතුමාගේ අමාත්‍යාංශයෙනුත් යමක් සිද්ධ වුණා. හැබැයි, එහා පැත්තෙන් කථා කළා, “ළඟම පාසල හොඳම පාසල” කියන වැඩ සටහන ගැන. අකිල විරාජ් ගරු අධ්‍යාපන ඇමැතිතුමාට අපි කියනවා, මේවා තෝරාගත්තු ක්‍රමවේදය තමයි වැරැදි. ළමයි 250 ක් ඉන්න පාසල “ළඟම පාසල හොඳම පාසල” කියලා මහා පරිමාණයෙන් මුදල් වෙන් කරලා තිබෙනවා. මේවා මහා අවිධිමත් වැඩ පිළිවෙළවල්. මොකද හේතුව?

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කලාපවලින් තේරුවේ.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

කලාපවලින් තේරුවාට වැඩක් නැහැ. ඇමැතිතුමාට යුතුකමක් තිබෙනවා, ප්‍රදේශයේ ඉන්න දේශපාලන අධිකාරියත් එක්ක සම්බන්ධ වෙලා, මේවා හොයලා බලලා හරියට කරන්න. මොකද, ළමයින් 15, 20, 200, 300 ඉන්න පාසල්වලට මේ විධියට මුදල් වෙන් කරලා සංවර්ධනය කළත් මේ තිබෙන තත්ත්වයේමයි තිබෙන්නේ. ඒ නිසා අලුත් වැඩ පිළිවෙළකට යනවා නම් මේවා කරන්න මම හිතන්නේ වැඩ පිළිවෙළක් තිබෙන්න ඕනෑ. සාකච්ඡා මාර්ගයකට ගිහිල්ලා හරියට තොරතුරු ගන්න ඕනෑ. ඒ නිසා අපි ඉල්ලා සිටින්නේ, 2017 වසරේ පළාත් සභාව තුළ ගරු ප්‍රධාන ඇමැතිතුමා සහ අනිකුත් අමාත්‍යාංශ හතරෙන්ම අපට හරියාකාර ඉක්මන් සේවයක්

තමුන්නාන්සේලා තුළින් ලබා දෙන කොට නිලධාරී මට්ටමින් අපට ඒ ශක්තිය ලබා දෙන්නය කියලා තමුන්නාන්සේලාගෙන් ඉල්ලනවා.

ඒ වාගේම මතක්කරන්න ඕනෑ. මම ප්‍රශ්න කිහිපයක් අහලා ගරු ප්‍රධාන අමාත්‍යතුමා මට පිළිතුරු දුන්නා. මම වගකීමෙන් කියනවා, ඒ ප්‍රශ්නවලට පිළිතුරු දීලා තිබෙන්නේ, මහා පරිමාණයේ වංචනික විධියට. මේ අපේ ගරු මන්ත්‍රීතුමාත් කථා කළා. හැමදාම මන්ත්‍රීවරයෙක් ප්‍රශ්නයක් ඇහුවොත් පිළිතුරු දෙන්නේ වැරැදි විධියට. බොරු තොරතුරු දෙන්නේ. විමර්ශනයට ගිය නිලධාරීන් ජරාවට යට වෙලාද මම දන්නේ නැහැ, මේ වාගේ තොරතුරු දෙන්නේ කියන එක සම්බන්ධයෙන් මම ප්‍රකාශ කරනවා. මම ඉල්ලීමක් කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මන්ත්‍රීවරුන් පස් දෙනෙකුගෙන් යුත් කමිටුවක් යොදලා මේකට පරීක්ෂණයක් පවත්වන්න කියලා. එහෙම ඉල්ලා සිටිමින් මේ 2017 අයවැයට අපි අවශ්‍ය කරන සහයෝගය එක සිතින් ලබා දෙනවා කියලා ප්‍රකාශ කරමින්, එක්සත් ජාතික පක්ෂය එහා පැත්තේ ඉඳගෙන නිකන් සමහරවිට බොරු දේවල් කිව්වාට - අපි භය වෙන්නේ නැහැ. තමුන්නාන්සේට ආසනය නැති වුණු කොට අවසානයේ මේ පුටුවේ ඉඳගෙන -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මීළඟට ලලිත් වර්ණකුමාර ගරු මන්ත්‍රීතුමා, -

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

තව ටික දවසකින් කැලණියේ ඕකත් තමුන්නාන්සේට නැතිව යනවා කියලා මතක් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මීළඟට ලලිත් වර්ණකුමාර ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 8 ½ ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 11.15]

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙනවා. අද දිනයේ 2017 අයවැය වෙනුවෙන් පොදු සාකච්ඡාවට කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව සියලු දෙනාටම ස්තුතිවන්ත වෙනවා. මම හිතන්නේ පොදු සාකච්ඡාව තුළදී බස්නාහිර පළාත් සභාව ගැන විනාඩි 8 ½ ක් තුළ නම් මේ අවුරුදු ගණනක දේවල් කියන්න මදී. කෙසේ වෙතත් සියලු දෙනාටම හිමිවිය යුතුයි වචනයක් හරි කථා කරන්න. මම මේ පළාත් සභාවට පත් වුණු දෙවැනි වතාව. සමහර වෙලාවට තිබුණු මතත් එකක් ගොඩක් අය උත්සාහ කළා, පළාත් සභාව සුදු අලියෙක්ය කියලා මවා පාන්න. පෙන්නුම් කරන්න. නමුත් කෙසේ වෙතත් මම නම් දකිනවා, අපි පත් වුණු දවසේ සිට ගමේ ලොකු රාජකාරියක්, ලොකු වැඩ කොටසක් පළාත් සභා මන්ත්‍රීවරයෙක් හැටියට අපට කරන්න පුළුවන් වටපිටාවක් ගොනුගුණා. පළමුවැනි වතාවට අපි ප්‍රාදේශීය සභාව නියෝජනය කරලා, ඒ තුළින් පළාත් සභාවට ඇවිල්ලා පළාත් සභාවේ දෙවැනි වතාවටත් ජයග්‍රහණය කරන්න පුළුවන් වුණේ, ඒ ගෙන ගිය වැඩ පිළිවෙළ තුළයි. අපි විශේෂයෙන් මතක් කරනවා. සමහර වෙලාවට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට වැඩිය පළාත් සභාව තුළ වැඩි වැඩ කොටසක් කරපු මන්ත්‍රී කණ්ඩායමක් හැටියට පළාත් සභාවේ පක්ෂ විපක්ෂ සියලු දෙනාම මම හිතනවා ලොකු සේවාවක් කළා කියලා. සුදු අලියෙක් කියන කථාවට විතරක් සීමා වෙලා තිබුණත්, ප්‍රායෝගිකව එසේ නොවන ක්‍රමවේදයක් තුළ අපි කටයුතු කරමින් යන අතරේ - දැන් නම් ඇත්තටම අපට හිතෙනවා. මේක සුදු අලියෙක් බවට ප්‍රායෝගිකව පත් කරන්න වැඩ කටයුතු යොදාගෙන යනවාද කියන එක, මේ තිබෙන වැඩ පිළිවෙළත් එක්ක ඇත්තටම අපට හිතාගන්න අමාරුයි.

අද දිනෙන් දින ජනගහනය වැඩි වන කොට, ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 28% ක් ජනගහනය ඉන්න, මේ අඩුම බිම් ප්‍රමාණයක් තුළ වැඩිම ජනගහනය ඉන්න පළාත් සභාව හැටියට බස්නාහිර පළාත් සභාව දිනෙන් දින දියුණු වන කොට, දිනෙන් දින සංවර්ධනය අවශ්‍ය වන කොට මුදල් ප්‍රතිපාදනවලින් දිනෙන් දින අඩුවන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙලා තිබෙන්නේ. මේ අයවැයේත් මම හිතන්නේ අපට ගිය අවුරුද්දට දුන්නාට වැඩිය රුපියල්

[ගරු ලලිත් වර්ණකුමාර ]

මිලියන 9000 ක අඩුවක් අපට පෙන්නලා තිබෙනවා. ගිය අවුරුද්දට වැඩිය අඩුවක්. ගිය අවුරුද්දට වැඩිය වැඩිපුර දිය යුතු වකවානුවක් වන කොට ගිය අවුරුද්දටත් දුන්නාට වැඩිය මිලියන 9000 ක අඩුවක් වෙලා තිබෙනවා. ඒකේ වඩාත්ම භයානකකම තිබෙන්නේ රජ්‍ය සේවයේ නිලධාරීන් පළාත් සභාවේ 80,000 ක් විතර ඉන්න කොට ඒ අයගේ පඩිනඩි ගෙවන මුදල් ප්‍රතිපාදනත් මිලියන 6000 ක් වාගේ අඩු කරලා තිබෙනවා. එහෙමනම් මින් ඉදිරියට මේ පළාත් සභාවට මොකක්ද වෙන්නේ කියන එක ඇත්තටම අපට හිතාගන්නත් අමාරුයි. සංවර්ධන වැඩ පිළිවෙළට රුපියල් මිලියන 3000 ක් වාගේ අඩු වන කොට ඊළඟට මේ සේවකයින් අඩු කරන්නද කියන්නේ? එහෙම නැත්නම් ඉදිරියේදී සේවකයන් බඳවාගන්න ක්‍රමවේදයක් තිබෙනවාද? මේ අයගේ අතිකාල දීමනා, එහෙම නැත්නම් වෙනත් දීමනාවක් දීලා ඒ අයගෙන් ඒ සේවය ලබා ගන්න පුළුවන් හැකියාවක් ඉදිරියට තිබෙනවාද කියන එක මේ මුදල් ප්‍රතිපාදන අඩු කිරීම තුළ අපට ප්‍රශ්නයක් වෙනවා.

එහෙම කියලා සමහරක් අය කියනවා, පළාත් සභාව තුළින් මේ මුදල් ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා අපි ආදායම් උත්පාදනය කරන්න ඕනෑය කියලා. එහෙමනම් ආයේ මේ කොතැනටද එන්න හදන්නේ? ආපසු මේ රටේ ජනතාවට, මේ පළාතේ ජීවත්වන ජනතාවට ඔළුවට තව කුළුගෙඩි පහරක් අතහරින්න තමයි එන්නේ. ඉවරයක් නැතිව මේ බදු ක්‍රමය එනවා. තවත් මොනවා හරි පළාත් සභාවෙනුත් යොදවලා, ජනතාවගේ රීරිමාංශ ටික හූරලා, ජනතාවගෙන්ම යැපෙන ආයතනයක් බවට පත් කරන්න, ජනතාව බිමට සමතලා කරන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වන්නේ. ජනතාවට බදු ගහලා අපි බදු ගත්තාට කමක් නැහැ, ඒ අයටත් හරි යමක් හම්බ කරගන්න වටපිටාවක්, ඒ අයගේ අතමිට සරුවන වැඩ පිළිවෙළක් හඳුන්වා දීලා සංවර්ධනයක් කරා යනවා නම්, ඒ සංවර්ධනයට ඒ අයට දායක වන්න දීලා, ඒ තුළ රැකී රක්ෂා උත්පාදනය වෙලා ඒ ආකාරයට ඒ අයගේ අතමිට සරු වෙලා අපි ඒ අයගෙන් ගත්තාට කමක් නැහැ. නමුත් මෙලෝ දෙයක් නැතිව, මධ්‍යම රජයෙන් ගහන බදු ටිකත්, පළාත් සභාවෙනුත් මේ ආකාරයට බදු ගැහුවාම මේ ජනතාව ඔළුව උස්සන්නේ කොහොමද? මේ ජනතාවට තමන්ගේ පවුල ගෙනියන්න පුළුවන් වටපිටාවක් ගොඩනැගෙනවාද කියන එක මම අහන්න කැමැතියි. මොකද අපි රාජ්‍ය නිලධාරීන්ගෙන් ඒ සේවාව ගන්නේ බදු වැඩි කරගන්න කියමු කෝ. ඒ අය සේවයේ යොදන්න තිබෙන කාලසීමාවට ගෙවන්න තිබෙන මුදල් අඩු කරලා, බදු වැඩි කරන්න කියනවා. අපට හිතාගන්න බැහැ, මොකක්ද මේ කරන්නේ කියලා. ඒකයි මම කිව්වේ ඇත්තටම ප්‍රායෝගිකව සුදු අලියෙක් බවට පත් කරන්න හදනවා ද කියලා.

අපි දන්නවා, පසුගිය දිනවල උද්ඝෝෂණ ගොඩක් තිබුණා. මේ දඩ මුදල් ප්‍රශ්නය පිළිබඳව තිබුණා. රටේ නීතියක් තිබිය යුතුයි. රියැදුරන්ට නීතියක් තිබිය යුතු බව අපි දන්නවා. ඒක, තිබෙන නීතියත් එක්ක බැරි නම්, වෙනස් විය යුතුයි. ඒ දඩයට අවනත නැත්නම් පොඩි ගණනකට වෙනස් විය යුතුයි. නමුත් මේ රු.2500/- ක් වාගේ තිබුණු ගණනක් රු.25,000/- ක් කළාම - සමහරු පැදගෙන යන බයිසිකලය රුපියල් දහ පහළොස් දහක්වත් වටින්නේ නැහැ. බයිසිකලෙත් දීලා තව ගෙදරිනුත් රුපියල් දහ පහළොස් දාහක් ගෙනත් දෙන්න වෙන දඩ ක්‍රමයක් තමයි මේ හඳුන්වලා දීලා තිබෙන්නේ. ඒක මිනිහෙකුට ඔරොත්තු නොදෙන දෙයක්. විනයක් තිබිය යුතුයි. අපි ඒකට විරුද්ධ නැහැ. අනිවාර්යයෙන්ම විනයක් තිබිය යුතුයි. නැත්නම් මේ රටේ පාරක තොටක යන්න බැහැ. හැබැයි, රජයක් හැටියට එහෙම දඩ ගහනවා නම්, ඒ අයට වටපිටාව හරිගස්සලා දිය යුතුයි. දකුණු පැත්තෙන් යන කෙනා අලුත් වාහනයක් ගත්තොත්, එහෙම නැත්නම් සතියකට සැරයක් වාහනය පදවන මිනිහෙක් දකුණු පැත්තෙන් දාගෙන බොහොම හිමින් හිමින් යනවා. මොනවා හරි හදිස්සියකට වෙන්න පුළුවන්. ඊට වැඩිය පොඩ්ඩක් හයියෙන් යන කෙනා ආවාම යන්න ඉඩ නැත්නම් ඉඩ තිබෙන්නේ වම් පැත්තෙන් නම් එයින් ගිහිල්ලා රු.25,000/- ක් දෙන වැඩ පිළිවෙළක් තිබෙන්නේ. එවැනි වටපිටාවක් සකස් නොකර ඒ පහසුකම් නොදී ඒ විධියට ගිහිල්ලා රජයක් ගෙනියන්න මුදල්ම හොයනවා නම්, ජනතාවගේ යම්කිසි අඩුපාඩුවකින්ම මුදල් හොයනවා නම් අපි ඒකට විරුද්ධයි. ඒක තමයි අපට කියලා තිබෙන්නේ පළාත් සභාවේත් එහෙම කරන්න කියලා. කොහොම හරි මිනිස්සු තලලා පෙළලා අරගෙන මේ පළාත් සභාව තුළ ඒ විධියට වැඩ කටයුතු කරන්නය කියලා.

දැන් අපි ගණන් බැලුවාම ගිය අවුරුද්දේ එන්න තිබුණු මිලියන 5000 ක් තවම අපට දීලා නැහැ. අපට ලබන අවුරුද්දට තිබුණු ගණනෙන් මිලියන 9000 ක් අඩු වෙලා තිබෙනවා. පරිපූරකයක් කියලා අපි දාලා රුපියල් මිලියන හත් දහස් ගණනක් අධ්‍යාපනය සඳහා දෙනවයි

කිව්වා රුපියල් මිලියන 333 ක් පමණයි හම්බ වුණේ. ඒ අනුව අපට අතිවිශාල මුදලක්, මිලියන විසි දහස් ගණනක මුදලක් අපට හම්බ වෙන්න තිබෙන ඒවා නැති වෙලා තිබෙනවා.

ඇත්තටම පිරිවැටුම් බදු ගැන කථා කළා. ඒක ඇත්තටම අපට ලොකු පාඩුවක්. ඉස්සෙල්ලා රජයෙන් එහෙම වුණත් පාඩුවක් හැටියට වුණා නම් දැන් එහෙම නම් ඒක අරගන්න ඕනෑ. ඒ ආණ්ඩුව ගෙදර යැව්වේ ඒ වැරැදි නිසා වෙන්න ඇති. ඊට වඩා හොඳ ආණ්ඩුවක් ඇවිල්ලා, ඊට වඩා හොඳ වැඩ පිළිවෙළක් පෙන්නපු නිසා තමයි ආණ්ඩු වෙනස් කළේ. වෙනස් කළා නම්, ඒවා එතැනින් එහාට යා යුතුයි. දැන් අධ්‍යාපනය ගැන ගොඩක් අය කථා කළා. මිලියන 7000 ක් දෙනවා කිව්වා. මධ්‍යම රජයෙන් කියයි, අපි මෙන්න මෙච්චරක් සල්ලි දුන්නා. කෝ ඔයගොල්ලෝ පාසල් හැදුවාද? කවුරුත් කථා කරන්නේ නැහැ. පාසල් තෝරාගත්ත ක්‍රමය කොහොමද? පාසල් සංවර්ධනයට තෝරාගත්ත ක්‍රමය කොහොමද? ගොඩනැගිල්ල ඕනෑ තැනට මොනවාද දීලා තිබෙන්නේ? ගොඩනැගිල්ල ඕනෑ තැනට දීලා තිබෙනවා කැන්ටිමක්. තවත් ඊට වඩා අත්‍යවශ්‍ය දෙයක් ඕනෑ තැනට දීලා තිබෙනවා නිල නිවසක්. එහෙම නොවෙයි. මේ මිලියන 7000 නොවෙයි. ඔය කියන පාසල් පද්ධතිය තුළ A කියන ශ්‍රේණියේ පාසල් ටික විතරයි යම්කිසි විධියකට කලාපය හරහාවත් හරි විධියට තෝරා ගත්තේ. ABCD කියන කිසිම පාසලක් කිසිම කෙනෙක් බලන්නේවත් නැතිවයි තේරුවේ. ඒ තුළ ඒ සංවර්ධන වැඩ පිළිවෙළ සම්පූර්ණයෙන්ම අඩාලයි. රජයෙන් මොන විධියට දුන්නත්. පළාත් සභාවට සල්ලි දුන්නා කියලා රජය අත පිහදා ගනියි. නමුත් පළාත් සභාවේ ඒ දේ සිද්ධ වුණේ නැහැයි කියලා කියයි. මම අද අභියෝග කරනවා. මේ මුදල්වල මේ කියන ඇස්තමේන්තු හදලා ආපසු මාස දෙකක් යන කොට මොනතරම් කඩා වැටුණු වහළවල් තිබේද? දරුවන්ට පන්ති කාමර නැති වෙයිද කියලා බලන්න. ප්‍රායෝගික නැති වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක වන්නේ. කොහෙන් වෙනවාද කියන එක අපි දන්නේ නැහැ. මහජන නියෝජිතයන් වශයෙන් අපි ඉන්නවා. අපි ඒවාට සම්බන්ධ වුණා නම් - සමහරවිට හැමදාමත් ඒවාත් එක්ක ගැටෙන අය ඉන්නේ. ඒවාත් එක්ක සම්බන්ධ වුණා නම් අවශ්‍යතාවයන් තිබෙන පාසල් අපි දන්නවා. සමහර නිලධාරීන් ගොඩක් දෙනෙක් උනන්දුවෙන් කටයුතු කරන අතර උනන්දුව නැතිව මේවා කඩාකප්පල් කරන නිලධාරීන් කොටසකුත් ඉන්නවා කියන එක මතක් කරන්න ඕනෑ. ඒ තුළ තමයි මේ ආකාරයට වැඩ කටයුතු වන්නේ. ඉතින් ඒ නිසා අපි මේ පළාත් සභා හැමෝටම කරදරයක් වෙලා ඇති. පළාත් සභා මොන පක්ෂයේ වුණත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාට ප්‍රශ්නයක් ඇති. දැන් පළාත් පාලන ආයතන ටික නැතිව මේ රටේ ජනතාව දුක් විඳින හැටි අපි කවුරුත් දන්නවා. අද නිලධාරි වාදයක් තිබෙන්නේ. අවුරුදු ගණන් අවශ්‍යතාවයන් අනුව පොදු කොටස රැකගෙන හිටිය දේ අද ඒ ලේකම්ට ඕනෑ විධියට, ඒ නිලධාරියාට ඕනෑ විධියට ඒවා කපලා කොටලා විනාශ කරලා රටේ ජනතාවගේ සම්පත් සම්පූර්ණයෙන් නැති කරනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, කාලය අවසන්.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

කොච්චර වුණත් ඇත්තටම කාලය මදී. කෙසේ වෙතත් මධ්‍යම රජයෙන් මේ ගෙනෙන වැඩ පිළිවෙළ වක්‍රව ගේන්නේ, මේක ඕනෑ නැහැයි කියන එක - මේක ඕනෑ නැහැයි කියන්නේ ප්‍රතිපත්තියක් නිසා නොවෙයි. ඉන්න අයට පළාත් සභා මන්ත්‍රීවරු අභියෝගයක් වන නිසා වෙන්න ඇති මේක ඕනෑ නැහැයි කියලා අතපය බැඳලා දාන මට්ටමට ගේන්න හදන්නේ. ඒ වැඩ පිළිවෙළ තුළ තමයි දවසින් දවස ක්‍රියාත්මක වෙන්නේ කියන එක මතක් කරනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 11.24]

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විසි නව වන මුදල් ප්‍රකාශය සම්බන්ධයෙන් කථා කිරීමට අවස්ථාව ලබා දීම ගැන බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පරණ කථාවක් තිබෙනවා, ගමේ කට්ටිය එකතු වෙලා ගෙයක් ඇතුළේ ලොකු මේසයක් හැදුවාලු. හැබැයි, මේසය හදලා ඉවර වුණාම මේක එළියට ගන්න බැරි වුණාලු. හැබැයි මම කියන්න හදන්නේ ඒක නොවෙයි. මේක පිටිපස්සේ පොඩි සිද්ධාන්තයක් තිබෙනවා. මොකක්ද? අපි මොකක්ද කරන්න හදන්නේ කියලා

[ගරු සුසිල් කිඳෙල්පිටිය ]

ඉස්සෙල්ලා හිතන්න ඕනෑ. ඒ කියන්නේ, කරුණු සොයා බලන්න ඕනෑ. මේක ප්‍රතිපත්ති සම්පාදනයේ මූලධර්මයයි. දෙවැනි කාරණය තමයි, සියල්ලට පෙර හානියක් සිදුවීම වළක්වන්න ඕනෑ. දැන් මෙවර මුදල් ප්‍රකාශයෙන් ඉස්සෙල්ලාම බරපතළ හානියක් සිද්ධ කරලා තිබෙනවා. මේ හානිවන ක්‍රමය මම විස්තර කරලා පෙන්වන්නම්. අපි කොහේටද යන්නේ? අපි කොහේටද යන්න හදන්නේ? අපි මොකක්ද කරන්න හදන්නේ? පළමුවෙන්ම කියන්න ඕනෑ, ඒ පිළිබඳව පැහැදිලි චිත්‍රයක් මේ මුදල් ප්‍රකාශය තුළ නැහැ.

අපි නිෂ්පාදන ආර්ථිකයකට යන්න හදන රටක්. නමුත් අපි තවමත් ඒක කෙරෙහි අවධානය යොමු කරලා නැහැ. මේ පළාත් සභාවේ මුදල් ප්‍රකාශය ඇතුළේ ඒ අර්බුදය තිබෙනවා. අර ඇඩම් ස්මිත් කියලා තිබෙනවා, ආත්මාර්ථකාමය නැති වුණොත් ආහාර හා භාණ්ඩ නිෂ්පාදනය වෙන්නේ නැහැයි කියලා. අන්න ඒ වාගේ සංකල්පමය තැනකට යන්න අප අසමත් වෙලා තිබෙනවා. ඒකට අපට යන්න පුළුවන්. ඇයි? අපි ඉන්නේ විමධ්‍යගත කළ බලය ඇතුළේ. විමධ්‍යගත කළ බලය ඇතුළේ මේක යස අගේට ක්‍රියාත්මක කරන්න පුළුවන්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. නමුත් ඒක කරන්න අපි සමත් වෙලා නැහැ. මොකද, මධ්‍යම රජය විසින් අපට ආධාර දෙන කොට - මේ "ළඟම පාසල හොඳම පාසල" ගැන අපේ ගරු මන්ත්‍රීවරු කථා කළා. මධ්‍යම රජය විසින් අපට ආධාර ලබා දෙන කොට විමධ්‍යගත කරන බලය විසින් ඒක සාර්ථක ලෙස මෙහෙය විය යුතුයි. නිර්මාණශීලී ලෙස මෙහෙය විය යුතුයි. නමුත් ඒක සිද්ධ වෙලා නැහැයි කියන එක කියන්න ඕනෑ. අපි කරලා තිබෙන්නේ මොකක්ද? අපි අපේ වගකීම වෙනුවට අපි අපේ පෞද්ගලික න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කරලා තිබෙනවයි කියන එක තමයි අපට පෙනෙන්න තිබෙන්නේ. අපි අවශ්‍ය දේ කරලා නැහැ. පසුගිය වසර දෙස ආපසු හැරිලා බැලුවොත් අපි අවශ්‍ය දේ කරලා නැහැ. අරමුදල් ටික හරියට කළමනාකරණය කරලා නැහැ. අනවශ්‍ය දේශපාලන ඇඟිලි ගැසීම් කරලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ හානිය සිද්ධ වුණේ කොහොමද කියලා මම පැහැදිලි කරන්නම්. දැන් අපේ අමාත්‍යාංශ දිහා බැලුවොත් 2016 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය මෙන්න. ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රගතිය 45% යි. අපේ ලලිත් වනිගරත්න ගරු ප්‍රවාහන අමාත්‍යතුමාගේ මූල්‍ය ප්‍රගතිය 29% යි. සෞඛ්‍ය ගරු ඇමැතිතුමාගේ මූල්‍ය ප්‍රගතිය 16% යි. කෘෂිකර්ම ගරු ඇමැතිතුමාගේ මූල්‍ය ප්‍රගතිය 37% යි. රංජිත් සෝමවංශ අපේ ගරු අධ්‍යාපන ඇමැතිතුමාගේ මූල්‍ය ප්‍රගතිය 23% යි. සමස්තයක් විධියට ගත්තාම මුළු පළාත් සභාවේම මූල්‍ය ප්‍රගතිය කීයද? 25% යි.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

කවදා වෙනතුරුද? දිනේ කියන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

කියන්නම්, ගරු මන්ත්‍රීතුමා. 2016.10.31 වැනිදා වන කොට. ගිය අවුරුද්දේ ඒ කාලය වන කොට මූල්‍ය ප්‍රගතිය 40% ක් පෙන්නුවා. අවසානයේ 80% කට යන්න පුළුවන් වුණා. මම කියන්නේ මේ කාලය වන විට 40% ක් වත් පෙන්නුවේ නැතිව ඉදිරි මාස තුළ 80% ට, 85% ට, 90%, 100% ට යන්නේ කොහොමද කියන ප්‍රශ්නය ගොඩනැඟෙනවාද? නැද්ද? මම තව උදාහරණ කියන්නම්. මේ ප්‍රගතිය අඩුවෙන්ම පෙන්වන්නේ වැඩිම අරමුදල් ප්‍රමාණයක් වෙන් කරපු අමාත්‍යාංශ. මේ අමාත්‍යාංශ මොනවාද? මෙන්න බලන්න. සුමිත් ලාල් මැන්දිස් මැතිතුමාගේ සෞඛ්‍ය අමාත්‍යාංශය. මිලියන 1034 යි. රංජිත් සෝමවංශ අධ්‍යාපන අමාත්‍ය. මිලියන 1420 යි. අඩුම ප්‍රතිශතයක්. සෞඛ්‍ය 16% යි. අධ්‍යාපනය 23% යි. දැන් මේ වැඩිම මුදල් වෙන් කරපු අමාත්‍යාංශවල ප්‍රගතිය මේක නම්, දැන් මේ කියන්නේ මොකක්ද? මාධ්‍ය ගණනේ හැම තැනම ගිහිල්ලා ගරු මහ ඇමැතිතුමා කථා කරනවා. බිලියන 09 ක් කපලලු. බිලියන 09 ක් -

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

රට යනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

රට යන කථාව වෙන එකක් අපේ ගරු මන්ත්‍රීතුමා. බිලියන 09 ක් කපලලු. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ මූල්‍ය ප්‍රගතිය ඉතාම අසාර්ථකයි. මේකට මහ ඇමැතිතුමා සහ ගරු ඇමැතිවරු වග කියන්න ඕනෑ. මහ ඇමැතිතුමාට

පාලනයක් නැහැ. මොනවද වෙන්නේ කියලා ඇමැතිවරු දන්නේ නැහැ. ඉතින් කොහොමද මූල්‍ය ප්‍රගතියකට යන්නේ? ඒක නිසා තමයි මම කිව්වේ, අපි ඉස්සෙල්ලාම හානියක් කරගෙන ඉවරයි. ඒ හානියක් කරගෙන තමයි අපි 2017 වසරට යන්න හදන්නේ. දැන් බලන්න. එක එක චෝදනා ගෙනෙන්න පුළුවන්. දැන් අධ්‍යාපන ඇමැතිතුමාට කිව්වාම ගරු අධ්‍යාපන ඇමැතිතුමා කියනවා, අනේ "ළඟම පාසල හොඳම පාසල" ව්‍යාපෘතිය ආපු නිසා මොකුත් කරගන්න බැරි වුණා. සියලුම TO ලා ඒකට යවන්න වුණා. නිලධාරීන් ඔක්කොම යවන්න වුණා. හරි. මේ මාස හය නිලධාරීන් ඔක්කොම යැව්වා කියමු කෝ. ඒකේ සාර්ථකත්වයක් ළඟා කරගෙන තිබෙනවාද කියන්න කෝ? මධ්‍යම ආණ්ඩුවට චෝදනා කිරීමේ වැරැද්ද අපි අතේ. අපට බලය විමධ්‍යගත කරලා තිබෙන්නේ. ක්‍රියාත්මක බලධාරියා හැටියට අධ්‍යාපන අමාත්‍යාංශය පත් කරලා තිබෙන්නේ. මේකේ අකාර්යක්ෂමතාවය සත්‍ය වශයෙන්ම අපේ අමාත්‍යාංශවලයි. ඒ නිසා මේකට අපි වගකියන්න ඕනෑ.

අපේ ගරු මහ ඇමැතිතුමා මහා ලොකු විස්තරයක් මේකේ කියලා තිබෙනවා. හරියට විස්තර කරලා තිබෙනවා. ගැටලුම විතරයි. විසඳුම් නැහැ. මේ මුදල් ප්‍රකාශයේ විසඳුම් නැහැ. මම උදාහරණයක් කියන්නම්. ප්‍රතිඵල වැඩියි කියනවා. මදියි කියලා කියනවා. මම මිලියන 390 ක් වෙන් කළයි කියනවා. මම මිලියන මෙච්චරක් වෙන් කළා. හැබැයි, පළාතේ ළමයි කොච්චර ඉන්නවාද? පළාතේ ළමයින් හත් ලක්ෂ හතළිස් එක් දහස් නවසිය තිස් හතරක් ඉන්නවා. එක ළමයෙකුට කොපමණ ලැබෙනවාද කියලා මූලාසනයේ ගරු මන්ත්‍රීතුමනි පොඩ්ඩක් සොයලා බලන්න. මේවා මේ මැජික්. මෙහෙම පළාතක් පාලනය කරන්න බැහැ. මෙහෙම අධ්‍යාපනයේ ප්‍රතිඵල වැඩි කරන්නේ කොහොමද? අධ්‍යාපනයේ ප්‍රතිඵල වැඩි කරන්න පසුගිය අවුරුද්දේ කරපු ගුණාත්මක වැඩ සටහන් කියන්න බලන්න. එක වැඩ සටහනක් නැහැ. සමාවෙන්න. සමහර අපේ ගරු මන්ත්‍රීවරු මැදිහත් වෙලා ළමයින්ට දේශන කරලා, එහෙම කරපු දේවල් තිබෙනවා. පෞද්ගලික සල්ලිවලින්. ප්‍රතිඵල වැඩි කරන්න කරපු වැඩ සටහන් පෙන්වන්න කෝ? ලබන අවුරුද්දට පෙන්වන්න කෝ? උපාය උපායික මාර්ගික වැඩ සටහනක්, ප්‍රතිඵල වැඩි කරන්න Starategic plan එකක් පෙන්වන්න කෝ? මිලියන 390 ක් වෙන් කළා කියලා මේ කයිවාරු ගහනවා. මේ බලන්න. තව කථාවක් කියනවා. මොකක්ද මේ. සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත දියුණු කරන්න අත්යන්ත්‍ර ජේෂ කර්මාන්තය දියුණු කරන්න, එක ගෙයකට එක මැෂිම ගණනේ දෙනවාලු. අනේ මෙහෙම පුළුවන් නම් - ගිය අවුරුද්දේ අපි කිව්වා, අඩුම ගණනේ ස්වයං රැකියාවලට - මේ නැති මිනිස්සුන්ට කරන්නයි අපි යන්නේ. අපි කියනවා, නැති මිනිහාට භාගයක් දෙන්නය කියලා. අපි කිව්වා මේක නතර කරලා දෙන්නය කියලා. මේ සභාවේදීම ගරු මහ ඇමැතිතුමා පොරොන්දු වුණා, නතර කරලා දෙන්න. ඒක ගණනකට ගත්තේ නැහැ. අවුරුද්ද අවසානය වනතුරු නිකන් හිටියා. මූල්‍ය කොමිසමට යන්නේ කවුද? නිලධාරීන්. නිලධාරීන් ඉන්නේ කාගේ යටතේද? නිලධාරීන් ඉන්නේ මහ ඇමැති යටතේ. එහෙමනම් එතුමා නේ මේකට මැදිහත් වෙලා මේ ප්‍රශ්නය විසඳගන්න ඕනෑ. ඒක කළේ කවුද?

දැන් සංචාරක කර්මාන්තය දියුණු කරන්න යනවාලු. සංචාරක කර්මාන්තය දියුණු කරන්නේ කොහොමද? සංචාරක කර්මාන්තය දියුණු කරන්නේ පන්සල්වල ගිමන්හල් හදලා. මාර ෂෝක්. පන්සල්වල ගිමන්හල් හැදුවාම සංචාරක කර්මාන්තය දියුණු වෙනවාද? ගරු මහ ඇමැතිතුමා එකක් නම් කරන බව අපි දන්නවා. මොකක්ද? සංචාරක කර්මාන්තය දියුණු කරනවා කියලා ඔය හැම පන්සලකම අන්තිමට අර වාලම්පුරි විකුණන කඩයක් නම් දායි. මොකද යාළුවා වාලම්පුරි මුදලාලි නේ? සංචාරක අමාත්‍යාංශයට දාගෙන ඉන්නේ. හරිද?

**ගරු මොරිස් විජේරත්න**
Hon. Moris Vijerathne

එතුමා ඉන්න වෙලාවේ කියන්න එපැයි.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

එතුමා ඉන්න එපැයි. එතුමාට ඕනෑ වෙලාවට මට කථා කරන්න බැහැ. ඔබතුමාට කීයක් දුන්නාද? ඔබතුමාට ලොකු ගණනක් දීලා ඇති. මේ එතුමා ඉන්න වෙලාවට මට කථා කරන්න බැහැ. එතුමා සභාවේ ඉන්න ඕනෑ. එතුමා සභාවේ නැති එක මගේ ප්‍රශ්නයක්ද?

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කථා කරන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,

**ගරු සුමිත් ලාල් මැන්දිස් - අමාත්‍යතුමා**
Hon. Sumith Lal Mendis - Minister

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගැටලු කියලා වැඩක් නැහැ, ගැටලුවලට විසඳුම් නැත්නම්.

**ගරු සුමිත් ලාල් මැන්දිස් - අමාත්‍යතුමා**
Hon. Sumith Lal Mendis - Minister

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විනාඩියක් දෙන්න. ගරු ප්‍රධාන අමාත්‍යතුමා මෙතැන නැති වෙලාවේ එතුමාට ඔය කියන ඒවාට උත්තර දෙන්න විධියකුත් නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒක අදාළ නැහැ. ප්‍රධාන ඇමැතිතුමා මෙතැන ඉන්න දැනගන්න ඕනෑ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මේක මුදල් ප්‍රකාශය පිළිබඳ පොදු සාකච්ඡාව.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ප්‍රධාන ඇමැතිතුමා එනකන් ඉඳලා කථා කරන්න බැහැ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

අන්තිමේ මොකක්ද මේ කරන්න හදන්නේ?

**ගරු සුමිත් ලාල් මැන්දිස් - අමාත්‍යතුමා**
Hon. Sumith Lal Mendis - Minister

ගරු ප්‍රධාන ඇමැතිතුමා ඉන්න වෙලාවේ -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු ඇමැතිතුමා වාඩි වෙන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔබතුමාට මූල්‍ය ප්‍රගතිය 16% ට වැඩිය වැඩි කරගන්න බැරිව ගියා. ඔබතුමාගේ තමයි අඩුම මූල්‍ය ප්‍රගතිය තිබෙන්නේ. නිකන් මෙතැන ඇවිල්ලා කථා කරනවා.

**ගරු සුමිත් ලාල් මැන්දිස් - අමාත්‍යතුමා**
Hon. Sumith Lal Mendis - Minister

මූල්‍ය ප්‍රගතිය මම කියන්නම්. මම මාස 10 ට කරපු දේවල්.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔබතුමාගේ වෙලාවට කියන්න කෝ. මගේ වෙලාව කන්නේ නැතිව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා පොඩ්ඩක් ඉන්න. ගරු ඇමැතිතුමා, ගරු මහ ඇමැතිතුමා ඇතුළු ඇමැතිවරුන්ගේ වගකීම තමයි මේ වෙලාවේ සභාවේ රැඳී සිටීම. ඒ නිසා මන්ත්‍රීවරයා නොවෙයි වැරැදි. ඇමැතිවරුයි වැරැදි. ඒක නිසා මේ වේලාවේ මම සංවිධායකතුමාගෙන් ඉල්ලා සිටිනවා, ඇමැතිවරුන්ට මෙතැනට එන්න කියලා දැනුවත් කරන්න කියලා.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු මහ ඇමැතිතුමා පිටත්ව ගියේ තේ පානය සඳහා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රීති ප්‍රශ්නයක්. සුමිත්ලාල් මැන්දිස් ගරු ඇමැතිතුමා මේ සභාවේ සභා කටයුතු ඇමැතිවරයා හැටියට වැරැදි කාරණයක් කිව්වා. ඒ නිසා අපේ මන්ත්‍රී වරප්‍රසාද අහිමි වෙනවා වාගේම මේ අයවැය විවාදයේදී

අද ඉන්නේ එක ඇමැතිවරයයි. ඒ නිසා මන්ත්‍රී වරප්‍රසාද ආරක්ෂා කර ගැනීම සඳහා ඔබතුමාගේ කාර්යභාරය ඇමැතිවරු ගෙන්වා ගැනීම.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඇමැතිවරු දෙන්නෙක් ඉන්නවා.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ඇමැතිවරයෙකුට ශරීර කෘත්‍යයකටවත් යන්න බැරිද?

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ වෙලාව යනවා. ඒ නිසා ඔබතුමා කථා කරන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බෙහෙවින්ම ස්තූතියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සාධනීය පියවරක් ගැන මේ ප්‍රකාශයේ තිබෙනවා. මොකක්ද? ආදායම් වැඩි කිරීම පිළිබඳව මන්ත්‍රීවරුන්ගේ කමිටුවක් පත් කරන්න තීරණය කළා කියලා ගරු මහ ඇමැතිතුමා කියනවා. අපි ඒක අගය කරනවා. ඒත් එතුමාට වැඩ සටහනක් නැති බව පෙන්වන එක තැනක් මම කියන්නම්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා කියනවා,

*"ආදායම් විෂමතාවය සහ දරිද්‍රතාවය යන අභියෝග තවමත් අප හමුවේ පවතී. මෙම අභියෝග ජය ගැනීමට නම්, පළාතේ යම් ස්ථාන කොටස් වශයෙන් පවතින දිළිඳුබව මුලින්උපුටා දැමීමට අවශ්‍ය පියවර ගත යුතුය."*

බොහොම හොඳයි. ගත යුතුයි. හැබැයි, පළාතේ ප්‍රමුඛ ප්‍රශ්නය හඳුනාගෙන නැහැ. ප්‍රමුඛ ප්‍රශ්නය මොකක්ද? විරැකියාව. විසඳුම රැකියා උත්පාදනය. නිෂ්පාදන ආර්ථිකයක් කරා යන්න ඕනෑ. හැබැයි, අපේ ප්‍රාග්ධන වියදම දිහා හැරිලා බලන්න. ප්‍රාග්ධන වියදම කොපමණද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට පුනරාවර්තන වියදම් සඳහා රුපියල් මිලියන 54164 ක් හම්බ වෙනවා. ප්‍රාග්ධන වියදම රුපියල් මිලියන 7112 යි. මේ ප්‍රාග්ධන වියදම 11% යි. ඓතිහාසික අඩුවීමක්. අපි කරන්න තිබුණේ මොකක්ද? ප්‍රාග්ධන වියදම මීට වැඩිය වැඩි කරන්න තිබුණා. දරිද්‍රතාවය නැති කරන්න නම් අපි නිෂ්පාදන ආර්ථිකයකට යන්න ඕනෑ. මේක මේ ජනාධිපතිතුමාවත්, අගමැතිතුමාවත් කරන්න ඕනෑ වැඩක් නොවෙයි. 2010 සිට කළයි කියලා එතුමා කියනවා. 2010 සිට කළා නම්, මෙහෙම වන්නේ නැහැ. ඒ පරණ කරපුවා නොවෙයි. ජනාධිපතිතුමා කරපුවා නොවෙයි. එහෙම නැතිව අපේ ප්‍රසන්න මහ ඇමැතිතුමා කරපු නොවෙයි. එතුමා කරපුවා ගැන කථා කරන්න ඕනෑ. එතුමා කරන දේවල් ගැන කියන්න ඕනෑ. පසුගිය අවුරුද්දේ මොනවද කළේ කියලා කියන්න ඕනෑ. මේ එකක්වත් මේකේ නැහැ. මහ ආණ්ඩුවේ ටැබ් බෙදන එක මේකට දාගෙන හරි යන්නේ නැහැ. තමන් කරන්නේ මොකක්ද කියලා පැහැදිලිව කියන්න ඕනෑ. ප්‍රාග්ධන වියදම් අඩු කරලා නිෂ්පාදන ආර්ථිකයක් වෙනුවට, රැකියා උත්පාදනයට යනවා වෙනුවට, මේ සියල්ල ප්‍රශ්නාර්ථ බවට මහ ඇමැතිතුමා පත් කරලා තිබෙනවා. හැබැයි, එහෙම පත් කරන ගමන් කියන්නේ මොකක්ද? පරිපූරකයෙන් මිලියන 190 ක් වෙන් කරනවා. කාටද? ජීප් 04 කටයි. කාර් 02 කටයි. ප්‍රධාන ඇමැතිතුමා, සභාපතිතුමා, නියෝජ්‍ය සභාපතිතුමා කෘෂිකර්ම ඇමැතිතුමා සෞඛ්‍ය ඇමැතිතුමා, මාර්ග හා ප්‍රවාහන ඇමැතිතුමා. රුපියල් මිලියන 190 යි. හරිද? ජීප් එකක් මිලියන 31 යි. දැන් ප්‍රශ්න ගොඩක් තිබෙනවා. අපේ විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාත් කැරට් එකක් කෑවා. අපේ ගරු විපක්ෂ නායකතුමාත් කැරට් එකක් කෑවා. ධූරධාරීන්ට දෙන්නම් කිව්වා. අන්තිමට ධූරධාරීන්ට වැඩේ වෙනකන් දන්නේ නැහැ.ඒ අය මිලියන 190 ක් වෙන් කරගෙන ඒ අය වාහන ගෙන්න ගත්තා. මේක තමයි අර්බුදය.

ඒ නිසා මේ මධ්‍යම ආණ්ඩුවට, යූ.ඇන්.පී. එකට බොරුවට බැණලා මේ වෙන වෙන කතන්දර කියන්න එපා. තමන්ගේ වැඩෙත් කර ගත්තා නම් කට වහගෙන ඉන්න ඕනෑ. ඒකයි අපි කියන්නේ. ඒ නිසා දැන් ඒ ඔක්කොම වෙලා අන්තිමට වැඩේ වෙලා තිබෙන්නේ කාටද? මේ අහිංසක අපි මන්ත්‍රීවරුන්ට. ගිය අවුරුද්දේ දීපු මුදලවත් මේ සැරේ නැහැ. මොකද වෙලා තිබෙන්නේ? 2016 ගිය සැරේ අපට මන්ත්‍රී ප්‍රතිපාදන උපමාන පාදක මිලියන 460 ක් හම්බ වුණා. මේ සැරේ වෙලා තිබෙන්නේ මොකක්ද? මිලියන 254 ට ඒක බහිනවා. එක්කෙනකුට හම්බ වෙන්නේ කීයද? මන්ත්‍රීවරයෙකුට ලක්ෂ 24 යි හම්බ වෙන්නේ. මිලියන 2.4 යි. ඒ නිසා -

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

හොඳින් හිටියොත් 50 ක් දෙනවා කිව්වා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

හොඳ කථා වෙන එකක් නේ. ඒක තමයි මම කියන්නේ. මේක සීනි බෝල හෝටලේ වාගේ. මේකේ තිබෙන්නේ සීනියි, කැරටුයි. සීනි ඕනෑ අයට සීනි දෙනවා. කැරට් ඕනෑ අයට කැරට් දෙනවා. කට්ටිය එකක් කනවා. අනික් අය අනික් එක කනවා. කාල ඉවර වෙලා අර මොනවද කාපු රිලව් වගේ ඉන්නවා. හරිද? මෙතුමා මේ හැම තැනම මාධ්‍යයට ගිහින් කියනවා, මේකෙනම් තිබෙන්නේ "අයවැයෙන් වෙන් කළ රුපියල් මිලියන 09 යි" කියලා. ඒක වැරැදිලා. මම හිතන්නේ නැහැ එතුමා ගීතා කුමාරසිංහගේ මට්ටමට වැටෙයි කියලා. රුපියල් බිලියන 09 යි. මේ මොකක්ද කියන්නේ? එතුමා කියනවා, රුපියල් බිලියන 09 ක් කපලා. මේ අපට විතරක් නොවෙයි. සියලු පළාත් සභාවන්ට කපලා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

අපි දැනට මූල්‍ය ප්‍රගතිය පෙන්නලා තිබෙන්නේ 25% යි. අඩුම ගණනේ 50% ට යන්න බැරි වුණු මේ පළාත් සභාව කියනවා, රුපියල් බිලියන 09 ක් කපලා කියලා. එක අතකින් මුදල් ඇමැතිතුමා කියපු එක හරි. ඇයි? මෙච්චර සල්ලි මොකටද? මෙච්චර සල්ලි ඕනෑ නැහැ. ඒ නිසා බිලියන -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය අවසානයි.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු මන්ත්‍රීතුමනි, අවසන් කරන්නම්. ඒ නිසා අවසාන වශයෙන් මම කියන්නේ මේ බිලියන 09 යේ කථාව බොරුවක්. එහෙම නොවෙයි වෙලා තිබෙන්නේ. මම පැහැදිලි කරන්නම්. රජයේ ප්‍රදාන ගිය අවුරුද්දේ අපට රුපියල් මිලියන 21744 ක් දුන්නා. මේ සැරේ ඒක රුපියල් මිලියන 4867 ට බැහැලා තිබෙනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, දැන් ඔබතුමාගේ කාලය අවසානයි.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

එතැන මිලියන 6877 ක වෙනසක් තිබෙනවා. හැබැයි, ගිය අවුරුද්දේ මිලියන දෙදහස් ගණනක් වැඩිපුර දුන්නා ගුරුවරුන්ගේ හිඟ වැටුප් ගෙවන්න. එහෙමනම් මිලියන 4000 ක වෙනසක් එන්නේ. හැබැයි, ඒක අනික් පැත්තෙන් Balance වෙනවා. ඒක Balance වෙන්නේ කොහොමද? ගිය සැරේ අපට NBT එකෙන් ලැබුණු මුදල 4512 කින් වැඩි කරලා තිබෙනවා. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

විනාඩි දෙකක කාලයක් ලබා දෙනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

තව විනාඩි දෙකක් තිබෙනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

සංවිධායකතුමනි, බොහොම ස්තුතියි. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට NBT එක හරහා බස්නාහිර පළාත් සභාවට ලැබෙන 48% වැඩි කරලා තිබෙනවා.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

තමුන්නාන්සේ මේ අයවැයට විරුද්ධද?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඒකෙන් අපට මිලියන 4512 ක් ඇවිල්ලා. එතකොට සම්පූර්ණ වෙනස, අපට නොලැබී යනවා නම් නොලැබී යන්නේ මිලියන 2365 යි. භාණ්ඩාගාරයේ නිලධාරීන්ගෙන් අහන්න. එහෙමනම් භාණ්ඩාගාරයේ නිලධාරීන් බොරු කියන්න ඕනෑ. එහෙමනම් අපට නොලැබී යන්නේ මිලියන 2365 යි. මම අහනවා. මූල්‍ය ප්‍රගතිය 25% ක් පෙන්නලා සල්ලි ටික ආපසු යන්න ඇරලද මේ ඇමැතිවරු මුදල් ලැබුණේ නැහැයි කියන්නේ. ඒ නිසා මම විශ්වාස කරනවා. ලබන අවුරුද්දෙත් මේ විධියටම පෙන්වන්නම්. අඩුවෙන් දුන්නත් ඔය ටිකවත් මේ ගරු මහ ඇමැතිතුමා සහ ඇමැතිවරු වියදම් කරන්නේ නැහැයි කියන එක මම දැඩි ලෙස කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වෙලා තිබෙන්නේ මොකක්ද? මේ වෙලා තිබෙන එක හරි සරලයි. දුන්න සල්ලි ටික වියදම් කළේ නැත්නම්, නිර්මාණශීලී වැඩ පිළිවෙළක් නැත්නම්, පැහැදිලි ගමනක් මේ පළාත් සභාවට නැත්නම්, ආදායම් උත්පාදනය කිරීමේ වැඩ පිළිවෙළක් මේ පළාත් සභාවට නැත්නම් සල්ලි කපන එක අහන්න දෙයක් නැහැ. සල්ලි කැපෙනවා. සල්ලි කපනවා. ඇයි? එක පැත්තකින් සල්ලි උත්පාදනය කරන්නේ නැහැ. ඒකට වැඩ පිළිවෙළක් හදන්නේ නැහැ. බොරුවට කියනවා, නිකන් කමිටු පත් කරනවා කියලා. ආදායම වැඩි කරගන්න මෙපමණ කල් ගත්ත ක්‍රියාමාර්ග මොනවාද? පසුගිය අවුරුද්ද ඇතුළේ ආදායම වැඩි කරගන්න ගත්ත ක්‍රියා මාර්ග මොනවාද? මේ අයවැය ලේඛනයේ අරමුදල් වැඩි කරගන්න, ආදයම වැඩි කරගන්න අරගෙන තිබෙන පියවර මොනවාද? ඒ එකක්වත් මේ ගරු මහ ඇමැතිතුමාට නැහැ. අන්තිමේදී හැබැයි එළියට ගිහින් කියන්නේ මොකක්ද? එළියට ගිහින් කියනවා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අය මේ එකමුතුකම, මේ එකඟතාවය ජාතික ආණ්ඩුව රකින්න කථා කරනවා. හැබැයි, එක්සත් ජාතික පක්ෂය එතැන නැහැ. අද මේ රටේ යහපාලනයක් ක්‍රියාත්මක වන්නේ නැහැ. මෙතුමා මහ ඇමැති වුණේ කොහොමද කියලා, මේ ඇමැතිවරු ඇමැතිවරු වුණේ කොහොමද කියලා දන්නේ නැහැ. මෙතුමන්ලා අමතක කරපු කාරණය මම කියන්නම්. ජනාධිපතිතුමා, ජනාධිපති වුණේ එක්සත් ජාතික පක්ෂය නිසයි. ඒක පිළිගන්න. ඒ විතරක් නොවෙයි, එක්සත් ජාතික පක්ෂය නොසිටියා නම් මේ මහ ඇමැති ඉන්නවාද? එක්සත් ජාතික පක්ෂය නොසිටියා නම් මේ මහ ඇමැති ලොවෙත් නැහැ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ලොව් ගහෙත් නැහැ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ලොව් ගහෙත් නැහැ. ඇත්ත කථාව පිළිගන්න. මේ අමතක වුණු සත්‍යය. ඒ නිසා අපි කියන්නේ (බාධා කිරීම්)

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, කාලය අවසානයි.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඊළඟට ගිහින් කියනවා, ජනාධිපතිතුමාට මූල්‍ය බලය ගන්නලු. දේශපාලන අ යන්න ආ යන්වත් තේරෙන්නේ නැහැ. මූල්‍ය බලය කොහේද ජනාධිපති ගන්නේ? මූල්‍ය බලය හිමි පාර්ලිමේන්තුවටයි. ඒ කියන්නේ මෛත්‍රීපාල ජනාධිපතිතුමාව ඒකාධිපතියෙක් කරන්න මෙතුමා හදනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා වාඩි වෙන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මෛත්‍රීපාල ජනාධිපතිතුමාව ඒකාධිපතියෙක් කරන්න මේ මහ ඇමැතිතුමා හදනවා. ඒ නිසා අවසාන වශයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි කියන්නේ. අපි මේ විවේචන - අපේ ලක්ෂ්මන් නිපුණආරච්චි ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ මේවා ධනාත්මකව ගන්න. අඩුපාඩු හදාගන්න. මේ ඔබතුමන්ලාව පරාජය කරන්න නොවෙයි කියන්නේ. එතුමාට යහපාලනය ගැන අවබෝධයක් නැති වුණාට, මාධ්‍යයට ගිහින් යහපාලනයක් නැහැයි කිව්වට, අපි යහපාලනයට තවදුරටත් උදව් කරනවා. අපි යහපාලනය වෙනුවෙන් තවදුරටත් පෙනී සිටිනවා. ඒ නිසා එතුමා එළවන්න නෙවෙයි හදන්නේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, වාඩි වෙන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මේවා ධනාත්මකව අරගෙන -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

අයවැයට විරුද්ධද?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මේ පළාත් සභාව යහපත සඳහා ක්‍රියාත්මක වන පළාත් සභාවක් බවට පත් කරන්නය කියලා ඉල්ලමින් මගේ කථාව අවසන් කරනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා, කාලය අවසානයි. බොහොම පොඩි වෙලාවයි තිබෙන්නේ. නීල් සුනේත්‍රලාල් ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මහ ඇමැතිතුමා තේ බොන්න ගිහිල්ලා තිබෙනවා. තේ බීලා පුළුවන් තරම් ඉක්මණට මෙතැනට එනවා කියලා පණිවුඩයක් දීලා තිබෙනවා.

[පූ.භා. 11.45]

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොම ස්තුතිවන්ත වෙනවා. මෙම අයවැය විවාදයේදී -

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාට පොඩි ඌණ පූර්ණයක්. ෆොන්සේකා මැතිතුමාවත් සිහිපත් කළා නම් හොඳයි ජනාධිපතිතුමාගේ ජයග්‍රහණයට.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මට මේ අයවැය විවාදයේදී වචන කිහිපයක් ප්‍රකාශ කරන්න අවස්ථාවක් සලසා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා හරි වෙනසකට භාජනය වෙලා තිබෙනවා වාගේ කියලා මට පේනවා. ඒ කාලේ ගරු මහ ඇමැතිතුමා එක්ක හොඳට කිරි පැණියට හිටියා. අද මොකක් වෙලාද දන්නේ නැහැ. මම හිතන්නේ අර කොරියන් ගිහිල්ලා ආවාට පස්සේ තමයි මේ ප්‍රශ්නය වුණේ. ඒක අපි දන්නේ නැහැ. අපි කථා කරන්නම්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අයවැය ලේඛනයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමා අතිවිශාල වැඩ කොටසක් කරන්න, එතුමා 2017 වර්ෂය වෙනුවෙන් අපේ බස්නාහිර පළාත් සභාව තුළ ජීවත්වන මිලියන 05 කට වැඩි ජනතාව වෙනුවෙන් විශේෂ පරිශ්‍රමයක් මේ අයවැය තුළින් දරලා තිබෙනවා. අපට ඒක විද්‍යාමාන වෙනවා. අයවැය ලේඛනයේ මුදල් සාරාංශය තුළින් ලබන වර්ෂයේ අපේ පළාතේ ජනතාව වෙනුවෙන් අතිවිශාල වැඩ කොටසක් කරන්න එතුමා තුළ යම් සූදානමක් තිබෙනවා. අපි ඒ පිළිබඳව එතුමාට ස්තුතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ කෙසේ වුවත් මම හිතන්නේ ලබන 2017 වර්ෂය අපි කියන තරම් සුන්දර වර්ෂයක් නොවෙයි. අපට මධ්‍යම රජයෙන් ලබා දෙන මුදල් මම හිතන්නේ මිලියන 9327 කට වැඩි මුදලක් 2016 වර්ෂයට වැඩිය කපා හැරලා තිබෙනවා. අද මේ පිළිබඳව මුදල් අමාත්‍යවරයාගේ ප්‍රකාශය, ඇත්ත වශයෙන්ම පළාත් සභාවල සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාට එතුමා නිග්‍රහයක් කළා. එතුමා කිව්වා, මේ පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ නාස්තිය.

පළාත් සභාවල තිබෙන නාස්තිය නිසයි අද මේ තත්ත්වය ඇති වෙලා තිබෙන්නේ. ඒකයි අපි මුදල් කපා හැරියේ කියලා. මේ පළාත් සභා මන්ත්‍රීවරු අනවශ්‍ය ලෙස විදේශගත වෙනවා. රුසියාව, ඊළඟට චීනය, මේ වාගේ රටවල්වලට අපෙන් අවසරය නැතිව යනවා. අපි මේ ප්‍රකාශය හෙළා දකිනවා. ඒක නොවෙයි මේ සිද්ධ වුණේ. මේ සිද්ධ වුණේ වැඩපුර පළාත් සභා සංඛ්‍යාවක් තිබෙන්නේ, අපේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය යටතේ. උතුරු, නැගෙනහිර පළාත් සභා හැර. ඒ නිසා එතුමන්ලා කැමැති නැහැ, පළාත් සභා මන්ත්‍රීවරු වැඩ කරනවාට. එතුමන්ලා කැමැති නැහැ. මේකෙනුත් වැඩි පිරිසක් මහින්ද රාජපක්ෂ මැතිතුමාත් එක්ක ඉන්න බහුතර මන්ත්‍රී සංඛ්‍යාව අද මුළු ලංකාවේ පළාත් සභාවලම ඉන්නේ. ඉතින් ඒ නිසා මේ කරුණු හේතු මත තමයි මේ පළාත් සභාවට දෙන මුදල් අද විශාල වශයෙන් කපා හැරලා තිබෙන්නේ. විශේෂයෙන් පුනරාවර්තන වියදම් පවා. එදා 2016 වර්ෂයේ මිලියන 21743 ක් දුන්නු පුනරාවර්තන වියදම් 2017 වර්ෂයේ මිලියන 14866 කට අඩු කරලා තිබෙනවා. ඒකේ වෙනස වන මිලියන 6877 ක් මේ සැරේ කපලා දාලා තිබෙනවා. ඒ වාගේම පළාත් නිශ්චිත කාර්යය ප්‍රදාන වලින් මිලියන 2160 ක් කපලා දාලා තිබෙනවා. ඒ වාගේම විශේෂ ප්‍රදාන යටතේ මිලියන 116 කුත්, උපමාන පාදක වැඩ සටහන් යටතේ මිලියන 206 කුත් වශයෙන් රජයෙන් ලැබෙන මුදල් රුපියල් මිලියන 9327 ක් කපා හැරලා තිබෙනවා. ඒ නිසා මම හිතන්නේ ඉදිරියේදී පළාත් සභාවේ අපට කටයුතු කිරීමේදී ඉතා දුෂ්කරතාවයකට පත් වෙනවා. මේ නිලධාරීන් මේ ලේකම්වරු ඉතා දුෂ්කරතාවයකට පත් වෙලා ඉන්නවා. 2017 වර්ෂයේ අපි කොහොමද වැඩ කරන්නේ?මහජනතාවට සේවය කරන්නේ කොහොමද? අපේ වැඩ පිළිවෙළ ඉදිරියට ක්‍රියාත්මක කරන්නේ කොහොමද? කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා ඉතා කනගාටුදායක තත්ත්වයක්. අපි මේ පිළිබඳව විශේෂයෙන්ම අද මුදල් අමාත්‍යවරයා නාස්තිය ගැන කථා කරනවා. අද රාජ්‍ය ඇමැතිවරුන්ට වාහන ගෙන්වන්න රුපියල් 79 කෝටියක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම දැනට කෘෂිකර්ම අමාත්‍යාංශයේ ගත්තු ගොඩනැගිල්ලට වසර දෙකක් සඳහා අත්තිකාරම් යටතේ කුළිය ලෙස දෙකෝටියක් අරගෙන තිබෙනවා. මේවා මුදල් නාස්තියක් නොවේද? අපිද පළාත් සභාවේ නාස්ති කරන්නේ? ඉතින් මේ වාගේ නාස්තිකාර දේවල් වන්නේ මධ්‍යම රජයෙන්. එහෙම තිබෙද්දී අපේ මුදල් ටික කපා හැරලා තිබෙනවා. ඒ වාගේම විශේෂයෙන්ම අපි ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ස්තුතිවන්ත වෙනවා. එතුමා අධ්‍යාපනය වෙනුවෙන් අතිවිශාල මුදලක්, 2017 වර්ෂයට රුපියල් මිලියන 22671 ක මුදලක් වෙන් කරලා තිබෙනවා. ඒක 2016 වර්ෂයට වඩා අඩු මුදලක්. මේ මධ්‍යම රජයේ මුදල් කපා හැරපු නිසා තමයි ඒ තත්ත්වය ඇති වෙලා තිබෙන්නේ. ඒ වාගේම ගරු ප්‍රධාන අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය යටතේ රුපියල් මිලියන 22095 ක් වෙන් කරලා තිබෙනවා. ඒකත් ගිය වර්ෂයට වඩා රුපියල් මිලියන 1179 ක අඩු වීමක්. (බාධා කිරීමක්) ඒ වාගේම 2016 වර්ෂයේ රුපියල් මිලියන 13293 ක් වෙන් කරලා තිබෙනවා. මේ අවුරුද්දේ මිලියන 12818 ක් වෙන් කරලා තිබෙනවා. ඒ සම්බන්ධව අපි ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ නිසා විශේෂයෙන්ම -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

අධ්‍යාපනය ගැන කියන්න කෝ?

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

අධ්‍යාපනය වෙනුවෙන් අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා වැඩිම මුදලක් වෙන් කරලා තිබෙනවා. අපි ඒ පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම අපි මේ අවස්ථාවේ මතක් කරන්න ඕනෑ. 2015.12.30 දිනැති 2016/01 මුදල් කොමිසමේ චක්‍රලේඛය අනුව පසුගිය වසරේ අපට වැඩ කරන්න ඉතාමත් අමාරු වුණා. අපි ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ස්තුතිවන්ත වෙනවා. එදා ත්‍රිකුණාමලයේ රැස්වීමේදී එතුමා පියවර හතක් අරගෙන තිබෙනවා. පළාත් සංවර්ධන ප්‍රදාන යටතේ ඒ සියලු චක්‍රලේඛ ඉවත් කරලා, මහජනතාවට අවශ්‍ය කටයුතු කරන්න. මම හිතන්නේ මුදල් කොමිසමේ ඉන්න නිලධාරීන් මේ පිළිබඳව දන්නේ නැහැ. ටෙන්ඩර් එහෙකට රුපියල් 30,000/- ක මුදලක් දෙන්නේ. අද වැට් බද්දත් එක්ක මේවා කරන්න පුළුවන්ද? පොකුණක් හදන්න රුපියල් තිස්දාහයි. ඒ වාගේ චක්‍රලේඛ ගහලා තිබුණා. මම හිතනවා, ඒවා ඉදිරියේදී වෙනස් වෙලා මහජනතාවට සේවයක් කරන්න අපට අවස්ථාවක් ලැබෙයි කියලා, අපි විශ්වාස කරනවා.

[ ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු ]

ඒ වාගේම විශේෂයෙන්ම අද පළාත් පාලන ආයතන ගැන අපේ ගරු මන්ත්‍රීවරු කථා කළා. පළාත් පාලන ආයතනයක සභාපතිවරයෙක් වශයෙන්, පානදුර ප්‍රාදේශීය සභාවේ වසර 09 ක් මම සභාපතිවරයෙක් වශයෙන් කටයුතු කළා. මම හිතන්නේ අද තිබෙන්නේ ඉතාමත්ම කනගාටුදායක තත්ත්වයක්. මුළු ලංකාවේම පළාත් පාලන ආයතනවල තිබෙන්නේ මේ තත්ත්වය. මම හිතන්නේ ඉතා ඉක්මණින් මේකට විසඳුමක් ලබා නොදුන්නොත් පළාත් පාලන ආයතන සියල්ල කඩා වැටෙන තත්ත්වයකට පත් වෙලා තිබෙන්නේ. මේ ඡන්දය තවමත් පෙනෙන තෙක් මානයක නැහැ. ඒ නිසා අද පළාත් පාලන ආයතන නිලධාරීවාදයට යට වෙලා. එතුමන්ලාට අවශ්‍ය කරන පරිදි තමයි කටයුතු කරන්නේ. මහජනතාවට සේවයක්, කිසිම දෙයක් කෙරෙන්නේ නැහැ. අද සැලසුමක් අනුමත කරගන්න මාස තුනකට වැඩි කාලයක් යනවා. වීදි ලාම්පුවක් හදාගන්න විධියක් නැහැ. ඒ වාගේම පාරේ හැම තැනම කුණු. ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කිසිම අයුරකින් නිසි පරිදි සිදු වන්නේ නැහැ. මහජනතාවගේ සියලුම මූලික අයිතිවාසිකම් පළාත් පාලන ආයතනවලින් අහිමි කරලා තිබෙන්නේ. ඒ පිළිබඳව අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා. ඒ වාගේම ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඉදිරිපත් කරන ලද මේ අයවැය ලේඛනයට මගේ සම්පූර්ණ සහයෝගය ලබා දෙන බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි.

[පූ.භා. 11.54]

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යහපාලන ආණ්ඩුව යටතේ ඉදිරිපත් කරන දෙවැනි අයවැය අද ඉදිරිපත් වෙන්නේ. රටේ ජාතීන් අතර, ආගම් අතර වෛරය, ක්‍රෝධය වපුරමින් එකිනෙකා බෙදලා වෙන් කරලා, ඒ තුළින් තමන්ගේ දේශපාලන බලය රඳවා ගනිමින් ඒ බලය පාවිච්චි කරලා, රටේ මහජන මුදල් තමන්ගේ හිතු මනාපෙට කොල්ල කන්න පාර හදාගත්තු ජාතිවාදීන්ගේ සහ අන්තවාදීන්ගේ අතකොලු බවට පත් වුණු ආණ්ඩුවක් යටතේ දවසින් දවස ලෝකයෙන් ඈත් වෙමින් තවත් සෝමාලියාවක්, ඉතියෝපියාවක්, මියන්මාරයක් බවට පත් වෙමින් තිබුණු රටක් ටික දෙනෙක් වෙනුවෙන් පමණක් සංවර්ධනය වූ ඒ අපේ රට එම තත්ත්වයෙන් මුදවාගෙන සියලු ජාතීන් අතර සමගිය, එකමුතුකම ඇති කරලා ඔවුන්ගේ සිත්වල තිබුණු සැකය, අවිශ්වාසය දුරුකරලා අපි ශ්‍රී ලාංකිකයෝ කියන හැඟීමෙන් එකට එකතු කරපු යහපාලනය යටතේ අපේ පළාත් සභාවේ ඉදිරිපත් වන දෙවැනි අයවැය ගැන කථා කරන්න ලැබීම ගැන මම සතුටු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළාත් සභාව කියන්නේ ජාතීන් අතර වූ ගැටලුවලට එනම් ජනවාර්ගික ගැටලුවලට පිළිතුරක් ලෙස පිහිට වූ ව්‍යවස්ථාදායක ආයතනයකි. ඇත්ත වශයෙන්ම පළාත් සභාවක් වශයෙන් පසුගිය වසර 30 ක කාලයක් තුළ පළාත් සභාව පිහිටුවීමෙන් බලාපොරොත්තු වූ සැබෑ සංහිඳියාව ඇත්තටම යථාර්ථයක් වෙලා තිබෙන්නේ මේ යහපාලන ආණ්ඩුව යටතේ කියලයි මම හිතන්නේ. මොකද, අද ජාතිවාදයට ඉඩ නැහැ. අද ආගම් වාදයට හෝ අන්තවාදයට ඉඩ නැහැ. අද සියලු ජාතීන්ට එක වාගේ සලකන, සියලු ආගමිකයන්ට සමානව සලකන, නීතිය හැමෝටම එකවාගේ ක්‍රියා කරන යුගයක් මේ රටේ ඇති කරලා තිබෙනවා. අද සුළුජාතීන්ට සුදුසු තැන දෙන කොට ආගම ජාතිය හරස් වෙලා නැහැ. ඒ නිසා තමයි යහපාලන ආණ්ඩුවේ මහ බැංකුවේ අධිපතිවරයා, අගවිනිසුරුවරයා විතරක් නොවෙයි. අපේ බස්නාහිර පළාත් සභාවේ ආණ්ඩුකාරවරයා සුළු ජාතිකයෙක් වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළාත් සභාවේ අයවැයක් කියන්නේ, මධ්‍යම ආණ්ඩුවේ දේශපාලන ගමන් මඟින් අයින් වූ තනි ඉලක්කම් ටිකක් නොවෙයි. පළාත් සභාව හැම විටම මධ්‍යම ආණ්ඩුවත් එක්ක එකට ගමන් කළ යුතුයි. මධ්‍යම ආණ්ඩුවේ ඉලක්කවලට සහාය දැක් විය යුතුයි. ඒක තමයි පළාත් සභාවක් හැටියට අපේ වගකීම විය යුත්තේ කියලයි මම හිතන්නේ. විශේෂයෙන් යහපාලන ආණ්ඩුවේ බලාපොරොත්තු ඉටු වන ආකාරයට, යහපාලනයේ ප්‍රතිලාභ සාමාන්‍ය මිනිස්සුන්ට ලැබෙන ආකාරයට හරියටම කියනවා නම්, යහපාලනය මිනිස්සුන්ගේ ඇඟට දැනෙන ආකාරයට අපේ පළාත් සභාවේ අරමුණ ස්ථාපිත කරන්න ඕනෑ. එතකොට තමයි පළාත් සභා පිහිටුවීමේ සැබෑ අරමුණ, පසු වෙලා හරි අපේ අතින් ඉටු වුණා වන්නේ. එහෙම නොවුණොත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළාත් සභාව සුදු අලියෙක් කියලා අදත් සමාජ ගත වෙලා තිබෙන්නේ. එය තහවුරු කරන්න අපත් කටයුතු කළා වාගේ වෙයි.

2017 වර්ෂයට අදාළ අපේ පළාත් සභාවේ මුළු වියදම වන රුපියල් මිලියන 61276 න්, රුපියල් මිලියන 54164 ක්ම, ඒ කියන්නේ 88% ක්ම තිබෙන්නේ පුනරාවර්තන වියදමටයි.

මේක හැමදාම පැවැතුණු පොදු තත්ත්වයක්. ඒකෙන් අදහස් වන්නේ පළාත් සභාවෙන් මේ රටේ බලාපොරොත්තු වන්නේ සංවර්ධයේ කාර්ය භාරයයි. වඩා මධ්‍යම ආණ්ඩුවේ ඉලක්කවලට අනුව පළාත් නියෝජිතයන් කටයුතු කරමින් එම පළාතේ විවිධත්වය නියෝජනය කරමින් ලබා දෙන සහයෝගීය පරිපාලන යයි. ඒ නිසා තමයි මම කිව්වේ, අපි මධ්‍යම ආණ්ඩුවේ ඉලක්කත් එක්ක එකට ගමන් කළ යුතුයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය වසර 10 ක් තිස්සේ රට ණය උගුලකට හිර කරලා. භාණ්ඩාගාරය හිස් කරලා. ආදායම් මාර්ගය වනසලා. මේ රටට කරලා තිබෙන විනාශයේ ප්‍රතිඵලයක් විධියට මේ පාර අපේ පළාත් සභාවටත් රජයෙන් ලැබෙන පුනරාවර්තන ප්‍රදාන 30% කින් විතරක් පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන සහ උපමාන පාදක ප්‍රදාන අපේ මධ්‍යම ආණ්ඩුවෙන් අඩු කරලයි තිබෙන්නේ. හැබැයි, ඒත් එක්කම 2014 වර්ෂයට අදාළව යහපාලන ආණ්ඩුවේ අයවැය මගින් විශේෂ ප්‍රාග්ධන යෝජනා සඳහා රුපියල් මිලියන එක් ලක්ෂ තිස් නව දහස් නවසිය පහක් වෙන් කරලා තිබෙනවා. ඒකෙන් රුපියල් මිලියන 5000 ක් A/L ළමයින්ට ටැප් දෙන්නත් තවත් මිලියන 5000 ක් පාසල්වලට කොම්පියුටර් ලබා දෙන්නත්, තවත් මිලියන 15000 ක් ආර්ථිකය ඩිජිටල් කරන්නත් වෙන් කරලා තිබෙන්නේ. එම යෝජනාවල වැඩිම ප්‍රතිලාභය ලැබෙන්නේ අපේ පළාතේ ජනතාවට බවත් අපේ ගරු මහ ඇමැතිතුමාගේ අයවැය කථාවේදී කිව්වා. අපි බොහොම සතුටු වෙනවා.

ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ යෝජනාවලට සැබෑ ප්‍රතිඵලයක් අපේ සාමාන්‍ය ජනතාවට නියම විධියට ලැබෙන්න වැඩ පිළිවෙළක් සැකසීමේදී පළාත් සභාව වශයෙන් අපට ලොකු කාර්ය භාරයක් පැවරිලා තිබෙනවා කියලා මම කල්පනා කරනවා. ඒ සම්බන්ධයෙන් අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා දක්වන උනන්දුව ඇත්තටම අගය කළ යුතුයි. එතුමා ඒ සම්බන්ධයෙන් වන උනන්දුව ඉදිරි වර්ෂය සඳහා වූ එතුමාගේ යෝජනා මගින් අපට බොහොම පැහැදිලි වෙනවා. ඒ ප්‍රතිපාදනවලින් උපරිම ප්‍රයෝජනය ගන්න ගමන් දැනට අපට තිබෙන ආදයම් මාර්ග නිසි ලෙස විධිමත් කර, ආදායම් වැඩි කර ගැනීම සඳහා එතුමා දියත් කරන්න හදන වැඩ පිළිවෙළ ප්‍රශංසනීයයි. දිළිඳු බව පිටු දැකීමේ වර්ෂය ලෙස නම් කර ඇති 2017 වර්ෂයේදී ඇති නැති පරතරය අඩු කරලා, සැමට සංවර්ධනය ළඟා කර දෙන මධ්‍යම රජයේ අරමුණට සහයෝගය දැක්වීම සඳහා අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ වැඩ පිළිවෙළට යහපාලනය අගයන කණ්ඩායමක් ලෙස අපේ පූර්ණ සහයෝගය ලබා දෙනවා.

ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි හැමෝම දන්න විධියට පළාත් සභාව පිහිටවපු 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් කරපු විශේෂම සංශෝධනය තමයි 17 වැනි වගන්තිය. එහි කරපු සංශෝධනය නම් 1988 වනතුරු රාජ්‍ය භාෂාව වුණේ එක භාෂාවයි. එනම් සිංහල භාෂාව විතරයි. පළාත් සභා පිහිටුවීමේදී දෙමළ භාෂාව රාජ්‍ය භාෂාව බවට පත් කිරීමයි. ඒකට ගරු කිරීමක් වශයෙන් මෙය සඳහන් කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට කලින් අපේ මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා කථා කරන කොට කිව්වා, 2015 ජනවාරි 09 වැනිදා අතිගරු ජනාධිපතිතුමා පදවි ගන්න කොට මහජන ඡන්දයෙන් ගත්තා. අගමැතිතුමා නිකන් ගිහිල්ලා ගත්තා කිව්වා.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

ඔව්. නිකන් තමයි ගත්තේ.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

මතක තියාගන්න. ගරු මන්ත්‍රීතුමන්ලා ඔබතුමන්ලා මතක තියා ගන්න ඕනෑ. අද ඔබතුමන්ලා සැපෙන්, සනීපෙන් මේ පළාත් සභාවට තිබෙන මුදල් ටික කොල්ල කාගෙන යන්නේ, අද මෙතැන ඉන්න මහ ඇමැතිතුමයි, ඇමැතිවරුන් හතර දෙනයි අපියි එක්සත් ජාතික පක්ෂයෙන් ඡන්දය දීලා යහපාලන ආණ්ඩුවක් බිහි කරපු නිසා තමයි කියලා මතක තියා ගන්න. යහපාලන ආණ්ඩුවක් නැත්නම් මෙතැන මේ ඇමැතිවරු හතර දෙනාත් නැහැ. මහ ඇමැතිතුමාත් නැහැ. (බාධා කිරීම්) මේගොල්ලන්ට එහෙම කථා කරන්න බැහැ. 2014 පළාත් සභාවට ආපු එක ගැන කථා කරනවා. 2014 අද අපේ ඉන්න මහ ඇමැතිතුමාට අඩුම තරමේ ඇමැතිකමක් හරි දුන්නාද? ඇමැතිකමක් ඕනෑ නැහැ. ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකමක් හරි තිබුණාද? අපේ හිටපු ඇමැතිතුමාටවත් දුන්නාද? මෙතැන පුටුවේ වාඩි වෙලා ඉද්දීත් ඒ පැත්ත බලාගෙන ඉන්නවා. අද මේ අය ඇවිල්ලා

[ ගරු එම්.එස්.එම්. ෆයිරෝස් ]

කයිය ගහනවා. අපි 2014 ආපු පළාත් සභාවලු මේක. ලැජ්ජා නැතිව කියනවා නේ. තිබෙන වරප්‍රසාද ඔක්කෝම ගන්නේ මේ අය.

[සභාවේ ඝෝෂා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමන්ලාට ඒකත් පිළිගන්න බැහැ. කවදා හරි මේ සභාව ඇතුළේ යහපාලන ආණ්ඩුවක් තිබෙනවා නම්, ඒ ඒකට අනිවාර්යයෙන් 99% ක් එක්සත් ජාතික පක්ෂය දීපු සහයෝගයෙන් තමයි. අද අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා, ඒ ජනාධිපතිතුමා මේ අයගේ නොවෙයි. අපේ. මේ අය හිතාගෙන ඉන්නේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා මේ අයගේ පැත්තේ කියලා. මේ අයට අයිතියක් නැහැ. මෙතැන ඉන්න 66 දෙනාම ජනවාරි මාසයේ 08 වැනිදා ඡන්දයට වැඩ කළේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාට. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට මෙතැන එක්කෙනෙක්වත් වැඩ කළේ නැහැ. මෙතැන ඔක්කොම වැඩ කළේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාට. (බාධා කිරීමක්) මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාත් එක්ක ඉන්නවාද? කීදෙනෙක් මහින්ද රාජපක්ෂත් එක්ක ඉන්නවාද කියලා අපි ඔක්කොම දන්නවා. ඒවා දන්නේ නැතිව අපි මෙතැන සෙල්ලම් කරන්න ආවේ නැහැ . මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට වැඩිය මම කථා කරන්නේ නැහැ. මට කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙමින් මගේ කථාව මෙයින් අවසන් කරනවා. ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මීළඟට ආණ්ඩු පක්ෂය වෙනුවෙන් මොරිස් විජේරත්න ගරු මන්ත්‍රීතුමා. විනාඩි 8 ½ ක කාලයක් තිබෙන්නේ.

[අ.භා. 12.02]

**ගරු මොරිස් විජේරත්න**
Hon. Moris Vijerathne

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2015 ජනවාරි 08 වැනිදා මේ රටේ ජනතාව වෙනසක් බලාපොරොත්තුවෙන් ඡන්දය පාවිච්චි කළේ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඒ නිසා තමයි ඔබතුමාට මන්ත්‍රීකම හම්බ වුණේ. නැත්නම් නැහැ.

**ගරු මොරිස් විජේරත්න**
Hon. Moris Vijerathne

අපේ කැමැත්තෙන් (බාධා කිරීම්) මෙතුමාත් සජිත් ප්‍රේමදාසගේ මිනිහෙක්. සංවිධායකකම අයින් කළා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මොරිස් විජේරත්න ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 8 ½ ක කාලයක් තිබෙන්නේ.

**ගරු මොරිස් විජේරත්න**
Hon. Moris Vijerathne

කථා කරන්න දෙන්නේ නැහැ නේ? මට බාධා කරනවා නේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2015 ජනවාරි 08 වැනිදා පැමිණි වෙනස තුළින් මේ රටේ ජනතාව බලාගෙන සිටියා හොඳට කාල බීලා, බයිසිකල් එකේ ගිය අයට වාහනයක් අරගෙන, තුන්වේල කාල බීලා යහපාලනය තුළ රටේ නීතිය හරියාකාරව ස්ථාපිත වෙලා නීත්‍යානුකූලව මේ රටේ මිනිස්සුන්ට වැඩ කරන්න පුළුවන් තත්ත්වයක් බිහි වෙයි කියලා. ඒ හරහා අපි දන්නවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රජයේ සේවකයෙක් ණය ගන්න කොට ඔහුට ගන්න පුළුවන් තමන්ගේ වැටුපෙන් 60% යි. 40% ක් ගන්න බැහැ. ඒක චක්‍රලේඛ මගින් පාලනය කරනවා. මේ 2015 ජනවාරි 08 කලිනුත්, ඊට කලිනුත් මේ රට ණය ප්‍රමාණවල් අරගෙන තිබුණා. අර කියන විධිවිධානවලට යටත්ව. හැබැයි, මේ ණය ප්‍රමාණය වැඩි වෙන්නේ ණය අරගෙන 2005, 2015 කාල සීමාව දක්වා දැවැන්ත සංවර්ධනයක් මේ රටේ ඇති කරලා වසර 30 ක් ඇති වුණු යුද්ධයක් නිමා කරලා, කාපට් තිබෙන තැනකින් අඩිය තියලා බැස්සා නම් ලංකාවේ වටේ ගිහිල්ලා එන්න පුළුවන් කාපට් තිබෙන පාරක. මෙවැනි දැවැන්ත වැඩ සටහනක් ක්‍රියාත්මක කළා. මේ රටේ බලය ලබා ගැනීම සඳහා අකැමැත්තෙන් වුණත් කියන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. නිදහසින් පසුව සෑම අයවැය ලේඛනයකින්ම දළ ජාතික නිෂ්පාදනයට සමගාමීව රජයේ සේවකයින්ට වැටුප් වැඩි කරපු ප්‍රමාණයක් තිබුණා. හැබැයි, රාජපක්ෂ පාලනය පෙරළන්න ඕනෑ නිසා මේ නියමයන් ගණන් ගන්නේ නැතිව රුපියල් 10,000/- කින් පඩි වැඩි කළා. රජයේ සේවකයන් දහතුන් ලක්ෂයක් ඉන්නවා. වැඩි කිරීම 10,000/-. රටේ ආර්ථිකයට ඔරොත්තු දෙයිද? ඒ වැඩි කරන්න ඕනෑ දේවල්. ඒවා වැඩි කළ යුතුයි. රජයේ විශ්‍රාමිකයින්ගේ වැටුප් වැඩි කළා. යම්කිසි ප්‍රමාණයකින් වැඩි කළ යුතුයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා පඩි වැඩි කළාට විරුද්ධද?

**ගරු මොරිස් විජේරත්න**
Hon. Moris Vijerathne

දැන් මම මතු කරන්න හදන ප්‍රශ්නය ඒක නොවෙයි. මේ වැඩි කරන කොට රජයේ ආදායම් වැඩි වුණාද? අපට තෙල් හම්බ වුණාද? දියමන්ති ආකර හම්බ වුණාද? නැහැ. අපි කොහෙන්ද සල්ලි හොයා ගන්නේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් හැම මාසයකටම දහතුන් ලක්ෂය වැඩි කිරීම දහ දාහක් මේ රටේ වැඩ කරන ජනතාවට දෙන්න ඕනෑ. මේ අර්බුදය වහ ගන්න පසුගිය කාලයේ -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

මේ එකාබද්ධ විපක්ෂයේ හඬද? පාර්ලිමේන්තුවේ වාගේ පළාත් සභාවේත් පුළුවන් නම් විරුද්ධ වෙන්න. මම ඉල්ලීමක් කරනවා.

**ගරු මොරිස් විජේරත්න**
Hon. Moris Vijerathne

මට මගේ කථාව කරන්න දෙන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

විරුද්ධ පක්ෂය ඔබතුමන්ලා නේ.

[සභාවේ ඝෝෂා]

අපි ආණ්ඩු පක්ෂයේ. ඔබතුමන්ලා විපක්ෂයේ නේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා,

[සභාවේ ඝෝෂා]

ඔය විදියට බාධා කරන්න ගියොත් විපක්ෂයේ කාලය අඩු කරන්න වෙනවා. ඒ නිසා කථා කරන්න ඉඩ දෙන්නය කියලා ඉල්ලනවා.

**ගරු මොරිස් විජේරත්න**
Hon. Moris Vijerathne

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, (බාධා කිරීම්) මගේ කථාව පටන් ගත්තු අවස්ථාවේ සිට විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා පිස්සු බල්ලෙක් වාගේ බුරනවා. මේ පිස්සු බල්ලව බැඳලා දාන්න. නැත්නම් කූඩුවට දාන්න. මේ විදියට බාධා කරන්න දෙන්න එපා. කථා කරන කොටම බල්ලෙක් වාගේ හපන්න ගන්නවා. මෙතුමාට පිස්සු. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වන කොට මේ රටේ

[සභාවේ ඝෝෂා]

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා කථා කරන්න. කරුණාකර නිශ්ශබ්ද වන්න.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. කරුණාකර මෙතුමා බාධා කරන නිසා, නම් කරලා දොට්ට දාන්න.

**ගරු මොරිස් විජේරත්න**
Hon. Moris Vijerathne

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ බල්ලව ගැට ගහන්න කෝ? මාර බාධාවක් නේ? හැම වෙලාවේම බුරනවා නේ? පිස්සුද? නැත්නම් ජලභීතිකාවද?

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කථා කරන්න.

**ගරු මොරිස් විජේරත්න**
Hon. Moris Vijerathne

අපේ ගරු සෞඛ්‍ය ඇමැතිතුමා, මෙතැන බලු සායනයක් තියන්න. පිස්සු බල්ලන්ට එන්නත ගහන්න. කථා කරන කොටම වැඬේ දෙනවා නේ? මොකුත් දන්නේ නැතිව.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

දැන් නිශ්ශබ්ද වෙලා තිබෙන්නේ. ඔබතුමා කථා කරන්න.

**ගරු මොරිස් විජේරත්න**
Hon. Moris Vijerathne

ඔබතුමා ඔහොම කෑ ගැහුවා කියලා කැලණියේ සංවිධායකකම දෙන්නේ නැහැ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමා, ඔබතුමාගේ කථාව කරන්න කෝ?

**ගරු මොරිස් විජේරත්න**
Hon. Moris Vijerathne

බාධා කරන කොට කොහොමද කථා කරන්නේ?

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

බාධා කරන එක නවත්තලා නේ තිබෙන්නේ. ඔබතුමා කථා කරන්න.

**ගරු මොරිස් විජේරත්න**
Hon. Moris Vijerathne

තව එකක් ගහන්න. ඔළුවටම ගහන්න.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමාගේ කාලය අවසානයි.

**ගරු මොරිස් විජේරත්න**
Hon. Moris Vijerathne

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ කියාගෙන යන්නේ -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

කියාගෙන ගියාට ඔබතුමා කියන්නේ නැහැ නේ?

[සභාවේ ඝෝෂා]

**ගරු මොරිස් විජේරත්න**
Hon. Moris Vijerathne

එන්නත ගහලා ටිකක් වෙලා යනතුරු පිස්සුව තිබෙනවා. අපි තව පොඩ්ඩක් ඉවසමු මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමාගේ කාලය අවසානයි.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

වාඩි වෙන්න.

**ගරු මොරිස් විජේරත්න**
Hon. Moris Vijerathne

ඔබතුමා මූලාසනයේ ඉඳගෙන පාලනය කරන්නේ නැතිව මගේ කාලය ඉවර කරන්න ආවොත් එහෙම ඒ සම්බන්ධව හරි කනගාටු වෙනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

කනගාටු වෙනවා නොවෙයි.

**ගරු මොරිස් විජේරත්න**
Hon. Moris Vijerathne

මමත් කාටවත් කථා කරන්න දෙන්නේ නැහැ. බාධා කරනවා. මම එහෙමනම් කාටවත් කථා කරන්න දෙන්නේ නැහැ. මම දැන් වාඩි වෙනවා. මම කාටවත් කථා කරන්න දෙන්නේ නැහැ. ඔබතුමා ඔය නීතියම එහෙමනම් ක්‍රියාත්මක කරන්න.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

පොඩ්ඩක් නිශ්ශබ්ද වන්න කෝ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මූලාසනයට තර්ජනය කරන්න එපා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මම සභාවෙන් ඉල්ලා සිටිනවා, සභාවේ සියලු දෙනාම නිශ්ශබ්ද වන්න. ගරු මහ ඇමැතිතුමා -

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩු පක්ෂයෙන් එතුමාට තව විනාඩි දෙකක් දෙනවා.

**ගරු මොරිස් විජේරත්න**
Hon. Moris Vijerathne

විනාඩි දෙක දෙනවා නම්, මේ බල්ලව ගැට ගහන්න.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

පොඩ්ඩක් නිශ්ශබ්ද වන්න.

[සභාවේ ඝෝෂා]

මම සියලු දෙනාගෙන්ම ඉල්ලා සිටින්නේ, මේ සියලු දෙනාම ජනතාව පත් කරලා එවපු අය, බුද්ධිමත් අය. ඒ නිසා මම මොරිස් විජේරත්න ගරු මන්ත්‍රීතුමාගෙන් ඉල්ලා සිටිනවා, මමද වෙන කෙනෙක්ද කියන එක නොවෙයි මෙතැන සභාපති. මින් ඉදිරියට සභාපති පුටුවට ඇඟිල්ල දික් කරලා කථා කරන්න එපැයි කියන එක ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා. කථා කරන්න.

**ගරු මොරිස් විජේරත්න**
Hon. Moris Vijerathne

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගෙන් වැරැද්දක් වුණා නම් සමාවෙන්න. මුළු සභාවෙන්ම සමාව ඉල්ලා සිටිනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ යස අගේට තිබුණු රට. රටේ සංවර්ධනයත් වුණා. අපි වෙනසක් බලාපොරොත්තු වුණා. යහපාලනය කියන සංකල්පය ඇති වුණේ ඒකයි. රටේ නීතිය ක්‍රියාත්මක වෙයි කියලා බැලුවා. මිනිස්සු හොඳට කාල බීලා ඉඳියි කියලා බැලුවා. දැන් මේ පාර්ලිමේන්තුවේ අයවැය ඉදිරිපත් කළා. දැන් අපේ සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා, අපේ ගරු මහ ඇමැතිතුමා නැති වෙලාවේ තමයි එතුමා සද්දේ දාන්නේ. එතුමා අපට කැරට් අලේ පෙන්නලා, හැම අමාත්‍යාංශයකටම රිංගලා ඉස්සරහා පැත්තෙනුත් බටර් ගාගෙන, පිටිපස්සේ පැත්තෙනුත් බටර් ගාගෙන යන්නේ. එහෙම ගිහිල්ලා තමයි එතුමා මේ හැම මන්ත්‍රීවරයෙකුටම චෝදනා කළේ. මුදල් කපන එකේ උතුරු පළාත් සභාවටත් කැපුවා. දකුණු පළාත් සභාවටත් කැපුවා. පළාත් සභා අටටම මුදල් කැපුවා. බස්නාහිරට සිදු වුණු දෙයක් නොවේ. බස්නාහිරට වැඩිපුර කැපුවා. මේ මුදල් මෙච්චර -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

නැගෙනහිරට කැපුවේ නැහැ.

**ගරු මොරිස් විජේරත්න**
Hon. Moris Vijerathne

දිගටම කපලා තිබෙන්නේ. මේ කපපු එකට අපේ මහ ඇමැතිතුමන්ලා - උතුරු මැද මහ ඇමැතිතුමා කියනවා, මුදල් ලබා ගන්න උසාවි යනවා කියලා. අපේ බස්නාහිර ක්‍රියාකාරීත්වය අඩු නම්, සාපේක්ෂව සියලුම පළාත් සභාවල ක්‍රියාකාරීත්වය අඩුයි. තර්කානුකූලව. මුදල් කපලා තිබෙන්නේ එහෙම තර්කයකට නම්. ඒ නිසා ඒක බොරු කථාවක් කියලා කියන්න ඕනෑ. මේ මුදල් කපා හැරීම තුළින් පළාත් සභා අකර්මණ්‍යය කරන්න හදනවා කියන විතරයි අපට කියන්න තිබෙන්නේ. "ළඟම පාසල හොඳම පාසල". වසර අවසානය වන කොට මිලියන 2000 ක වැඩ කරලා තිබෙන්න ඕනෑ. මේකට බිල් දාලා තිබෙනවා, මිලියන 2000 ක. හැබැයි, තවම මිලියන 350 යි ලැබිලා තිබෙන්නේ.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

සල්ලි අපෙන් නේ?

**ගරු මොරිස් විජේරත්න**
Hon. Moris Vijerathne

ඉතින් සල්ලි නැතිව කොහොමද ප්‍රගතියක් පෙන්වන්නේ. එවැනි ආකාරයේ වැඩ කටයුතු රාශියක වැඩ පෙන්නලා තිබෙනවා. මේ වන කොට මිලියන 2000 ක් ලැබෙන්න ඕනෑ. මිලියන 350 යි ලැබිලා තිබෙන්නේ. මේ විධියට වැඩ අකර්මණ්‍ය කරලා එක පැත්තකින් මෙතැන චෝදනා කරනවා, පළාත් සභා වැඩ කරලා නැහැයි කියලා. මම මේ මතු කරගෙන ආවේ, දැන් අපේ රටේ පඩි වැඩි කළා. දැන් පඩි බේරන්න සල්ලි හොයන්න ඕනෑ. ඒකට සල්ලි එකතු කරන්නේ කාගෙන්ද?

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

බදු ගහලා.

**ගරු මොරිස් විජේරත්න**
Hon. Moris Vijerathne

හැම මිනිහෙක්ටම බදු ගහලා. ඉස්පිරිතාලේ යන ලෙඩාගෙන් ගන්නවා. මළ මිනියටත් ගන්නවා. පාරේ යන කොට ගන්නවා. උසාවියේ නඩුවක් දැම්මත් ගන්නවා. මේ අර තිබෙන ප්‍රමාණය ගෙවන්න තම රටේ ජනතාවගෙන්ම එකතු කරලා තිබෙනවා. අද පාරට බැස්සොත් සියලු දෙනාම කියන්නේ, මේ වාගේ ටික කාලයකින් එපා වුණු ආණ්ඩුවක් නැහැයි කියලයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඒ කාලයේ වැට් එක 15% යි.

**ගරු මොරිස් විජේරත්න**
Hon. Moris Vijerathne

අපේ රටේ හිටපු මුදල් ඇමති රොනී ද මැල් ඇමැතිවරයා, මේ වාගේ දීර්ඝ කාලයක් මුදල් ඇමති ධුරය දරලා -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

කාලය ඉවරයි.

**ගරු මොරිස් විජේරත්න**
Hon. Moris Vijerathne

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉවර කරනවා. එතුමා කිව්වා, මී මැස්සා මලකින් රොන් උරන ආකාරයට තමයි බදු ක්‍රමය සකස් වෙන්නේ කියලා. අද මේ වන කොට රටේ මුදල් ඇමතිතුමා මලකින් නොවෙයි, අපේ රටේ ජනතාවගේ බොටුව මිරිකලා ඒ ඉස්ම ටික අරගෙන එතුමා පානය කරලා මේ රටේ ජනතාව කනත්තට දක්වන්න හදනවා කියන කථාව කියමින් මගේ කථාව අවසන් කරනවා.

[අ.භා. 12.14]

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පළාත් සභාවට සහභාගිවන පුද්ගලයෙක් වශයෙන් අද දවස දිහා බලන කොට මේක හොඳ විමසිලිමත්ව පිට සිට අහන අයට දැනෙනවා, හොඳ අවබෝධයක් එන්න ඇති දේශපාලනය මොකක්ද කියලා. මේක ඇතුළේ මරාගන්නවා. කෑ ගහනවා. ඊට පස්සේ ඇමැතිතුමා ළඟට ගිහිල්ලා වැඩ කර ගන්නවා. ආපසු ඇවිල්ලා බණිනවා. දොස් කියනවා. මේක තමයි දේශපාලනය කියලා ජනතාව දන්නවා ඇති. තැන් තැන්වල බෝඩ් ගහලා තිබෙනවා, අපි සාමාන්‍යයෙන් දැකලා තිබෙනවා. අවිහිංසාවාදයේ පියා, මහත්මා ගාන්ධි. එතුමා කියනවා, වැඩක් කරනකොට, අලුතෙන් වැඩක් ආරම්භ කළාම එය කඩාකප්පල් කරන්න, විනාශ කරන්න ගොඩක් මිනිස්සු දඟලනවා. හැබැයි, ඒ වැඩේ අවසන් වන කොට අන්තිමට වර්ණනා කරන්නෙත් ඒ කඩාකප්පල් කරපු මිනිස්සු. අපි දැක්කා. ගරු මහ ඇමැතිතුමා පත් වුණාම කිව්වා, ඔය මිනිහාට ඕක කරන්න පුළුවන්ද? ඕක ඔය ඇමැතිලාට කරගෙන යන්න පුළුවන්ද? දැන් එහෙම කියපු අය ගරු මහ ඇමැතිතුමා වර්ණනා කරනවා. ඇමැතිවරු වර්ණනා කරනවා. අනාගත බලාපොරොත්තුව මොකක්ද කියන එක අපටත් දේශපාලනය කරන නිසා තේරෙනවා. ඒ නිසා මෙය පිල් දෙකක් බවට පත් කරන්න බලාපොරොත්තු වුණා. මහින්ද පාර්ශවය. මෛත්‍රී පාර්ශවය. එක්සත් ජාතික පක්ෂය පිල් බෙදලා, මේක අවුලක් බවට පත් කරලා, අයවැයට යම්කිසි අවධානමක් ඇති කරලා, අත උස්සලා නැවත අපි තමයි ඔබතුමන්ලා බේර ගත්තේ. අපි තමයි ඔබතුමාට හයියට හිටියේ කියලා පෙන්නලා වර්ෂ අවසානයේ වැඩ ටික කරගන්න තමයි කට්ටිය උත්සාහ කරන්නේ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මේ අවුරුද්දේ කෙරුවා වාගේ නේද?

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

මේ අවුරුද්දේ කරන්න උත්සාහ කළේ මේ දේ තමයි. හැම කෙනාටම ඔය බුද්ධිමත් භාවය තිබෙනවා. ඒ නිසා පළාත් සභාවේ ආණ්ඩු පක්ෂය වශයෙන් අපි හැමදාමත් ගරු මහ ඇමැතිතුමාත් එක්කත්, ගරු ඇමැතිවරු එක්කත් බොහොම සමීපව කටයුතු කළා. ඒක අපි මහින්ද පාර්ශවයද, මෛත්‍රී පාර්ශවයද කියලා බැලුවේ නැහැ. ඒ නිසා මෙවර අයවැයේදී අලුත් මන්ත්‍රීවරයෙක් වශයෙන් මම කියනවා. අපි කිසිම ඇමැතිවරයෙකුට විරුද්ධව ඡන්දයක් පාවිච්චි කරන්නේ නැහැ. පළාත් සභාවට විරුද්ධව ඡන්ද පාවිච්චි කරන්නේ නැහැ. ආණ්ඩු පක්ෂයේ ගෞරවය රැකලා, බස්නාහිර පළාත් සභාවේත් ගෞරවය ආරක්ෂා කරන්න අපි කටයුතු කරනවා. ඒ බව පැහැදිලිව කියන්න ඕනැ. ඒ නිසා ඔබතුමන්ලා ඔය බොරු බටර් ගාන්න එපා.

ගංවතුර ගැලුවා. සිද්ධිය හමාරයි. වෛරය හිතේ තියාගෙන, අයවැය ආපුවාම වෛරය පිරිමහන්න, එහෙම නැත්නම් වෙනත් වෙනත් විධියට යම් යම් මුදල් ගනුදෙනුවලට ගිහිල්ලා, ඒක සිද්ධ නොවුණාම, වෛරයෙන් කථා කරන්න අපට මේ පළාත් සභාවේ ඇමැතිවරු ගැනවත්, පළාත් සභාව ගැනවත්, නිලධාරී ගැනවත් වෛරයක් අපි ළඟ නැහැ. ඒ නිසා ඒ වෛරය පිරිමහන්න නොවෙයි, අපි මෙතැනට අවිල්ලා තිබෙන්නේ. මහජනතාවගේ අදහස් ටික අරගෙන ඇවිල්ලා තිබෙන්නේ. අපේ ගම් දනව්වල තිබෙන පාලම වෙන්න පුළුවන්. බෝක්කුව වෙන්න පුළුවන්. පාර වෙන්න පුළුවන්. ඒවායේ හඬයි අපි මෙතැනට ගෙනැල්ලා තිබෙන්නේ. නැත්නම් පෞද්ගලික කරුණු කාරණා අපට මෙතැනට වැදගත් නැහැ. ඒ නිසා අපේ අරමුණ වන්නේ මේ බස්නාහිර පළාත් සභාවට ඇවිල්ලා, අමාත්‍යාංශයට ගිහිල්ලා අපේ ගමට යමක් අරගෙන යන්නේ කොහොමද? අපේ ජනතාවට සේවය ලබා දෙන්නේ කොහොමද? කියන එක තමයි අපේ බලාපොරොත්තුව. ඒ නිසා අපට දෙන්න පුළුවන් සහයෝගය අපි අවංකව ලබා දෙනවා.

ඉතින් මම සතුටු වෙනවා. 1987 අංක 42 දරන පනත යටතේ මේ බස්නාහිර පළාත් සභාව ස්ථාපිත කරලා, හයවැනි පළාත් සභාවේ තුන් වැනි අයවැය ඉදිරිපත් කරන අවස්ථාවේ මමත් මන්ත්‍රීවරයෙක් වශයෙන් මේ කටයුත්තට සම්බන්ධ වන්න ලැබීම පිළිබඳව. හැබැයි, මේ පළාත් සභාව ගැන අපට ලොකු සිහින ගණනාවක් තිබුණා. අපි දැක්කා. මේ පළාත් සභාවේ කටයුතු කරන කාලයේ - ඒ කාලයේ මම අපේ පළාත් සභාවේ සභාපතිතුමා එක්ක සමීපව කටයුතු කළා. සුනිල් විජේරත්න මැතිතුමා එක්ක. අපේ පළාත් සභාවේ මන්ත්‍රීතුමන්ලා එක්ක. අපි එතුමාට ගිහිල්ලා කියනවා, අනේ ගරු මන්ත්‍රීතුමා, අපේ සමිතියට පුටු දෙන්න. අපේ සමිතියට හට් එකක් දෙන්න. අපට ගොවි උපකරණ දෙන්න. එහෙම නැත්නම් අපේ පාසලට තීන්ත ටිකක් ගාන්න සල්ලි දෙන්න. මොනවා හරි දෙයක් අපි ගිහිල්ලා ඉල්ලුවා. එතුමන්ලා ඒවා අහලා අපට ලක්ෂ ගණනින් මේවාට මුදල් ලබා දුන්නා. ඒ වාගේම යම් යම් කරුණු කාරණාවලට දුන්නා.

අවුරුද්දෙන් අවුරුද්ද අපේ දහම් පාසල්වල හාමුදුරුවරුන්ට මුදල් දුන්නා. ඒ මුදල්වලින් දහම් පාසල්වල කණු ගහලා වහලේ හදාගෙන තිබෙනවා. මේ වාගේ මේ පළාත් සභාව දිහා බලන කොට අපට යම් යම් සිහින තිබුණා. ක්‍රීඩා උපකරණ දෙනවා. ව්‍යායාම කට්ටල දෙනවා. එහෙම නැත්නම් වැඩිහිටි සංවිධානවලට වැඩ සටහන් කරනවා. වැඩිහිටියන්ව වන්දනා ගමන් අරගෙන යනවා. ස්වයං රැකියා උපකරණ දෙනවා. මේ සිහින දැකලා අපි මෙතැනට ආවේ. අපිත් මෙතැනට යන්න ඕනෑ. අපි ගිහිල්ලා, අපිත් මේවා ජනතාව වෙත ඒවා ලබා දෙන්න ඕනෑය කියලා ඇවිල්ලා අද කටයුතු කරන්න හදන කොට අපට නීති රීති ගණනාවක් පෙන්නුම් කරලා තිබෙනවා. මේ නීති රීතිත් එක්ක අපට යමක් කරන්න පුළුවන්කමක් අද ඇති වෙලා නැහැ. ක්‍රීඩා භාණ්ඩයක් බෙදන්න බැහැ. රුපියල් 15,000/- යේ සීමාව තියලා. අද බර උස්සන කට්ටලයක්වත් දෙන්න පුළුවන්කමක් ඇති වෙලා නැහැ. ඒ වාගේම දහම් පාසල ගොඩනහන්න සල්ලි දෙන්න විධියක් නැහැ. එම නිසා මේ පළාත් සභා ගලාගෙන පැමිණි ක්‍රමය තුළ යම් යම් මුදල් සීමාවන් දැක්වීම තුළ අපට යම් යම් තිබුණු බලාපොරොත්තු අද ඉටු නොවන තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා.

නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට කනගාටුවක් නැහැ. අපි උත්සාහ කළා. ජන සමාජයේ කථිකාවතක් තිබෙනවා, මේ බස්නාහිර පළාත් සභාව කියන්නේ, නැත්නම් පළාත් සභා සමූහයටම අර්ථ කථනය දෙන්නේ සුදු අලියෙක් කියලා. වැඩක් නැති ආයතනයක් කියන එක තමයි අර්ථ නිරූපණය කරන්න හදන්නේ. නමුත් මේකට යම් යම් බලතලයන් දීලා, සීමාවන් දීලා, මුදල් කටයුතු භාර දීලා, මේ ජන සමාජයට මේ පළාත් සභාව භාර දුන්නේ යම්කිසි අරමුණක් ඇති. ඉතින් අපේ අරමුණ වෙන්නට ඕනෑ - මම එදා කථා කරන කොට කිව්වා, මේ පළාත් සභාවේ රැස්වීම් 63 ක් තියලා තිබෙනවා. එයින් ගණපූරණය නැතිව 12 ක් අපි ගෙදර ගිහිල්ලා තිබෙනවා. අපේ වගකීම මොකක්ද කියලා අපි හොඳින් තේරුම් ගන්නට ඕනෑ. මේ සුදු අලියෙක් කියලා මිනිස්සු අර්ථ කථනය කරන, ජනතාව කියන ආයතනය වඩාත් ක්‍රියාත්මක මට්ටමේ ආයතනයක් හැටියට අපට පත් කරන්න පුළුවන් කොහොමද? ඒ නිසා අපට වගකීම් තිබෙනවා. මේ ඉන්න නිලධාරී කණ්ඩායමත් එක්ක අපි එකතු වෙන්න ඕනෑ. අපි ඇවිල්ලා මෙතැන නිලධාරියාව විවේචනය කරනවා. නිලධාරියාට ගහනවා. මූල්‍ය අපරාධ කොට්ඨාශයක් පිහිටුවනවා. නිලධාරියාට විරුද්ධව කටයුතු කරනවා. අවසානයේ නිලධාරියාගෙන් වැඩේ කර ගන්න ගියාම නිලධාරියාට යම් ගැටලුකාරී

[ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ ]

තත්ත්වයන් අපි සභාව තුළ ඇති කරලා තිබෙනවා. ඉතින් නිලධාරියාගේ තිබෙන දක්ෂතාවය, සංකල්පය අපි අරගෙන නැහැ. අපි උත්සාහ කරනවා, අපි කියන දේ විතරක් හරියි කියලා යථාර්ථයක් බවට පත් කරන්න. ඊට වඩා අරමුණක් අපට තිබෙන්නට ඕනෑ. අපි අතර සංකල්ප තිබෙනවා. මහජන පරමාධිපත්‍ය අපි නියෝජනය කරනවා. ඒ පරිමාධිපත්‍ය නියෝජනය කරලා, අපි මෙතැන කථා කරන කොට ඒකට නෛතික රාමුව ගොඩනඟලා ඒක ව්‍යාපෘතියක් බවට පත් කරලා අවසානයේ මහජනතාවට භේදයකින් තොරව නීත්‍යානුකූල භාවයෙන් සංවර්ධන ව්‍යාපෘති අරගෙන යන්න නම්, අපි නිලධාරියා විවේචනය කරනවාට වඩා නිලධාරියාත් එක්ක එකතු වෙලා, ඔහුගේ දක්ෂතාවයත් අරගෙන, ඔහුගේ හැකියාවත්, බුද්ධිමත්කමක් පාවිච්චි කරලා ඒ ව්‍යාපෘතිය ගමට අරගෙන යන එක තමයි අපේ අරමුණ වෙන්නට ඕනෑ. නමුත් අපි හැමදාමත් කළේ, අපි තමයි සියලු දේ දන්න අය. අපට තමයි පරමාධිපත්‍ය බලය තිබෙන්නේ. අපටයි වරප්‍රසාද තිබෙන්නේ. අපි තමයි මේකේ හරි දේ කියන්නේ. අපි කියන දේ කරන්නට ඕනෑ. එය යථාර්ථයක් කරන්න මේ රටේ නීතියෙන් යම් යම් බාධා තිබෙන්න පුළුවන්. ඒ නිසා මේක තේරුම් ගන්නට ඕනෑ. ඒ නිසා මේ සුදු අලියෙක් කියන ආයතනයට අපි හොඳ අර්ථකථනයක් දෙන්න නම්, අපේ කැප කිරීම වඩා වැදගත් වෙයි කියන විශ්වාසය මට තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කරුණු ගණනාවක් කියන්නට තිබෙනවා. මේ අලුත් අයවැයත් එක්ක මහ කරුණු ගණනාවක් තිබුණා. අපි ඒවාට මහා විරෝධතාවයන් දක්වන්නේ නැහැ. නමුත් ජනතාව පැත්තෙන් බලන කොට යම් අසරණකමක් තිබෙනවා. අද දඩුවම් පැත්තෙන් බැලුවොත් ඒවාට විශාල වශයෙන් මුදල් යෙදිලා තිබෙනවා. ඒ වාගේම 15% ක වැට් බද්ධ තිබෙනවා. ඒ වාගේම තවත් විවිධ බදු වර්ග හඳුන්වා දී තිබෙනවා. ඊයේ දවසේ අපි පළාත් පාලන ආයතන ටික ගෙන්නෙව්වා. අයවැය සම්බන්ධයෙන් අපි සාකච්ඡාවක් කළා. ඒ අයගේ තිබෙන මූලික මුදල් උත්පාදනය තමයි - අපි කොහොමද ප්‍රඥප්තියක් ඇති කරගෙන, එහෙම නැත්නම් අතුරු ව්‍යවස්ථාවක් ඇති කරගෙන නගරයට එන ත්‍රිවිල් එකෙන් සල්ලි ගන්නේ? බයිසිකලෙන් සල්ලි ගන්නේ කොහොමද? ඒ අය රථගාල් පවත්වාගෙන යන්නේ කොහොමද? එහෙම නැත්නම් ඒ අයගේ වරිපනම් බදු වැඩි කරන්නේ කොහොමද? කඩ කුළිය වැඩි කරන්නේ කොහොමද? ඒ වාගේ තමයි අදහස් දැක් වූයේ. එතකොට අද රටේ ජනතාව හැම පැත්තෙන්ම, පළාත් පාලන ආයතනය පැත්තෙන් ගත්තත්, පළාත් සභාව පැත්තෙන් ගත්තත්, රජය පැත්තෙන් ගත්තත් මූල්‍ය වශයෙන් හිරවීමක් පවතිනවා. තමන්ට මේ ලැබෙන මුදල කෑලි කෑලිවලට බෙදලා ආදායම් බද්දට පත් කරන්න සිද්ධ වෙලා තිබෙන නිසා. ඒ නිසා අපි වඩාත් බුද්ධිමත්ව මේ ජනතාව වෙත දෙන්න පුළුවන් සහන ලබා දෙන්නට ඕනෑ. ඒ වාගේම පළාත් සභාව පැත්තෙන් ගන්න කොට, අපි සතුටු වෙනවා. එදා ප්‍රධාන ලේකම්තුමා ප්‍රකාශ කළා -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

තව විනාඩියක්, දෙකක් දෙන්න. ආදායම් කමිටුවක් පිහිටුවලා කටයුතු කරමුයි කියලා. අපි ඊයේ දවසේ සාකච්ඡා කළා. ඉඩම් අංශයෙන් අපට ආදායම් ගන්න තිබෙන්නේ කොහොමද? ඒ නිසා අපේ අදහස වන්නේ මේ ආයතනවලට භය වෙන්න අවශ්‍ය නැහැ. මොන Club එකද? මොන ආයතනයද? නොවේ. රාජ්‍ය ආයතන වෙන්න පුළුවන්. ඒ හැම ආයතනයක්ම මුදල් උත්පාදනය කරන කාර්යයන්වල යෙදිලා ඉන්නවා නම්, මේවාට නඩු කියලා හරි මේ මුදල් උපයා ගන්නට ඕනෑ. මේවා අරගෙන අපි මහජනතාවගේ සේවය සඳහා යොදවන්නට ඕනෑ. මෙන්න මේ කරුණු සම්බන්ධවත් ඔබතුමාගේ අවධානය යොමු කරනවා වාගේම මගේ කනගාටුවට කාරණයක් තිබෙන්නේ, පළාත් සභාවට තිබෙන මුදල් ටික කපා හැරලා තිබෙනවා. අද අපේ පළාත් සභාවේ ඇමැතිතුමාට කථා කරලා ඇහුවොත් කියනවා, අනේ මන්ත්‍රීතුමා සල්ලි කෝ කියලා. හැබැයි, අපේ ගම්වල පළාත් සභා මාර්ගය හැදෙනවා. එහෙම නැත්නම් ග්‍රාමීය මාර්ගය හැදෙනවා. අපට දෙන්න තිබෙන මුදල් ටික මධ්‍යම රජය පාවිච්චි කරලා, ග්‍රාමීය පාරවල් හදන්න කටයුතු කරලා තිබෙනවා. පළාත් සභා පාර අපේ. අපි දන්නෙත් නැහැ, අපේ ගමේ තිබෙන පළාත් සභා පාර හදන්නේ මෙගා පොලිස් කියන ආයතනයෙන්. එතකොට මේවා නොවෙයි වෙන්නට තිබුණේ. අදාළ ආයතනවලට මුදල් දීලා ඒවා ඉටු කරන එක තමයි මම හිතන්නේ වැදගත් වන්නේ. ඒ නිසා අපට ගැටලු ගණනාවක් තිබෙනවා. ඒ වාගේම -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, කාලය අවසානයි. වැඩිපුරත් විනාඩියක් ගිහිල්ලා තිබෙන්නේ.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

නාගරික සංවර්ධන අධිකාරිය මැදිහත් වුණා. දැන් මහ නගර සැලැස්ම ක්‍රියාත්මක වන කොට පළාත් පාලන ආයතනය සතු බලතල සියල්ල උදුරාගන්න ක්‍රමවේදයක් තිබෙනවා. මේවා නියාමනය කිරීම හා ඒවාට උපදෙස් දීමේ බලය තිබෙන්නේ පළාත් සභාවට. ඒ නිසා මේ පල්ලෙහා තිබෙන ආයතන ටිකත් රැක ගන්නට ඕනෑ. ඉතින් කරුණු කාරණා ගණනාවක් කථා කරන්න තිබුණත් කාලය හමාරයි කියලා ඔබතුමා කියනවා. ඒ නිසා මම අවසාන වශයෙන් කියන්නේ, අපි මේ පළාත් සභාවට යමක් කරන්න හිතාගෙන ආවේ. ඒ නිසා අපට ඒ මුදල් සම්බන්ධයෙන් යම් යම් සීමාවන් තිබෙන්න පුළුවන්. කෘෂිකර්ම අමාත්‍යාංශයේ ගරු ඇමැතිතුමා එක්ක අපි සාකච්ඡාවක් කළා. මුදල් ගොනුවක් ලබා දීලා තිබෙන්නේ. අපට අවශ්‍ය විෂයයන්වලට බෙදාගන්න හරි පුළුවන් වීම සම්බන්ධයෙන් අපි එක අතකින් සතුටු වුණා. ඉදිරි කාලයේ මේ පළාත් සභාව මේ ප්‍රදේශවලට අර්ථවත් යමක් කරන පළාත් සභාවක් වෙන්නය කියලා එක සිතින් මම ප්‍රාර්ථනා කරන අතර කවුරු හරි හිතනවා නම් ඩීල් දාලා, අරවා මේවා කරලා මේක විකෘතියක් කරන්න. අලුතින් ආව මන්ත්‍රීවරයෙක් වශයෙන් අපිත් එක්කත් යම් කොටසක් ඉන්නවා. අපි තනි මතයක ඉන්නවා. අපි මොකක්ද කරන්න ඕනෑ. අපි ගන්න තීන්දුව. ඒ නිසා මහ ඇමැතිතුමාටත්, අමාත්‍ය මණ්ඩලටයත් ඉදිරියට හොඳට වැඩ කරන්න ශක්තිය ලැබෙන්න කියලා ප්‍රාර්ථනය කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 12.25]

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් අවසරයි. ඒ වාගේම ප්‍රධාන ලේකම්තුමා ඇතුළු සියලුම නිලධාරීන්ගෙන් අවසරයි. විශේෂයෙන්ම 2017 අයවැය ලේඛනය සම්බන්ධයෙන්, පොදු සාකච්ඡාව පිළිබඳව කථා කිරීමට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් සතුටු වෙනවා. මොකද, අපි පළාත් පාලන ආයතන විසුරුවා හැර තිබෙන නිසා පළාත් පාලන ආයතන මන්ත්‍රීවරුන්ට පස්සේ මේ රටේ මහජන නියෝජිතයන් හැටියට ජනතාවට වැඩියෙන්ම ළඟින් කටයුතු කරන්නේ පළාත් සභා මන්ත්‍රීවරු. ඒ පළාත් සභා මන්ත්‍රීවරු ළඟට තමයි වැඩ කරගන්න අද මහජනතාව වැඩියෙන් එන්නේ. නමුත් අපි අද කනගාටු වෙනවා. පක්ෂ විපක්ෂ පළාත් සභා මන්ත්‍රීවරුන්ට 2017 වර්ෂය තුළ වැඩ කරන්න අවස්ථාව ලබා ගන්න පුළුවන් තත්ත්වයක් උදාවෙයිද කියන එක පිළිබඳව අපට ලොකු ගැටලුවක් තිබෙනවා. මොකද, ගමේ ගිහිල්ලා පළාත් සභා මන්ත්‍රීවරු වැඩ කරනවාට අද පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, ඇමැතිවරු කැමැති නැහැ. ඒ නිසා තමයි අද පළාත් සභාවට ලබාදෙන මුදල් පුනරාවර්තන වාගේම ප්‍රාග්ධන මුදල්වල අඩුවීමක් සිද්ධ කරලා තිබෙන්නේ. මොකද, පළාත් සභාව තුළ විශාල වැඩ කොටසක් පළාත් සභා මන්ත්‍රීවරු පක්ෂ බේදයෙන් තොරව ගම්වල කරනවා. ඒක බලාගෙන ඉන්න බැරි නිසා තමයි, අද විශේෂයෙන්ම ප්‍රාග්ධන මුදල්වල විශාල අඩුවීමක් සිද්ධ කරනවා වාගේම අපේ පුනරාවර්තන මුදල්වලත් විශාල අඩුවීමක් සිද්ධ කරලා තිබෙන්නේ.

අපි 2016 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේ මුළු අයවැයෙන් ඇස්තමේන්තුගත මුදලෙන් මිලියන 6212 ක් අඩු කරලා තිබෙනවා. ඒ වාගේම පළාත් සභාව රැස් කරන ආදායම 2015 දී සත්‍ය ආදායම වුණේ, මිලියන 34,809 යි. ඒ අනුසාරයෙන් තමයි අපි 2016 ඇස්තමේන්තුවත්, 2017 අයවැය ඇස්තමේන්තුවත් සකස් කරන්නේ. නමුත් මෙවර මිලියන හතළිස් දෙදහස් ගණනක් සභාව රැස් කරන ආදායම් හැටියට අය ශීර්ෂවලින් එකතු කරන්න අද කටයුතු කරලා තිබෙනවා. නමුත් මෙහිදී අපි පැහැදිලිව කියන්න ඕනෑ. 2015 ට සාපේක්ෂව 2017 දී අය ශීර්ෂ දෙකක හැරෙන්න අනික් අය ශීර්ෂවල ලොකු වෙනසක් සිද්ධ වෙලා නැහැ. ඒ අය ශීර්ෂ දෙක තමයි, මුද්දර ගාස්තු සහ ජාතිය ගොඩනැඟීමේ බද්ද. ජාතිය ගොඩනැඟීමේ බද්දෙන් රුපියල් මිලියන 1500 ක් වැඩි කරන කොට, අනික් පැත්තෙන් NBT වල මිලියන 6000 ක් වැඩි කරලා තිබෙනවා. නමුත් NBT වැඩි කරන්න නම්, දැන් රජය අය කරලා තිබෙන බදුවලට අමතරව තවත් ජාතිය ගොඩනැඟීමේ බද්ද වැඩි කරන්න සිද්ධ වෙනවා. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට මේක පිළිගන්න පුළුවන්කමක් නැහැ. මේ විධියට බලනකොට 2017 දී මිලියන 13,500 ක අඩු වීමක් තිබෙනවා. අපට මේ අයවැය ලේඛනය තුළ පෙන්නලා දුන්නාට, ගිය වසරට වඩා

[ගරු සහන් ප්‍රදීප් විතාන ]

සාපේක්ෂව සමාන මුදලක් ලැබෙනවා කියලා පළාත් සභාව රවට්ටලා තිබෙන්නේ. අපේ නිලධාරීන්, අපේ මන්ත්‍රීවරු රවට්ටලා, ගන්න බැරි මුදලක් ගන්නවා කියන එක අද පෙන්නලා තිබෙනවා. ඒ පිළිබඳව අපේ කනගාටුව ප්‍රකාශ කරනවා. මේ විධියට ගියොත් පුනරාවර්තන වියදම් යටතේ අපට කිසිම සේවකයෙක් බඳවාගන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. අනික් පැත්තෙන් ඉන්ධන, ඒ වාගේම අතිකාල මේ නිලධාරීන්ට ගෙවන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. මේ විධියට ලොකු අසාධාරණයක් සිද්ධ වෙනවා. මේ පිළිබඳව සභාව දැනුවත් කරන්න කැමැතියි. ඒ වාගේම පළාත් සභාවේ අපේ තිබෙන සංචිතයෙන් රුපියල් මිලියන 2500 ක් මේ අයවැයට එකතු කරලා තිබෙනවා. නමුත් අපේ තිබෙන සංචිතය දවසින් දවස අඩු වෙනවා. ඒකට හේතුව තමයි, ගිය වසරේ සංචිතයේ මුදල් ගත්තා. මොකද, අපේ සංචිතයෙන් ගන්න මුදල් වියදම් වුණත් පළාත් සභාවට දෙනවයි කියන රජයේ ප්‍රදාන ලබා දෙන්නේ නැහැ. ඒ නිසා අපේ සංචිතයේ මුදල් දවසින් දවස වියදම් වෙනවා. මේ මිලියන 2500 ගන්න කොට පළාත් පාලන ආයතනවල තිබෙන මුද්දර ගාස්තු, ඒ වාගේම අනික් පැත්තෙන් කොන්ත්‍රාත්කරුවන්ගේ තැන්පත් කරලා තිබෙන අත රැඳවුම් මුදල් ඉවත් කරලා අයින් කළාට පස්සේ, අපට ලොකු මුදලක් ඉතිරි වන්නේ නැහැ.

අනික් පැත්තෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ රුපියල් මිලියන 7000 ක් දෙනවා කියලා අපි මේ අවුරුද්දේ රුපියල් මිලියන 3000 ක ගිවිසුම් ගත වෙලා තිබෙනවා, කොන්ත්‍රාත්කරුවන් එක්ක. මේ අවුරුද්දේ වැඩ ක්‍රියාත්මක කරන්න. නමුත් මිලියන 300 යි ඇවිල්ලා තිබෙන්නේ. අපේ හිටපු ප්‍රධාන ලේකම්තුමිය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමාත් එක්ක ගිවිසුම්ගත වෙලා තිබෙනවා, මේ මුදල ගෙවන්න. එයත් ගෙවන්න සිද්ධ වන්නේ අපේ සංචිතයෙන්. එතකොට එතැනටත් මුදල් යන කොට මේ මිලියන 2500 ත් මේකට ඇතුළත් කළාම එන අවුරුද්ද වන කොට අපේ සංචිතයේ ශත පහක්වත් ඉතුරු වන්නේ නැහැ. ඒ පිළිබඳව අපි සභාව දැනුවත් කළ යුතුයි.

ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අපේ අමාත්‍යාංශවලට වෙන් කරපු මුදල් 2016 වසර තුළ අපට හරි හැටි වියදම් කරගන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ. නමුත් ගරු ප්‍රධාන අමාත්‍යතුමාත්, ප්‍රධාන ලේකම්තුමාත් 2017 වර්ෂය සඳහා අලුත් ප්‍රවේශයක් ලබාගෙන තිබෙනවා. මේ වන කොට ප්‍රධාන අමාත්‍යතුමාගෙන් කියැවුණා. නියෝග හතක් ඒ පොතේ ලබා දීලා තිබෙනවා. ඒ නියෝගයන් ක්‍රියාත්මක වුණොත් - විශේෂයෙන්ම අමාත්‍යාංශවල ඒ කරන වැඩ අධීක්ෂණය කිරීම සඳහා කමිටුවක් පත් කිරීම. මූල්‍ය සීමාවන්ට යටත්ව ව්‍යාපෘති අනුමත කිරීමේ බලය ප්‍රධාන ලේකම්තුමා අමාත්‍යාංශ ලේකම්වරුන්ට ලබා දීම. ඒ වාගේම පළාත් සංවර්ධන සැලැස්ම යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී දැනට පවතින කොන්දේසි ලිහිල් කිරීම. ඒ වාගේම මන්ත්‍රී යෝජනා ක්‍රියාත්මක කිරීමේදී සියලු යෝජනා ලැබෙන තෙක් නොසිට ලැබී ඇති යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කිරීම. මෙවැනි කටයුතුත් එක්ක මම හිතන්නේ 2017 වර්ෂය තුළ මේ වෙන් කරලා තිබෙන මුදල් ප්‍රමාණය හොඳින් වියදම් කිරීමේ සහ ඵලදායි ලෙස ජනතාවට යොමු කිරීම සඳහා අවස්ථාව ලැබෙයි කියලා අපි විශ්වාස කරනවා.

ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අඩුවීම තුළ සෑම අමාත්‍යාංශයකම, සෑම වැය ශීර්ෂයකම පුනරාවර්තන සහ ප්‍රාග්ධන මුදල්වල විශාල අඩුවීමක් සිද්ධ වෙලා තිබෙනවා. ඒකට නිලධාරීන්ට කරන්න දෙයක් නැහැ. ගරු මහ ඇමැතිතුමාට කරන්න දෙයක් නැහැ. ගරු අමාත්‍යවරුන්ට කරන්න දෙයක් නැහැ. නමුත් අපට ලබා දීලා තිබෙන ඒ රාමුව තුළ තමයි මේ කටයුතු ක්‍රියාත්මක වෙන්නේ. නමුත් ප්‍රධාන ලේකම්තුමා ඇතුළු ඒ අමාත්‍යාංශ ලේකම්තුමන්ලාට 2017 වර්ෂයේ ලොකු වගකීමක් තිබෙනවා. ගරු මහ ඇමැතිතුමාගේ අයවැය කථාවත් එක්ක අර්ථවත් විධියට ඒ ලබා දෙන මුදල කොහොම හරි වියදම් කරලා 2017 දී ඒ ප්‍රගතිය පෙන්වන්න. එහෙම වුණොත් අපට 2018 දී මේ පළාත් සභාව තුළ ලොකු වෙනසක් කරන්න පුළුවන්කම තිබෙනවා. ඒ වාගේම අනික් එක තමයි, PDG, PSDG වල අමාත්‍යාංශ හරහා මුදල් වෙන් කරන කොට වැය ශීර්ෂවලට, නැත්නම් විෂයයන්වලට පැහැදිලිව මුදල් වෙන් කරලා තිබෙනවා. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, PDG වල, පළාත් සභාවෙන් වෙන් කරන මුදල්වල එක පොදියට මුදල් වෙන් කරනවා මිසක්, පැහැදිලිව මුදල් වෙන් කරලා නැහැ. ඒක අපි ගරු ප්‍රධාන අමාත්‍යතුමාටත්, ප්‍රධාන ලේකම්තුමාටත් කියන්න ඕනෑ. මොකද මම උදාහරණයක් හැටියට කිව්වොත් ක්‍රීඩා අමාත්‍යාංශයට PDG වලින් ශත පහක්වත් වෙන් වෙලා නැහැ. කාන්තා කටයුතු කියලා විෂයයක්

තිබෙනවා. ශත පහක්වත් වෙන් වෙලා නැහැ. අනික් පැත්තෙන් තොරතුරු තාක්ෂණයට ශත පහක්වත් වෙන් වෙලා නැහැ. කලා කටයුතු, සංස්කෘතික කටයුතුවලට ශත පහක්වත් වෙන් වෙලා නැහැ. මේ නිසා අපි ඉල්ලීමක් කරනවා. අර්ථවත් විධියට PDG මුදල් ඒ විෂයයන්වලට අදාළව වෙන් කිරීමට කටයුතු කරන්නය කියලා.

ඒ වාගේම පළාත් සභාව පිළිබඳව උසස් ඩිප්ලෝමාවක් හදාරන්න, අපේ පළාත් සභා මන්ත්‍රීවරු 38 දෙනෙක් කැමැත්ත ප්‍රකාශ කරලා තිබෙනවා. අපේ ගරු මහ ඇමැතිතුමා, අපේ ගරු සභාපතිතුමා, ඒ වාගේම ප්‍රධාන ලේකම්තුමා, ඒ වාගේම සභා ලේකම්තුමා ඇතුළු හැමෝම මෙය ක්‍රියාත්මක කරන්න ලොකු උත්සාහයක් ගන්නවා. හැබැයි, තිබෙන කනගාටුව, මේ වනකොට තවමත් පළාත් සභාවේ සභා කටයුතු වැය ශීර්ෂය සඳහා ඒ නමින් මුදල් වෙන් කරලා නැහැ. ඒ පිළිබඳව අපේ කනගාටුව ප්‍රකාශ කරනවා. ඒ නිසා ප්‍රධාන ලේකම්තුමාගෙන් ඉල්ලීමක් කරනවා. අද මේ වන කොට කොළඹ විශ්ව විද්‍යාලයත් එක්ක සාකච්ඡා කරලා අවසානයි. විෂයය නිර්දේශයන් තෝරාගෙන අවසානයි. අද පළාත් සභා මන්ත්‍රීවරුන්ට තිබෙන ලොකුම ගැටලුව මේ පළාත් සභාව, පළාත් පාලන ආයතන සහ මේ විෂයයන් සම්බන්ධව තිබෙන දැනුම ලබා දෙන්න තිබෙන මදිකම. ඒ නිසා මේ ඩිප්ලෝමාව කිරීම සඳහා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ මුදල් වෙන් කරලා දෙන්නය කියන ගෞරවනීය ඉල්ලීම කරනවා. එම ඉල්ලීම කරමින්, විශේෂයෙන්ම පළාත් පාලන ආයතන පිළිබඳව ගරු මහ ඇමැතිතුමා අපට පසුගිය කාලයේ වගකීමක් ලබා දුන්නා. ඒ අයවැය ලේඛන සකස් කරන්න. ඒ සම්බන්ධව අපි කටයුතු කරමින් අද පළාත් පාලන ආයතනය අර්ථවත් විධියට, සැලසුම් සහගතව 2017 වර්ෂය සඳහා පළාත් පාලන ආයතන වෙනසක් ඇති කරමින් හොඳින් කටයුතු කරන්න පුළුවන් පසුබිම නිර්මාණය කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළ සඳහා අපි දායකත්වය ලබා දීලා තිබෙනවා. ඒ නිසා අපි ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු හැටියට අපි සියලු දෙනාම මේ අයවැය ලේඛනය සඳහා අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු සියලුම ගරු අමාත්‍යවරුන්ට සහයෝගය ලබා දෙමින්, පක්ෂ විපක්ෂ සියලු දෙනාගේම ගෞරවය රැකෙන විධියට, හැමෝගේම සහයෝගය නිලධාරීන් හැටියට ඔබ ලබා දෙමින්, හැමෝටම ඒ ප්‍රතිපාදන උපරිමයෙන් ලබා දෙන්න කියන ඒ ඉල්ලීම කරමින් සියලු දෙනාට සුභ අනාගතයක් ප්‍රාර්ථනා කරනවා.

[අ.භා. 12.35]

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම සන්තෝෂ වෙනවා. 2017 අයවැය වෙනුවෙන් පොදු සාකච්ඡාව කරන මේ මොහොතේදී මගේ සහෝදර සහන් ප්‍රදීප් අපේ පළාත් විගණකාධිපතිතුමාගේ කාර්ය භාරය ඉටු කරන මගේ සහෝදර මන්ත්‍රීතුමාගේ කථාවට පස්සේ අපේ ෆයිරූස් ගරු මන්ත්‍රීතුමාගෙන් ඉතුරු වුණු වෙලාවත් මට ලැබිලා තිබෙන නිසා මම හිතන්නේ විනාඩි 20 ක කාලයක් තුළ යමක් කියන්න පුළුවන්කම ලැබෙයි කියලා. ඉතාමත්ම ස්තූතිවන්ත වෙනවා.

මට කලින් කථා කරපු අපේ උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමා පොඩි පූර්ව හැඳින්වීමක් කළා ගරු මහ ඇමැතිතුමා සහ විපක්ෂයේ කණ්ඩායම පිළිබඳව. හැබැයි, උපුල් මහේන්ද්‍ර ගරු මන්ත්‍රීතුමා විශ්වාස කරන, කල්පනා කරන ආකාරයට ගරු මහ ඇමැතිතුමා සහ අප අතර තිබෙන බැඳීම සහ සම්බන්ධතාවය ගොඩනැගෙන්නේ මහ ඇමැති කියන ඉසුර දේවප්‍රියව පුම්බලා නොවෙයි. එහෙම පුම්බලා හිටන් ප්‍රතිලාභ ලබා ගන්න ඕනෑකමක් තිබුණා නම්, ප්‍රතිලාභ ලැබුණා නම් ඒකේ වැරැද්ද තිබෙන්නේ මහ ඇමැතිතුමාගේ මිසක් අපේ නොවෙයි. පරිණත දේශපාලඥයෙක් වුණු ගරු මහ ඇමැතිතුමා 1991 මහරගම නගර සභාවෙන් මන්ත්‍රීවරයෙක් වශයෙන් ඇවිල්ලා, මේ පැමිණි ගමන්මඟ තුළ එක එක්කෙනාගේ පිම්බිලිවලට අහු වෙනවා නම් ඒකේ වැරැද්ද තිබෙන්නේ අපේ නොවෙයි, ගරු මහ ඇමැතිතුමාගේ. ඒ නිසා උපුල් මහේන්ද්‍ර ගරු මන්ත්‍රීතුමා කල්පනා කරන්න ඕනෑ. මේ ගරු මහ ඇමැතිතුමාව පුම්බලා, ඒ ගරු මහ ඇමැතිතුමාට ඒ විධියට වැරැදි ආකාරයට කටයුතුවලට අත පන්දම් දෙමින් වැඩ කරගන්නේ කවුද කියන එක ඔබතුමා ඇඟිල්ල දික් කළේ අපට නොවෙයි. තමුන්නාන්සේලාගේම පැත්තේ කට්ටියට. ඔබතුමාගේ කථාවේදී කිව්වා වාගේ අපි එක එක්කෙනාගේ කීම්බස්වලට, ඉගැන්වීම්වලට අයවැය පරද්දන්නේ නැහැ. ඇමැතිවරු හතර දෙනාටමත්, ගරු මහ ඇමැතිතුමාටත් සහාය දෙනවා කියලා. ඒක කළෙත් තමුන්නාන්සේගේ පැත්තේ. මේ අපි නොවෙයි. ඒ නිසා තමුන්නාන්සේ ඔය කථාව පටන් ගත්තේ තමුන්නාන්සේගේම අයට ඒ දෝෂාරෝපණය කිරීමෙන් නිසා කියන එකට, ඔබතුමාගේ කොන්ද කෙළින් තිබෙන

[ගරු කේ.ඩී. අරුණ දීපාල් ]

කමට මම ස්තුතිවන්ත වෙනවා. තව වුට්ටක් කෙළින් වුණා නම්, නම කියලාම ඔබතුමා කියනවා. ඊළඟ අවුරුද්ද වන කොට කියයි.

අපි ගරු මහ ඇමැතිතුමාට පළමුවැනි අයවැයේදී උදව් කළා. උපකාර කළා. සහාය පළ කළා. එදා අපේ ගරු විපක්ෂ නායකතුමා නැඟිටලා කිව්වා, ඔබතුමාගේ පළමුවැනි අයවැය නිසා අපි කිසිඳු කාරණයක් නොතකා මේ අයවැයට සහයෝගය දෙනවා කියලා. එදා 2016 අවුරුද්දේ අයවැය. අද 2017 අවුරුද්දේ අයවැය. අද අපි ඉන්න ස්ථාවරය මොකක්ද කියන එක තමුන්නාන්සේලාට වැය ශීර්ෂයෙන් වැය ශීර්ෂයට ඉදිරියට යන කොට, අමාත්‍යාංශයෙන් අමාත්‍යාංශය ඉස්සරහාට යන කොට, තමුන්නාන්සේලාට දැකගන්න, අහගන්න පුළුවන්කම ලැබේවි, විපක්ෂයේ කණ්ඩායමේ කාර්යභාරය සහ ස්ථාවරය මොකක්ද කියන එක පිළිබඳව. අපි ගරු මහ ඇමැති ඉසුර දේවප්‍රිය මැතිතුමාට සලකන්නේ, වෙන කිසි හේතුවක් නිසා නොවෙයි. අපි මේ පළාත් සභාවේ නවක මන්ත්‍රීවරු. අපි කෙටි කාලයක් හිටපු මහ ඇමැතිවරයෙක් එක්ක වැඩ කළා. පළමුවැනි වතාවට අපි දැක්කා, දේශපාලන පක්ෂයක මහ ඇමැති කෙනෙක් වෙනුවට බස්නාහිර පළාත් සභාවට, පළාතට මහ ඇමැති කෙනෙක් විධියට ඉසුර දේවප්‍රිය මැතිතුමා හැසිරෙන විධිය. අන්න ඒ දේශපාලන පක්ෂයක මහ ඇමැති කෙනෙක් වෙනුවට බස්නාහිර පළාතට මහ ඇමැති කෙනෙක් විධියට තමන්ගේ මහ ඇමැති ධුරයේ වගකීම සහ කාර්යභාරය ඉෂ්ට කරන බව දැක්ක නිසයි අපි ගරු මහ ඇමැතිතුමාට සහාය සහ සහයෝගය පළ කරන්න හැම අවස්ථාවේම ඉදිරිපත් වුණේ. ඒක අදටත් එහෙමයි.

අපි සන්තෝෂ වෙනවා. මන්ත්‍රීවරු විධියට අපි දිහා බලනවා වාගේම මම දැක්කා, එතුමා අද උදෑසන රියැදුරන්ගේ කෑම වේල දිහා බලලා, ඒ කෑම වේල රියැදුරෙකුට තරම් නොවටින නිසා එතුමා ඒකට මැදිහත් වෙලා, රියැදුරන්ගේ කෑම වේල ප්‍රශ්නයත් එතුමා විසඳුවා. ඒ මහ ඇමතිකම නොවෙයි. ඒ මනුස්සකම. ඒ මනුස්සකමට අපි මේ අයවැයේදීත් ප්‍රමාණාත්මකව සලකනවා. ඒ නිසා ගරු මන්ත්‍රීවරුනි, තමුන්නාන්සේලා මොහොතක් කල්පනා කරලා බලන්න. මේ මම කියන කාරණය අඩු වැඩි වශයෙන් මේ මන්ත්‍රීවරු කථා කරද්දී කිව්වා. තමුන්නාන්සේලාගේ මේ පළාත් සභාවේ මේ ගරු මහ ඇමැතිතුමා හැම තිස්සේම එක කථාවක් කියනවා. මොකක්ද කියන්නේ? මහ ආණ්ඩුවේ යහපාලනය තිබුණාට පළාත් සභාවේ යහපාලනය නැහැ. මහ ඇමැතිතුමාට වැරදුණු තැනත්, අනාගතයේ ගරු මහ ඇමැතිතුමාට කෙළවෙන්න පටන් ගන්න තැනත් ඔන්න ඔය වචන ටික ඇතුළේ තියෙන්නේ. පළාත් සභාවේ යහපාලනය නැත්නම්, 2017 අවුරුද්දේ පළාත් සභාවේ යහපාලනය ගොඩනැඟිය යුතු වෙනවා. ඒක කොයි විධියට හරි පළාත් සභාවේ යහපාලනයක් නැත්නම් 2017 අවුරුද්දේ ඒක කරන විධිය -

[සභාවේ ඝෝෂා]

ගරු මහ ඇමැති ඉසුර දේවප්‍රිය මැතිතුමාට මහ ඇමැති පුටුව ලැබෙන්නේ, ගාමිණී තිලකසිරි මැතිතුමාට කෘෂිකර්ම ඇමැතිකම හම්බ වන්නේ, රංජිත් සෝමවංශ මැතිතුමාට අධ්‍යාපන ඇමැතිකම හම්බ වන්නේ, ලලිත් වනිගරත්න මැතිතුමාට සමූපකාර, ප්‍රවාහන ඇමැතිකම හම්බ වෙන්නේ, සුමිත් ලාල් මැන්දිස් මැතිතුමාට මෙහි සෞඛ්‍ය ඇමැතිකම හම්බ වන්නේ වෙන හේතුවක් නිසා නොවෙයි. ජනවාරි මාසේ 08 වැනිදා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා පක්ෂයෙන් අයිනට ඇවිල්ලා, පොදු අපේක්ෂයා විධියට තරග කරන කොට, එක්සත් ජාතික පක්ෂ කණ්ඩායම ඇතුළු මේ රටේ බහුතර මිනිස්සු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජනාධිපති කරපු නිසා. අගෝස්තු මාසේ 17 වැනිදා හදපු ආණ්ඩුව යහපාලන ආණ්ඩුවක් නිසයි මේ කට්ටිය ඇමැතිකම් ගන්නේ. එහෙම නැත්නම් ඉසුර දේවප්‍රියට මේ පුටුවේ මහ ඇමැති වෙන්න බැහැ. මහරගම ආසනයේ සංවිධායක වෙන්න බැහැ. ගාමිණී තිලකසිරිට ඇමැති කෙනෙක් වෙන්න බැහැ. හෝමගම සංවිධායක වෙන්න බැහැ. රංජිත් සෝමවංශට ඇමැති වෙන්න බැහැ. අගලවත්තේ සංවිධායක වෙන්න බැහැ. ලලිත් වනිගරත්නට ඇමැති වෙන්න බැහැ. සුමිත් ලාල් මැන්දිස්ට කළුතර සංවිධායක වෙලා ඇමැතිකමක් ගන්න හම්බ වෙන්නේ නැහැ, මේ පළාත් සභාවේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා, වාඩි වෙන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් නඟනවා. මොකද, මෙතුමා බොරු ප්‍රකාශ කිරීමේදී අපට ප්‍රශ්නයක් මතු වෙනවා. මොකද, ඔබතුමා දන්නවා, මේ පළාත් සභාවේ හිටපු මහ අමාත්‍යවරයා අගොස්තු 17 වැනිදා වනතුරු හිටියා. අගෝස්තු 17 වැනිදා පාර්ලිමේන්තුවට ගියාම අලුත් මහ ඇමැතිවරයෙක් පත් වන තුරු කැබිනට් මණ්ඩලය අහෝසියි. නැවත කැබිනට් මණ්ඩලය පත් වන්නේ ප්‍රධාන අමාත්‍යවරයාගේ යටතේ. නැතිව මේ යහපාලනය නිසා මෙතැන පත් වුණයි කියන එක අපි පිළිගන්නේ නැහැ. මෙතුමා තනිකර බොරුවක් කථා කරන්නේ. මෙතුමා බොරු කථා කරන්නේ. මොකද, හිටපු -

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

හරි. හරි. ඒ තනි චිත්‍රය නේ. අහගන්න කෝ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

එහෙමනම් ජනවාරි 09 වැනිදා වෙන්න එපැයි.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු මන්ත්‍රීතුමා, මේ ටික අහගන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ජනවාරි 09 වැනිදා වෙන්න ඕනෑ. අගෝස්තු 17 වැනිදා වනතුරු ඉන්න ඕනෑ නැහැ. බොරු කියන්න එපා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

කරුණාකර වාඩි වෙන්න. අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමාට කථා කරන්න දෙන්න.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

යහපාලනයේ ප්‍රතිඵලයක් විධියට විතරයි ඔය අද ධූරධාරීන්, තනතුරුධාරීන්, ඇමැතිවරු අද මහ ඇමැතිතුමාගේ ඉඳලා පෙළට වාඩි වෙලා ඉන්නේ. ජනවාරි 08 වැනිදා මහින්ද රාජපක්ෂ මහත්මයා නැවත වතාවක් ජයග්‍රහණය කරලා ප්‍රසන්න රණතුංග පාර්ලිමේන්තු ගියා නම්, ඉසුර දේවප්‍රියට ඇමැතිකම හම්බ වෙනවාද?

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

ඇයි නැත්තේ?

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මහින්ද රාජපක්ෂ බලයේ හිටියා නම් රංජිත් සෝමවංශ ඇමැති වෙනවාද?

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ඔබතුමා කොහොමද නැහැයි කියන්නේ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

අහගෙන ඉන්න. ඉතිරි ටික මම කියලා දෙන්නම්. ඉතිරි ටිකත් අහගන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මෛත්‍රීපාල මැතිතුමාත් අපේ. ඒක මතක තියාගන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා කියන විධියට (බාධා කිරීම්) ඒක යථාර්ථය නම් -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

එහෙමනම් නිශාන්ත වර්ණසිංහ හිටපු ඇමැතිතුමාව යහපාලනයෙන් බේරගන්න බැරි වුණේ ඇයි?

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ඒක යථාර්ථය නම්, උපාලි කොඩිකාර තවමත් ඇමැති.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මෛත්‍රීපාල ලේකම්තුමාත් අපේ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ප්‍රසන්න රණතුංග මහ ඇමැති වුණාට පස්සේ අර මම කිව්ව සාධකය නොවෙයි නම්, සාධකය. උපාලි කොඩිකාර එහෙමනම් තවමත් ඇමැති. කොඩිකාරගේ ඇමැතිකම නැති වෙන්නේ ඒ සාධකය නිසා විතරයි. නැත්නම් අද ලලිත් වනිගරත්න නොවෙයි ඔය පුටුවේ ඉන්නේ. උපාලි කොඩිකාර. මේකේ ප්‍රතිඵලය බවට පත් වෙන්නේ ජනවාරි 08.

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

දෙපැත්ත කොටවලා වාසි ගන්න හදන්නේ.

[සභාවේ ඝෝෂා]

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

යූ.ඇන්.පී එකට හරි අමාරු ඇති මහ ඇමැතිට උදව් කරන එකට. ඔබතුමන්ලාගේ හීනේ හැබෑ වෙන්නේ නැහැ. ඇමැතිකම් දෙකක් ගන්න හම්බ වෙන්නේ නැහැ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

රට යන්නේ ප්‍රධාන ඉලක්ක පහක් ඇතුළේ. ඒ රට යන ගමනට අද ආණ්ඩු පක්ෂයෙන් (බාධා කිරීම්) ඉලක්ක පහක් යටතේ. මේ ඉලක්ක පහ හදලා තිබෙන්නේ අපි නොවෙයි. රනිල් වික්‍රමසිංහ මහත්මයා නොවෙයි. මෛත්‍රීපාලයි, රනිල් වික්‍රමසිංහයි එකතු වෙලා. මෙතැන ඉඳගෙන අද කවුරු හරි කථා කරපු කෙනෙක් කිව්වා නම්, මහ ආණ්ඩුවේ අයවැය විවේචනය කළා නම්, ආණ්ඩුව විවේචනය කළා නම් ඒ විවේචනය කළේ තමුන්නාන්සේලාගේ ජනාධිපතිතුමාත් එක්කම තමයි. මේක රනිල් වික්‍රමසිංහගේ ආණ්ඩුවක් විතරක් නොවෙයි. මෛත්‍රීපාල සිරිසේනගෙත් ආණ්ඩුව මේක. මේක රනිල් වික්‍රමසිංහගේත් ආණ්ඩුව. මෛත්‍රීපාල සිරිසේනගේත් ආණ්ඩුව.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි 04 යි තිබෙන්නේ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ෆයිරුස් ගරු මන්ත්‍රීතුමාගේ විනාඩි පහත් එක්ක විනාඩි 09 යි. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

ගරු මන්ත්‍රීතුමා, අයවැය ලේඛනයට අදාළව කථා කරන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

දිළිඳුතාවය පිටු දකින්න ඕනෑය කියලා. (බාධා කිරීම්) ඒ නිසා ඔය විවේචන ඇතුළේ තිබෙන හැම එකකින්ම ජනාධිපතිතුමාවත් විවේචනය කළා. (බාධා කිරීම්) මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මෙතැන කථා කරපු බොහෝ දෙනෙක් කිව්වා, ආදායම් කපා හැරලා කියලා. 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 "ජ" වගන්තියෙන් මොකක්ද කියන්නේ. 154 "ජ" එකෙන් කියනවා, වෙනම පරිපාලන ඒකකයක් බව කියනවා. ප්‍රඥප්ති නීති හදන්න පුළුවන් කියලා කියනවා. ආදයම් එකතු කිරීමේ බලය තිබෙනවා. පළාත්බද මහ අධිකරණ ව්‍යූහයක් තිබෙනවා. 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඇතුළේ මේවා තිබෙනවා. ඒකේ 154 "ජ" තුන කොටසෙන් මොකක්ද කියන්නේ? මේ ආදායම පළාත් සභාවට දෙනවාද? නැද්ද? කියන සාධක ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව ඇතුළේ තිබෙනවා. ඒ නිසා මේ කැපුවා කැපුවා කියන්න එපා. අපි අසමත් වෙලා තිබෙනවා. බස්නාහිර පළාත් සභාව විධියට ජාතික අදායම 44% ක් ගන්න මිනිස්සු ඉන්න, රටේ ජනගහනයෙන් 1/3 ක් ඉන්න, වැඩිම ආදායම තිබෙන පළාතේ පළාත් සභාව හැටියට, අපි ඉතිහාසය පුරා හිටපු හැම මහ ඇමති කෙනෙක්ම, හැම මන්ත්‍රී කෙනෙක්ම අපි ඔක්කෝම අසමත්

වෙලා තිබෙනවා. මේ පළාත් සභාවට ස්වයංව නැඟී සිටින්න පුළුවන්. අදායම ඒකරාශී කරන, ආදායම් මාර්ග උත්පාදනය කරන දේවල් හඳාගන්නට -

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

2017 හදනවා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

80% ක් මූල්‍ය වර්ධනයක් තිබෙනවා. අපේ මහ ආණ්ඩුවේ දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවේ 23% ක මූල්‍ය වර්ධනයක් තිබෙනවා. කොහොමද ඒ මූල්‍ය වර්ධනය තිබෙන්නේ? පරිගණකගත කරලා, සිස්ටම් එකකට ඇවිල්ලා මේවා නියමිත පරිදි හඳාගත්තාට පස්සේ 23% ක මූල්‍ය වර්ධනයක් තිබෙනවා. අපේ පළාත් ආදායම් දෙපාර්තමේන්තුව තිබෙනවා. අපේ අනිකුත් ආයතන තිබෙනවා. මේවා නිසි කළමනාකරණය කරලා මේවා හරහා ආදායම් ලබා ගන්න මාර්ග හදා ගන්නවා මිසක් කවුරුවත් මුදල් කපපු එකකට දොස් කියලා වැඩක් නැහැ. ඒ දොස් කියනවා වෙනුවට අපි කළ යුතු වන්නේ අපේ මුදල් ප්‍රමාණය වැඩි කරන වැඩ පිළිවෙළකට අපි යන එකයි.

ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2017 කියලා කියන්නේ අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හැදෙන, ජාතික සමගිය හැදෙන, යහපාලනය පිහිටුවන ආර්ථිකයේ දෙපයින් නැඟිටින අවුරුද්දයි. ඒ විතරක් නොවෙයි. 2017 කියලා කියන්නේ, යහපාලනය මුවාවෙන් දෙබඩි ප්‍රතිපත්තියක් අනුගමනය කරන, දෙබඩි දරුවෝ තනි දරුවෙක් බවට පත් කරන කාලයයි. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ පඹයා හදලා පුච්චපු මිනිස්සුත් අද සංවිධායක ධූරවල ඉන්නවා. රටම වෙනස්වන අවුරුද්දක් 2017 කියලා කියන්නේ. යහපාලනය ජනතාවට යහපාලනයක් වන කොට හොරුන්ට, තක්කඩින්ට, මංකොල්ලකාරයින්ට, මිනීමරුවන්ට යමපාලනයක් වෙන්න ඕනෑ. 2017 අවුරුද්ද මේ රටේ ජනතාවට යහපාලනයක් වෙනවා වාගේම මංකොල්ලකාරයන්ට ඒක යමපාලනයක් වෙන්න ඕනෑ අවුරුද්ද තමයි 2017 අවුරුද්ද කියලා කියන්නේ. ඒකාබද්ධයේ කට්ටිය හිතාගෙන ඉන්නවා, බාල්දියේ අඩිය තියෙනවා කියලා. බාල්දියේ අඩිය නැහැ. ඔය බාල්දියේ අඩිය තියාගෙන ඉන්නවා කියලා හිතාගෙන බාල්දියෙන් වහගෙන හිටියට ගරු මන්ත්‍රීතුමා, බාල්දියේ අඩිය නැහැ. ඔය නිරුවත පේනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

බණ්ඩාරගම සංවිධායක කමත් නැහැ. කෑ ගැහුවාට දෙන්නේ නැහැ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ආණ්ඩුව වැටෙනකන් බලන් ඉන්න එපා. අර එළුවාගේ මොකක්ද එක වැටෙනකන් බලන් හිටියා වාගේ ආණ්ඩුව වැටෙනකන් බලාගෙන ඉන්න එපා. මේ ආණ්ඩුවත් යනවා. පළාත් සභාවත් -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, (බාධා කිරීම්) –

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

පී.ඩී. අබේරත්න ගරු මන්ත්‍රීතුමාගේ කාලයෙන් විනාඩි 03 ක් දෙනවා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අධ්‍යාපනයට වෙලා තිබෙන්නේ මොකක්ද?

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, පී.ඩී. අබේරත්න ගරු මන්ත්‍රීතුමාගෙන් විනාඩි 03 ක් ඔබතුමාට ලැබෙනවා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

හරි. කුමාරතුංග මුනිදාස මැතිතුමා කියනවා, "අලුත් අලුත් දෑ නොතකන ජාතිය ලොව නොනඟී" කියලා. ඒ නිසා

[ ගරු කේ.ඩී. අරුණ දීපාල් ]

අනුන්ට ආවඩන්න එපා. "අලුත් අලුත් දෑ නොතකන ජාතිය ලොව නොනගී" කියනවා වාගේම මේ පළාත් සභාව උත්සාහ කරන්න ඕනෑ, අදායම් උත්පාදනය කරන ක්‍රමවලට යන්න. පසුගිය අවුරුද්ද වන කොට අධ්‍යාපනය බැලූ විට O/L විභාගයෙන් ගණිතය ප්‍රතිශතයෙන් 47% ක්ම අසමත් වෙලා තිබෙනවා. ඉංග්‍රීසිවලින් 53% ක් අසමත් වෙලා තිබෙනවා. අධ්‍යාපනයට අද මධ්‍යම ආණ්ඩුවේ අයවැයෙන් විශාල වරප්‍රසාද ප්‍රමාණයක්, විශාල ප්‍රතිලාභ ප්‍රමාණයක් ලබා දෙනවා. ඒවාත් එකතු කරගෙන අධ්‍යාපනය ඉදිරියට යන්න ඕනෑ.

මේ විධියට ගියොත් එහෙම සමූපකාරයේ අන්තිමට ඉතුරු වන්නේ සමූපකාරයේ ඇමැති විතරයි. සමූපකාරයේ ඇමැති විතරයි අවසානයේ ඉතුරු වන්නේ, සෞඛ්‍ය ගැන මම කනගාටු වෙනවා. නිශාන්ත ශ්‍රී වර්ණසිංහ මැතිතුමාට විරුද්ධව ඡන්දය දීලා අර වාගේ ඇමැතිවරයෙක් පත් කරගත්ත එක ගැන මම සෞඛ්‍ය අමාත්‍යාංශය ගැන කනගාටු වෙනවා. (බාධා කිරීම්) මේ බස්නාහිර පළාත් සභාව ඇතුළේ ප්‍රවාහන පහසුකම් දියුණු කිරීම සඳහා ඇළවේලි මාර්ග උපයෝගී කරගෙන බෝට්ටු ප්‍රවාහන සේවාවක් පටන් ගන්න කාලය එළැඹිලා තිබෙනවා. මේ නාස්ති කරන මුදල්, කාලය විතරක් නෙවෙයි. මේ බස්නාහිර පළාත් සභාවේ පළාත ඇතුළට බෝට්ටු මගින් ප්‍රවාහන සේවාවක් ඇති කරන්න ඕනෑ. ඒ නිසා කුසලතාවය මත රාජ්‍ය නිලධාරීන්ගේ (බාධා කිරීම්) ජ්‍යෙෂ්ඨත්වය සහ අවුරුදු ගණන අනුව වැටුප් වර්ධක ලබා දෙන්නේ නැතිව මේ අලුත් ක්‍රමවේද හඳුන්වා දීලා මේ පළාත් සභාව නිසි ගමන් මගට යන්න ඕනෑ. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළාත් සභාවේ යහපාලනය ඇතුළේ රිංග ගත්ත දෙබිඩි දරුවන් ඉන්නවා. එක පාරක් පෙන්වනවා, යහපාලනයට යන මුහුණ. අනික් පැත්තෙන් යහපාලනය නොවන මුහුණ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඔය කථා කරන එක්කෙනත් එක්කෙනෙක්. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් සංවිධායකකම අරන් බණ්ඩාරගමට එනවා කිව්වා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

2017 අවුරුද්දේ මේ දෙබිඩි දරුවන් ශල්‍යකර්මයක් කරලා වෙන් කරන්න ඕනෑ. ඒ ශල්‍යකර්මය කරලා දෙබිඩි දරුවෝ 2017 අවුරුද්දේ වෙන් කරන්නම ඕනෑ. එහෙම නැතිව -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ප්‍රධාන දෙබිඩි එක්කෙනා තමයි කථා කරන්නේ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

අවසාන වශයෙන් මම ස්තුතිවන්ත වෙනවා. සිංගප්පූරුවේ ලී ක්වාන් යූ තමන්ගේ ජීවිත කථාවේ අවසාන කථාවේදී කියනවා. ලංකාවේ වෘත්තීය සමිතිවලට ස්තුතිවන්ත වෙනවා. ලංකාවේ වෘත්තීය සමිති ලබා දුන්නු ජයග්‍රහණය නිසා තමයි මම සිංගප්පූරුව ගොඩනැගුවේ කියලා. (බාධා කිරීම්) 2017 අවුරුද්දේ යහපාලනය හදන්නට ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ සහයෝගය නිසාම 2017 අවුරුද්දේ නියත වශයෙන්ම බස්නාහිර පළාත් සභාවේ යහපාලනය හදනවා. මහ ඇමැතිතුමා කැමැති වුණත් අකැමැති වුණත් 2017 අවුරුද්දේ යහපාලනය හදනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ආ ... ඒවා අමාරු වෙයි.

[අ.භා. 12.55]

**ගරු ඉන්දික මහීෂ බණ්ඩාර**
Hon.Indika Maheesha Bandara

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ස්තුතියි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට රීති ප්‍රශ්නයක් තිබෙනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මේ කථාවෙන් පස්සේ.

**ගරු ඉන්දික මහීෂ බණ්ඩාර**
Hon.Indika Maheesha Bandara

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ පළාත් සභාවේ -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මට අහන්න ඕනෑ, අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා මොන පක්ෂයද නියෝජනය කරන්නේ? මෙතුමන්ලාගේ පක්ෂය විසුරුවා හැරලා තිබෙන්නේ.

[සභාවේ ඝෝෂා]

**ගරු ඉන්දික මහීෂ බණ්ඩාර**
Hon.Indika Maheesha Bandara

29 වැනි මුදල් ප්‍රකාශය සම්බන්ධව අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලැබීම සම්බන්ධයෙන් ගරු විපක්ෂ නායකතුමාටත්, විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාටත් ස්තුතිවන්ත වෙනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මහර සංවිධායක ධූරය ලබා දීම පිළිබඳව අපි ස්තුතිවන්ත වෙනවා.

**ගරු ඉන්දික මහීෂ බණ්ඩාර**
Hon.Indika Maheesha Bandara

සංවිධායක ධූර පිළිබඳවත්, මහර දිනන එක ගැනත් අපි බලාගන්නම් ගරු මන්ත්‍රීතුමා. විපක්ෂ නායක ධූරය ඔබතුමාට ලැබෙයි. 1987 ආරම්භ කරපු පළාත් සභා ක්‍රමයත් එක්ක මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටේ ප්‍රධාන පළාත් සභාව, බස්නාහිර පළාත් සභාවයි. හැබැයි, මේ ගරු මන්ත්‍රීතුමන්ලා සියලු දෙනාම කියපු කරුණු කාරණාත් එක්ක අරගෙන බැලුවාම අපි සියලුම දෙනාම කනගාටු වෙන්න ඕනෑ, ස්වෝත්සාහයෙන් නැගී සිටින්න පුළුවන් තත්ත්වයක් අපට නිර්මාණය කරගන්න බැරි වෙලා තිබෙනවා. මීට පෙර හිටපු ඇමැතිවරු, ප්‍රධාන අමාත්‍යතුමන්ලා සියලුදෙනා විවිධ යෝජනා ඉදිරිපත් කළා. හැබැයි, ඒ දේ ක්‍රියාත්මක කර ගැනීමට බැරිවීම තමයි ලොකුම ප්‍රශ්නය වෙලා තිබෙන්නේ. අපේ නව ගරු ප්‍රධාන අමාත්‍යතුමා මම හිතන්නේ ඉතාමත්ම ඉහළ උත්සාහයක් ගන්නවා, සියලු දෙනාම එකතු කරගෙන මේ වැඩ පිළිවෙළට යන්න. මම හිතන්නේ එතුමාගේ උත්සාහය අසාර්ථක කිරීමට විවිධ පාර්ශවයන් අද උත්සාහ කරනවා. ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතන්නේ මේ රටේ රජය වෙනස්වීමත් එක්ක අපට අවශ්‍යතාවයක් තිබුණා, අපි හිතුවා පළාත් සභාව තුළත් යහපාලනයට අනුකූලව අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා යටතේ මේ වැඩ පිළිවෙළ කරගෙන යන්න පුළුවන් කියලා. නමුත් අවාසනාවකට අද වන කොට අපේ උපුල් මහේන්ද්‍ර ගරු මන්ත්‍රීතුමා කිව්ව ආකාරයට, එදා ගරු මහ ඇමැතිතුමා විවේචනය කරලා, මහ ඇමැතිතුමාට විවිධ දේවල් කියපු (බාධා කිරීම්) අය දැන් එතුමාගේ පාර්ශවය අරගෙන. එය අපේ ආදරණීය සහෝදර ගරු මන්ත්‍රීතුමා පැහැදිලි කළා. එතුමා කියනවා, පත් වුණේ ප්‍රසන්න රණතුංග මැතිතුමා ගිය හින්දා කියලා. මම හිතන්නේ ඔබතුමා මට වැඩිය ගොඩක් ජොෂ්ඨයි. ජනාධිපතිවරයා තමයි අලුතින් මහ ඇමැතිවරයා පත් කරන්න ඕනෑ. එතුමාට පක්ෂව හිටපු නිසා තමයි ඉසුර දේවප්‍රිය මැතිතුමාව -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අඩුපාඩුවට පත් කළේ.

**ගරු ඉන්දික මහීෂ බණ්ඩාර**
Hon.Indika Maheesha Bandara

අඩුපාඩුවට වෙන කෙනෙක් පත් කරන්න තිබුණා. ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම තව පැත්තකින් ආඩම්බර වෙනවා. මට බාධා කරන්න ඉන්න තව එක මන්ත්‍රීවරයෙක්, ඔබතුමා ඔතැන අසුන් ගෙන සිටින නිසා. ඇත්තටම මේ ඒකාබද්ධ විපක්ෂය හැටියට පත් වෙලා, පාර්ලිමේන්තුවේ වෙනමම මේ කණ්ඩායම පෙනී ඉඳගෙන, රජය විවේචනය කරමින් විවිධ දේවල් කරනවා. හැබැයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කනගාටුයි කියන්න. පළාත් සභාව තුළ මේ අපේ පොහොට්ටු කණ්ඩායම මොකක්ද කරන්නේ. ඒ ඒකාබද්ධ විපක්ෂයේ (බාධා කිරීම්) මට ඉතා සුළු වෙලාවයි තිබෙන්නේ. කන්න යන්න වෙලාව හරි. ඒකාබද්ධ විපක්ෂයේ නායකත්වය අරගෙන ප්‍රබලව කෑගහන්නේ මේකේ හිටපු මහ ඇමැතිතුමා. එතුමා කරපු දූෂණ, වංචා, අසාධාරණකම් ගැන වෙනම අපි කටයුතු කරගෙන යනවා. එතුමාගේ ගෝලයෝ ටික අද මෙතැන ඉඳගෙන, අපේ ඉසුර දේවප්‍රිය ගරු මහ ඇමැතිතුමාට අසභ්‍ය වචනයෙන් බැණලා, මේ ඇමැතිවරු විවේචනය කරලා ඇමැතිවරුන්ගේ අයවැය පරාජය කරන්න හදනවා. මේ ඩබල් ගේම් ගහන්න හදන එක. මේ දෙපැත්තට තිබෙන ඩබල් ගේම අපි සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරනවා.

[සභාවේ ඝෝෂා]

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

අපි ගරු මහ ඇමැතිතුමාට සහයෝගය දෙන එකට අමාරුයි වාගේ.

**ගරු ඉන්දික මහීෂ බණ්ඩාර**
Hon.Indika Maheesha Bandara

අපේ ගරු මහ ඇමැතිතුමා -

[සභාවේ ඝෝෂා]

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

ගරු මහ ඇමැතිතුමා, හොරෙන් හොරෙන් ඇවිල්ලා මෙතුමන්ලා ඔබතුමාගෙන් වැඩ කර ගන්නවා.

**ගරු ඉන්දික මහීෂ බණ්ඩාර**
Hon.Indika Maheesha Bandara

ඒකාබද්ධ විපක්ෂය නියෝජනය කරන සුනිල් ජයමිණි සභා නායකතුමාටත් මම කියනවා -

[සභාවේ ඝෝෂා]

පළාත් සභාවේ වැඩ කරන්න දෙන්නේ නැතිව, පළාත් සභාවේදි කකුළෙන් අදිමින්, විවිධ තර්ජන කරමින්, ඇමැතිවරුන්ව භය කරමින් මේ කරන්න හදන - තමන්ගේ ළමයින් ටික දා ගන්නවා. ඉස්කෝලේ ළමයින් ටික දා ගන්නවා. පාරවල් හදා ගන්න, විවිධ කාරණා ඉෂ්ට කරගන්න, ඒ දේවල් කරලා ඊට පස්සේ ගමේ ගිහිල්ලා පොහොට්ටු පුම්බන්න කථා කරනවා. ගරු මන්ත්‍රීතුමනි, හිතට එකඟව කරන්න පුළුවන් දෙයක්ද? මේ සියලු දෙනා අද ඩබල් ගේම් ගහන්නේ. දෙපත් නයි ගේම් ගහන්නේ.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

ඩබල් ගේම් ගහලා තමයි තමුන්නාන්සේ ෆොන්සේකාගෙන් ආවේ.

**ගරු ඉන්දික මහීෂ බණ්ඩාර**
Hon.Indika Maheesha Bandara

තමුනාන්සේලාගේ එක ප්‍රතිපත්තියකින් පොහොට්ටු නායකතුමා, ඔබතුමා -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මහර -

[සභාවේ ඝෝෂා]

**ගරු ඉන්දික මහීෂ බණ්ඩාර**
Hon.Indika Maheesha Bandara

මහර එයා වුණත්, කිසි දවසක ගේමක් නැහැ. එතුමා වුණත්, මම වුණත්. මහර ප්‍රශ්නයක් නැහැ. මම එක දෙයක් කියන්න ඕනෑ. කිව්ව නිසා කියන්නම්. සහන් ගරු මන්ත්‍රීතුමාත් චන්ද්‍රිකා මැතිනියගේ ගෙදර ගියා. ලසන්ත ආවේ නැත්නම් මෙතුමා තමයි සංවිධායක වෙන්න හිටියේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

කථාව අවසන් කරන්න.

**ගරු ඉන්දික මහීෂ බණ්ඩාර**
Hon.Indika Maheesha Bandara

කාගේ කාගේත් කිල්ලෝටවල හුණු තිබෙනවා. හැබැයි ඒවා පැත්තක තියලා මේ සභාව දිනවන්න, ඉදිරියට ගෙනි යන්න, මෙම වැඩ පිළිවෙළ ඉදිරියට ගෙනි යන්න -

[සභාවේ ඝෝෂා]

ළඟම පාසල හොඳම පාසල වැඩ සටහන - තව විනාඩියක් දෙන්න.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, රීති ප්‍රශ්නයක්.

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

මේ පළාත් සභාවේ කියන කිසිම දෙයක් ඇහැන්නේ නැහැ. අපේ හොඳට කන් ඇහෙනවා. මෙතුමා කථා කරන විධියට අර ස්පීක්ර් හදලා, සවුන්ඩ් එක පොඩ්ඩක් අඩු කරලා කථා කරන්න කියන්න.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා,

**ගරු ඉන්දික මහීෂ බණ්ඩාර**
Hon.Indika Maheesha Bandara

තත්පරයක් දෙන්න. මම අසනීපෙන් ඉන්නේ.

[සභාවේ ඝෝෂා]

**ගරු රවීන්ද්‍ර යසස් කුමානායක**
Hon. Ravindra Yasas Kumanayake

නිලධාරීන්ට හැන්සාඩ් වාර්තාව හදා ගන්න බැරිව යනවා.

**ගරු ඉන්දික මහීෂ බණ්ඩාර**
Hon.Indika Maheesha Bandara

අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රතිපත්තියක් කියලා. හැබැයි මම කියන්න ඕනෑ, ඒක මගේ දේශපාලන ගුරුවරයා වන අකිල විරාජ් කාරියවසම් මැතිතුමාගේ ප්‍රතිපත්තියක්. එය අගමැතිතුමාගේ ප්‍රතිපත්තියක්. මේ අපි සියලු දෙනා අතර ප්‍රශ්න තිබෙන්න පුළුවන්.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, කාලය අවසන්.

**ගරු ඉන්දික මහීෂ බණ්ඩාර**
Hon.Indika Maheesha Bandara

හැබැයි, මේ සභාව ඉදිරියට ගෙන යන්නේ අලියාද, අතද, පොහොට්ටුවද, හක්ගෙඩියද මේවා පැත්තකින් තියලා මේ ඇමැති මණ්ඩලයත් එක්ක - කාට උවමනා වුණත් 2020 වනතුරු මේක වෙනස් කරන්න බැහැ. අපිට අවශ්‍යතාවය තිබුණා නම් මම දේශපාලනය ආරම්භ කළෙත් යූ.ඇන්.පී. එකෙන්. අද ඉන්නෙත් යූ.ඇන්.පී එකේ -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

දිවා විවේකය සඳහා පස්වරු 02.00 දක්වා කල් තබනවා.

***ඊට අනුකූලව පූර්ණ කාරක සභාව තාවකාලිකව අත්සිටුවන ලදින් අ.භා. 02.00 ට ගරු නියෝජ්‍ය සභාපතිතුමාගේ [යසපාල කෝරළගේ මහතා] ප්‍රධානත්වයෙන් යළිත් රැස් විය.***

*Accordingly the Committee of the Whole Council Suspended and. it resumed at 02.00 p.m. with Hon. Deputy Chairman [Mr. Yasapala Koralagae] in the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර් ගරු මන්ත්‍රීතුමාට විනාඩි 05 ක කාලයක් ලබා දෙනවා.

[අ.භා. 02.01]

**ගරු ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

වත්මන් ගරු මහ ඇමැතිතුමාගේ දෙවැනි අයවැය විවාදයේ කථා කිරීමට අවස්ථාවක් ලබා දීම ගැන ගරු නියෝජ්‍ය සභාපතිතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. පළමුව අපි පළාත් සභාවක් හැටියට මහමාත්‍ය ධුරය පාලනය කරන සභාවේ මම අවස්ථාවක් කර ගන්නවා විනාඩියක කාලයක්, ලෝකයේ විශාලම ප්‍රජාතන්ත්‍රවාදී රටක් හැටියට මහාභාරතය වන ඉන්දියාවේ තමිල්නාඩු ප්‍රාන්තයේ මහාමාත්‍යතුමිය හැටියට වැඩ කටයුතු කළ ජයලලිතා ජයරාම් මහ ඇමැතිතුමිය වෙනුවෙන් මේ රටේ දෙමළ ජනතාව වෙනුවෙනුත් එතුමියට ආදරය කරන මේ රටේ ජනතාව වෙනුවෙනුත් මේ ගෞරවනීය සභාවේ ශෝකය පළ කිරීමට අවස්ථාවක් කර ගන්නවා. ඒ ශෝකය, කනගාටුව මේ අවස්ථාවේදී පළ කරනවා.

ඒ වාගේම බස්නාහිර පළාත් සභාවේ මම හිතන්නේ 2017 අයවැය විවාදයේ, ප්‍රධාන අරමුණ සහ ප්‍රතිපත්ති අයවැය පොතේ සඳහන් වෙනවා. මූලිකම අරමුණ එක වගන්තියේ දෙක හැටියට සඳහන් කරලා තිබෙනවා, ප්‍රජාතන්ත්‍රවාදය තවදුරටත් ශක්තිමත් කිරීම කියලා. ප්‍රජාතන්ත්‍රවාදී රටක ප්‍රශංසා කළ යුතුයි ප්‍රජාතන්ත්‍රවාදය රැකගෙන තවදුරටත් ශක්තිමත් කිරීම පිළිබඳව අවස්ථාවක්, 2017 වසරේදී ඉදිරිපත් කිරීම පිළිබඳව. ප්‍රධාන අරමුණේ සහ ප්‍රතිපත්ති එක, මනා පරිපාලනයක් ස්ථාපිත කිරීම කියලා සඳහන් කිරීම මම හිතන්නේ, ඉතිහාසයේ හිටපු අමාත්‍යවරුන් කරපු වැරැදි එහෙම නැත්නම් මහ ඇමැති ඇතුළු සියලුම ඇමැතිවරුන්, මන්ත්‍රීවරුන් කරපු පරිපාලනයේ වැරැද්දක් නිසාදෝ දන්නේ නැහැ. මම මුස්ලිම් ජාතිකයෙකු හැටියට භාෂා තුනක් පරිවර්තනය වන එකම සභාවක් හැටියට තමයි මේ සභාව පෙනෙන්නේ. භාෂා තුනත් එක්ක මේ සඳහන් කිරීම මම හිතන්නේ 2017 වසරේදීවත් මනා පරිපාලනයක් ඇති විය යුතු වේවායි මා ප්‍රාර්ථනා කරනවා. සුභ පතනවා. අතීතය අරගෙන බැලුවාම වැරැදි, එහෙම නැත්නම් අවතක්සේරුවට වැටුණු පරිපාලනයක් තිබිලා වෙන්න ඇති එහෙම සඳහන් කර ඇත්තේ කියලා මම මතක් කරනවා.

[ ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර් ]

ඒ වාගේම සමූපකාරය, කෘෂිකර්මය, සෞඛ්‍ය, පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ ඇතුළුව ගත්තාම ඉතිරි අමාත්‍යාංශ ටික අරගෙන බලද්දී කිසිම සේවාවක් නොවනවා වාගේ තමයි මේ බස්නාහිර පළාත් සභා අමාත්‍ය ධූරය. මහ මාර්ගය, ප්‍රවාහනය ඇරුණු කොට අනිකුත් සියලුම අමාත්‍යාංශ සම්බන්ධයෙන් මම හිතන්නේ මේ අයවැය පොතේ මිලියන ගණන් සඳහන් වුණත්, පිටුවකින් තමයි ඒ සංවර්ධනයත්, අනාගත සංවර්ධනයත් සඳහන් වෙලා තිබෙන්නේ කියන එක පිළිබඳවත් මතක් කළ යුතු වෙනවා. විශේෂයෙන් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සමූපකාර ක්ෂේත්‍රය ගත්තාම බංකොලොත් භාවයට පත් වෙලා තිබෙන සමූපකාර සමිති - සමූපකාර බැංකුවේ මුදල් තිබුණත් අද සමූපකාර සමිතියකට කළමනාකරුවෙක් පත් කරන්න පඩියක් ලබා දෙන්නවත් ශක්තිමත් භාවයක් නැහැයි කියන එක මතක් කළ යුතු වෙනවා. ඒ නිසා මම හිතන්නේ සමූපකාර ක්ෂේත්‍රෙය් වැඩ පිළිවෙළ සම්බන්ධව මේ ගෞරවනීය සභාවේ වගකීමක් වෙනවා. ඒ චක්‍රලේඛ ලිහිල් කරලා, වෙනස් කරලා, දැනට ඒ පඩියට සරිලන තනතුරක් හැටියටවත් පරිවර්තනය කරලා, උපාධිධාරීන් කියන ක්ෂේත්‍රය ඉවත් කරලා ඊට පහළ මට්ටමකට බැහැලා හරි පළාතේ, රටේ සංවර්ධනය සඳහා සමූපකාරය නඟා සිටුවීමට කටයුතු කරන්න ඕනෑය කියන එකත් මේ සභාවේදී මම මතක් කරන්නට ඕනෑ.

කෘෂිකර්මය අරගෙන බැලුවාම, මම බොහොම කෙටියෙන් සඳහන් කරන්නේ. ඉදිරියේදී පැවැත්වෙන විවාදවලදී ඒවා සඳහන් කළ යුතුයි. කරුණු කාරණා අනුව, සංඛ්‍යා ලේඛන අනුව අපි ඒවා ඔප්පු කළ යුතුයි. කෘෂිකර්ම ක්ෂේත්‍රය අරගෙන බැලුවාම, මේ රටේ කනගාටුදායක සිද්ධියක් තිබෙන්නේ. හැබැයි, මම මේක කිව්වාම කියයි කෘෂිකර්මයට විරුද්ධව කථා කරනවා කියලා. මම බේරුවල මැතිවරණ කොට්ඨාශයේ සංවිධායකවරයා හැටියට කන්න දෙකටම අපි කෝටි ගණනක් වියදම් කරනවා. සියලුම රජයන්. මම පක්ෂයක් හැටියට කථා කරන්නේ නැහැ. පැවැත් වුණු සියලුම රජයන්, සියලුම කෘෂිකර්ම අමාත්‍යාංශ, මහ අමාත්‍යාංශ, පළාත් අමාත්‍යාංශ සියලුම අමාත්‍යාංශ කෘෂිකර්මය වෙනුවෙන් වියදම් කරනවා. මම හිතන්නේ රතු කැකුළු කිලෝවක් අපි ලබා ගන්න රුපියල් 300 ක් වත් වියදම් කරනවා ඇති. උදාහරණයක් හැටියට කියන්නේ. අපි ඇළවේලි සුද්ද කරලා, කුඹුරුවලට වතුර සපයන්න, පොහොර සහනාධාරය දීලා මේ ගණන් අරගෙන බැලුවාම මේ හාල් කිලෝවක් හදාගන්න අපි රුපියල් 300 ක් විතර වියදම් කරනවා ඇති. උපරිමයෙන්ම ඔය කිලෝවක වටිනාකම රුපියල් 80/- ක්, 90/- ක්, 100/- ක් වෙන්න පුළුවන්. නමුත් මේවා මනා කළමනාකරණයක් වෙන්නේ නැහැයි කියන එක අපි මතක් කරන්න ඕනෑ. අක්කර 1000 කට ඇළවේලි කපලා, ඇළවල් සුද්ධ කරලා, ගංගා සුද්ධ කරලා දුන්නාම අක්කර 1000 න් 100 ක්වත් කුඹුරු කරන්නේ නැති තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ඒ නිසා ඒවා වෙනස් කළ යුතුයි.

ඒ වාගේම අධ්‍යාපන අමාත්‍යාංශය ගැන බලමු. මම හිතන්නේ ගරු ඇමැතිතුමා නැහැ. "ළඟම පාසල හොඳම පාසල" සංකල්පය තුළ සමහර ගම්මානවල ළමයින් 250, 300 ඉන්න ප්‍රදේශවල විදුලිය තිබෙන පාසලකට ත්‍රීජේස් විදුලිය ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා. මම හිතන්නේ, ඒක අපි කථා කරන්නේ නොදැනුවත්කම නිසා. සමහරවිට ඒ පාසලේ භූමි භාගය විශාල වෙන්න පුළුවන්. ඒ නිසා ඒ භූමිය තුළ තාක්ෂණ විද්‍යාගාර, අනිකුත් පර්යේෂණ විද්‍යාගාර හදලා, අපේ නව රජය තුළ අවුරුදු 13 ක් උසස් පෙළත් එක්ක ඉදිරි වසර දෙකක් දරුවන්ට අධ්‍යාපනය ලබා දෙන්නට පුළුවන් සරිලන වපසරියක් සංවිධානය කරන්නයි, *"ළඟම පාසල හොඳම පාසල"* සංකල්පය තුළ ඒ කටයුත්ත කෙරෙන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ නිසා ඒ අධ්‍යාපනය වෙනුවෙන් අපේ රජයෙන් මේ බස්නාහිර පළාත් සභාවට ලැබිලා තිබෙන සියලුම මුදල් අනිවාර්යයෙන්ම ලබා දීලා ඒ කටයුතු කරනවා කියන එක කියනවා. මේ රටේ දරුවන් වෙනුවෙන් ගරු මුදල් අමාත්‍යතුමාත් යහපාලන රජයත් පොරොන්දු වෙලා තිබෙනවා. බස්නාහිර පළාත් සභාවේ දරුවන් වෙනුවෙන් ඒ සියලුම දේවල් කැප කරලා එය ලබා දෙන්නට කටයුතු කරනවා කියන එකත් මේ අවස්ථාවේදී මතක් කළ යුතුයි.

විශේෂයෙන් සෞඛ්‍ය සම්බන්ධයෙන් ගත් කළ කළුතර, බේරුවල මැතිවරණ කොට්ඨාශ ගත්තාම, අපි බස්නාහිර පළාත් සභාවේ පාලනය වන ප්‍රදේශයක් වුණත්, අඩුම තරමින් සායනයක් පළාත් සභාව තුළ ලබා ගන්නට බැරි තත්ත්වයකට අපි පත් වෙලා තිබෙනවා. මාතෘ සායනයක්වත් කළුතර, බේරුවල කරන්නට අපට අවස්ථාව උදා වෙන්නේ නැහැ. මේවා වෙනස් කළ යුතුයි. පරිවර්තනය කළ යුතුයි කියන එකත් මේ අවස්ථාවේදී මම මතක් කරන්න ඕනෑ.

ඒ වාගේම ගරු මහාමාත්‍යතුමාට තිබෙන පළාත් පාලන ආයතනය. අද බේරුවල මැතිරවණ කොට්ඨාශයේ ප්‍රාදේශීය සභාව ගත්තාම මුළු ප්‍රදේශයම කුණු පිරුණු ප්‍රදේශයක් හැටියට පරිවර්තනය වෙලා තිබෙනවා. කන්ද විහාරයේ අපි පසුගිය දවස්වල කුණු දාන්න ස්ථානයක් හදලා තිබුණා. අද ඒවා නැවතිලා තිබෙනවා. අද බේරුවල මුළු ප්‍රදේශයේම කුණු කන්දරාවක් ව්‍යාප්ත වෙලා හැම තැනම පාර දිගේ කුණු තිබෙනවා. හැම ගම්මානයක්ම ඒ තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ නිසා ගරු මහ ඇමැතිතුමාගෙන් ඉල්ලීමක් කරන්නේ. තැනක් ලබා දෙන කොට, PHI මහත්වරු හරහා ඒ අවස්ථාවට ගිහිල්ලා ඒවා වළක්වන තත්ත්වයට අද බේරුවල පත් වෙලා තිබෙනවා. මම හිතන්නේ විශේෂ වූ බලවේගයක් ක්‍රියාත්මක වෙනවාද කියන සැකයක් මට මතු වෙන නිසා මේවා අපි විපරම් කරලා, පරීක්ෂණය කරලා බලලා මේකට වහා විසඳුමක් ලබා දිය යුතුයි. අද පළාත් පාලන ප්‍රධානීන් නැති නිසා ලේකම්තුමිය මේකට වගඋත්තරකරු හැටියට ඉදිරිපත් වෙන්නට ඕනෑ. ඒ අවස්ථාව ලබා දිය යුතුයි. කොහෙද කුණු දාන්නේ කියන ප්‍රශ්නය විසඳීමටත් අවස්ථාවක් ලබා දිය යුතුයි කියන එකත් මේ අවස්ථාවේදී මතක් කරනවා. ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. 2017 අයවැය - අපි රජයෙන් මුදල් ගත්තා කියලා චෝදනා කළත්, 2016 දහවැනි මාසය දක්වාම ගිය අයවැයේ මුදල් පරිහරණය නොකර ළඟ තියා ගැනීම, ඒ කියන්නේ ගිණුම්වල තබා ගැනීම කියන කාරණාවක් නිසා තමයි මේ මුදල් මධ්‍යම රජය අරගෙන ඒ තුළින් මේ රටට වැඩ කරපු රජයක් හැටියට එක්සත් ජාතික පක්ෂ රජය, ඒ මුදල් ලබා ගෙන මේ රටේ සංවර්ධනයක් කරන්නට ඉදිරියටත් වැඩ කටයුතු කරනවා කියන එකත් මේ ගෞරවනීය සභාවට අවධාරණය කරමින්, මට අවස්ථාව ලබා දීම ගැන ස්තුතිය පුද කරමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

[අ.භා. 02.13]

**ගරු ප්‍රදීප් උඳුගොඩ**
Hon. Pradeep Undugoda

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, හයවැනි පළාත් සභාවේ තුන්වන අයවැය වෙනුවෙන් පොදු සාකච්ඡාවේදී අදහස් ඉදිරිපත් කිරීමට ලැබීම මා ලද භාග්‍යයක් කොට සලකනවා. ඇත්තෙන්ම අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ දෙවැනි අයවැය හැටියටත් විවිධ අභියෝග මධ්‍යයේ වුවත් මෙම අයවැය යම්කිසි සාර්ථක මට්ටමිකින් ඉදිරිපත් කර ඇති බව අපට මෙම අයවැය දිහා බැලීමෙන් තේරෙනවා. නමුත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙම අයවැය පිළිබඳව සැලකිලිමත් වීමේදී මූල්‍ය මාර්ගයන් සහ මූල්‍ය යෙදවීම් අතර 2016 වර්ෂයේත්, ඒ වාගේම 2017 වර්ෂය හා සැසඳීමේදී 2016 වර්ෂයට වඩා 2017 වර්ෂයේ මෙම මූල්‍ය මාර්ගයන් සහ මූල්‍ය යෙදවීම් අතර වෙනස රුපියල් මිලියන 6412 ක අඩුවීමක් අපට පැහැදිලිව දකින්නට ලැබෙනවා. මේ අතරින් අපි රජයෙන් ලැබීමට අපේක්ෂිත ප්‍රදාන තුළින් 2016 වර්ෂයේ රුපියල් මිලියන 21,744 ක් අපේක්ෂිත ප්‍රදාන ලෙස තිබුණත් 2017 වර්ෂයේදී එය රුපියල් මිලියන 14,867 ක් වී තිබෙනවා. රුපියල් මිලියන 6877 කින් අඩු වෙලා තිබෙනවා. ඒ වාගේම පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන 2016 වර්ෂයට වඩා රුපියල් මිලියන 2129 කින් අඩු වෙලා තිබෙනවා. ඒ වාගේම විශේෂ ව්‍යාපෘති යටතේ ප්‍රදාන රුපියල් මිලියන 116 කින් අඩු වෙලා තිබෙනවා. මේ සමස්ත අයවැය දිහා බැලීමේදී රජයෙන් ලැබීමට අපේෂිත ප්‍රදාන මුළු අයවැය තුළම මිලියන 9122 ක්, 2017 වර්ෂයේදී අඩු කරලා තිබෙනවා. මා දකින්නේ, අපේ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළින් මධ්‍යම රජයට අමතරව පළාත් සභා ක්‍රමය ඇති කළේ, ජනතාවට යහපත් සංවර්ධන ක්‍රියාදාමයකට මුල පුරන්නට හැකි ආයතනයක් හැටියටයි. නමුත් වර්තමානයේ කථා කරන යහපාලන ක්‍රියාදාමය තුළින් අද පළාත් සභාව තුළට කුඩම්මාගේ සැලකිල්ල ලබා දෙනවා කියන එක අපට පැහැදිලිව පේනවා. 2016 වර්ෂයේත්, 2017 වර්ෂයේත් මූල්‍ය සාරාංශය දිහා බැලීමේදී අපට ඒක පැහැදිලිවම පෙනෙන්නට තිබෙනවා.

ඒ වාගේම මූල්‍ය යෙදවීම් තුළින් අපට දකින්නට ලැබෙන්නේ, පුනරාවර්තන වියදමේ වැඩිවීමක් පමණයි. මීට අමතරව ආදායම් රැස් කිරීම රුපියල් මිලියන 37,860 ඉඳලා රුපියල් මිලියන 42,260 දක්වා වැඩි කරලා තිබෙනවා. මේ ආදායම් රැස් කිරීමට පළාත් සභාව බලාපොරොත්තු වන්නේ මුද්දර ගාස්තු ඒ වාගේම ජාතිය ගොඩ නැඟීමේ බද්ද - මුද්දර ගාස්තු තුළින් රුපියල් මිලියන 1450 කුත්, ජාතිය ගොඩ නැඟීමේ බද්ද තුළින් රුපියල් මිලියන 6000 කුත් බස්නාහිර පළාත් සභාව ආදායම් එකතු කිරීමට බලාපොරොත්තු වෙනවා. මේ මුද්දර ගාස්තු සහ ජාතිය ගොඩ නැඟීමේ බදු කියන දෙකම වක්‍රව ඉදිරිපත් වන බදු. මේ වක්‍ර බදු එකතු කිරීම තුළින් රටේ ජනතාවගේ

[ ගරු ප්‍රදීප් උඳුගොඩ ]

උද්ධමනය වැඩි වෙනවා වාගේම, දරිද්‍රතාවයට විශේෂයෙන්ම බලපාන සාධකයක් තමයි වක්‍ර බදු වැඩි කිරීම. ඒ වාගේම මෙම අයවැය තුළින් ආයතනික ප්‍රාග්ධන රුපියල් මිලියන 1293 ක් වැඩි වෙලා තිබෙනවා. ඒ නිසා මා පෙන්වා දෙන්නට කැමැතියි අපේ සංවර්ධන ක්‍රියාදාමයට බලපාන උපමාන පාදක, පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන, විශේෂ ව්‍යාපෘති යටතේ මූල්‍ය වියදම් ඒ වාගේම පළාත් සංවර්ධන වැඩ සටහන් යන සියලුම - මේ පළාත් සංවර්ධන වැඩ සටහන්වලට අමතරව ඉතිරි සියලුම ව්‍යාපෘති සඳහා යොමු කරන්න තිබෙන මුදල් අඩු කරලා තිබෙනවා. අපි ධනාත්මක කොටසක් හැටියට දකින්නේ, පළාත් සංවර්ධන වැඩ සටහන යටතේ 2016 වර්ෂයේ රුපියල් මිලියන 1230 ක් තිබුණත්, මෙවර අපි ධනාත්මකව බස්නාහිර පළාත් මහ ඇමැතිතුමා විසින් එය රුපියල් මිලියන 2379 දක්වා වැඩි කරලා තිබෙනවා. එය රුපියල් මිලියන 1149 ක වැඩි වීමක්. ඒ නිසා මේ බස්නාහිර පළාතේ 2017 මුදල් ප්‍රකාශය තුළ සංවර්ධන කටයුතු සඳහා වෙන් කර ඇති මුළු මුදල රුපියල් මිලයන 4028 ක්. ඒ නිසා මා දකිනවා, මේ අයවැය තුළින් අපි සෞඛ්‍ය, අධ්‍යාපන, කෘෂිකර්මික ක්ෂේත්‍රයන් සඳහා වෙන් කරන ලද මුදල් සැලකිය යුතු අගයකින් අඩු කරලා තිබෙනවා. අපි දකිනවා මෙම ක්ෂේත්‍රයන් තුළින් අපි සාවදානව සොයා බැලිය යුත්තේ, මෙම මුදල් කපා හැර තිබෙන්නේ, ප්‍රාග්ධන වියදම් තුළින්ද, නැත්නම් පුනරාවර්තන වියදම් තුළින්ද කියලයි. ඇත්තටම මෙම සියලුම සේවා ක්ෂේත්‍රයන් සඳහා වෙන් කරලා තිබෙන මුදල්වලින් මෙම මුදල් අඩු කරලා තිබෙන්නේ, ප්‍රාග්ධන වියදම් තුළින්. ඒ නිසා මෙය අනාගත ආර්ථික වර්ධන වේගය කෙරෙහි අහිතකර ප්‍රතිවිපාක ලබා දෙන්නට පුළුවන්. ඒ වාගේම අයවැය හිඟය පියවීම සඳහා ප්‍රාග්ධන වියදම් කපා හැරීම තුළින් අධ්‍යාපන, සෞඛ්‍ය සහ කෘෂිකර්ම යන අංශවල වියදම් මෙලෙස සීමා කිරීමෙන් කෙටි කාලීන සහ දිගු කාලීන අහිතකර ප්‍රතිවිපාක බස්නාහිර පළාත් සභාවක් හැටියට අපට අත්විඳින්නට සිද්ධ වෙනවා.

ඒ වාගේම ප්‍රාග්ධන වියදම් සඳහා මධ්‍යම රජයෙන් මුදල් වෙන් නොකිරීමට හේතු වශයෙන් දක්වා තිබෙන්නේ, පසුගිය වර්ෂය තුළදී අමාත්‍යාංශ සඳහා වෙන් කරන ලද මුදල් නියමාකාරයෙන් වියදම් කර නොමැති බවයි. මෙය විහිළුවට ගත යුතු කාර්යයක්. ඇත්තෙන්ම අමාත්‍යාංශ සඳහා මුදල් වෙන් කරනවා කියලා මධ්‍යම රජයෙන්, මහ භාණ්ඩාගාරයෙන් මුදල් පොදියක් ගෙනැල්ලා අපේ පළාත් සභාවට ලබා දෙන්නේ නැහැ. මේ අමාත්‍යාංශවලින් සිදු කරන ව්‍යාපෘති ඉටු කිරීමේදී පමණයි මධ්‍යම රජයෙන් අපේ පළාත් සභාවට මුදල් ලබා දෙන්නේ. මේ සරල තර්කය තුළ මධ්‍යම රජයෙන් මෙම පළාත් සභාව වෙත එවන ලද මුදල් නියමාකාරයෙන් වියදම් කර නොමැතියි කියන හේතුව අපට මුදල් ලබා නොදීමට හේතුවක් වශයෙන් මා සලකන්නේ නැහැ. ඒ වාගේම ශ්‍රී ලංකාවේ පවතින යල් පැන ගිය නීති අනුව අපේ මිලදී ගැනීම්, ඒ වාගේම සේවා මිලදී ගැනීම් තුළදී මේ යල් පැන ගිය නීති මගින් මෙම සංවර්ධන ක්‍රියාදාමයන් සිදු කිරීමේදී අපට නියමිත කාල වකවානු තුළ මෙය සිදු කිරීමට අපහසු තත්ත්වයක් තියෙනවා. ඒ නිසා මේ අමාත්‍යාංශ තුළින් සිදු වන ව්‍යාපෘති කෙරුනේ නැහැයි කියන එක නොවෙයි අපට පෙනෙන්නට ඕනෑ. මේ ව්‍යාපෘති සිදු කිරීමට අවශ්‍ය ක්‍රමවේදයන් සකසා දීම තුළින් පළාත් සභාවට යහපත් ඉදිරි වැඩ සටහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්න පුළුවන් කියන ඒක මා දැනුවත් කිරීමට කැමැතියි.

ඒ වාගේම බස්නාහිර පළාත තුළ සේවා අංශයන් සඳහා වෙන් කරන මුදල් කපා හැරීම තුළින් පළාත් සභාවක් හැටියට මහජන සුභසාධන කටයුතුවලින් ඉවත් වීමක් අපට දකින්නට ලැබෙනවා. ඒ වාගේම සෞඛ්‍ය සහ අධ්‍යාපන ක්ෂේත්‍ර සඳහා පෞද්ගලික ආයෝජනයන් සිදු වන්නේ නැහැ. මේ සෞඛ්‍ය සහ අධ්‍යාපන ක්ෂේත්‍රයන් තුළට වෙන් කරන ලද මුදල් අඩු කිරීම තුළින් කවදාවත් මේ ක්ෂේත්‍රයන් සඳහා පෞද්ගලික ආයෝජනයක් සිදු නොවෙන නිසා එම ක්ෂේත්‍රයන්ට විශාල අසීරුතාවයකට මුහුණ පාන්නට සිදු වෙනවා. ඒ වාගේම තමයි ඍජු බදුවලට වඩා වක්‍ර බදු අය කර ගැනීම තුළින් ආර්ථිකමය වශයෙන් රටේ ජනතාවගේ ජීවිතවලට විශාල ලෙස බලපාන බවත් මා මෙහිදී මතක් කරන්නට කැමැතියි. ඒ වාගේම පරිපූරක ඇස්තමේන්තුව තුළින් පසුගිය වර්ෂය තුළදී ශුන්‍යපාදක අයවැය ක්‍රමය යටතේ අපට බලපාපු මූලිකම අපහසුතා හැටියට මම මතක් කරන්නට කැමැතියි, පරිපූරක ඇස්තමේන්තුවකින් අපි ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති අවසන් කිරීම සඳහා වෙන් කරනු ලැබුවත්, එය ක්‍රියාත්මක කිරීමේදී බලපෑ විශාල අපහසුතාවයන් රාශියක් තිබෙනවා. මා කියන්නට කැමැතියි, මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී අපට පුළුවන්කමක් තිබෙනවා නම්, බස්නාහිර පළාත් සභාවක් හැටියට අපේ තිබෙන අමාත්‍යාංශ යටතේ ඒ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට හැකි අවශ්‍ය පියවර ගන්න, එකී පියවර ගන්නා ලෙස මම ගරු නියෝජ්‍ය සභාපතිතුමා මාර්ගයෙන් ගරු ප්‍රධාන ඇමැතිතුමාට මතක් කරන්නට කැමැතියි.

ඒ නිසා මා දීර්ඝ වශයෙන් කරුණු ඉදිරිපත් කරන්නේ නැහැ. බොහොම ස්තුතියි.

[අ.භා. 02.23]

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ගරු ප්‍රධාන ඇමැතිතුමාට ස්තුතිවන්ත වෙනවා 2017 අයවැයේදී මට අවස්ථාවක් ලබා දීම සම්බන්ධව. මෙම අයවැය කථාවේදී මට මතක් වුණා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ජේ.ආර්. ජයවර්ධන මහත්තයාගේ කාලයේ මේ පළාත් සභා ලංකාවට බලෙන් එවනකොට අපි පාසල් යන කාලයේ විශ්ව විද්‍යාලයේ තරුණයෝ පිරිසක් කවි පන්තියක් ලියලා තිබුණා. මොකද, ජේ.ආර්. ජයවර්ධන මහත්තයා මේක බලෙන් ගෙනැල්ලා දානකොට ප්‍රේමදාස මහත්තයා තරහා වෙලා ජපානෙට යන්න ගියා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඔබතුමා මොන විශ්ව විද්‍යාලයේද?

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

විශ්ව විද්‍යාලයේ හිටපු කට්ටිය ලියලා තිබුණේ. අපි ඉස්කෝලේ යනවා. ඒකේ ලියලා තිබුණා,

ජනපති ජේ.ආර්. ට බුද්ධං සරණේ සරණයි
අගමැති ආර්.පී. ට ධම්මං සරණේ සරණයි
ජනපති ජේ.ආර්. ට සංඝං සරණේ සරණයි
අනේ ඉතින් මුන් දෙන්නට මහජනතාවගෙ සරණයි

ජේ. ආර් කියනවා,

ජපානෙන් හැරිලා එන්න ඇරියා මම පණිවුඩයක්
උතුමාණෙනි ඒ හින්දයි ආවේ මං තකහනියක්
කලබල වෙන්න එපා, වලි දාගන්න එපා
සිද්ධ වෙච්ච දේ කියන්න මොකක්ද වාගෙයි

එතකොට ප්‍රේමේ කියනවා,

අයියෝ මොන පිස්සුද?
කියන්න ඕනෑ දෙයක්
හොඳ ගින්නක් දෙන්නට යන වග විශ්වාසයි

කැම ගෙනැත් බලෙන් දාපු
රජ්ජුරුවෝ දන්නවා නේද?
අපොයි මොකද මම නොදන්නේ
තමුසේ ඌට බයයි නේද?
ජේ.ආර්. කියනවා,

මං කළ දෙයක් නොවෙයි
මට බණින්න එපා ප්‍රේමේ
කැම වගේ ආස නැතත් බලෙන් ඇවිල්ලා

ප්‍රේමේ කියනවාලු,

ඕකනේ මං කියන්නේ
මාත් බල බලා උන්නේ
තෝ පන්නා රජ වෙන්නේ කොහොමද කියලා

ජේ.ආර්. කියනවාලු,

සරු බිම උතුරුකරේ
වෙරළබඩ නැගෙනහිරේ
නැති වුණු එක මට කනගාටු

එතකොට ප්‍රේමේ කියනවාලු,

රට පාවා දී මදිවට
මකබෑවෙන්නේ නැතුව
රජ පුටුවේ ඉන්නා එක මට කනගාටුයි

ඔන්න ඔය ආකාරයෙන් තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ පළාත් සභා ක්‍රමය බලහත්කාරයෙන් රජීව් ගාන්ධි අපේ ලංකාවට ඉන්දියාවෙන් ගෙනාවේ. ඒ පළාත් සභාව තුළ අපිත් ඉඳගෙන මේ වසර 30 කට ආසන්න කාලයක් මොනවා මොනවා හරි කරමින්, යමක් කරමින් යනවා. නමුත් අද වනකොට ඒ පළාත් සභා ක්‍රමය ඇති කළේ, මොන සංකල්පයක් මතද කියන එක මේ යහපාලන ආණ්ඩුවට හොඳටම තේරිලා තිබෙනවා. මේ පළාත් සභා ක්‍රමය රජීව් ගාන්ධි ගෙනාවේ, ඉන්දියාවෙන් බලෙන් ආවේ උතුරු - නැගෙනහිර ප්‍රශ්නයට විසඳුමක් දෙන්න. ඒ නිසා තමයි මේ යහපාලන ආණ්ඩුව ඉතුරු පළාත් සභා හතේ සල්ලි කපලා උතුරු, නැගෙනහිර පළාත් වල සල්ලි එහෙම්මම තියලා තියෙන්නේ. සුසිල් කිඳෙල්පිටිය, අරුණ දීපාල් ගරු මන්ත්‍රීවරු කිව්වා මේ පළාත් සභාව සල්ලි වියදම් කළේ නැති නිසා තමයි සල්ලි කපලා තියෙන්නේ කියලා. උතුරු පළාත් සභාව අපි තරම්වත් වියදම් කරලා නැහැ. එහෙම නම් ඇයි ඒ සල්ලි කැපුවේ නැත්තේ? ඒගොල්ලන්ගේ ගෙනාපු සංකල්පය ඉදිරිපත් කළාට කමක් නැහැ. දැන් අර ඉන්න එකේ යන්න එපැයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ විෂයය ගැන කථා කළොත් ගිය වසරේ ඔය කවුරු මොනවා කිව්වත් අපි දන්නවා, ඔක්තෝබර් වනකොට මූල්‍ය ප්‍රගතිය නැතිව ඇති. සල්ලි ගෙවලා නැහැ නේ? නමුත් භෞතික ප්‍රගතිය තියෙනවා.

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

පුප්පනවාද? පුම්බනවාද?

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

අන්තිම වන කොට පුප්පන්නේ නැහැ. ගහන්න තියෙන ඒවා තව ඉස්සරහාට ගහනවා. අන්තිම වන කොට හැම අමාත්‍යාංශයකම සෑහෙන ප්‍රගතියක් තිබෙනවා. කොයි අමාත්‍යාංශයකටවත් සියයට සියයක් ප්‍රගතිය ලබන්න පුළුවන් වෙන්නේ නැහැ. ඒක ඒ නිලධාරීන්ගේ වරද නොවෙයි. අමාත්‍යාංශ සහ ඇමැතිවරුන්ගේ වරද. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ආර්ථික ප්‍රවර්ධන අමාත්‍යාංශය අයිති ගරු ප්‍රධාන ඇමැතිතුමාට. සංචාරක අමාත්‍යාංශය අයිති එතුමාට. මම එතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ සංචාරක අමාත්‍යාංශයේ නිලධාරීන් රට කඩනවා ගංගා දිගේ. ගස් සිටුවන්න. මොනවා හරි දාන්න දුවනවා. එහෙම එකපාරට ඒවා නිර්මාණය කරන්න බැහැ. අවුරුද්දක්, දෙකක්, තුනක් ඇතුළත නිර්මාණය කරලා, පළාතේ සංචාරක කර්මාන්තය දියුණු කරන්න බැහැ. මම යෝජනා කරනවා. අපේ රටේ මේ බස්නාහිර පළාතේ කුඹුරු වගා කරන්න බැහැ. මොකද, පිට ඇළවල් නැහැ. වට ඇළවල් නැහැ. යලට, මහට වතින්නේ නැහැ. යහපාලනය හොඳ නිසා වැස්ස වෙලාවට එන්නේ නැහැ. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශාල ජලාශ ඇති කරලා, වැව් ඇති කරලා අපේ කෘෂිකර්ම ගරු ඇමැතිතුමාත් එක්කලා ඒවායේ සංචාරක ව්‍යාපාර ඒ ආසන්නව ඉදි කරන්න. ඒ වාගේම මම දැක්කා කෘෂිකර්ම ඇමැතිතුමා විසින් මේක කියලා තියෙනවා. අභ්‍යන්තර මත්ස්‍ය සම්පත අඩුම පළාත කියලා. ඉතින් ජලාශ මෙහේ නැහැ නේ? ජලාශ ඉදි කරන්න ඕනෑ. ජලාශ ඇති කරන්න ඕනෑ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගොඩ කළොත් හොඳ නැද්ද?

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ඒත් කමක් නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ ආකාරයෙන් මේවා නිර්මාණය කරන්න. නිර්මාණය නොකළොත් සල්ලි උත්පාදනය වෙන්නේ නැහැ. ආදායම් ඇති වෙන්නේ නැහැ. රැකී රක්ෂා උත්පාදනය වෙන්නේ නැහැ. නැත්නම් මේ තියෙන සල්ලි ටික අමාත්‍යාංශයෙන් බෙදලා, බෙදලා ඍජු ප්‍රදාන දැම්මාට වැඩක් වෙන්නේ නැහැ. එහෙම නම් ඇමැතිවරයෙක් ඕනෑත් නැහැ. නිලධාරී ඕනෑත් නැහැ. මේ පළාත් සභාවේ කිසිම අමාත්‍යාංශයක් නිර්මාණශීලී නැහැ. උදාහරණයක් විධියට අපේ ලලිත් වනිගරත්න ගරු ඇමැතිතුමාගේ අමාත්‍යාංශය තමයි මහ මාර්ග. මාර්ගයේ මැද ඉඳලා අඩි කීයක් පිටින්ද ඉදි කිරීම කරන්න ඕනෑ කියලා තව වනතුරු පළාත් මාර්ග අමාත්‍යාංශයෙන් කිසිම කෙනෙක් දැනුවත් කරලා නැහැ. ඒ ආයතනයෙන් දැනුවත් කරලා නැහැ. පාරේ ගෙවල් හදනවා. වැටේ ගෙවල් හදනවා. අන්තිමට පාරක් පළල් කරන්න බැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි (බාධා කිරීමක්) එතුමාට කියලා නොවෙයි ඕවා දාන්නේ. එතුමාගේ අමාත්‍යාංශයට අපි අත උස්සනවා. එතුමා සල්ලි ඔක්කොම දාගන්නවා. එතුමා ඔක්කෝම පාරවල් හදනවා. ඇමැතිතුමා අපේ ආසනයේ ඉන්නේ. අඩුම ගාණේ අපේ Photo එකක්වත් දාන්නේ නැහැ. ඒකනේ ඇත්ත කථාව. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කවුරුවත් මෙතැන කථා කරලා වැඩක් නැහැ. අපි එනවා. මෝඩයෝ වාගේ අත උස්සනවා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඔබතුමාගේ දැම්මේ නැති වුණාට, රෝස් මන්ත්‍රීතුමියගේ දානවා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

අපි එනවා. මෝඩයෝ වාගේ අත උස්සනවා. ඡන්දය පාස් කරලා දෙනවා. ඒ අමාත්‍යාංශවල ඇමැතිවරු ඔක්කෝම වැඩ කරනවා. අපි කෙලෝ ගන්නවා. ආයිත් ලබන අවුරුද්දේ එනවා. ආයිත් Budget එනවා. පාටියක් දානවා. කන්න දෙනවා. ආයිත් ඒ දේමයි කරන්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කටානේ පාරවල් හදන්න ඔබතුමා ඉල්ලුවේ නැද්ද?

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ පළාත් සභාවේ අයවැය විවාදයේදී මේ හැම කෙනෙක්ම අඩු වැඩි වශයෙන් කථා කරනවා. මේ කථා කරන කිසිම දෙයක් අපි දකින විධියට ලබන වසරේවත් ක්‍රියාත්මක කරන්නේ නැහැ. ඒ කියලා තියෙන විධියට කරනවා. දැන් යන ප්‍රතිපත්ති එහෙම්ම යනවා. ඇමැතිවරුන්ගේ වැඩ සටහන් එහෙම්ම යනවා. අපේ කෘෂිකර්ම ඇමැතිතුමා කොස් පැළ ලක්ෂයක් හිටවනවා කියලා තිබුණා. එක කොස් පැළයක්වත් අපි නම් දැක්කෙත් නැහැ. හම්බ වුණෙත් නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ නිසා අපේ ඇමැතිවරුන්ට කියන්නේ, අපි හැම දෙනාම එකතු වෙලා, අත උස්සලා, අපි අයවැයේදී සාධාරණයක් කරනවා. අපිත් ඡන්දයෙන් ඇවිල්ලා තියෙන්නේ. අපටත් දෙන්න කියන දේ කියමින් අයවැයට සහාය දෙමින් මම නිහඬ වෙනවා.

[අ.භා. 02.30]

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇත්තටම අද අපි සියලුම ගරු මන්ත්‍රීවරුන්ගේ කථා සියල්ල අහගෙන ඉන්න කොට - වෙන අවුරුදුවල අයවැය වාගේ නොවෙයි. මේ ගමන අයවැයේදී කථා කෙරුණේ පළාත් සභාවට මුදල් අඩුවීම සම්බන්ධයෙන්. බස්නාහිර පළාත් සභාවට විතරක් නොවෙයි. පළාත් සභා ගණනාවකම මධ්‍යම රජයෙන් මුදල් ලබා දීම 50% ක් විතර අඩු කරලා තිබෙනවා. ඉතින් මම හිතුවා මධ්‍යම රජයට එහෙම මුදල් අඩු කරන්න තියෙන හේතුව මොකක්ද කියලා. අපි බලාපොරොත්තු වුණා, ගිය කාල සීමාවේදී මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ රජය තිබෙන කාලයේ මේ දීපු මුදල්වලට දැන් මොකක්ද වුණේ කියලා. එක්සත් ජාතික පක්ෂ කණ්ඩායම එදා කිව්වා, හොරකම තියෙනවා. මේ හොරකම නැවැත්තුවාම සංවර්ධනය දෙගුණ තෙගුණ කරන්න පුළුවන් කියලා. එහෙම කියපු යහපාලන රජය අද බස්නාහිර පළාත් සභාවේ 50% කට ආසන්න සංඛ්‍යාවක් මුදල් කපලා. මුදල් කපලා තිබෙන විධිය අපි බැලුවාම මම හිතුවා ඇයි මෙහෙම රජයේ මුදල් අඩු වුණේ කියලා. සල්ලි අඩු වුණේ වෙන හේතුවක් නොවෙයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, (බාධා කිරීමක්)

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ජනමාධ්‍යවේදීන් කියනවා ඒ අයට ඇහෙන්නේ නැහැලු.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මේ රජයේ හොරකම වැඩියි. හොකරම වැඩි නිසා -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒ සම්බන්ධව පාලන මැදිරියෙන් කටයුතු සිදු වෙන්න ඕනෑ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

හැබැයි, මට මේ වෙලාව දෙන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා කථා කරන්න.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මේ රජයේ හොරකම වැඩි නිසා තමයි අපේ මුදල් කප්පාදු කරන්නේ. මොකද, ඒකට හේතුව අපි බැලුවා. අපට වුණු පාඩුව මම නිකම් බැලුවා. යහපාලන රජයට. අපි දැක්කා එදා අපේ මුදල් ඇමැතිතුමා එක එක දේවල්වලට බදු සහන දුන්නා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ලයන් ඩ්‍රවර් කියන බියර් සමාගමේ ලීටර් එකක් 528 ට තිබුණේ. මේ බදු අඩු කිරීම නිසා මේක 211 කට බැස්සා. ලීටර් එකක පාඩුව 317 ක් වුණා. මේ බදු අඩු කිරීමත් එකක්ම ඒ සමාගම විසින් ක්ෂණිකව ලීටර් 2000 ක් ගෙන්නුවා. මේ ලීටර් 2000 න් විතරක් රජයට රුපියල් මිලියන 72 ක් පාඩු වුණා. ඊට පස්සේ කන්ටේනර් 2000 ක් ගෙන්නුවා. මේක නිසා රජයට පාඩුව ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රුපියල් මිලියන 5288 යි. බත්තරමුල්ල, රජමල්වත්තේ කෘෂිකර්ම අමාත්‍යාංශයක් තිබෙනවා. කෘෂිකර්ම අමාත්‍යාංශයේ

[ ගරු ලලිත් එල්ලාවල ]

ගොඩනැගිල්ල ඉතාමත් හොඳට තිබෙනවා. එහෙම තිබියදී ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් ගොඩනැගිල්ලක් ගන්නවා. මේ ගොඩනැගිල්ලට අත්තිකාරම් මුදල විතරක් පනස්කෝටි හතළිස් ලක්ෂයක් ගෙවනවා. ඒ අත්තිකාරම් මුදල ගෙවලා එතැනින් නවතින්නේ නැහැ. මේකේ පැහැදිලිවම මාසික කුළිය දෙකෝටි දස ලක්ෂයක්. ඒත් එක්කම රජයේ වර්ග අඩියක් ගන්න පුළුවන් අවම මුදල රුපියල් 150 යි. හැබැයි මේ අමාත්‍යාංශයෙන් ගන්නේ රුපියල් 167.50 ට. වර්ග අඩියකට 17.50 ක් වැඩියෙන් තමයි ගන්නේ. මේ වර්ග අඩියත් එක්කම, මේකේ පැහැදිලිවම ඉංජිනේරු පිළිබඳව මධ්‍යම උපදේශක කාරක සභාව කියනවා, මේ ගොඩනැගිල්ල නැවත පාවිච්චියට ගන්න නම් මේකට තව කෝටි පනහක් වියදම් කරන්න ඕනෑ කියලා.

හැබැයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේකේ පුදුමය තමයි - මේ ටික කළත් කමක් නැහැ කියමු කෝ? මෙහෙම මහා නාස්තියක් කළත් අද වනකොට මාස 08 ක් ගත වෙලා තිබෙනවා. මේ මාස 08 කට මේ ගොඩනැගිල්ල මොනම එහෙකටවත් පාවිච්චි කරලා නැහැ. දෙකෝටි දස ලක්ෂය ගණනේ අද වනකල් මාසයෙන් මාසයට කුළිය ගෙවනවා. දහසය කෝටි අසූ ලක්ෂයක් මේ රජයේ මුදල් නිකම් ගිහිල්ලා තිබෙනවා. මේක මහා නාස්තියක් නොවෙයිද? ඒත් එක්කම අපි කියන්න ඕනෑ මේ රජයට ශත පහකවත් ආදායමක් නාපු - අපි දන්නවා. හැමෝම කිව්වා. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාව අත්අඩංගුවට ගන්න හැදුවා. පාවෙන අවි ගබඩාව සම්බන්ධව. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගෝඨාභය රාජපක්ෂ ආරක්ෂක ලේකම්තුමා ඉන්න කොට මේක ආරම්භ කළා. මේක ආරම්භ කළාට පස්සේ - පළමුවෙන්ම නාවික හමුදාවෙන් ආරම්භ කළේ. පළමුවැනි අවුරුද්දේම රුපියල් බිලියන 1.8 ක ලාභයක් තිබුණා. මිලියන නොවෙයි. බිලියන 1.8 ක ලාභයක්. ඊට පස්සේ ඇවන්ගාඩ් සහ රක්නා ලංකා ඒකාබද්ධ කරලා රක්නා ලංකා සමාගම ඇති කළා. ඇති කරලා ඒකට දුන්නා. ඒකට දුන්නාට පස්සේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රුපියල් බිලියන 4.1 ක ලාභයක් තිබුණා. ඊට පස්සේ මේ ආණ්ඩුව ආවා. මේ ආණ්ඩුව ඇවිල්ලා මේ රක්නා ලංකා සමාගමට නොයෙකුත් චෝදනා දාලා මේකෙන් අයින් කළා. අයින් කළාට පස්සේ දැන් කීයද රජයට ලැබෙන්නේ? රුපියල් බිලියන 4.1, රුපියල් බිලියන 1.2 ට බැස්සා. අපි කියන්නේ, මෙන්න මේ නිසා රජයට මොනතරම් පාඩුවක් සිද්ධ වුණාද? මෙන්න මේ නිසා තමයි අපේ මුදල් කපන්න වුණේ.

ඒ වාගේම තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ රටේ වුණු ලොකුම හොකරම මොකක්ද? බැඳුම්කර සිද්ධිය. අපි කවුරුත් දන්නවා. එදා 8.1 ට ගන්න පුළුවන්කම තියෙද්දී, ඒ පොලී අනුපාතය 11.28 ට ගත්තේ. එහෙම වුණේ පර්පචුවල් ටෙෂරිස් ආයතනයේ අධිපති අර්ජුන් මහේන්ද්‍රන්ගේ බෑණා නිසා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේකේ ලාභය තිබුණේ රුපියල් මිලියන 760 යි. මේ බැඳුම්කර නිකුත් කරන්නට පෙර රුපියල් මිලියන 760 යි. හැබැයි බැඳුම්කර නිකුත් කළාට පස්සේ මේකේ වැඩිවීම කොහොමද? මේ පර්පචුවල් ටෙෂරිස් ආයතනයේ වැඩිවීම සියයට 434 යි. මේ බැඳුම්කර සිද්ධිය නිසා. එහෙම නම් අපට වුණු පාඩුව කීයද? රුපියල් බිලියන 159 ක පාඩුවක් රජයට සිද්ධ වුණා. මේක අදට තිබෙන තත්ත්වය. අවුරුදු 30 ක් යනකල් මේ හොරකම, මේ නාස්තිය සිද්ධ වෙනවා. රජයට මේ පාඩුව සිද්ධ වෙනවා. මේකේ හොඳම දේ තමයි ජනාධිපතිතුමා, මේ අධිපතිතුමා හොරෙක් කියලා අයින් කරනවා. අයින් කළාට පස්සේ අද මේ රජයේ ආණ්ඩුවේ පස් අවුරුදු සැලැස්මේ ප්‍රධානියා විධියට පත් කරන්නේ ඒ හොකරම් කරපු පුද්ගලයාව. ඉතින් මෙන්න මේ විධියට මම කියපු ටික විතරක් ගත්තාම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ පළාත් සභා ටිකට මේ මුදල් ටික දෙන්න පුළුවන්. මේ පොඩි ප්‍රමාණයක් විතරයි කිව්වේ. මේ අවුරුදු 1 ½ , 2 තුළ මේ රජය විසින් කරපු හානිය, නාස්තිය, දූෂණය. ඒ නිසා අපි රජයට යෝජනා කරන්නේ මේ දූෂණය, වංචාව නවත්වන්න. මේ දූෂණය, වංචාව, හොකරම නවත්වන්න. මේ හොරකම, වංචාව නැවැත්තුවොත් එහෙම මේ සියලුම පළාත් සභාවලට පුළුවන්කම තිබෙනවා එදා දුන්නාටත් වඩා දෙන්න. ඒ වෙන හේතුවක් නිසා නොවෙයි. එදා මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ යුගයේ මේ පළාත් සභාවට සල්ලි දුන්නේ මේ රටේ අතිමහත් යුද්ධයක් කරන ගමන්. එතුමා මේ යුද්ධය අවසන් කරලා තිබෙනවා. ඒ යුද්ධය අවසන් කරලා, ඒ මුදල අතේ ඉතුරු වෙලා තිබෙනවා. ඒ ඉතුරු වෙලා තිබෙන මුදල මේ සභාවල්වලට දෙන්න අද පුළුවන්කම තිබෙනවා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

2012, 2013 කීයක් දුන්නාද?

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

2012, 2013 අරගෙන බලන්න. තමුන්නාන්සේ අරගෙන බලන්න. එදා නොවෙයි. අද දීලා තිබෙන ගණනට ලැජ්ජා වෙන්න. තමුන්නාන්සේලාගේ යහපාලන ආණ්ඩුව. තමුන්නාන්සේලා කිව්වේ, හොරකම දූෂණය තිබෙනවා කියලා. අද තරම් හෙරකම, දූෂණය - ඉතින් මේවා බොරුද? මේ ඇත්ත කියන්නේ. ගිහිල්ලා අගමැතිතුමාත් එක්ක කථා කරන්න. ගිහිල්ලා කථා කරලා -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අපි කැපුවා. ඔයගොල්ලෝ යහපාලනේ නැති නිසා අපි කැපුවා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

යහපාලනය. මෙන්න මේවා තමයි හොරකම. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ වාගේ හොකරම් නිසා තමයි අද මේ රට ජනතාවට පුළුවන් තරම් බදු ගහලා. ඒ සියල්ල කරලා, අද මොකක්ද කරන්නේ? අද මේ රජයේ මන්ත්‍රීවරුන්ට සල්ලි දෙන්න වෙන්නේ නැති නිසා අද පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ට පුළුවන් තරම් සැප දෙනවා. මොකද, ඉදිරි වර්ෂවලට තමන්ගේ ආසනයේ, දිස්ත්‍රික්කයේ වැඩ කර ගන්න සල්ලි දෙන්න විධියක් නැති නිසා ඒ අයව තියාගන්න ඕනෑ. ඒ නිසා පොළී රහිත ලක්ෂ 100 ණය දෙනවා. පඩිය වැඩි කරනවා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

උපේක්ෂා ස්වර්ණමාලී ගත්තු හැටි මතක නැහැ නේද?

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

උපේක්ෂා ස්වර්ණමාලී කැමැත්තෙන් ආවා. රුපියලක්වත් දීලා, ඒ කාලේ කාවවත් ගත්තේ නැහැ. ඒ කාලේ රටේ සංවර්ධනය දැකලා, යුද්ධය ඉවර කරපු නිසා තමයි ආවේ. අද තමුන්නාන්සේලා මොකක්ද කරන්නේ? තමුන්නාසේලා ලැජ්ජ වෙන්න ඕනෑ. දූප්පත් මිනිහාගේ බඩට ගහලා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ව සනසනවා. ඒ නිසා මට මේකේ මතක් වෙන්නේ - ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම අවසන් කරන්නම්. බ්‍රහ්මදත්ත රජතුමාව මට මතක් වෙන්නේ. අපි පුංචි කාලේ අහලා තිබෙනවා. බ්‍රහ්මදත්ත රජතුමාට අවශ්‍ය වුණා රාජකීය අශ්වයෙක් පුහුණු කර ගන්න. රාජකීය අශ්වයෙක් පුහුණු කර ගන්න ගියාම රාජකීය අශ්වයා පුහුණු කරන කොට අශ්වයා නොණ්ඩි ගහන්න ගත්තා. මේ හොඳට හිටපු අශ්වයා නොණ්ඩි ගහන්න ගත්තාම රටේම ඉන්න වෛද්‍යාවරු ගාවට ගියා. හොඳ කර ගන්න බැරි වුණා. ඊට පස්සේ එක වෛද්‍යාවරයෙක් කිව්වා, මේ අශ්වයාට පුහුණු කරන කෙනා නොණ්ඩි ගහනවා. ඒක නිසා පොඩ්ඩක් පුහුණු කරන කෙනාව අයින් කරලා බලන්න. අන්න එතකොට මේක හොඳ කර ගන්න පුළුවන් කියලා. ඒ විධියටම අශ්වයාව පුහුණු කරන කෙනාව අයින් කළා. අයින් කළාට පස්සේ නොණ්ඩි ගහන එක නැවතුණා. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම කියන්නේ එදා බ්‍රහ්මදත්ත රජතුමා රාජකීය අශ්වයාව පුහුණු කරලා හදා ගත්තා වාගේ ඉදිරියේදී අපටත් සිද්ධ වෙනවා මෙන්න මේ නොණ්ඩි ගහන අශ්වයින්ව අයින් කරලා මේ රට හොඳ තැනකට ගෙනියන්න කියන එක මතක් කරමින් මම නිහඬ වෙනවා.

[අ.භා. 02.43]

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ පළාත් සභා වාරයේ තුන්වැනි අයවැය ලේඛනය ඉදිරිපත් කරන මේ මොහොතේ පොදු සාකච්ඡාවට සම්බන්ධ වෙන්න ලැබීම පිළිබඳව ස්තූතිය ප්‍රකාශ කරනවා. බස්නාහිර පළාත් සභාව 1988 ආරම්භ වෙලා, අද වනකොට අවුරුදු 29 ක කාලයක් ගෙවිලා තිබෙනවා. ඒ අවුරුදු 29 පුරාවමට බස්නාහිර පළාත් සභාව විවිධ මහ ඇමැතිවරුන් යටතේ, විවිධ අමාත්‍යවරුන් යටතේ පාලනය වෙලා අද අපේ ගරු ප්‍රධාන අමාත්‍ය ඉසුර දේවප්‍රිය මැතිතුමාගේ නායකත්වයෙන් අපි රැස් වෙලා, බස්නාහිර පළාතේ ඊළඟ වර්ෂයට ජනතාවගේ සංවර්ධනය සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් කරන මේ මොහොතේදී අපි පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරු වශයෙන් සාකච්ඡා කරලා මේ අයවැය ලේඛනයේ අඩුපාඩු පෙන්වා දීලා, මේ ඉදිරිපත් කරලා තිබෙන අයවැය ලේඛනය සම්පූර්ණ අයවැය ලේඛනයක්ද, වැරැදි සහිත අයවැය ලේඛනයක්ද කියලා සාකච්ඡාවට භාජනය කරන මොහොතක්. අපේ අනන්ද හරිස්චන්ද්‍ර ගරු මන්ත්‍රීතුමා කථා කළා වාගේ, නිර්මාණශීලී භාවයෙන් තොරව අයවැය ලේඛනයක් ඉදිරිපත් කළොත්

[ ගරු මංජුල ප්‍රසන්න සම්පත් ]

මේ අයවැය ලේඛනය ප්‍රායෝගික මට්ටමට ගෙන එන්න බැහැ. මට මතකයි. අපි පළාත් පාලන ආයතන නියෝජනය කරන කොට, ප්‍රාදේශීය සභාවල අයවැය ලේඛන සකස් කරන කොට ඊට පෙර මාස පහකට හයකට කලින් ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරු ගෙන්නලා, ප්‍රදේශයේ ජනතාව ගෙන්නලා මේ අයවැය ලේඛනයට යෝජනා ගන්නවා. නමුත් මම මේ පළාත් සභාවට ඇවිල්ලා දැනට දීර්ඝ කාලයක් නැහැ. අවුරුදු දෙකකට ආසන්න කාලයක්. පසුගිය කාල සීමාව තුළදී අපි දැක්කේ නැහැ මේ බස්නාහිර පළාත් සභාවේ අයවැය ලේඛනය සකස් කරන කොට ප්‍රදේශයේ ජනතාවගේ සහ මහජන මන්ත්‍රීවරුන්ගේ අදහස් ලබාගෙන, මේ අයවැය ලේඛනය සකස් කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ත්‍රිකුණාමලයේ සාකච්ඡාවක් තිබ්බා. ඒ සාකච්ඡාව ඉතාමත් හොඳ සාකච්ඡාවක් වුණාට, මම ඉල්ලීමක් කරනවා. මේ සාකච්ඡාව අවුරුද්ද අවසානයේ නොවෙයි නිලධාරීන් මේ අයවැය ලේඛනය සකස් කරනවාත් එක්කම කියන්න ඕනෑ. ඒ අනුව මන්ත්‍රීවරු වශයෙන් අපි සියලු දෙනාගේම අදහස් ලබාගෙන මේ අයවැය ලේඛනය සකස් කරන්න ඕනෑ. ප්‍රාදේශීය සභාවල අයවැය ලේඛනය සකස් කරන කොට සියලුම මහජන නියෝජිතයින්ගේ සහ ප්‍රදේශයේ පොදු සංවිධානවලින් අදහස් ගන්නවා. මේ අයවැය දිහා බැලුවාම, ගිය අවුරුද්දට වඩා යම්කිසි මුදල් ප්‍රමාණයක් අඩු කරලා තිබෙනවා. නමුත් ඊට වඩා මුදල් ප්‍රමාණයක් පළාත් සභා අරමුදල්වලින් පසුගිය කාල සීමාව තුළදී වියදම් කරලා නැහැ. අධ්‍යාපන ක්ෂේත්‍රය, මහ මාර්ග ක්ෂේත්‍රය, සෞඛ්‍ය අමාත්‍යාංශය පසුගිය අවුරුදුවල ඒ වැය ශීර්ෂවලින් මම හිතන්නේ 60% ක් 65% ක් තමයි මුදල් වෙන් කරලා තිබෙන්නේ. මේ වනකොට මධ්‍යම ආණ්ඩුවෙන් යම්කිසි මුදලක් අඩු වෙලා කියලා අපේ මන්ත්‍රීතුමන්ලා කෑගහනවා. මම හිතනවා විශේෂයෙන්ම අපි පසුගිය කාල සීමාව තුළ කථා කරන කොට හොඳම පාසල, ළඟම පාසල ව්‍යාපෘතියේදී මම හිතන්නේ මධ්‍යම ආණ්ඩුවෙන් රුපියල් මිලියන 7000 ක් වෙන් කරලා තිබෙනවා. මෙතැන මන්ත්‍රීතුමන්ලා කථා කරලා කිව්වා, ඒ රුපියල් මිලියන 7000 හම්බ වෙන්නේ නැහැයි කියලා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ රුපියල් මිලියන 7000 දෙසැම්බර් මාසේ වනකොට අනිවාර්යයෙන්ම ලබා දෙනවා කියලා අධ්‍යාපන ඇමැතිතුමා ගිය සතියේ අපට පොරොන්දු වුණා. ඒ නිසා විශේෂයෙන්ම අපි ඉල්ලීමක් කරනවා මධ්‍යම ආණ්ඩුවෙන් දෙනවා කියපු මුදල් ශත පහක්වත් - මම හිතන්නේ යම්කිසි මුදලක් අඩු කරලා තිබුණාට අපි විශ්වාස කරනවා, ඊළඟ අවුරුද්දේ මුල් වකවානුව තුළදී මධ්‍යම ආණ්ඩුවෙන් ලැබෙන්න තිබෙන මුදලුත් මේ පළාත් සභාවට ලබා දෙයි කියලා.

විශේෂයෙන්ම අධ්‍යාපන අමාත්‍යාංශය. මේ පළාත් සභාවේ ප්‍රධානම අමාත්‍යාංශයක් විධියට අපි ගන්නේ, අධ්‍යාපන අමාත්‍යාංශයයි. පසුගිය කාල සීමාව තුළදී අධ්‍යාපන අමාත්‍යාංශය දේශපාලනීකරණය වෙලා තිබුණේ. මම හිතන්නේ වර්තමාන අමාත්‍යවරයා යම්කිසි සීමාවකට මේ අධ්‍යාපන අමාත්‍යාංශය ජනතාවට සහ බස්නාහිර පළාත් සභාවේ ආදරණීය දරුවන්ට සුභදායක අමාත්‍යාංශයක් බවට පරිවර්තනය කරන මේ මොහොතේදී මේ අධ්‍යාපන අමාත්‍යාංශයේ තවත් විශාල අඩුපාඩු රාශියක් තිබෙනවා. අධ්‍යාපන අමාත්‍යාංශයේ අඩුපාඩු ටික ඉදිරි වර්ෂයේදී සකස් කිරීමට එතුමාට ශක්තිය ධෛර්ය ලැබේවා කියලා ප්‍රාර්ථනා කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ මාර්ගයෙන් තමයි මේ පළාත් සභාව පාලනය වෙන්නේ. අපි දැක්කා, පසුගිය කාල සීමාව තුළදී ඔබතුමා මහරගම නගර සභාවේ සභාපතිවරයා වශයෙන් ඉන්න කොට ඔබතුමා විශාල කාර්ය භාරයක් කරලා තිබෙනවා කියලා අපි අහලා තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමා මාර්ගයෙන් ගරු මහ ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. අද වනකොට පළාත් පාලන ආයතන අක්‍රීයයි. ඒ පළාත් පාලන ආයතන අක්‍රීය තත්ත්වයේ පවතින කොට ඒවා පාලනය කරන්නේ, ලේකම්තුමන්ලා සහ ලේකම්තුමියන්ලා. අපි දැක්කා පසුගිය කාල සීමාව තුළදී බියගම ප්‍රාදේශීය සභාව. බියගම ප්‍රාදේශීය සභාවේ පරිපාලනය කරන කොට පසුගිය 21 වැනිදා මේ ප්‍රාදේශීය සභාවේ බහු කාර්ය ගොඩනැගිල්ලක් ෆයිසර් මුස්තාපා ගරු ඇමැතිතුමාගේ සහ රුවන් විජේවර්ධන ගරු ඇමැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සංවිධායක ඩුලිප් විජේසේකර මැතිතුමා, ගුණසිරි ජයනාත් සංවිධායකතුමා, මමත් ඇතුළු අපට විවෘත කරන්න තිබුණා. නමුත් ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය මේ උත්සවය සංවිධානය කරලා තිබෙන කොට, එක පාරටම වෙනත් කණ්ඩායමක් කඩා පැනලා මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ Photo ගහලා මේ ගොඩනැගිල්ල විවෘත කළා. ඉතින් ඒ නිසා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ Photo ගහලා මේ ගොඩනැගිල්ල විවෘත කිරීම

සම්බන්ධව ඔබතුමා වහාම පරීක්ෂණයක් කරන්න. මම හිතන්නේ ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය රුපියල් ලක්ෂක් විතර වියදම් කරලා සංග්‍රහයක් ලැහැස්ති කරලා තිබුණා. ඒ රුපියල් ලක්ෂයේ සංග්‍රහය ඒ අය සම්පූර්ණයෙන් භුක්ති විඳලා ඒ උත්සවය සම්පූර්ණයෙන් විනාශ කරලා ගියා. අපි ඉල්ලීමක් කරනවා. බස්නාහිර පළාතේ පළාත් පාලන අමාත්‍යවරයා වශයෙන් ඔබතුමා මැදිහත් වෙල සොයා බලන්න. මම හිතන්නේ, බියගම ප්‍රාදේශීය සභාව තුළ විශාල ලෙස ජනතාවට අකටයුතුකම් සිද්ධ වෙනවා. ඒ නිසා ඔබතුමාගේ මැදිහත් වීමෙන් බියගම ප්‍රාදේශීය සභාවේ ඉදිරි කටයුතුවලට ඔබතුමාගේ ශක්තිය සහ කාර්යක්ෂමතාවය ලබා දෙන්න කියලා ඉල්ලීමක් කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පළාත් පාලන ආයතන අක්‍රීය වුණත් ඉදිරි කාලය තුළදී ගරු මහ ඇමතිතුමාගේ නායකත්වයෙන් මේ පළාත් පාලන ආයතනවලට යම්කිසි ශක්තියක් ලබා දෙන්නය කියා ඉල්ලා සිටිනවා. ඔබතුමා මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට ශක්තියක් ලබා දෙන මහ ඇමැතිවරයෙක්. අපි දැක්කා ගම්පහ දිස්ත්‍රික්කයේ සමහර ආසනවල පළාත් සභා අරමුදල්වලින්, බියගම ප්‍රාදේශීය සභා අරමුදල්වලින් මුදල් ප්‍රතිපාදන වෙන් කරන කොට ඒවායේ Photo ගහන්නේ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමගේ Photo එක නොවෙයි. ඒවායේ ගහන්නේ මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ Photo. අපි දැක්කා අද වනකොටත්, හෙට වනකොට, පසුගිය කාල සීමාව තුළදීත් බියගම ආසනයේ සහ ගම්පහ දිස්ත්‍රිකකයේ සැරිසරන කොට පළාත් සභා ව්‍යාපෘති කරන කොට, ප්‍රාදේශීය සභා ව්‍යාපෘති කරන කොට අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා තමයි මේ රටේ නායකයා. නමුත් අද හැම තැනම පළාත් සභා අරමුදල්වලින්, බියගම ප්‍රාදේශීය සභා අරමුදල්වලින් කරන ඒවායේ මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ Photo එක ගහන්නේ. මේ ගැන ඔබතුමාගේ අවධානය යොමු කරලා, ඉදිරි කාල සීමාව තුළදී මේ පළාත් සභාවේ යහපාලනය ක්‍රියාත්මක කරන්නට ඔබතුමගේ සහයෝගය ලබා දෙන්න. මේ බියගම ප්‍රාදේශීය සභාවෙන් කරන අකටයුතුකම් මහ හරින්නට ප්‍රදේශයේ ජනතාවට ඔබතුමාගේ ශක්තිය ධෛර්ය ලබා දෙන්නය කියලා ඉල්ලීමක් කරනවා. කෘෂිකර්ම අමාත්‍යාතුමාටත් ගෞරවයෙන් ස්තුති කරනවා.

පසුගිය කාල සීමාව තුළදී විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් වුණත් ඔබතුමා උපදේශක කාරක සභාව හරහා අපට විශාල ශක්තියක් ලබා දුන්නා. ඒ නිසා ඉදිරි කාල සීමාව තුළදී ඔබතුමාගේ අමාත්‍යාංශයට අපි ඒ ශක්තිය ලබා දෙනවා. එත් එක්කම විශේෂයෙන්ම කියන්න ඕනෑ අපේ මහ මාර්ග ඇමැතිතුමා ගැන. මහ මාර්ග ඇමැතිතුමාගේ අමාත්‍යාංශය මම හිතන්නේ අවුරුදු - මම මේ පළාත් සභාවට ඇවිල්ලා අවුරුද්දයි මාස තුනයි. එතුමාගේ මුල් කාල සීමාවේදීම අපෙන් ගත්තා Bus halt එක්ක ලබා දෙන්න කියලා. අදට මාස 15 ක් ගියා. තවම ඒ Bus halt එක ලබා දුන්නේ නැහැ. ඒ නිසා මේ පළාත් සභාවේ තිබෙන දුර්වලම අමාත්‍යාංශය වශයෙන් මම දකින්නේ, ඔය මහ මාර්ග සහ සමූපකාර අමාත්‍යාංශයයි. බස්නාහිර පළාතේ සමූපකාරය සම්පූර්ණයෙන්ම විනාශ වෙලා තිබෙන්නේ. කලින් නිමාල් ලාන්සා ඇමැතිතුමා තමයි මේ අමාත්‍යාංශයේ ඇමැතිවරයා වශයෙන් හිටියේ. එතුමා ඉන්න කොට විශාල වශයෙන් යම්කිසි වැඩ කොටසක් කළා. අපි ඇත්ත කියන්න ඕනෑ. එක නිසා මේ වනකොට මෙම අමාත්‍යාංශය මිනිසුන් කෙරෙහි දැඩි පිළිකුල් සහගත තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ නිසා ඔබතුමා මැදිහත් වෙලා මේ Bus halt එක අපට නැතත් ඉදිරි කාල සීමාව තුළදී මේ අමාත්‍යාංශය හරහා වන සේවාවන් සක්‍රීය කරන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. එතුමා ලස්සනට අත් දෙක බැඳගෙන අහගෙන ඉන්නවා. ඉදිරි කාල සීමාව තුළදී මේ අමාත්‍යාංශය හරහා ජනතාවට සේවාවක් කරන්න. ඒත් එක්කම සෞඛ්‍ය ඇමැතිතුමාත් යම්කිසි උත්සාහයක් දරනවා මේ පළාත් සභාව හරහා විශාල කාර්ය භාරයක් කරන්නට. ඒක නිසා මේ පළාත් සභාවේ මම දැකපු අකාර්යක්ෂම, දුර්වලම අමාත්‍යාංශය තමයි මහ මාර්ග අමාත්‍යාංශය. ඊළඟ වසරේදී මේ අමාත්‍යාංශය, හොඳම අමාත්‍යාංශය වේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 02.50]

**ගරු අර්ෂාඩ් නිසාම්ඩීන්**
Hon. Arshad Nizamdeen

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 2017 අයවැය විවාදයේදී, බස්නාහිර පළාත් සභාවේ 6 වැනි පළාත් සභාවේ තුන්වැනි අයවැයට සහභාගී වෙමින් පොදු සාකච්ඡාවේදී මට අවස්ථාවක් ලබා දුන් ආණ්ඩු පක්ෂයේ ගරු සංවිධායකතුමා, ගරු ප්‍රධාන ඇමැතිතුමා ඇතුළු ඔබතුමාට ස්තුතියි.

[ ගරු අර්ෂාඩ් නිසාම්ඩීන් ]

ඒ වාගේම 2017 අයවැය පොත බලන කොට, මේකේ තිබෙනවා ස්වයං රැකියා සඳහා සුළු පරිමාණ ව්‍යවසාය අංශය දිරි ගැන්වීම. මම අහන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ස්වයං රැකියා කොහොම දිරිගන්වන්න යනවාද කියලා අපි දන්නේ නැහැ. ඇයි කියනවා නම් 2016 දී අපි මෙතෙක් කල් - ගියවරත් ස්වයං රැකියා සඳහා අපි ජනතාවට නොමිලේ ස්වයං රැකියා උපකරණ ලබා දුන්නා. නමුත් 2016 දී මුදල් අමාත්‍යාංශය මගින් මුදල් කොමිෂන් සභාව හරහා අපට තහංචි පැනවූවා. ඒ කියන්නේ, ප්‍රතිලාභියා විසින් 50% ක් ගෙවන්න කියලා. අපි සෑම විටම මේ ගැන කථා කරලා තිබෙනවා. අපේ සෑම මන්ත්‍රීවරයෙක්ම මේ ගැන කථා කරලා තිබෙනවා. නමුත් මේකට අපට තව වනතුරු උත්තරයක් ලැබිලා නැහැ. මේකේ දාලා තිබෙනවා ස්වයං රැකියා සඳහා දිරි ගන්වනවා කියලා. කොහොම දිරි ගන්වනවාද කියලා මම නම් දන්නේ නැහැ. මම හිතන්නේ සල්ලි තියෙන කට්ටියට දිරි ගන්වන්න පුළුවන් කියලා. අඩුම ගණනේ සිංගර් එකෙන් මැෂින් එකක් ගන්නවා නම් රුපියල් 34,000/- යි. එහෙම නම් ඒ ප්‍රතිලාභියා රුපියල් 17,000/- ක් ගෙවන්න ඕනෑ. ඒ ප්‍රතිලාභියාට ඊට වඩා හොඳයින් නේ සිංගර් එකට ගිහිල්ලා රුපියල් 2,000/- ක් ගෙවලා අනෙක් ටික මාසික වාරික වශයෙන් ගෙවන්න පුළුවන් නේ? රුපියල් 17,000/- ක් ගෙවන්න ඕනෑද? ඉතින් මෙවැනි ආකාරයෙන් මධ්‍යම රජය විසින් පළාත් සභාවට තහංචි පනවලා කරන්නේ කාටද? ජනතාව අපෙන් ලබා ගන්නා වූ සේවාවන් ලබා ගැනීම නතර කිරීමක් තමයි මේ කරලා තිබෙන්නේ.

ඒ වාගේම මේකේ දාලා තිබෙනවා දුෂ්කර ගම්මාන දියුණු කිරීම කියලා. දැන් අපේ පළාත් සභාවට මුදල් අඩු කරලා තිබෙනවා. මුදල් අඩු කරලා තියෙද්දී, මේ දුෂ්කර ගම්මාන කොහොම දියුණු කරයිද කියලා. කෝ මුදල්? අපේ තිබෙන ආදායම් සියල්ල මධ්‍යම රජයෙන් ලබාගෙන ඉවරයි. අපේ සමහර මන්ත්‍රීවරු කථා කළා අපට ආදායම් ලබා ගන්න පුළුවන් කියලා. ආදායම් ලබා ගන්න පුළුවන් ක්‍රම තිබෙනවා. නමුත් තිබුණු ආදායම අපි භාර දීලා ඉවරයි. ඒ ආදායම භාර දීලා ඉවරයි. ලැබෙන්න තිබෙන දේවලුත් පළාත් සභාවෙන් කපා හරිනවා. ඉතින් මේවා කොහොමද කරන්නේ කියලා මට නම් තේරෙන්නේ නැහැ. නමුත් මේවා පොත පතට සීමා වෙනවා කියලා තමයි මට හිතා ගන්න පුළුවන්. මේවා පොතේම තියෙයි. ලබන 2017 අවුරුද්දේත් අපි මේ වාගේම කථා කරයි. ඉතින් මේක තමයි වෙන්නේ.

ඒ වාගේම මේ පොතේ සඳහන් වෙනවා, සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්තකරුවන් නඟා සිටුවීම කියලා. හොඳ ප්‍රවණතාවයක්. හොඳ දැක්මක්. කොහොම ක්‍රියාත්මක වෙයිද කියලා, මම නම් දන්නේ නැහැ. ඒ වාගේම තිබෙනවා, රජයේ සහ පෞද්ගලික අංශයේ ඒකාබද්ධ ව්‍යාපෘති කෙරෙහි අවධානය යොමු කිරීම. ඒකත් හොඳ දැක්මක්. කොහොම වෙයිද කියන්න දන්නේ නැහැ. බැල්ම තියෙනවා. දැක්ම කොහොම වෙයිද දන්නේ නැහැ. ඉතින් මේ වාගේම තව දෙයක් තියෙනවා. පළාතේ පවතින 6.5% ක් වූ විරැකියා අනුපාතය 2018 දී 2% දක්වා අඩු කිරීම. ඉතාම හොඳ යෝජනාවක්. අපි ප්‍රාර්ථනා කරනවා මේ යෝජනාව ඉටු වෙන්නෙයි කියලා. 2018 වනකොට 2% ක ප්‍රමාණයකට විරැකියාව අඩු වෙන්නය කියලා. ඒ වාගේම 2010 දී 4% ක් වූ දරිද්‍රතා ප්‍රතිශතය 2018 දී 1% දක්වා අඩු කිරීම. ඉතාමත් හොඳ දැක්මක්. හොඳ වර්ධනයක් වේවා කියලා අපි ප්‍රාර්ථනා කරනවා.

ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ මැති ඇමැතිවරු සෑම කෙනෙක්ම වැඩක් කරනවා. නැහැයි කියන්නේ නැහැ. සමහර අඩුපාඩු තිබෙනවා. නමුත් මහ ඇමැතිතුමාගේ වැඩ පිළිවෙළ නිසා අපේ පළාත් සභාව හොඳ තත්ත්වයකට නඟා සිටුවලා තිබෙනවා. ගරු ප්‍රධාන ඇමැතිතුමාට සමහර මන්ත්‍රීවරු දෝෂාරෝපණය කළා. නමුත් ඒ දෝෂාරෝපණය කිරීමෙන් පළක් වන්නේ නැහැ. මම නම් කියන්නේ ඔක්කෝම එකට එකතු වෙලා වැඩ කළොත් මේ පළාත් සභාව නඟා සිටුවීමට අපට හැකියාව තිබෙනවා. ඒ වාගේම අද මේ රටේ ඉතාම භයානක තත්ත්වයක් උද්ගත වෙලා තිබෙනවා. මේ අන්තවාදී පිරිසක් බිහි වෙලා. ගිය රජය වෙනස් කිරීමට මූලික හේතුව තමයි මේ අන්තවාදීන්. නැවත මේ අන්තවාදීන් බිහි වෙලා මුළු රටම ගිනි ජාලයක් බවට පත් කරගෙන යනවා. මේ අන්තාවාදීන් සෑම ආගමකම, සෑම ජාතියකම මුස්ලිම් හෝ වේවා, දෙමළ හෝ වේවා, සිංහල හෝ වේවා, ක්‍රිස්තියානි හෝ වේවා අන්තවාදීන්ට මේ රටේ ඉඩ දෙන්නම නරකයි. අපේ අභිප්‍රාය, අපේ අභිමතය ඒක තමයි. ඒ වාගේම මේ අන්තවාදීන් මේ රටට, ජාතියට, ආගමට නොවෙයි කරන්නේ. ඔවුන්ගේ පැවැත්ම සඳහා. ඔවුන්ට මුදල් ලබා ගැනීමට. අන්තවාදීන් ලෙස හැසිරිලා මුදල් ලබා

ගැනීමට සහ පැවැත්ම සඳහා තමයි ඔවුන් ක්‍රියාකාරකම් එහෙම කරන්නේ.

මේ අන්තවාදීන් රටට, ජාතියට ආදරයක් තිබෙනවා නම්, මේ අන්තවාදීන් කවදා හරි මත්ද්‍රව්‍යවලට විරුද්ධ වෙලා තිබෙනවාද? මත්පැන්වලට විරුද්ධ වෙලා තිබෙනවාද? මේ සම්බන්ධව කොහේ හරි වචනයක් කියලා තිබෙනවාද? සෑම නගරයක්ම ගත්තාම අද මත්පැන් හලක් තිබෙනවා. පූජා නගරයේ වේවා, පාසල් ළඟ වේවා, පන්සල් ළඟ වේවා, පල්ලි ළඟ වේවා, කෝවිල් ළඟ වේවා මත්පැන් හලක් තිබෙනවා. Wine Stores එකක් තිබෙනවා. Wine Stores වල පෝළිමේ කට්ටිය ඉන්නවා. ඉතින් මෙවන් ආකාරයට අද රට පත් වෙලා තියෙද්දී පොඩි ළමයි, තරුණ පිරිස ගම් මට්ටමින් මේවාට ඇබ්බැහි වෙලා. මේ අන්තවාදීන්ට බලන්න කියන්න මේ පොඩි තරුණ පිරිස් පාවිච්චි කරන දේවල්. එදා මම ගමකට ගියා. ඒ ගමට යන ගමන් සිල්ලර කඩේකට ගොඩ වුණා, පැනඩෝල් ගන්න. එතකොට ඒ මුදලාලි ළඟට තරුණ පිරිසක් ආවා. මොනවාද ඒ කට්ටිය ගන්න ආවේ? චොකලට්. පැණි රස කෑම. ඒ පැණි කෑම කන්නේ මොකටද? මත්ද්‍රව්‍ය පාවිච්චි කළාම ඒ පැණි රස කෑම තමයි ඔවුන් කන්නේ. ඉතින් මෙවන් ආකාරයට මුළු රටම විනාශයට පත් වන මත්ද්‍රව්‍යවලට මේ අන්තවාදීන් විරුද්ධ වෙලා නැහැ.

මැතකදී එක මනුස්සයෙක් මාත් එක්ක කථා කරමින් ඉන්න කොට කියනවා මේ රජයට නැවත මේ තරුණ පිරිස ඡන්දය දෙන්නේ නැහැයි කියලා. ඒ කියන්නේ Wedding ගන්න පිරිස. ඇයි කියලා ඇහුවාම කියනවා මත්පැන්වල මිල වැඩි කරලා නේ තියෙන්නේ කියනවා. මමත් බැලුවා, බඩු බාහිරාදිය, ඇඳුම් මිල වැඩි කරලා ආදිය කියයි කියලා. නැහැ. මත්පැන් වැඩි කරපු නිසා තරුණ පිරිස ඡන්දය දෙන්නේ නැහැයි කියලා කියනවා. කොපමණ දුරකට අපි ගිහිල්ලා තියෙනවාද? මේවා ගැන අන්තවාදීන් බලන්නේ නැත්තේ ඇයි? මේ අන්තවාදීන්ට ඒක නොවෙයි ඕනෑ. ඔවුන්ට ඕනෑ තමන්ගේ යහ පැවැත්ම සඳහා මේ රට විනාශ කරන්න. මේ රජයෙන් ඉල්ලා සිටිනවා. මේ අන්තවාදීන්ට ආයෙත් නම් කිසිම අවස්ථාවක ඉඩදෙන්නට එපා. ඉඩ දුන්නොත් එහෙම, මේ රජයටත් නැවත තමන්ගේ ගෙදර බලා යන්න වෙයි කියමින් මම නිහඬ වෙනවා. ස්තූතියි.

[අ.භා. 02.59]

**கௌரவ எம்.எஸ்.எம் ரஹீம்**
ගරු එම්. ෂාෆි රහීම්

பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம். கௌரவ பிரதித் தவிசாளர் அவர்களே VI ஆவது மாகாண சபையின் இருபத்தி ஒன்பதாவது நிதிக் கூற்றின் ஆரம்ப நாளான இன்று பொதுக் கலந்துரையாடலின் கீழ் பேசுவதற்கு எனக்கு சந்தர்ப்பத்தை வழங்கிய முதலமைச்சருக்கும் மற்றும் அமைச்சர்களுக்கும் முதலில் நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

இன்று பல உறுப்பினர்கள் கதைத்தார்கள் இந் நாட்டில் இன்னுமோர் எதிர்க் கட்சியை ஆளுங் கட்சியாக மாற்றுவதற்கும், இவ் ஆட்சி தவறு என்று கூறுவதற்கும் பலர் முயற்சித்துக் கொண்டிருக்கிறார்கள். ஆனாலும் சிலர் அரசியலை பெறியதோர் வியாபாரமாகத் தான் செய்து கொண்டிருக்கிறார்கள், இது ஒரு தவறான விடயமாகும்.

சென்ற காலங்களில் இந் நாட்டு ஜனாதிபதியை தோற்கடித்து இன்று புதியதொரு ஜனாதிபதியை நாங்கள் வெற்றியடைய செய்திருக்கிறோம். ஆனாலும் இந் நாட்டில் பெரும்பான்மை மக்கள் நல்லாட்சியை எதிர்ப்பார்க்கின்றார்கள். இந் நாட்டு மக்களுக்கு நிம்மதியான வாழ்க்கை ஒன்றை நடாத்திச் செல்வதற்காக நாங்கள் நல்லாட்சியை உருவாக்கினோம். பாராளுமன்றத்திலோ அல்லது மாகாண சபையிலோ இதனை சரியான முறையில் செய்வதற்கு முதலமைச்சர் மற்றும் அமைச்சர்கள் முயற்சி செய்த போதிலும் அதிலும் கூட பின் விழைவுகள் இருக்கத்தான் செய்கின்றன.

இன்று கூட இம் மாகாண சபையில் அமைச்சுக்களின் புத்தகங்களை அச்சிடுவதற்காக செலவழிக்கும் பணம் ஒரு வீ ண் விரயமாகும் இப் புத்தக அச்சீட்டுக்காக கோடிக் கணக்கான பணத்தை செலவழிப்பதை விட மாகாண சபை உறுப்பினர்கள் அணைவருக்கும் ஒரு Tab ஐக் கொடுத்து அல்லது ஒரு Pendriver ஐக் கொடுத்து பணத்தை மீதப்படுத்துவதே மிகச் சிறந்ததாகும்.

அதேபோல் கொழும்பு, களுத்துறை, கம்பஹா இம் மூன்று மாவட்டத்திலும் கட்டிடங்கள், பாதைகள், பாலங்கள் என பல நிர்மாணங்கள் நிர்மாணிக்கப்படுகின்றன ஆனாலும் இதன் மொத்த செலவினத்தைப் பார்க்கும் போது ஒரு கட்டிடத்தை கட்டும் போது இரு கட்டிடங்கள் கட்டக் கூடிய அளவு பணம் வீ ணாக்கப்படுகின்றன இதை நாங்கள் உணர்ந்து கொண்டு

[கௌரவ எம்.எஸ்.எம் ரஹீம்]

எதிர் காலத்தில் இந் நாட்டின் வழர்ச்சிக்கு ஒத்துழைப்பை வழங்க வேண்டும்.

இலங்கையில் ஒன்பது மாகாண சபைகள் இருக்கின்றன, இம் மாகாண சபைகள் ஏன் உருவாக்கப்பட்டது என்றால் 1983 ஆம் ஆண்டுகளில் தமிழ், சிங்கள மக்களுக்கு இடையே ஏற்பட்ட பிரச்சினையின் போது சொத்துக்கள் அழிக்கப்பட்டு, பாதிக்கப்பட்ட ஐம்பதாயிரம் மக்களுக்காகவே உருவாக்கப்பட்டதாகும். இப்படியான ஒரு மாகாண சபை உருவாக்கப்பட்டதினால் தான் எங்களுக்கும் இம் மாகாண சபையில் வந்து கதைக்கக் கூடிய வாய்ப்பு கிடைத்திருக்கின்றன. எனவே இம் மாகாண சபைகளில் ஜனாதிபதியைப் போன்று முதலமைச்சரும், பிரதமரைப் போன்று அமைச்சர்களும் இருக்கின்றார்கள் எனவே எங்களுடைய உரிமைகளைப் பற்றிப் பேசுவதற்கும், இலகுவான முறையில் தொடர்புகளை ஏற்படுத்திக் கொள்ளக் கூடிய வகையில் இம் மாகாண சபைகள் உருவாக்கப்பட்டதையிட்டு நாம் மகிழ்ச்சி அடைகின்றோம்.

அன்று 1988 ஆம் ஆண்டு மாகாண சபை உருவாக்கத்தின் போது சிறீலங்கா சிதந்திரக் கட்சியும், மக்கள் விடுதலை முன்னணியும் எதிர்த்தார்கள் ஆனால் இன்று அவர்கள் ஆட்சியை கைபிடித்து, மக்களுக்கு சேவைகளை செய்து வருவதைப் பார்க்கக் கூடியதாக உள்ளது. இது தான் எங்களுக்குத் தேவை. ஏனென்றால் பாராளுமன்றத்தில் செய்ய முடியாத விடயங்களை இன்று மாகாண சபையினூடாக பல வழிகளில் மக்களுக்கு தேவையான உதவிகளை செய்து கொண்டு வருகிறோம். அது மட்டும் அல்ல எங்களுடைய நாட்டிலுள்ள பெண்களையும், இளைஞர்களையும் வெளிநாட்டிற்கு அனுப்பிவிட்டு, உள் நாட்டில் வேலை செய்யக் கூடிய ஊழியர்கள் பற்றாக்குறையினால் மிகவும் கஷ்டப்படுகின்றோம், அதேபோல் இன்று எங்களுடைய நாட்டின் வருமானம் என்ன. இன்று உள் நாட்டில் வருமானம் வரக் கூடிய உற்பத்திகள் மிகக் குறைவு. அன்று வெளிநாட்டவர்கள் தேயிலைப் பயிர்செய்கை, தேங்காய்ச் செய்கை மற்றும் இறப்பர் பயிர்ச் செய்கைகளையும் புகையிரதப் பாதைகளையும் முன்னேற்றிவிட்டுச் சென்றார்கள் ஆனால் இன்று நாம் என்ன செய்து கொண்டிருக்கிறோம். உண்மையிலேயே பார்க்கும் போது நாம் செய்தது கொஞ்சம் ஆனால் செய்ய வேண்டியது இன்னும் நிறையவே இருக்கின்றன.

எமது நாட்டு மக்களின் பணத்தால் கல்வி கற்ற பதினைந்தாயிரத்திற்கும் மேற்பட்ட வைத்தியர்கள் வெளிநாடு சென்று சேவை செய்கிறார்கள், அவர்களை எமது நாட்டு மக்களுக்கு சேவை செய்வதற்காக ஜனாதிபதி மைத்திரிபால சிறிசேன அவர்கள் அழைப்பு விடுக்கின்றார். ஆனாலும் வைத்தியர்களுக்கு இந் நாட்டில் குறை நிறைகள் காணப்படுகின்றன அவர்களுக்கு நாங்கள் தேவையான வழிமுறைகளை செய்து கொடுக்க வேண்டும். அதேபோல் எங்களுடைய மாகாண சபையில் உள்ள அரச ஊழியர்களினதும், செயலாளர்களினதும் ஆலோசனைகளைப் பெற்று, அதேபோல் உள்ளூராட்சி மன்றம் கலைக்கப்பட்டிருக்கின்றன. இன்று இரண்டு வருடங்களுக்கு மேற்பட்ட காலங்கள் போனாலும், சபைகள் நடைமுறைப்படுத்தாவிட்டாலும், இன்று அம் மக்களுக்கு தேவையான சேவைகள் நடந்துகொண்டு தான் இருக்கின்றன. இன்று இந் நாட்டில் சில குழுக்கலால் சிங்களவர்களுக்கும் முஸ்லிம்களுக்கும் இடையே இணப் பிரச்சினைகளை உருவாக்குவதற்காக பல வழிகளில் முயற்சித்துக் கொண்டிருக்கிறார்கள். உண்மையிலே முன்னைய காலங்களில் இந் நாட்டில் ஒற்றுமையாக வாழ்ந்த சமூகம் தான் சிங்களவர்களும் முஸ்லிம்களும். இந் நாட்டிற்கு முஸ்லிம்கள் வந்தது வியாபார நோக்கத்திற்காகவே அன்றி இந் நாட்டை கைப்பற்றுவதற்காக அல்ல. அன்று வந்த முஸ்லிம்கள் இந் நாட்டில் உள்ள சிங்கள பெண்களை திருமணம் செய்து தான் இன்று முஸ்லிம்களாக வாழ்ந்து கொண்டிருக்கின்றார்கள். அவர்களுக்கும் சிங்கள பௌத்தர்களுக்கும் இடையில் எந்தவொரு வேறுபாடும் இல்லை. அவர்கள் ஒற்றுமையாக வாழக் கூடிய சூழ்நிலையை இந் நாட்டில் உருவாக்க வேண்டும். இவ்வாறான பிரச்சினைகளை உருவாக்கி அரசியல் இலாபம் பெறுபவர்கள் இருக்கத் தான் செய்கிறார்கள். இன்னும் இச் சபையில் இதைப்பற்றி கதைக்கவேண்டிய தெளிவு படுத்தவேண்டிய தேவை இருந்தாலும் நேரம் போதாமையினால் என்னுடைய பேச்சை இத்துடன் முடித்துக் கொள்கின்றேன்.

[අ.භා. 03.07]

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම පළාත් සභාවේ හිටපු මන්ත්‍රීවරයෙක් හැටියට මේ අවස්ථාවේ කථා කරන්නේ, මට මතකයි මුලින්ම පළාත් සභා ක්‍රමය හඳුන්වා දෙන

අවස්ථාවේදී මේ රටේ විශාල තර්ජනයකට මුහුණ දෙමින් තමයි පළාත් සභාවට ඉදිරිපත් වුණේ. ඒ අවස්ථාවේ මූලාසනය හොබවන අපේ නියෝජ්‍ය සභාපතිතුමා එතුමාගේ දේශපාලන ජීවිතයේ ගමන් කළ කාලයේ විජේසිරි මන්ත්‍රීතුමාත් එක්ක ඒ අභියෝගවලට අපි මුහුණ දුන්නා. ඒත් එක්කම මාත් සමග හොරණෙන් පත් වුණු සුනිල් ගුණතිලක මැතිතුමාව ඝාතනය කළා. එවැනි විශාල අභියෝගයක් මැද අපි පළාත් සභා ක්‍රමය ඇති කරන්න දිරි දීලා කටයුතු කළා. මේ පළාත් සභා ක්‍රමයට විරුද්ධ වුණු අයත් පළාත් සභා ක්‍රමය පිළි අරගෙන හොඳ ක්‍රමයක් හැටියට පවත්වාගෙන යන්න ඉදිරිපත් වෙලා කටයුතු කිරීම ගැන මම සතුටු වෙනවා.

විශේෂයෙන්ම අපි පළාත් සභාවේ මහ ඇමැතිවරු කිහිප දෙනෙක් එක්ක කටයුතු කළා. විශේෂයෙන්ම මම මේ අවස්ථාවේදී අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමා ගැන වචනයක් කියන්න ඕනෑ. මීට කලින් අපට ලැබෙන මුදලින් අමතර මුදලක් අපට ලබා ගන්න අවස්ථාවක් තිබුණේ නැහැ. නමුත් අපට විශේෂ අවශ්‍යතාවයක් වුණොත් එහෙම එතුමාට කථා කළොත් ඕනෑම අවස්ථාවක පැකිලෙන්නේ නැතුව ඉදිරිපත් වෙලා, අපට ඒ මුදල් ලබා දීලා, පොදු කටයුතු කරන අප වෙනුවෙන් සමාජ සේවයට ලොකු ශක්තියක් දෙන්න එතුමා කටයුතු කළා. ඇමැති මණ්ඩලයත් ඒ වාගේමයි. මේ අවස්ථාවේ යහපාලනය ක්‍රියාත්මක වෙන්නේ. ඇමැතිවරයෙකුට කථා කළොත් ඕනෑම වෙලාවක අපට සමාජ සේවයට අවශ්‍ය සල්ලි ටිකක් උවමනා වුණොත් ලබා ගන්න පුළුවන්කම තිබෙනවා. ඒක හොඳ වැඩ පිළිවෙළක්. අද මේ රට ගෙන යන්නේ ශ්‍රී ලංකා නිදහස් පකෂය සහ එක්සත් ජාතික පක්ෂය දෙකම එකතු වෙලා ආණ්ඩුවක් පිහිටුවලා. යහපාලන ක්‍රමයක් යටතේ වැටීගෙන යන රටක් ගොඩ නැඟීම සඳහා විශාල වෙහෙසක්, මහන්සියක් ගරු අගමැතිතුමාත්, ජනාධිපතිතුමාත් එකතු වෙලා ගෙන යන වැඩ පිළිවෙළක්. අද යම්කිසි ප්‍රවේශයකට ඇවිල්ලා තිබෙනවා. කවුරු මොනවා කිව්වත්, නොදියුණු ලෝකයේ රටක් හැටියට තිබුණු අපේ රට අද මේ පක්ෂ දෙක ඒකාබද්ධ වීම තුළින් සැලසුම් සහගතව ක්‍රියාත්මක කරනවා. ලෝකයේ සංවර්ධනය වෙමින් පවතින රටක් තුළට අපත් ගමන් කරන්න. වේගවත් ගමනක් යන්න අරමුණක් ඇතිව තමයි අපි කටයුතු කරන්නේ. ඒ අරමුණ අපේ ජීවිත කාලය තුළ අපට දකින්න ලැබුණොත් මම හිතනවා, අපි ලැබූ ලොකුම ජයග්‍රහණය ඒක කියලා මම විශ්වාස කරනවා. (බාධා කිරීමක්) අපේ මහ ඇමැතිතුමා ලැහැස්ති කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ ජනාධිපතිතුමා 2017 වසරේදී දිළිඳුකම පිටුදැකීමේ වර්ෂය හැටියට නම් කරලා තිබෙනවා, සැමට ප්‍රතිලාභ හිමි වන වේගවත් සංවර්ධනයක් කරා යන වැඩ පිළිවෙළක් හැටියට. බස්නාහිර පළාත් සභාව හැටියට අපට වගකීමක් තිබෙනවා. ජනාධිපතිතුමාගේ අරමුණ ඉෂ්ට කරන්න අපට ලොකු වගකීමක් තිබෙනවා. ඒ වගකීම ඉටු කරන්න අපි කවුරුත් කටයුතු කරන්න ඕනෑය කියන මතයක ඉන්නේ. ඒ සඳහා සැමගේම සහයෝගය අපේක්ෂා කරනවා. අද මුදල් අඩු කිරීම ගැන ඔක්කෝම කථා කරනවා. මුදල් අඩුවෙන් ලබා දුන්නා කියලා ආණ්ඩුවට දොස් කියනවා. නමුත් මුදල් ලබා නොදුන්නේ ඇයි කියන එක අවබෝධයෙන් තේරුම් ගන්නේ නැහැ. පසුගිය කාලය තුළ මුදල් වැය කරපු - අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ අයවැය ලේඛනයේ 09 වැනි පිටුවේ සඳහන් වෙලා තිබෙනවා *"වර්ෂයකට වෙන් කරන මුදල් වියදම් නොකර ඉදිරි වර්ෂයට රැගෙන යෑම හොඳ මූල්‍ය පාලනයක් නොවෙයි"* කියලා. එහෙම නම් ගරු ප්‍රධාන ඇමැතිතුමාත් පිළි අරගෙන තිබෙනවා ලැබෙන මුදල් හරියට පාලනය කරන්නේ නැතුව, වියදම් කරන්නේ නැතුව ඉතුරු කරන එක වැරැදියි කියලා. නමුත් අද සමහර මන්ත්‍රීවරු බලවත් විධියට විවේචනය කරනවා. ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා විශාල විවේචනයක් කළා. මේ සල්ලි ලබා දුන්නේ නැහැයි කියලා. නමුත් අපි දන්නවා ගරු ජනාධිපතිතුමාත් සමග තිබුණු සාකච්ඡාවේදී මේ ලබා දෙන්න තිබෙන මුදල් ඉදිරි කාලයේදී ලබා දෙනවා කියලා පොරොන්දුවක් වෙලා තිබෙනවා වාගේම, මීට අතීතයේත් අපට සාක්ෂි තිබෙනවා. පළාත් සභාවට ලබා දුන් මුදල් රජයෙන් මද ප්‍රමාණයක් ලබා දුන්නත්, පසුවට ඒ මුදල් ලබා දීලා වැඩ කටයුතු ගෙන යන්න පුළුවන් විධියේ ශක්තියක් සෑම රජයකින්ම ලබා දුන්නාය කියලා. ඒ වාගේම දූප්පතාට පහර ගහපු රජයක් වශයෙන් විවේචනය කරනවා. අපි ඒක ප්‍රතික්ෂේප කරනවා.

මම හිතන්නේ මේ රජයෙන් තමයි දුප්පත් ජනතාවට සහනයක් ලැබුණේ. විශේෂයෙන්ම රුපියල් 10,000 කින් රජයේ සේවකයින්ගේ වැටුප් වැඩි කිරීම මේ රටේ ඓතිහාසික සිද්ධියක්. කාටවත් කරන්න බැරි වුණු වැඩක්.

[ ගරු පී.ඩී. අබේරත්න ]

යහපාලන රජය යටතේ රජයේ සේවකයින්ට රුපියල් 10,000 කින් වැටුප් වැඩි කරලා විශාල සහනයක් ලබා දුන්නා වාගේම අද ඩීසල් මිල, පෙට්‍රල් මිල, ගෑස් මිල, අත්‍යවශ්‍ය භාණ්ඩ වන සහල්, පරිප්පු, සීනි වාගේ ජනතාවට අවශ්‍ය සෑම භාණ්ඩයකම මිල අඩු වෙලා තිබෙනවා. 2015 මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුවේදී මෙන් නොව අද බඩු මිල අඩුයි කියලා අපට බය නැතුව කියන්න පුළුවන්කම තිබෙනවා. මේ රටේ ඉතිහාසයේ පළමු වරට පඩි වැඩි කරලා, බඩු අඩු කරපු එකම ආණ්ඩුවත් මේ රජය කියන එක මම ආඩම්බරයෙන් මතක් කරන්න කැමැතියි. එහෙම අවදියක කොහොම විවේචනය කළත් මේ රටේ ජනතාවට සහනයක් දෙමින් අපේ මේ රජය කටයුතු කරනවා කියන එක මතක් කරන්න කැමැතැයි. ඒ වාගේම පළාත් සභාව ගැන බලන කොට ත්‍රිකුණාමලයේ තිබුණු වැඩ මුළුව පළාත් සභා ඉතිහාසයේම තිබුණු සාර්ථකම වැඩ මුළුව. බොහොම සුහදව සාකච්ඡා කරලා, අපේ මන්ත්‍රීවරුන්ගේ අදහස් අරගෙන, නිලධාරීන් එක්ක කථා කරලා, හොඳ වැඩ පිළිවෙළකට අවතීර්ණ වෙලා තිබෙනවා. ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම තුළින් මම හිතනවා ඉදිරි අනාගතයේදී අපට මීට වැඩිය සහන ජනතාවට දෙන්න ලැබෙයි කියලා.

විශේෂයෙන්ම මම සඳහන් කරනවා අපි භාණ්ඩ ලබා දීමේදී නිවාස ආධාර සඳහා සිමෙන්ති ලබා දෙනවා. ඔබතුමන්ලා අපි කවුරුත් දන්න දෙයක්. එක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක එක මිලක්. තවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක තව මිලක්. සමහර ඒවායේ රුපියල් 10 ක්, 15 ක් වැඩියි. මේ දෙන මුදල් බැලුවාට පස්සේ විශාල ලෙස මුදල් අපතේ යනවා. ගිය අවුරුද්දේ වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ස්වයං රැකියා බඩු බෙදන කොට රුපියල් 600 බඩු රුපියල් 1800 යි කියලා පෙන්නලා තිබුණා. මේ වාගේ විශාල ලෙස මුදල් අවභාවිතා වෙනවා. මේවාගේ නිලධාරීන් අතින් විශාල වැරැදි වෙනවා. ඒ වාගේ තත්ත්වයක් නොවෙන්න අපි එදා කථා කරපු විධියට අමාත්‍යාංශ තුළින් තමයි මුදල් අනුමත කරන්නේ. අමාත්‍යාංශයෙන් සියලුම ඇස්තමේන්තු එනවා. එහෙම නම් අමාත්‍යාංශ කෙළින්ම නිෂ්පාදන ආයතනවලින් බඩු අරගෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ලැබෙන්න සලස්වනවා නම් අපට පුළුවන්කම ලැබෙනවා ඒවා හරියට බෙදා දෙන්න. මීට වැඩිය වැඩි ප්‍රමාණයක් ලබා දෙන්න පුළුවන් වෙනවා.

ඒ වාගේම සැලසුම් කළාට පස්සේ මුදල් අනුමත කිරීම. ඒවායේ ඇමැතිවරුන්ට මුදල් වෙන් කිරීමේ බලය පවරා දීම වාගේ දේවල්වලින් මීට වැඩිය ඉක්මන් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන් පුළුවන්කම ලැබෙනවා. ඒවා අපි සාකච්ඡා කළා වාගේම මේ වැඩ පිළිවෙළත් ක්‍රියාත්මක වුණොත් අපට පසුගිය වර්ෂවලට වැඩිය වැඩි වැඩ කොටසක් කරන්න පුළුවන් කියලා මම විශ්වාස කරනවා. ඒ වාගේම අපද්‍රව්‍ය කළමනාකරණය ගැන අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමා විශාල වෙහෙසක්, මහන්සියක් ගන්නවා. එතුමා විදේශ රටවලට ගිහිල්ලා බලලා ඇවිල්ලා මේ අපද්‍රව්‍යවලින් විශාල මුදල් ප්‍රමාණයක් උපයන්න පුළුවන් ක්‍රමවේදයක් සකස් කර තිබෙනවා. එය හරියට ක්‍රියාත්මක කළොත් අපට විශාල ආදායමක් ගන්න පුළුවන්.

අද කාබනික පොහොර නිෂ්පාදනයට. රසායනික පොහොර ඉවත් කරලා කාබනික පොහොරවලට යන්න විශාල වෙහෙසක්, මහන්සියක් දරනවා. ඒ ගැන විශේෂ වැඩ කටයුතු කරගෙන යනවා වාගේම, ගොවියාට ඒ ගැන අවබෝධයක් ලබා දීලා, ගොවියාත් ඒ සඳහා නැඹුරු වෙලා තිබෙන අවස්ථාවක රසායනික පොහොර නැතුව කාබනික පොහොර ලබා දෙන්න හොඳ අවස්ථාවක් වෙනවා. බස්නාහිර පළාතේ පමණක් දවසකට මෙට්‍රික් ටොන් 3500 ක් අපද්‍රව්‍ය තිබෙනවා. මෙයින් 16% යි අපි පොහොර සඳහා ප්‍රයෝජනයට ගන්නේ. 2018 වනකොට 40% ක ඉලක්කයකට යන්න පළාත් සභාව සැලසුම් කරලා තිබෙනවා. ඒ තුළින් මම හිතනවා අපේ ගොවිතැනට විශාල සහනයක් ලැබෙයි කියලා. එක පැත්තකින් මේක කෘෂි කර්මාන්තයට සම්බන්ධ වෙනවා. රසායනික පොහොර නැතුව කාබනික පොහොර උත්පාදනය කරන්න. එළවළු, පළතුරුවලට හොඳ මිලක් ලැබෙයි.

සහල්වලට. අද සහල්වලට මිලක් නැහැ කියලා සමහරු කථා කරනවා. සහල් වෙළඳ පොළේ වී මිල රුපියල් 30, 35 යි. සහල් මිල රුපියල් 60 යි, 65 යි. නමුත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කාබනික පොහොර භාවිතා කරලා සහල් දෙනවා නම් රුපියල් 250 යි, 260 යි. ඒවා ගන්න ඕනෑතරම් පෙළ ගැහිල්ලා ඉන්නවා. මොකද, මේ සල්ලි දීලා ලෙඩ ගන්නේ නැතුව හොඳ හාල් ටිකක් ගන්න බලාපොරොත්තු වන ජනතාව අද මේ රටේ සුලභව අපට දකින්න ලැබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

මට පොඩි කාලයක් දෙන්න. පරිසරය ගැනත් කියන්න ඕනෑ. අපි පරිසරය පිළිබඳව විශාල වෙහෙසක්, මහන්සියක් ගන්නවා. අද පරිසරය විනාශ වීම තුළ පසුගිය කාලයේ ජලය හිඟවීම අපට බෙහෙවින් බලපෑවා. මම නියෝජනය කරන අගලවත්ත මැතිවරණ කොට්ඨාශය විශාල වන ගහනවලින් පිරිණු ප්‍රදේශයක්. නමුත් පසුගිය පෑවිල්ලකට සෑම තැනක ජලය නැතුව බවුසර්වලින් ජලය බෙදන තත්ත්වයට පත් වුණා. පරිසර විනාශය තමයි ඒකට බලපාන්නේ. අපි පරිසරය ආරක්ෂා කරන්න විවිධ උපාය මාර්ගයන් ගන්නවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද තේ වගාව කඳුකර ප්‍රදේශවල හුහක් ප්‍රචලිත වෙලා තිබෙනවා. කඳු මුදුන්වල තේ වගා කිරීම තුළින් කඳු මුදුන් විශාල වියළීමකට පත් වෙනවා. නුවර එළියට පැත්තට ගිහිල්ලා බැලුවොත් ආදි කාලයේ විදේශිකයෝ ඇවිල්ලා තේ වවපු වතුවල කඳු මුදුන් ඔක්කෝගේම කැලෑ පවත්වාගෙන ආවේ. රක්ෂිත කැලයක් ආරක්ෂා කරන්න කියලා තිබෙනවා. නමුත් අපේ ප්‍රදේශවල බිංදුවක්වත් නැහැ. සම්පූර්ණ ප්‍රදේශ ආවරණය වන විධියට තේ වගා කරලා තිබෙනවා. මේක, වතුර හිඟයට එක පැත්තකින් බලපානවා. අනෙක් එක තමයි රබර් වගාව ගලවන කොට - මම ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේදී යෝජනා කළා ගහක් ගාණේ පාරවල් කපනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කන්ද මුදනට යන කොට පේළියෙන් පේළියට මුදුනට යනකල්ම පාරවල් කපනවා. ඒ තුළින් විශාල සෝදා පාළුවක් ඇති වෙනවා. නාය යෑමට පත් වෙනවා. අපේ උල්පත් හිඳෙනවා. මේ නිසා විශාල ජල ප්‍රශ්නයකට මුහුණ දෙන්න සිදු වෙලා තිබෙනවා. අපට පානීය ජල ප්‍රශ්නයක් එනවා. ලෝකයම පිළිගන්නවා ඉදිරියේදී එවැනි ප්‍රශ්නයක් ඇති වෙනවා කියලා. අපේ තිබෙන වතුර ටිකත් නැති වන තත්ත්තවයට පත් වෙලා තිබෙනවා. ආර්ථිකය ගැන විතරක් බලනවා. අනෙක් දේවල් ගැන බලන්නේ නැහැ. ඒක නිසා මම ගරු නියෝජ්‍ය සභාපතිතුමා මාර්ගයෙන් ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ අවධානයට යොමු කරනවා. මේ තේ වගාවේ කඳු මුදුන්වලට වන හානියත්, රබර් වගාවේ පාරවල් කැපීම නිසා පරිසරයට වන හානිය ගැනත් විශේෂ අවධානයක් යොමු කරන්නයි කියලා. කාල වේලාව ඉක්ම ගිය නිසා මම කනගාටු වෙනවා. නමුත් අද අපි ගෙන යන වැඩ පිළිවෙළ තුළින් පළාත් සභාවට මෙතෙක් ගෙනොපු සේවයට වැඩිය විශාල සේවයක් කරන්න මේ අවස්ථාවේදී පුළුවන් වෙයි කියලා විශ්වාස කරමින්, අනාගතය සාර්ථක කර ගැනීමට හැකි වේවායි ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේ අවස්ථාවේදී ගරු සභාපතිතුමා මූලාසනයේ අසුන් ගන්නවා ඇති.

***ඊට අනුකූලව ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.***

*Accordingly the Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] left the Chair and Hon. Chairman [Mr. Sunil Wijeratne] took the Chair*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට ජානක සූරියබණ්ඩාර ගරු මන්ත්‍රීතුමා අවස්ථාව ලබා දෙනවා.

[අ.භා. 03.16]

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

ගරු සභාපතිතුමනි, මම ප්‍රථමයෙන්ම ස්තුතිවන්ත වෙනවා මට අවස්ථාව ලබා දීම ගැන. ඒ වාගේම අපේ ගරු ප්‍රධාන අමාත්‍ය ඉසුර දේවප්‍රිය මැතිතුමා සියලුම අමාත්‍යාංශ විෂයයන් ගැන සඳහන් වන එතුමාගේ දෙවැනි අයවැය කෙටුම්පත මීට කලින් මේ සභාවට ඉදිරිපත් කළා. එතුමා ඉදිරිපත් කළ යම් යම් විෂයයන් ගැන අද අපි පොදුවේ යම්කිසි සමාලෝචනයක් කිරීම තමයි දැන් සිදු වෙමින් පවතින්නේ. ඊට අවස්ථාව සලසා දීම ගැන ගරු ප්‍රධාන ඇමැතිතුමා ප්‍රමුඛ ගරු සභාපතිතුමාට මාගේ අවංක ස්තුතිය ප්‍රකාශ කරනවා. මම මුලින්ම කථා කරන්න කැමැතියි ගරු ප්‍රධාන ඇමැතිතුමා යටතේ පවතින විෂයයක් වන පළාත් පාලන විෂයය යටතේ පවතින පළාත් පාලනය ගැන.

[ගරු ජානක සූරියබණ්ඩාර]

ගරු සභාපතිතුමනි, සමහර මන්ත්‍රීවරු අර්ථ කථනය කළා වාගේ පළාත් පාලන ආයතනවල මහජන ඡන්දයෙන් පත් වුණු මන්ත්‍රීවරු එහෙම නැත්නම් සභාපතිවරු නැතුව අවුරුදු 1 ½ කට වැඩි කාලයක් කොමසාරිස් පාලනය යටතේ පවත්වාගෙන යන ස්ථානයක් බවට අද පළාත් පාලන ආයතන පත් වෙලා තිබෙනවා. නමුත් බස්නාහිර පළාත් සභාව තුළ මේ පළාත් පාලන ආයතන සියල්ලක්ම ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ අධීක්ෂණය සහ මහ පෙන්වීම යටතේ තමයි ඒ කොමසාරිස්වරුන්, කොමසාරිස්වරියන් පළාත් පාලන ආයතන පාලනය කරගෙන යන්නේ. ඒ නිසා අද මන්ත්‍රීවරුන් බොහෝ දෙනෙක් ඉතාමත් නරක විධියට කථා කළා. මේක හොඳ නැති දෙයක්. ඡන්දයක් තියන්න ඕනෑ කියලා. ඔව් ඡන්දයක් තියන්න ඕනෑ. ඒක ප්‍රජාතන්ත්‍රවාදීව තියන්න ඕනෑ. නමුත් සමහර පළාත් පාලන ආයතන තිබෙනවා ඡන්දය තිබුණු කාලෙට වැඩිය හොඳට පළාත් පාලන ආයතන කරගෙන යනවා. ඒ වාගේම සමහර ගරු මන්ත්‍රීවරු කිව්වා වාගේ දූෂණය, ඒකාධිපතිවාදය, කොමසාරිස් ධූරයෙන් ආරූඪ වුණු අයත් යම් යම් තැන්වල ඉන්නවා. ඒ නිසා මේ පාලනය තුළ ඇත්ත වශයෙන්ම මහජනතාව නියෝජනය කළ යුතුයි. නමුත් ඒ මහජනතාව නියෝජනය කරන්නේ නැති කාලයේ වුණත්, මේ කාලය තුළ වුණත් ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ මහ පෙන්වීම යටතේ ඒ කොමසාරිවරුන් විශේෂයෙන්ම පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ සහ අපේ පළාත් සභාවේ ගරුත්වය ආරක්ෂා වන විධියට වැඩ කරනවා කියන එක මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න ඕනෑ. එහෙම නැත්නම් අපි කරන්නේ ලොකු වැරැද්දක්. මොකද, හැම දෙයක් විවේචනය කරන එක විතරක් නොවෙයි ගරු සභාපතිතුමනි, අපේ වැඩේ. අපි ඇත්ත ඇත්ත විධියට කථා කරන්න ඕනෑ. පළාත් පාලන ආයතන එහෙමයි.

ඊළඟට කථා කරන්න ඕනෑ සෘජු ප්‍රදාන ගැන. අනෙක් මන්ත්‍රීවරු කථා කළා වාගේ අපි පළාත් සභා මන්ත්‍රීවරු වශයෙන් සෘජු ප්‍රදාන දුන්නා. 2015 දෙන කොටත් සෘජු ප්‍රදාන දුන්නේ, ශත පහක්වත් අය කර ගන්නේ නැතුව. මාළු විකුණන මනුස්සයාට බයිසිකලේ අරගෙන දුන්නා. ඔළුවේ පෙට්ටිය තියාගෙන යනවා නම් බයිසිකලයේ තියාගෙන ගිහිල්ලා විකුණන්න. නමුත් අද බයිසිකලයක් රුපියල් 14,000 ක් නම් ඒ මාළු විකුණන අහිංසක මනුස්සයාගෙන් රුපියල් 7000 ක් ගන්න සිද්ධ වෙලා තිබෙනවා. මේක ඉතාම වැරැදි සහගත වැඩක්. මේක කාලෝචිත වැඩක් නොවෙයි. අපි දුගී ජනතාව යම්කිසි ස්ථානයකට ගෙන එන්න ඕනෑ නම්, ඔය කියන විධියට පළාත් සභාව, පාර්ලිමේන්තුව අපි කථා කරන්නේ දුගීකම නැති කරන්න නම්, අපි ඒ අයට ඇති හැකි අය විධියට ජීවත් වෙන්න යම්කිසි විධියක් හොයලා දෙනවා නම්, අපි ඒ අයව යම්කිසි ස්ථාවරයකට ගේන්න ඕනෑ. ඒ නිසා අපි මැෂින් එකක් නැති මහන්න පුළුවන් ගැහැණු කෙනෙකුට මැෂින් එක නොමිලේ ලබා දෙනවා මිසක් මැෂින් එකට දෙකෙන් පංගුවක් දෙන්න කියනවා නම්, එයා ඔය රස්සාව කරන්නේ නැහැ. එයා සල්ලි ටික තියාගෙන වෙන මොනවා හරි කරනවා. ඒ නිසා මේ පළාත් සභාව තුළ 2016 දැනට මගේ සල්ලි රුපියල් ලක්ෂ 6 ක් ඉතුරු වෙලා තිබෙනවා. සෘජු ප්‍රදාන. ඇයි ජනතාවට දෙකෙන් පංගුවක් ගෙවා ගන්න විධියක් නැහැ. අපි නම් දාපු ජනතාව කියනවා 50% ක් ගෙවන්න විධියක් නැහැයි කියලා. දැන් ලක්ෂ 6 ක් තවම ඉතුරුයි. මම ඊයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගිහිල්ලා තව ක්‍රමවේදයක් හැදුවා. අපි ස්වයං රැකියා ලාභීන් ගෙන්නලා මේ ගැන පැහැදිලි කරලා 50% ක් ගෙවලා මේ අවුරුද්දේ මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්න සහයෝගය දෙන්න කියලා මුළු ආසනයම දැනුවත් කරලා. 50% ක් සෘජු ප්‍රදාන ලෙස ගෙවලා. ගරු සභාපතිතුමනි, ත්‍රිකුණාමලයේ පැවති රැස්වීම වෙලාවේ අපට යම්කිසි ලියවිල්ලක් දාලා තිබුණා. ඒකෙත් තිබෙනවා සෘජු ප්‍රදාන දෙන කොට යම් යම් සෘජු ප්‍රදානවලට සියයට ගණනක් ගෙවන්න ඕනෑ කියලා. 30% කියනවා. 20% කියනවා. අවුරුදු හතරක් ඇතුළත ඒ ආයතනය ආපහු බඩු අරගෙන තිබෙන්න බැහැ. 50% ක් තියෙනවා. මේවාත් එක්ක අපට ගමේ වැඩ කරන්න හම්බ වෙන්නේ නැහැ. නමුත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට මේවා මුකුත් නැහැ. පාර්ලිමේන්තු ගිණුම් කාරක සභාවෙන් ගෙනාවා කියන යෝජනාව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ක්‍රියාත්මක වෙන්නේ නැහැ. බස්නාහිර පළාත් සභාවේ විතරයි මේවා තියෙන්නේ. ගරු සභාපතිතුමනි, ඒ නිසා -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

හරි දෙනවා.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

හරි, පුටු දෙනවා නේ? හරි, පුටු දෙන කොට එහෙම නිර්ණායකයක් නැහැ නේ? ගරු සභාපතිතුමනි,

පාර්ලිමේන්තුවේ විතරක් නොවෙයි. එක ග්‍රාම සේවක කොට්ඨාශයකට ආර්ථික කටයුතු අමත්‍යාංශයෙන් ලක්ෂ පහ, පහ දුන්නා. ඒකේ අපි ස්වයං රැකියා ලක්ෂ 1 ½ දැම්මා. ශත පහක්වත් ගෙවන්නේ නැතුව ඔය ඕනෑතරම් දෙන්නේ. සංවර්ධන නිලධාරී අත්සන් කළාම ස්වයං රැකියාලාභියාට නොමිලේ මැෂින් එක හම්බ වෙනවා. ඇයි? මේ පළාත් සභාවට විතරක් නීතිරීති. ඒ නිසා මම ඉල්ලා සිටිනවා. මේ නීතිරීති ලිහිල්ලා කරලා අපට ලබන අවුරුද්දේවත් මහජනතාවට වැඩක් කරන්න පුළුවන් විධියට කටයුතු කරලා දෙන්නය කියලා.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, අධ්‍යාපනය. අධ්‍යාපනය ගැන කථා කරන කොට අපි ළඟම පාසල - හොඳ පාසල ව්‍යාපෘතිය ගැන එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරු කථා කළා. ළඟම පාසල - හොඳ පාසල කියන්නේ, හොඳ ව්‍යාපෘතියක්. ව්‍යුහ කමිටුවේ ඉන්න නියෝජිතයෝ විධියට අපි සහභාගී වන නිසා දන්නවා. කැලණි කලාපය බැලුවොත් හැම පාසලකටම මොනවා හරි මුදලක් වෙන් කරලා තිබෙනවා. සමහර පාසල්වලට ලක්ෂ 20 දීලා තිබෙනවා. සමහර ඒවාට ලක්ෂ 50 දීලා තිබෙනවා. මොකක් හරි ක්‍රියාත්මක කරනවා. සමහර පාසල් අවුරුදු 05 සැලැස්මකට තෝරාගෙන. අර දුන්නා කියපු රුපියල් මිලියන 7000 ක්‍රියාත්මක වෙන්නේ අවුරුදු 05 තුළ. මේ අවුරුද්ද තුළ නොවෙයි.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

නැහැ, නැහැ. වැරදියි. මේ අවුරුද්දේ දෙසැම්බර් 31 වනකොට තමයි රුපියල් මිලියන 7000 වෙන් කරනවා කියලා පොරොන්දු වෙලා තිබෙන්නේ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඒ වුණාට ඒක දිගටම යන්න පුළුවන්.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

ඒක දිගටම යන්න පුළුවන් ව්‍යාපෘතියක්. මම මේ යහපාලනයට හුණු ගානවා නොවෙයි. වෙන දේවල් ගැන කථා කරන්න ඕනෑ. ඒ කියන්නේ අධ්‍යාපනයන පැත්තෙන් යම්කිසි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙනවා. නැත්තේ නැහැ. අපට ප්‍රතිපාදන ලැබෙනවා. අපේ පාසල්වල අධ්‍යාපනය දියුණු වෙනවා. එහෙම නැත්තේ නැහැ. අර කිව්වා වාගේ 5 වසර පාස් වුණාට පස්සේ - ප්‍රාථමික පාසලේ උගන්වලා, උගන්වලා 5 වසර ශිෂ්‍යත්වය පාස් වුණාට පස්සේ, ඒ ඉස්කෝලේ එක ළමයෙක් ද්විතියික පාසලකට යන්නේ නැහැ. ඒ අය ඉහළ පාසල්වලට යනවා. එතකොට මොනවා දුන්නත් වැඩක් නැහැ. අපි පළාත් සභාව තුළින් පාසල් දෙකක් තුනක් එක ගමක, එක ආසනයක හදන්න ඕනෑ. ඒ නිසා අධ්‍යාපනය පැත්තෙන් අපට උපරිම මුදල් ලැබිලා තිබෙනවා. ඒකෙන් උපරිම ප්‍රයෝජන ගන්න අපි දැනගන්න ඕනෑ.

එතකොට අපේ ලලිත් වනිගරත්න ගරු ඇමැතිතුමාගේ අමාත්‍යාංශය. එක මන්ත්‍රීවරයෙක් කිව්වා එතුමා අදක්ෂයි කියලා. කවුද එහෙම කියන්නේ? නිමල් ලාන්සා ඇමැතිතුමා ඉන්න කොට ආර්ථික කටයුතු අමාත්‍යාංශයෙන් ඇති තරම් මුදල් දුන්නා. වැඩ කරන්න කෝටි ගණන් සල්ලි දුන්නා. තමුන්නාන්සේලා දන්නේ නැතුව ඇති 2017 ට රුපියල් මිලියන 300 යි හම්බ වෙන්නේ. හරියට කළොත් පාරවල් දෙකයි කරන්න පුළුවන්. ඒ කාලේ කරපු විධියට කෙරුවොත්. කරන්න බැහැ. සල්ලි දීලා නැහැ. ඉතින් එතුමා මොනවා කරන්නද? ඒ නිසා මම ඉල්ලා සිටිනවා ගරු සභාපතිතුමනි, එහෙම කථා කරන්න එපා. පක්ෂ විපක්ෂ ඕනෑම කෙනෙක්ට ගිහිල්ලා මේ ඇමැතිවරු ඕනෑම කෙනෙක් එක්ක කථා කරලා වැඩක් කර ගන්න පුළුවන්. ඒ නිසා අපි සියලු දෙනාම අද පක්ෂ භේදයකින් තොරව - මට හොඳටම පේනවා. විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂයේ අය පක්ෂ භේදයෙන් තොරව ඔක්කෝටම ඡන්දය දෙනවා. ඒ ඡන්දය දෙන්න හේතුව මේ යන වැඩ පිළිවෙළ හොඳ නිසා. මේ යන ක්‍රමය හොඳ නිසා නේ? එහෙම නැත්නම් ගියවර බෙදුණා. ඇමැතිවරුන්ව අයින් කළා. විශ්වාසභංග යෝජනා ගෙනාවා. මොන තරම් කලබල කෙරුවාද? මේක හොඳයි. අපේ මහ මාර්ග, සමූපකාර ඇමැතිතුමා එතුමාගේ වැඩ රාජකාරී හරියට කරනවා. යම් යම් නිලධාරීන් ඉන්නවා. ඇත්ත. ඒ නිලධාරීන්ට එතුමා හෙට අනිද්දා බෙහෙත දෙයි. එතුමා පත් වෙලා තවම මාස කීයද? අවුරුද්දක්වත් නැහැ නේ?

එතකොට අපේ සෞඛ්‍ය ඇමැතිතුමා. එතුමා හරියට වැඩ කරගෙන යනවා. එතුමා හෙට අනිද්දාට බෝ නොවන

[ගරු ජානක සූරියබණ්ඩාර]

රෝග බලකායක් හදනවා. බෝ නොවන රෝග නැති කරන්න බස්නාහිර පළාත තුළ බලකායක් හදනවා. ගෙයින් ගෙට ගිහිල්ලා, පාරට කුණු දාන්න එපා. උඹලා මේවා කැවොත් මෙහෙම වෙනවා. වස විෂ කන්න එපා. මදුරුවෝ ඇති කරන්න එපා. මදුරුවේ බෝ වන තැන් විනාශ කරන්න. මේ ඔක්කෝම උපදෙස් දෙනවා. මේවා ඔක්කෝම ක්‍රියාත්මක කරනවා. හැබැයි මේවා ක්‍රියාත්මක නොකර, ලබන අවුරුද්දේ නම් අපි මේ පළාත් සභාවේ අයවැය ගැන කථා කරන්නේ නැහැ. මේ දේවල් ක්‍රියාත්මක වෙන්න ඕනෑ. ශ්‍රම බලකාය හදනවා කිව්වා. පාසල් සංවර්ධනය කරලා අංග සම්පූර්ණ කරනවා කිව්වා. අපේ ලලිත් වනිගරත්න ඇමැතිතුමා කිව්වා සමූපකාරයේ ඉන්න හොරු ටික එළවලා සමූපකාරය හොඳ තැනකට ගෙනැල්ලා ග්‍රාම සංවර්ධන සමිති පිහිටුවලා, ග්‍රාම සංවර්ධනය හොඳ තැනකට ගෙනැල්ලා මේවා දියුණු කරනවා කිව්වා. ඒවා එහෙම කරන්න ඕනෑ. එහෙම නොකර හරි යන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතකොට අධ්‍යාපන ඇමැතිතුමා ගැන ඔබතුමා මොනවාද කරන්නේ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

අධ්‍යාපන ඇමැතිතුමාට සේවකයෝ දාන්න විධියක් නැහැ. එතුමාගේ දිස්ත්‍රික්කයේ වැඩ කරන්නේ මිනුවන්ගොඩ කට්ටිය. ඒකයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අධ්‍යාපන ඇමැතිතුමාත් මේ සභාවේ ඉන්නවා නේ? එතුමා ගැනත් මොනවා හරි කියන්න.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

මුලින්ම කථා කළේ ඒ ගැන නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කිව්වාද? ආ ... හරි, හරි.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

කිව්වා. කිව්වා. එතුමාට කිව්වා. ළමයින් ඉස්කෝලේ දාන්නත් අපට කීයක් හරි වැඩියෙන් දෙන්න කියලා. අපේ කෘෂිකර්ම ඇමැතිතුමා -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

දැන් ඉතුරු වෙලා ඉන්නේ ගාමිණී තිලකසිරි ගරු ඇමැතිතුමා විතරයි.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

ගරු සභාපතිතුමනි, අපට කථා කරන්න වෙලාව තියෙනවා නේ? අපි කථා කරන්නේ පළාත් සභාව ගැන මිසක් අපට පාර්ලිමේන්තුව ගැන කථා කරන්න ඕනෑ නැහැ. අපි බඩු මිල අඩු කරන්න කිව්වාට පාර්ලිමේන්තුව අඩු කරයිද? අපි Tax අඩු කරන්න කිව්වාට අඩු කරයිද? අපට එහෙම උවමනාවක් නැහැ. අපි මේ පළාත් සභාව ගැන කථා කරමු. අපි ගිය අවුරුද්දේ ක්‍රියාත්මක කරපු කීයක් මේ අවුරුද්දේ ක්‍රියාත්මක වෙලා තිබෙනවාද? සමහර ඒවා ක්‍රියාත්මක වෙලා නැහැ. ඔය කෘෂිකර්ම අමාත්‍යාංශයට අපි කියලා තියෙනවා වගා කරන්න බැරි - මගේ ප්‍රදේශයේ තියෙනවා කුඹුරු අක්කර 200 ක්, 300 ක්, වගා කරන්න බැරුව අවුරුදු ගණන් පුරන් වුණු ඒවා. දැන් ඒවා ඔක්කෝම වල් වැදිලා. මම කිව්වා, මේවාට වෙනත් බෝග. සුළු බෝග. ඒ කියන්නේ එළවළු වගා කරන්නය කියලා. ගරු සභාපතිතුමනි, ඉතින් මම කියන්නේ, කෘෂිකර්ම ඇමැතිතුමාට පුළුවන් මේ අවුරුද්දේ කෘෂිකර්මය කරනවා නම්, වී වගා කරන්න බැරි කුඹුරු තියෙනවා නම්, ඒවායේ වෙනත් බෝග වගා කරන ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්න. වෙනත් බෝග. වී නැතුව. ඒ වාගේම තමයි සත්ව නිෂ්පාදනය. කුකුල් ෆාම් කරන්න. ඒ වාගේම නොයෙකුත් බෝග. මල් වගාව. එහෙම නැත්නම් වෙනත් කෘෂි නිෂ්පාදන. ඒ සියලු දෙයක්ම කරගන්න පුළුවන්. ඒ නිසා ගරු සභාපතිතුමනි, (බාධා කිරීමක්) මේ අය කොහොමත් අවහිර කරනවා. මාව අන්තිම වෙනකල් තියාගත්තේ අවහිර කරන්න තමයි. ගරු සභාපතිතුමනි, මේ මහ ඇමැතිතුමා ප්‍රමුඛ ඇමැතිවරු හතර දෙනාම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කාලය අවසන්. විනාඩියක් දෙන්නම් මං ගැනත් පොඩ්ඩක් කියලා කථාව අවසන් කරන්න.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

ගරු සභාපතිතුමනි, පොඩ්ඩක් ඉන්න. ගරු ප්‍රධාන ඇමැතිතුමා ඇතුළු ඇමැතිවරු හතර දෙනාම මේ මුළු සභාවටම, යහපාලනයට විතරක් නොවෙයි. අපට වැඩිය ඒකාබද්ධ විපක්ෂයට හොඳයි. ගරු සභාපතිතුමා අද බොහොම ලස්සනට ඉන්නවා. ඉස්කෝප්ප ආසියා වාගේ. ඒ වාගේම තමයි ආපු වෙලාවේ ඉඳලා සංවිධායකතුමා මගේ නම කපලා තිබුණේ. මම බලෙන් තමයි නම දාගත්තේ. එතුමාටත් මම ස්තූතිවන්ත වෙනවා මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මා ගැන වර්ණනා කරන්නේ නැහැ. මගෙන් මුකුත් ගන්න දෙයක් නැහැ නේ? කමක් නැහැ. කීර්ති කාරියවසම් ගරු මන්ත්‍රීතුමාට විනාඩි 08 ක කාලයක් තිබෙනවා.

[අ.භා. 03.30]

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

ගරු සභාපතිතුමනි, 6 වැනි පළාත් සභාවේ 2017 වර්ෂයේ අයවැය සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරන්න අපට අවස්ථාවක් ලැබීම පිළිබඳව මුලින්ම සතුටු වෙනවා. ඒ වාගේම ස්තූතිවන්ත වෙනවා. විශේෂයෙන්ම මේ පළාත් සභාවේ අයවැය විවාදය ආරම්භ කරන කොට මම විශ්වාස කරනවා, මධ්‍යම ආණ්ඩුවේ අයවැය ලේඛනය කොහොමද? මධ්‍යම ආණ්ඩුව කටයුතු කරන්නේ කොහොමද? කියන කාරණාව අපට සෘජුවම බලපාන නිසා, ඒ පිළිබඳ කරුණු කෙරෙහිත් සැලකිලිමත් වෙලා අපේ අයවැය විවාදය අපි සාකච්ඡා කරන්න ඕනෑ කියලා. මොකද, අද විවේචනය තදින්ම එල්ල වුණා. අයවැයේදී අපි යහපාලනයේ නැතය. මේ පළාත් සභාවේ යහපාලන පාලන ක්‍රමයක් ඇත්තේ නැහැයි කියලා. ඒක ඇත්ත වෙන්න පුළුවන්. නමුත් පැහැදිලිව තේරුම් ගන්න ඕනෑ. මේ සභාව තුළ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ පාලනයක් තමයි තියෙන්නේ. පාලනය තිබෙන්නේ, එක්සත් ජනතා නිදහස් සන්ධානය පැත්තේ. එසේ නම් ගරු සභාපතිතුමනි, එක්සත් ජනතා නිදහස් සන්ධානය ගොඩනැඟිලා තියෙන්නේ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මුල් කර ගත්තු පක්ෂය හැටියට. අද මේ රට පාලනය කරන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත්, එක්සත් ජාතික පක්ෂයත් යන පක්ෂ දෙකම එකට එකතු වුණු ආණ්ඩුවක් හැටියට. එහෙම නම් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, එක්සත් ජනතා නිදහස් සන්ධානයේ පක්ෂයක් හැටියට ඉදිමින් ඒ වාගේම ආණ්ඩුවේ කොටස්කාර පක්ෂක් හැටියට කටයුතු කරනවා නම්, අයවැය ලේඛනයේ හොඳ සහ නරක සියල්ලේම වගකීම මේ දෙපැත්තම එක විධියට දරා ගැනීමේ වගකීම තිබෙනවා කියන එක විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. මේක අමතක කරලා පිපෙන්න යන පොහොට්ටුවක් ගැන විශ්වාසය තියලා විවේචනය විතරක් ඉදිරිපත් කිරීම සාධාරණ වෙන්නේ නැහැයි කියන කාරණාව මතක් කරන්න වෙනවා. (බාධා කිරීම්) මට ඉඩ දෙන්න. මම කාටවත් බාධා කළේ නැහැ. ඒක නිසා අපි දන්න තරමට මේ අයවැය ලේඛනය සකස් කරන කොට - එක්සත් ජාතික පක්ෂය, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඇතුළුව කැබිනට් එකේ ඉන්න තවත් පක්ෂ තියෙනවා. මේ පක්ෂ සියල්ලෙන්ම සැදුම්ලත් කාරක සභාවක් හැටියට රැස් වෙලා අයවැය ලේඛනයේ සකස් වෙන්න ඕනෑ මූලික කරුණු මොනවාද කියන එක පිළිබඳව එකඟතාවයක් ඇතුව සකස් කළා. එකඟතාවයක් ඇතුව සකස් කළා විතරක් නොවෙයි. අයවැය ලේඛනයට පස්සේ ජනාධිපතිතුමා මන්ත්‍රීවරු අමතන අවස්ථාවේදී කිව්වා, මේක මේ ආණ්ඩුවේ මුදල් ඇමැතිවරයා අයවැය ලේඛනය ප්‍රකාශ කළා විතරයි. මේකේ වගකීම අපි දෙගොල්ලෝම සියලු දෙනාම දරා ගන්න ලැහැස්තියි කියන කාරණාව බොහොම පැහැදිලිව කිව්වා. එහෙම නම් මේකේ වගකීම අපි කවුරුත් එක සමානව අරගෙන කටයුතු කරන්න ඕනෑ කියන කාරණාව තමයි අපට විශේෂයෙන්ම මතක් කරන්න වෙන්නේ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

අපි නැහැ.

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

අපි නැහැයි කියන්න බැහැ. මම දන්නේ නැහැ. මේ සන්ධානයේ ඉන්න පක්ෂ. ඒක නිසා -

[සභාවේ ඝෝෂා]

[ගරු කීර්ති කාර්යවසම්]

කාටත් මොකක් හරි පක්ෂයක් තියෙන්න ඕනෑ. ඔබතුමන්ලාට එක වෙලාවකට යහපාලනය නැහැ. එක වෙලාවක සන්ධානය නැහැයි කියන්න බැහැ. මොකක් හරි පක්ෂයක් තියෙන්න ඕනෑ. ඒ නිසා ඒක පිළිගන්න. ඒ වාගේම මේ අයවැය ලේඛනය පිළිබඳව අපි කථා කරන කොට අපි තේරුම් ගන්න ඕනෑ, ආණ්ඩුව කොහොමද ක්‍රියා කරන්නේ? ඒ වාගේම අපි ආණ්ඩුව ක්‍රියා කරන ආකාරය සහ අද ජාත්‍යන්තර දේශපාලන තත්ත්වය, ජාත්‍යන්තර ආර්ථික තත්ත්වයන් සියල්ල කල්පනාවට අරගෙන අපි කටයුතු කරන්න ඕනෑ කියන එකයි අපි විශ්වාස කරන්නේ. මොකද, මේ රටේ ජාතික අයවැයේ, ජාතික ආර්ථිකයේ 44% ක වගකීම තිබෙන්නේ බස්නාහිර පළාතට. එලෙස 44% ක වගකීමක් තිබෙන බස්නාහිර පළාත් සභාව මේ ජාතික ආර්ථිකයේ විශාලම, වැදගත්ම කොටස්කාරයා වෙනවා. එහෙම වැදගත්ම කොටස්කාරයා වෙනවා නම්, අපි ඒ වැදගත්කම, ඒ වගකීම දරාගෙන කටයුතු කිරීම වැදගත් වෙනවා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු සභාපතිතුමනි, අපට බනිනවා. අපි පොහොට්ටුවට හිතවත් එක ඇත්ත. අපට බනිනවා එක තැනක නැහැයි කියලා. එතුමා පළාත් සභාවට සම සමාජ පක්ෂයෙන් ඉල්ලලා මෙතැනට ඇවිල්ලා, මහ ඡන්දයේදී අලියාගෙන් ඉල්ලුවා. එතුමාත් එක තැනක නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බාධා කිරීමක් කරන්න එපා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

අපට මොකටද එහෙම කියන්නේ? එතුමා ඉන්නේ කොහේද?

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

ඒක නිසා අද අමතක කරන්න නරකයි අපි ඉන්දිය කලාපයේ ජීවත් වන රටවල්. ආසියාවේ ජීවත් වන රටවල්. අද ලෝක ආර්ථිකයේ 20% ක බල හිමිකාරීත්වය තිබෙන්නේ මේ ආසියාවටයි. ආසියාවේ 8% ක ආර්ථික වේගයක් පවත්වාගෙන යමින් දියුණු වන රටවල් තිබෙනවා. චීනය, ඉන්දියාව වැනි රටවල්. ඒ අසලම තිබෙන රටක් හැටියටයි අපි, ලංකාව කටයුතු කරන්නේ. එහෙම නම් මේ ආසියාවේ නැඟීගෙන එන ආර්ථිකයේ අවස්ථාව අපට ලබාගන්න අවශ්‍ය වෙනවා. ඒ අවස්ථාව ලබා ගැනීමේ ඉතාම කිට්ටු ඉඩකඩ තිබෙන්නේ අපටයි. ඒ අවස්ථාවේ අපි 44% ක මේ රටේ ආර්ථිකයේ කොටස්කාරයෝ හැටියට, ඒක අමතක කරලා කටයුතු කරන්න යනවා නම්, ඒක අපි වැරැදි විධියට තේරුම් අරගෙන කටයුතු කිරීමක් වෙනවා කියලා මම හිතනවා. ඒ නිසා අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමා, අපේ අමාත්‍ය මණ්ඩලය ඒ වාගේම ප්‍රතිපත්ති තීන්දු ගන්න නිලධාරීන් කවුරුත් මේ වෙනස්කම් එක්ක, මේ ආර්ථික ප්‍රවනතාවයනුත් එක්ක කල්පනාවට අරගෙන වැඩ කරන්න ඕනෑය කියන එකයි අපි මේ අවස්ථාවේ විශේෂයෙන්ම සිහිපත් කරන්නේ.

අපි විශ්වාස කරනවා අපේ මහ ඇමැතිතුමාව. එතුමා තරුණ මහ ඇමැතිවරයෙක්. දක්ෂ මහ ඇමැතිවරයෙක්. එතුමා මහ පොළොවේ ජීවත් වන මහ ඇමැතිවරයෙක් හැටියට මේ යථාර්ථය තේරුම් අරගෙන කටයුතු කරන්න එතුමා නායකත්වය දේවිය කියන එක අපි විශ්වාස කරනවා. විශේෂයෙන්ම අපි ආණ්ඩුවක් හදලා තවම අවුරුද්දයි මාස තුනයි ගත වෙලා තියෙන්නේ. ප්‍රජාතන්ත්‍රවාදය අගය කරන රටක, ඒක පිළිගන්න රටක, පිළිගත්තු සම්ප්‍රදාය තමයි ආණ්ඩුවක් හදලා මාස තුනක් යනකොට ඒ ආණ්ඩුව පෙරළන්න කටයුතු කරන්න කවුරුත් ඉදිරිපත් වෙන්නේ නැහැ. ඒක ප්‍රාජාතන්ත්‍රවාදයේ මූලික අංගෝපාංග නොවෙයි. ඒක නොතේරුණු අය ඒ විධියට කටයුතු කරනවා වෙන්න පුළුවන්. ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය තුළ අපට විවේචනයට ඉඩකඩක් තිබෙනවා. නමුත් අපට කල් දෙන්න බැහැ. අවුරුද්ද අන්තිමට අපි ආණ්ඩුව පෙරළා අලුත් ආණ්ඩුව හදනවා. මහජන වරමක් නැති වුණත්, අපට ආණ්ඩුව හදන්න අපි මන්ත්‍රීවරුන්ව ගන්න හැටි දන්නවා කියාල ආණ්ඩු පෙරළන එක ප්‍රජාතන්ත්‍රවාදය ගරු කරන උදවිය කටයුතු කරන්න ඕනෑ ආකාරයක් නොවෙයි කියන එක විශ්වාස කරන්න ඕනෑ. ආණ්ඩුවක් විවේචනය කරන්න කාලය වැඩියි. අපි අවුරුද්දක්, දෙකක්, තුනක් ඉඩ දෙන්න ඕනෑ. මොකක්ද මේ ප්‍රතිපත්තිය? කොතැනටද මේ රට අරගෙන යන්නේ? මහජනතාව ඉඩ දීලා තිබෙනවා. ඒ ඉඩ දීලා තිබෙන තැනට මේ රටට කටයුතු කරන්න ඒ අවස්ථාව සලසන්න ඕනෑ. ඒ අවස්ථාව සලසන්නේ නැතුව අපි මොකද වෙන්නේ කියලාවත් බලන්නේ නැතුව පටන් ගත්තු තැන ඉඳලාම මේක වැරැදියි, වැරැදියි කියලා කටයුතු

කරන්න ගියොත් මම හිතන්නේ ගරු සභාපතිතුමනි, අපට රටක් හැටියට ඉදිරියට යන්න පුළුවන්කම ඇති වෙන්නේ නැහැයි කියන එකයි අපි විශ්වාස කරන්නේ. ඒක නිසා මේක බරපතළ විධියට කල්පනා කිරීමක්. මේ බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරු හැටියට අපේ යුතුකම, වගකීම වෙනවා කියන එකයි අපි විශේෂයෙන්ම විශ්වාස කරන්නේ.

අපි දන්නවා අද අපට ප්‍රශ්නයක් තිබෙනවා. අපේ මුදල් කපලා කියලා අපට චෝදනාව තියෙනවා. පළාත් සභාව හැටියට අපට මේවා පිළිබඳව යම් නීත්‍යානුකූල තත්ත්වයක්, එහෙම නැත්නම් මේවා මෙහෙම කරන්න බැරි වන තත්ත්වයක් ඇති කරගන්න කටයුතු කරන්න අවශ්‍ය වෙනවා. විශේෂයෙන්ම අද අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් එන්න හදනවා. පළාත් සභාව ගොඩනැඟී තිබෙන්නේ ව්‍යාවස්ථාව පදනම් කරගෙනයි. එහෙම නම් අපි හැදෙන්න යන ව්‍යාවස්ථාව තුළ කොහොමද අපි පළාත් සභාවේ බලය ශක්තිමත් කරන්නේ? පළාත් සභාවට යම් යම් කටයුතුවලදී ස්වාධීනව ක්‍රියා කරන්න තිබෙන ඉඩකඩ සකස් කර ගන්න අපි ඉදිරිපත් වෙන්න ඕනෑ කියන එකයි අපි විශ්වාස කරන්නේ. අද අපට ඒ නිදහස ඇත්තේ නැහැ. ජනාධිපතිතුමාවත් අඩු වශයෙන් මහ ආණ්ඩුවේ කටයුතුවලට ඇඟිලි ගහනවාට වැඩිය අපව පාලනය කරන්න ආණ්ඩුකාරවරයා සූදානම් වෙනවා ජනාධිපතිවරයාගේ නියෝජිතයා හැටියට. ඒකට ඉඩ තියන්න පුළුවන්කමක් ඇත්තේ නැහැ. ප්‍රජාතන්ත්‍රවාදය අගයන අපි, මහජන නියෝජිතයින් හැටියට පත් වුණු අපි එවැනි නිලධාරීන් හරහා මේ පළාත් සභාවේ වැඩ කටයුතු සීමා කරන්න ගන්න උත්සාහය වෙනස් කරන්න අපි පැහැදිලිව ආණ්ඩුකාරවරයාට තිබෙන බලතල පිළිබඳව වෙනසක් ඇති කරන්න අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ යෝජනා ඉදිරිපත් කරන්න ඕනෑ. ඒ වෙනුවෙන් පෙනී ඉන්න ඕනෑ කියලා අපි කල්පනා කරනවා.

ඒ වාගේම පළාත් සභාවට තිබෙන බලතල තවත් වැඩි වෙන්න ඕනෑ කියලා අපි විශ්වාස කරනවා. මුදල් කොමිෂන් සභාව සකස් කරලා තිබෙන්නේ භාණ්ඩාගාරයේ නිලධාරීන්ගෙන් සහ මුදල් අමාත්‍යාංශයේ නිලධාරීන්ගෙන්. ඒවා ස්වාධීන ආයතන බවට පත් වෙන්න ඕනෑ. ස්වාධීන බුද්ධිමතුන් ඒවාට පත් වෙලා, වඩා සාධාරණ ක්‍රමයකට පළාත් සභාවල් පවත්වාගෙන යන්න ඒවාට මුදල් වෙන් කරන්නේ කොහොමද කියන එක ස්වාධීනව කටයුතු කරන්න පුළුවන් ඉඩකඩක් සකස් වෙන්න ඕනෑය කියලා අපි විශ්වාස කරනවා. එහෙම කළොත් තමයි අපට නැවත ඒ තත්ත්වය ඇති කර ගන්න පුළුවන් වෙන්නේ. අපේ තිබුණු බලය ආපහු අරගෙන තිබෙනවා. අපේ තිබුණු ගොවිජන සේවා එක ආපහු ගත්තා. සුප්‍රීම් උසාවිය කිව්වා, නැහැ, ඒක වැරැදියි. ආපහු ලැබෙන්න ඕනෑ කියලා. කොයිම ආණ්ඩුවකවත් ඒක ආපහු දෙන්න කටයුතු කරලා නැහැ. අපි ඒ වැරැදි නිවැරැදි කර ගන්න අඩු ගණනේ අලුතෙන් හැදෙන්න යන ව්‍යවස්ථාව තුළවත් ඒ ඉඩකඩ නිර්මාණය කර ගන්න මේ පළාත් සභාව කටයුතු කරාවිය කියලා අපි විශ්වාස කරනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

පොලිස්, ඉඩම් ඕනෑද?

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

පොලිස් බලතලත් දුන්නාට කිසිම වැරැද්දක් වෙන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සමාවෙන්න. ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

මම විශ්වාස කරනවා පසුගිය කාලය තුළ මධ්‍යම ආණ්ඩුවට පොලීසිය තිබුණා කියලා පොලීසියෙන් සියලු සාධාරණකම් ඇති වෙලා නැහැ. මම විශ්වාස කරනවා, අපේ ඉසුර දේවප්‍රිය ගරු ප්‍රධාන ඇමැතිතුමා යටතේ පොලීසිය තිබුණාට ඔයිට වැඩිය සාධාරණයක් ඉෂ්ට කරන්න තිබුණායි කියලා. මොකද, පසුගිය කාලය තුළ පොලීසිය ක්‍රියා කරලා තිබෙන ආකාරය මධ්‍යම ආණ්ඩුව යටතේ තිබුණා කියලා පොලීසියෙන් සාධාරණයක් වුණා නම්, එක්නැලිගොඩලාට, ලසන්ත වික්‍රමසිංහලාට එහෙම වෙන්න ඉඩකඩක් ඇත්තේ නැහැයි කියන එක අපි පැහැදිලිව කියන්න ඕනෑ. ඒ අයට ඒ දේවල් සිද්ධ වුණේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා කථාව අවසන් කරන්න.

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

ඒ ඉඩකඩ තුළ එවැනි නිදහස තිබුණු නිසයි. ඒ ඉඩකඩ නැවත -

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

ඇයි බටලන්ද? බටලන්ද කොහොමද ඇති වුණේ?

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

මේ කාලපරිච්ඡේදය තුළ මේ රටේ වෙනසක් ඇති කරන්න, මේ රටේ සමාජ ක්‍රමයේ වෙනසක් ඇති කරන්න, මේ රටේ විධායක බලයේ වෙනසක් ඇති කරන්න, මේ රටේ සාධාරණත්වයේ වෙනසක් ඇති කරන්න, මේ රටේ මිනිස්සුන්ට ජීවත් වෙන්න තිබෙන නිදහස් අයිතිය ආරක්ෂා කරන්න වැඩ කටයුතු ආරම්භ වෙලා තිබෙනවා. වෙනසක් ආරම්භ වෙලා තිබෙනවා. අපි දන්නවා ඇමරිකාවේ කළු මිනිස්සුන්ට, වහල්ලුන්ට නිදහස දෙන කොට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ කාලය අවසන්. කරුණාකරලා කථාව අවසන් කරන්න.

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

ඒ වහල්ලු තේරුම් ගත්තේ නැහැ අපි නිදහස් වෙලා තිබෙනවා කියලා. මම මතක් කරනවා මේ සභාවේ මන්ත්‍රීවරුන් සහ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කාලයේ ප්‍රශ්නයක් තිබෙනවා. ඔබතුමා කථාව අවසන් කරන්න. කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

බෙහෙවින් ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඉතාමත්ම ගෞරවයෙන් ගරු මන්ත්‍රීතුමන්ලාට දැනුම් දෙනවා. දෙපක්ෂයටම කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. කලින් කථා කරපු මන්ත්‍රීවරු වැඩිපුර විනාඩි දෙක තුනක කාලය අරගෙන කථා කරලා තිබෙනවා. ඒ නිසා අන්තිමට කථා කරන මන්ත්‍රීතුමන්ලාට ඒ පාඩුව වෙන්නේ. ඒ නිසා මම මූලාසනයෙන් නිවේදනය කළාට පස්සේ කථාව නවත්වන්න. ඇදගෙන යන්න එපා.

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

නැහැ, මම මිනිත්තු 08 යි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා මිනිත්තු 08 නොවෙයි, මිනිත්තු 12 ක් කථා කළා. ඒ දේ හැම මන්ත්‍රීවරයෙක්ම තේරුම් ගන්න. සිරිකමල් පිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට විනාඩි 07 ක කාලයක් තිබෙනවා.

[අ.භා. 03.43]

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු සභාපතිතුමනි, විනාඩි 10 ක් කියලා ඉස්සෙල්ලා කිව්වේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ, මෙහෙමයි මම දෙන්නම් කාලය. නමුත් -

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු සභාපතිතුමනි, හයවැනි පළාත් සභාවේ තුන්වැනි මුදල් ප්‍රකාශය කථා කරන අවස්ථාවේ වත්මන් ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ දෙවැනි මුදල් ප්‍රකාශය පිළිබඳව වචන කිහිපයක් කථා කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳව සන්තෝෂ වෙනවා. විශේෂයෙන්ම මම මේ අවස්ථාවේදී සන්තෝෂ වෙනවා, මේ සභාවේ රැඳී ඉන්න මන්ත්‍රීවරු ස්වල්ප දෙනා අතරින් ගරු ප්‍රධාන ඇමැතිතුමාව මෙහෙයවන මන්ත්‍රීවරු බහුතරයක් මේ සභාවේ රැඳී සිටීම පිළිබඳව. මොකද, අද

මේ සභාව දිහා බලන කොට, පසුගිය ගත වුණු කාලය දිහා බලන කොට එක්සත් ජාතික පක්ෂ කණ්ඩායමත්, විශේෂයෙන්ම විපක්ෂයේ ඉන්න කණ්ඩායම ගරු ප්‍රධාන ඇමැතිතුමාට සහ මේ නවක අමාත්‍ය මණ්ඩලයට ඉතාමත්ම සාධනීය සහයෝගයක් ලබා දුන්නා. ඒ ගැන මම හිතන්නේ අමාත්‍ය මණ්ඩලයත්, ප්‍රධාන ඇමැතිතුමාත් ඉතාම හොඳින් දන්නවා.

යහපාලන ආණ්ඩුව 2015 බිහි වුණාට පස්සේ, බොහොම අමාරුවෙන් එක්සත් ජාතික පක්ෂයේ ඉඳගෙන - එක්සත් ජාතික පක්ෂය ප්‍රධාන කොට ගෙන මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාව මේ රටේ ජනාධිපති කරලා, කවදාවත් අපි බලාපොරොත්තු වුණු නැති, ආයුධ විප්ලවයකින් තොරව, ලේ හැලීමකින් තොරව මේ රටේ නිහඬ විප්ලවීය වෙනසක් ඇති කරලා යහපාලන ආණ්ඩුවක් මේ රටේ නිර්මාණය කළා. ඒ යහපාලන ආණ්ඩුව නිර්මාණය කරන්න දායක නොවුණු බහුතරයකුත් අද මේ රජයට එකතු වෙලා, මධ්‍යම රජය කරගෙන යනවා. එතකොට මධ්‍යම රජය ඒ කටයුතු කරගෙන යනකොට බස්නාහිර පළාත් සභාවේත් ඒ යහපාලනය තිබෙන්න ඕනෑ කියන චේතනාවෙන් තමයි ඉසුර දේවප්‍රිය ගරු ප්‍රධාන ඇමැතිතුමාවත් ඒ අමාත්‍ය මණ්ඩලයත් මේ බස්නාහිර පළාත් සභාවේ ස්ථාපිත කෙරුවේ. හැබැයි බොහෝ තැන්වල ප්‍රධාන ඇමැතිතුමාගේ මුවින් නික්මෙන කථාවක් තමයි - ඒක කියන්න ඕනෑ. පාර්ලිමේන්තුව ඇතුළේ යහපාලනය තිබුණාට, මේ පළාත් සභාව ඇතුළේ යහපාලනය නැහැයි කියලා. ඒක එතුමා හෘදය ඇතුළෙන්ම, බොක්කෙන්ම කියන කථාවක්ද කියන එක ගැන විශාල කුකුසක් තිබෙනවා. මොකද, හේතුව අර කථාවක් තිබෙනවා බල්ලා නගුට වනන්නේ නැහැ. නගුට විසින් බල්ලා වනනවා කියලා. ඉතින් මේ සභාවේත් මට ඒක තමයි පේන්නේ. අර පොහොට්ටුවට කියලා ඉන්න නගුටේ කිහිප දෙනෙක් බහුතරයක් තිබෙනවා කියලා හිතාගෙන, මහ ඇමැතිතුමාව පාලනය කරන්න උත්සාහ කරනවා. හැබැයි මේකේ ඔළු ගෙඩි ගණනේ බැලුවාම එහෙම නැහැ. මේ එක්සත් ජාතික පක්ෂය සහ ඒ ඉන්න කණ්ඩායමත්, ඍජුවම යහපාලනයට සම්බන්ධ වෙලා ඉන්න කණ්ඩායමත් දිහා බැලුවාම බහුතරය එතැන තිබෙනවා. නමුත් අර කණ්ඩායම (බාධා කිරීමක්) පාලනය කරගෙන තමන්ගේ තිබෙන ඒ අවශ්‍යතාවයන්, මේ පළාත් සභාව ඇතුළේ මුදල්මය වශයෙන්, ප්‍රතිපාදනමය වශයෙන් ලබා ගන්නවා. හැබැයි පාර්ලිමේන්තුව ඇතුළේ ඉන්න ඒකාබද්ධ විපක්ෂයේ කණ්ඩායමට මොනවා වුණත් කොන්දක් තිබෙනවා. ඒකේ පැහැදිලිව ඉන්නවා. විරුද්ධව ඉන්නවා. විරුද්ධව කථා කරනවා. විරුද්ධව පෙනී ඉන්නවා. දූෂණ -

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

පළාත් සභාවේ විපක්ෂයට කොන්දක් නැහැ. ඒකයි වෙලා තිබෙන්නේ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

විරුද්ධව කථා කරනවා. හැබැයි ඒ අයගේ හෙංචයියෝ ටික සියලුම වරප්‍රසාද ටික අර ගන්නවා. අතක් තියාගෙන

[සභාවේ ඝෝෂා]

මොකක්ද මේකේ වෙනස? කොහෙන්ද මෙහෙයවන්නේ කියලා අපි දන්නවා. දැන් මේ අධ්‍යාපනයට සල්ලි හම්බ වෙන්නේ නැහැ. අධ්‍යාපනයේ මුදල් කපලා කියලා කථා කරනවා. මට කියන්න. ඒකාබද්ධ විපක්ෂයේ ඔය තරම් කෑගහන බන්දුල ගුණවර්ධන අධ්‍යාපන ඇමැතිවරයා හැටියට මේ පළාත් සභාවට දීපු කජ්ජක් තියෙනවාද කියලා. හිතා බලන්න. පසුගිය අවුරුදු ගණන කල්පනා කරලා බලලා ආපස්සට ගිහිල්ලා බලන්න. මේ පළාත් සභාවට දීපු සල්ලි දිහා බලන්න. අකිල විරාජ් අධ්‍යාපන ඇමැතිවරයා මේ පසුගිය අවුරුද්දේදී මේ පළාත් සභාව තුළ තිබෙන විද්‍යාල -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මහින්දෝදය විද්‍යාගාර, කැසිකිළි, වැසිකිළි කවුද දුන්නේ? ඔබතුමාද?

[සභාවේ ඝෝෂා]

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා දන්නවා. එක අධ්‍යාපන කොට්ඨාශයකට - මේවා හෘදය වස්තුව ඇතුළේ තියාගෙන පැහැව පැහැව ඉන්නවා. හැබැයි කියන්න කැමැති නැහැ.

[ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා]

පාසල් කිහිපයක් තෝරාගෙන ජා-ඇළ කොට්ඨාශයේද, වත්තල කොට්ඨාශයේද, මීගමුව කොට්ඨාශයේද -

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

ව්‍යාපෘති තියෙනවා. සල්ලි නැහැ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මුදල් වෙන් කරලා තිබෙනවා. ඒක අවුරුදු -

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

ව්‍යාපෘති තියෙනවා. සල්ලි නැහැ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

අහගෙන ඉන්න. අහගෙන ඉන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා බාධා කිරීම් කරන්න එපා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

අහගෙන ඉන්න පුරුදු වෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බාධා කිරීම් කළාට කමක් නැහැ. මයික්‍රෆෝන පාවිච්චි කරන්න එපා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

අවුරුද්දක ව්‍යාපෘතියක් නොවෙයි. 2017, 2018, 2019, 2020 යන ව්‍යාපෘතියක්. මොනම අවුරුද්දකවත් මේ විධියට රේඛීය අමාත්‍යාංශයෙන් මුදල් දුන්නේ නැහැ. හොඳට හිතලා බලන්න. බන්දුල ගුණවර්ධනගෙන් අහලා බලන්න. පසුගිය කාලයේ මේ බස්නාහිර පළාත් සභාවට තමුන්නාන්සේලාගේ ඒකාබද්ධ විපක්ෂයේ ඉන්න කැගහන අධ්‍යාපන ඇමතිවරයා කෙන් ගෙඩියක්වත් දීලා නැහැ. ඒ නිසා අද අපට ආඩම්බරයෙන් කියන්න පුළුවන් මේ පළාත් සභාවට මේ වර්තමාන අධ්‍යාපන ඇමතිවරයා කිසිම භේදයක් නැතිව අතිවිශාල මුදල් ප්‍රමාණයක් දීලා තිබෙනවා. දෙමිනුත් පවතිනවා. ඒක නිසා දීපු නැති දේවල් ගැන කථා කරන්න. නමුත් ප්‍රසන්න රණතුංග මහ ඇමතිවරයාගේ කාලයේ කිවන් කැබිනෙට්ටුවක් මෙකේ තිබුණේ. ඔය මුහුණ කිහිපයක් එතුමාගේ වටේ ඉඳගෙන - එතුමා කිව්වොත් එහෙම ඔන්න ඔය සිරිකමල්ටත් කීයක් හරි දීපන් කියලා, ඔන්න මෙරිල් කියනවා, සිරියටත් කීයක් හරි දෙමු. එහෙම තමයි මේකේ වැඩ කෙරුවේ. මේකේ තම තමන්ට ඕනෑ කරන විධියට, තම තමන්ට පන්දම් ඇල්ලුවා නම් ඒ විධියට තමයි. අද මම සන්තෝෂ වෙනවා අපේ ප්‍රධාන ඇමතිතුමාත්, වර්තමාන අධ්‍යාපන ඇමතිතුමා ඇතුළු මේ අමාත්‍ය මණ්ඩලයත් එහෙම නැහැ. හැමෝටම සමව බෙදනවා. ඒක නිසා එදා මහින්ද රාජපක්ෂ මැතිතුමා පරාද වුණාම, පාර්ලිමේන්තු ඡන්දය තියලා කිව්වේ, අපි මහින්දත් එක්ක ආපහු නැඟිටිමු කියලා. මේ අයවැය ලේඛනය -

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

දැනුත් කියන්නේ එහෙම තමයි.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

අපි කියන්නේ, මේ මහ ඇමතිතුමාත් (බාධා කිරීමක්) රංජිත් සෝමවංශ එක්කත් තමයි අපි නැඟිටින්නේ කියන එක බය නැතුව කියනවා. ගිය වතාවේත් තමුන්නාන්සේලා මොනවාද කෙරුවේ? ගිය වතාවේත් කෙරුවේ මිරිකලා තියලා, හිර කරලා තියෙන වරප්‍රසාද ටික ගත්තා. මේ සැරේත් කරන්න හදන්නේ ඒකයි. ඒ උගුලේ අපි අහුවෙන්නේ නැහැ. ඒ උගුලට අපි වැටෙන්නේ නැහැ. ඒ නිසා එතැනින් එහාට මම ඒ ගැන කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ.

ගරු සභාපතිතුමනි, මේ සභාවේ විවිධ කාරක සභා තිබෙනවා. පෙත්සම් කාරක සභාව, අවදි කාරක සභාව, කාර්ය පටිපාටි රීති කාරක සභාව, පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවේ වාගේ කාරක සභා තිබෙනවා. මේවාවලට එක සමාන වරප්‍රසාද තිබෙන්නේ. නමුත් ගිණුම් කාරක සභාව වාගේ ඒවාට විශේෂ වරප්‍රසාද තිබෙනවා. ඒක නිසා හිටපු ප්‍රධාන ලේකම්තුමිය ඉන්න වෙලාවේ මේ කාරක සභාවල තිබෙන වරප්‍රසාද, ඉන්න නිලධාරී මහත්වරුන්ගේ

නෝනාවරුන්ගේ තිබෙන දීමනාවල් පිළිබඳව, මන්ත්‍රීවරුන්ගේ සහභාගීත්ව දීමනා - මට එක් වතාවකදී මතකයි පෙත්සම් කාරක සභාවේ ස්ථානීය පරීක්ෂණයකට ගියා. ඒ ස්ථානීය පරීක්ෂණයට ගිය වෙලාවේ කැති පිහි උස්සාගෙන ආවේ. එතකොට ඒවායේ ජීවිත අනතුරු තිබෙනවා. ඒක නිසා ඒ දීමනාවල් ලබා දෙන කොට සමානව ලබා දෙන්න. මේ පිළිබඳව මම තමුන්නාන්සේගෙන් ඉල්ලීමක් කරනවා. මේක බොහොම යල්පැන ගිය අදහසක්. ඒක නිසා මේ පිළිබඳව නැවත වතාවක් කථා කරලා කටයුතු කරන්න. මොකද, ඊළඟට දැන් අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය එනකොට 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් මේ සභාවට තිබුණු බලතල - මෙතුමා කථා කරද්දීත් කිව්වා. අපට තිබුණු සමහර දේවල් උදුර ගත්තා. මේ සභාවේ අපි කැමැත්තෙන්ම බන්දේසියේ තියලා දීපු දේවල් තිබුණා. දැන් මේ BTT එක අපෙන් උදුර ගත්තේ නැහැ නේ? ප්‍රසන්න රණතුංග මහ ඇමැතිතුමා ඉන්න කොට මේ කැගහන මන්ත්‍රීවරු මහින්ද රජපක්ෂ මහත්තයා ඉල්ලුවා කියලා BTT එක බන්දේසියේ තියලා දුන්නේ. මේ සභාවේ -

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

එදා සල්ලි දුන්නා. එදා සල්ලි දුන්නා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

බොරු කියන්න එපා. කැමැත්තෙන් දුන්නේ. අද කථා කරනවා -

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

එදා සල්ලි දුන්නා. ගත්තා වාගේ දෙගුණක් දුන්නා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

දීලා ඉල්ල ගන්න එක නොවෙයි වැඩේ. ඒක නිසා තමයි කියන්නේ, මේ අපට තිබුණු වරප්‍රසාද. අපට තිබුණු බලතල. මේවා දුන්නා. මේ සභාවට තිබුණු දේවල් තමයි දුන්නේ. අර කිව්වා වාගේ ගොවිජන සේවා එකේ තිබුණු බලතල, ඒවා දුන්නා. ඉඩම්වල තිබෙන බලතල අපි ඉල්ලනවාද? අද අපි අධිකරණ බලතල ඉල්ලනවා. පොලිස් බලතල ඉල්ලනවා. හැබැයි මේවා ගන්න යනකොටත් දැන් කථා කරපු අය කියනවා උතුරට දීපුවාම - දැන් මේ රටේ බිල්ලෙක් මවන්න හදනවා. ඒ නිසා කරුණාකරලා ප්‍රධාන දේශපාලන පක්ෂ දෙක එකට එකතු වෙලා මේ රට අද ශක්තිමත් විධියට පාලනය කරනවා. තමුන්නාන්සේලාට තිබෙන්නේ, ඒ භීතිකාව තමයි. පරදියි කියලා හිතුවේ නැහැ. අවුරුදු දෙකකට කලින් ඡන්දය තියලා ඉල්ලගෙන කෑවා. ඒකයි වුණේ.

[සභාවේ ඝෝෂා]

බලයට තිබෙන කෑදරකමට, බලයට තිබෙන පෙරේතකමට, තණ්හාවට ඡන්දය තියලා ඉල්ලනගෙන කෑවා. මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා (බාධා කිරීම්) රනිල් වික්‍රමසිංහ මැතිතුමාත් එක්ක යහපාලනය ගෙනැල්ලා මේ රටේ ජනතාවගේ වාසනාවට මේ රට බේරුණා.

[සභාවේ ඝෝෂා]

පාලන ක්‍රමයක් තමයි එන්නේ. නැවත වතාවක් අපි කියනවා, ප්‍රධාන දේශපාලන පක්ෂ දෙක මේ පළාත් සභාව ඇතුළේත් ක්‍රියාත්මක වෙන්නේ ඒ විධියටයි. හැබැයි අවසාන වශයෙන් අපේ මංජු ශ්‍රී අරංගල විපක්ෂ නායකතුමාත් එක්ක එකතු වෙලා මේ ප්‍රධාන ඇමැතිතුමාත්, මේ ඉන්න අමාත්‍ය මණ්ඩලයත් එක්ක මේ පළාත් සභාව සාධනීය පළාත් සභාවක් විධියට 2017 මහජනතාවට ක්‍රියාත්මක වෙන්න පුළුවන් නැට්ට විසින් බල්ලා වනන පළාත් සභාවක් නොවෙයි. බල්ලා විසින් නැට්ට වනන පළාත් සභාවක් බවට -

[සභාවේ ඝෝෂා]

මේ පළාත් සභාව පත් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 03.54]

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, ස්තුතිවන්ත වෙනවා. අවුරුදු 30 ක ඉතිහාසයක් තිබෙන පළාත් සභා ක්‍රමය යටතේ මහ ඇමැතිවරු රාශියක් යටතේ ඇමැතිවරයෙක් හැටියටත්

[ගරු උපාලි කොඩිකාර]

මන්ත්‍රීවරයෙක් හැටියටත් කටයුතු කරලා, මේ රටේ 29 වැනි අයවැය විවාදයට යහපාලන ආණ්ඩුවක් යටතේ කථා කරන්න ලැබීම ගැන මම සතුටු වෙනවා. දැන් මේ අපේ සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා - මම මේ මාතෘකාව පටන් ගත්ත හිටියේ, වෙන තැනකින්. නමුත් සිරිකමල් මන්ත්‍රීතුමා ඇහුවා අකිල විරාජ් කියන - අකිල ඕනෑ රනිල්ට, රනිල් ඕනෑ අකිලට කියනවා වාගේ අද මේ ලංකාවම කියන කථාවක් තිබෙනවා. ඒක ගැන කථා කරපු සිරිකමල් මැතිතුමාට මම පොඩ්ඩක් කියන්න ඕනෑ. 2015 දීපු සල්ලි ටික තමයි මේ මහ ඇමැතිතුමා 2016 ඔක්කෝම වියදම් කළේ. මෙන්න බලාගන්න. එක්කෙනෙක්වත් කථා කළාද? තමුන්නාන්සේගේ මේ සභාවේ හිටපු ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක්. 2015 වසරේ පුනරාවර්තන වියදම් කීයද? රුපියල් මිලියන 4064 යි. එතකොට 10.67% කින්. දැන් බලන්න මේ අපේ මහ ඇමැතිතුමාගේ එක. දැන් මේ කියන්නේ 2017. මම චන්ද්‍රිකාගේ එකත් කියන්නම් කෝ? චන්ද්‍රිකාගේ එකත් මා ළඟ තිබෙනවා. ගරු සභාපතිතුමනි, චන්ද්‍රිකා කුමාරතුංග බණ්ඩාරනායක මැතිනියගේ එකත් මා ළඟ තිබෙනවා. මේ පළාත් සභාව ආරම්භ කරපු අපේ හිටපු දක්ෂ මහ ඇමැතිවරයෙක් වුණු සුසිල් මුණසිංහ මැතිතුමා. එතුමාගේ අයවැයත් මා ළඟ තිබෙනවා. ඊට පස්සේ චන්ද්‍රිකා කුමාරතුංග බණ්ඩාරනායක මැතිනිය කරපු අයවැය ප්‍රකාශයත් මා ළඟ තිබෙනවා. මම අමාත්‍යාංශ යටතේ එකින් එක කියනවා. දැන් වෙලාව නැති නිසා. හරිද? මම හිතුවේ නැහැ සිරිකමල් මෙපමණ -

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී. ]*
*[Expunged on the order of the chair]*

කරන කෙනෙක් කියලා. ඒකටම අදාළ වැඩ කටයුතු -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඔබතුමා ඉස්සෙල්ලා චන්ද්‍රිකා නෝනා ගැන කිව්වා නේද?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

සමාවෙන්න. සමාවෙන්න. ඒ වචනය කපා දාන්න. අපේ මිත්‍රයා නේ? මේ යහපාලනයට කත් අදින ඊළඟට පැරදිලා ලැයිස්තුවෙන් ආපු එක්කෙනා. ඊළඟට පරදින එක්කෙනා. වත්තලින්. එතකොට දැන් අපේ මහ ඇමැතිතුමා. මගේ මිත්‍රයා. 1991 අපි දෙන්නා පළාත් පාලන ආයතනයකට පත් වෙලා, ප්‍රාදේශීය සභාවේ සභාපති, උප සභාපති වෙලා ආපු අය. මම එතුමාගේ හොඳ ගතිගුණ ඉගෙන ගත්තා. එතුමාගෙන් ඉගෙන ගත්තු ගතිගුණ තමයි පළාත් පාලන ආයතනයක වැඩියෙන්ම ලාභ ලබන්න පුළුවන් කර්මාන්තය මොකක්ද කියලා. ඒක මම ඉගෙන ගත්තා. ඒ ඉගෙන ගත්තු නිසා තමයි අද අපේ ආසනයට මේ තිබෙන පළාත් පාලන අයවැය මුළු එකතුව ගත්තාම, කපපු ගාණයි එකතු කරපු ගාණයි ඔක්කෝම ගත්තාම මහරගමට විතරක් වැඩ කරලා තිබෙන ගාණ කිව්වොත් - තමුන්නාන්සේලා ගිහිල්ලා ලිස්ට් එක බලන්න. 104 දෙනාම යන්න. ගිහිල්ලා බලන්න. මගේ මහරගම මිනිස්සු අද කොපමණ සතුටින් යනවාද කියනවා නම් -

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

මහරගමට වැඩ කළාට විරුද්ධද?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

එදා 2015 ජනවාරි 08 වැනිදා අපේ මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා යහපාලන ආණ්ඩුවට ගෙනාපු දින 100 වැඩ සටහන -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

අපේ, අපේ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

අපේ නොවෙයි. ඔයගොල්ලන්ගේ. අපි ශ්‍රී ලංකා එකෙන් පැන්නුවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඔබතුමා අපේ කිව්වා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

පන්නලා තමයි ආපහු ගත්තේ. පැන්නුවා. මම විධායක සභාවේ සාමාජිකයෙක් හැටියට මම අත උස්සපු කෙනෙක්

තමයි මෛත්‍රීපාල ඇතුළු 17 දෙනෙක් එළියට දාන්න. අපි අත උස්සපු මිනිස්සු. අද මොනවාද වෙලා තිබෙන්නේ? මෙන්න දින 100. මෙන්න මාධ්‍ය මහත්වරු ඕක දාන්න. අපේ මහ ඇමැතිතුමා, සභාපතිතුමා, මන්ත්‍රීවරු දන්නවා. දැන් දින 100 යේ වැඩ 100 යි. මේ තියෙනවා වැඩ 100 ය. වැඩ වල වකවානු තිබෙනවා. රාජ්‍ය කොමිෂන් සභාව. මැතිවරණ කොමිෂන් සභාව. පොලිස් කොමිෂන් සභාව. එතකොට අපේ නීති කොමිෂන් සභාව. මේ වාගේ කොමිෂන් සභා තිබෙනවා. එක කොමිෂන් සභාවක් ස්ථාපිත කරලා මේ පළාත් පාලන මැතිවරණය -

එදා ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා අවුරුදු ගණනාවක් පළාත් පාලන ඡන්දය තියන්නේ නැති කොට අපේ තරුණ නංගිලා මල්ලිලා තුවක්කු අරගෙන පාරට බැහැලා බටලන්දේ රනිල් වික්‍රමසිංහ වාගේ ඒ ළමයින්ව ඒ ගෙනැල්ලා තිබුණු එකෙන් ප්‍රේමදාස ජනාධිපතිතුමා එදා කල්පනා කරලා බලලා පළාත් පාලන ආයතන ඡන්ද තියපු නිසා තමයි මේ පේළියට ආණ්ඩු පක්ෂයේ විපක්ෂයේ ඉන්න බර සංඛ්‍යාවක් අද මේකට ඇවිල්ලා ඉන්නේ. ප්‍රේමදාස මැතිතුමා තමයි ඡන්දයයක් තිබ්බේ. එදා අපව ගෙනාපු නිසා තමයි පළාත් සභාව හැදුණේ. මේ පළාත් සභාව හැදුණේ අපේ රටේ උතුරු - නැගෙනහිර තිබුණු ප්‍රශ්නයට, සුළු ජාතීන්ගේ ප්‍රශ්නයට, ජාතීන් අතර මතභේදයක් තිබුණු ප්‍රශ්නයකට බලය විමධ්‍යගත කරන්න ඉන්දියාවෙන් ගෙනැල්ලා තල්ලු කරපු දේ ජේ.ආර්. ජයවර්ධනට මේක කරේ තියාගෙන යන්න සිද්ධ වුණා. අනික් සියලුම අයට. චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය පැකේජය ගෙනැල්ලා පළාත් සභා ක්‍රමයට තවත් බලය බෙදන්න උත්සාහ කළා. බැරි වුණා. තව අවුරුදු 30 කින් යුද්ධය අවසන් කරලා මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාට 2015 ජනවාරි 08 වැනිදා කාල වකවානුවේ මඩ ගහලා, මඩ කාලා කෝටි මිලියන 100 ජිනිවා බැංකුවල තිබෙන සල්ලි, ස්විස් බැංකුවේ තිබෙන සල්ලි ගෙනැල්ලා කන්න දෙනවා කිව්වා. මේ යහපාලනයේ කට්ටිය ගෙනාවා පරාජය කරන්න. අද කොහොමද?

එදා මම ගෙනැල්ලා පෙන්නුවා, මේක තිබෙනවා හැන්සාඩ් එකේ. ලන්කට් එකටත් වැට් එක ගහලා. යටට අඳින ඇඳුමටත් වැට් එක ගහලා. රාජ්‍ය සේවකයන්ට 10,000 ක් දෙන්න කියලා මේකේ තියෙනවා. ඒකට පඩි ගෙවන්න අපේ බන්දුල ගියපාර සල්ලි දීලා තිබෙනවා. ඒ අපේ මුදල් ඇමැති නේ? දැන් ඒක කපලා මේ අවුරුද්දේ මොනවාද කළේ? මේ ගමන එච්චා, මේ බලන්න. මේ ව්‍යාපෘති එවනවා මහ ඇමැතිතුමාට වැඩ කරන්න කියලා. අධ්‍යාපන ව්‍යාපෘති 2016, 1091 යි. මේකට 180 යි. වෙනස බලන්න. 911 ක් වෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මොකක්ද?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

අඩු වෙලා තිබෙන ප්‍රමාණය. 2016 ට වෙන් කරලා තිබුණා. 2017 මේක 180 ට බැහැලා 911 ක් අඩු වෙලා. අධ්‍යාපන අමාත්‍යාංශයට. මේ එක එක විෂයන්වලට තිබෙනවා. මට තව විනාඩි 10 ක් කාලය දෙනවා නම් මම ඔක්කෝටම කියන්නම්, මේ ඇමැතිවරු 04 දෙනාගේම ඇඳුම් ගලවලා යන්න. මට තව විනාඩි 05 ක් කාලය දෙන්න. යහපාලන ආණ්ඩුව ගැන කියන්න. එතකොට දැන් සිරිකමල් ගරු මන්ත්‍රීතුමා කිව්වා ඒකාබද්ධ විපක්ෂය පාර්ලිමේන්තුවේ ඉන්නවා. මේකේ නැහැයි කියලා. උපාලි කොඩිකාර ඒකාබද්ධ විපක්ෂයත් එක්ක මේ රටේ අනාගතය වෙනුවෙන් ගොඩ නඟන ඕනෑම තැනක කෙළින් හිටගන්න මිනිහෙක් කියන එක මම මේ වෙලාවේ කියනවා. දැන් බලන්න අපේ මහ ඇමැතිතුමා. එදා මගේ සභාපතිතුමා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

පාරවල් 91 ක් හැදුවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මෙතුමාගේ ආසනයේ සංවිධායකතුමා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

කාපට් කරලා තිබෙනවා. පාරවල් 20 ක් විතර කොන්ක්‍රීට්, තාර දාලා තිබෙනවා. මහ ඇමැතිතුමා කොපමණ දක්ෂද කිව්වොත් බලන්න තාර දාන පාරේ පණුවොයි, තණ කොළයි. තාර දාන පාරේ තණ කොළ එනවා සුමානෙන්. පරීක්ෂණයක් කරන්න ඔබතුමන්ලා එන්න. ඒක තමයි යහපාලනයේ සුරක්ෂිතතාවය. තාර දාලා සති තුනක් යනකොට තණ කොළ එනවා. තණ කොළ අස්සෙන් පණුවෝ එනවා. අන්න පාර වේයෝ කාලා. එතකොට අපේ කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාත් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

දැන් මේ ඇමැතිවරු හතර දෙනාට අපි මේ වෙලාවේ විරුද්ධව ඡන්දය නොදී ඉන්නේ මේක ඕනෑ නිසා නොවෙයි. මේ පළාත් සභාවේ (බාධා කිරීම්) -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ආණ්ඩු පක්ෂ සංවිධායකතුමා මට පොඩි උදව්වක් කරන්න. එතුමාව වාඩි කරවන්න. කාලේ ඉවරයි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

දැන් බලන්න -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කාලය ඉවරයි. වාඩි වෙන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මට විනාඩියක් දෙන්න. මුදල් ඉල්ල ඉල්ලා අපි 104 දෙනාට - දැන් බලන්න මේ දීපු මුදල්වලින් මේ ඇමැති මණ්ඩලය වැඩ කරලාද? මේ අපේ කැලණියේ ඉන්නවා නේ - මෙයා ඇවිල්ලා අර පතෝල කොටුවල ඉන්න පඹයෝ වාගේ. ඒ වාගේ තමයි මෙයාත් ගෙනැත් දෙන්නේ, ජෙනරාල් ෆොන්සේකා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර වාඩි වෙන්න. කාලය දෙන්න බැහැ. මට කාලය නැහැ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

(බාධා කිරීම්) 2015 මෛත්‍රීපාල සිරිසේන මේ රටට කරපු පාප කර්මයත් එක්ක, ඒකට හවුල් වෙන්න අපේ මහ ඇමැතිතුමා ගිය මාසේ 03 වැනිදා මෛත්‍රීපාල සිරිසේන මහත්තයාව මහරගමට ගෙනාවා. අපේ ජනාධිපතිතුමා ගෙනැල්ලා -

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

මේක නවත්වන්න. සභාපතිතුමාට කන් දෙන්න ඕනෑ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මට කාලය දුන්නා නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ, නැහැ. දුන්නේ නැහැ. වාඩි වෙන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

විනාඩි 02 ක් දෙන්න.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

සභාපතිතුමාට කන් දෙන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වාඩි වෙන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මගේ මිත්‍රයෙක් වාගේ මහරගම දේශපාලනය කරන එක මේ ඊළඟ මැතිවරණයෙන් ගෙදර යන්න කරපු උත්සාහයට මගේ ගෞරවනීය ස්තුතිය සිරිසේන මැතිතුමාට පුද කරනවා.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. මට කොඩිකාර ගරු මන්ත්‍රීතුමාගේ කථාව පැහැදිලි වුණේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මටත් පැහැදිලි වුණේ නැහැ. මීළඟට ජගත් අංගගේ ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

[අ.භා. 04.06]

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු සභාපතිතුමනි, මොලේ කොලොප්පම් වෙලා තිබෙන වෙලාවේ තමුන්නාන්සේ මට වෙලාව දීපු එක ගැන මම ස්තුතිවන්ත වෙනවා. ගරු සභාපතිතුමනි, අද 2017 වර්ෂයේ මුදල් ප්‍රකාශය පිළිබඳව ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් අද උදෑසන සිට විවිධ කාරණා ඉදිරිපත් වුණා. මම අතිශයින්ම සන්තෝෂ වෙනවා, මේ අවස්ථාවේදී මුදල් ප්‍රකාශය පිළිබඳව යම් වචනයක් ප්‍රකාශ කරන්න ලැබීම ගැන. ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු සභාපතිතුමනි, අද උදෑසන ඉඳලා කිව්වේ, මේ සභාවේ 2017 වර්ෂයට වැඩ කරන්න මන්ත්‍රීවරයෙකුට ලැබෙන ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් කපා හැරීම පිළිබඳවයි. ඒ නිසා ගරු සභාපතිතුමනි, 2017 වර්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ට මේ පළාත් සභාව තුළ ක්‍රියාත්මක වීම සඳහා අවශ්‍ය වන ප්‍රාග්ධන ආයෝජන සහ මේ පළාත් සභාව මෙහෙයවන්න ඉදිරිපත් වෙලා ඉන්න නිලධාරීන්ගේ වැටුප් හා දීමනා පිළිබඳව අනාගතයේ කුමන ප්‍රශ්නවලට මුහුණ දෙන්න සිද්ධ වෙයිද කියන කාරණාව පිළිබඳව සංඛ්‍යාත්මක වශයෙන් ගරු මන්ත්‍රීතුමන්ලා විවිධ තොරතුරු ඉදිරිපත් කළා. ගරු සභාපතිතුමනි, පැහැදිලිවම උදාහරණයක් වශයෙන් ගත්තොත් උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරන්න උත්සාහ කළා. 2016 වර්ෂය සහ 2017 වර්ෂය සංසන්දනාත්මකව බැලුවොත් එහෙම විශාල මුදල් අඩුවීමක් පිළිබඳව පැහැදිලි වෙනවා. විශේෂයෙන්ම අධ්‍යාපනය වාගේ පුළුල් විෂයක් සඳහා 2016 වර්ෂයේ රජය මගින් ලබා දුන් ප්‍රදාන, පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන ප්‍රමාණය බැලුවොත් 1091 ක් හැටියට 2016 සඳහන් වනකොට 2017 ලැබීම 1080 කට සීමා වෙනවා. ඒ වාගේම මේ 2015, 2016, 2017 වර්ෂ වෙන් වෙන්ව සලකා බැලුවොත් වර්ෂයෙන් වර්ෂය මේ සඳහා වෙන් වන මුදල් ආයෝජන ප්‍රමාණය මධ්‍යම රජය සීමා කිරීම නිසා මේ පළාත් සභාවේ අනාගතය පිළිබඳව මහ ගැටළුවක් බවට පත් වෙලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, මේ සංඛ්‍යාත්මක තොරතුරු මේ හැන්සාඩ් වාර්තාවේ අද උදෑසන ඉඳලා මේ මොහොත වනකල් බැලුවොත්, දහ පහළොස් පොළක ගරු මන්ත්‍රීවරුන්ගේ වචනවලින් ප්‍රකාශ වෙලා සටහන්ව තිබෙනවා. මම 2011 ඉඳලා සංඛ්‍යාත්මක තොරතුරු හොයාගෙන ආවා. නමුත් මේවා ඉදිරිපත් කිරීමෙන් වැඩක් නැහැයි කියලා මා විශ්වාස කරනවා. මොකද, ඒවා අවශ්‍ය පමණට මේ හැන්සාඩ් වාර්තාවට ඇතුළත් වෙලා තිබෙනවා. නමුත් කනගාටුවට කාරණාව වසර 25 ක් මම මේ පළාත් සභාවේ අයවැය විවාදවලට සම්බන්ධ වෙලා තිබෙනවා. අද මම දැක්කා, අසරණ වුණු මන්ත්‍රීවරු. අපේ අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා. ඒ වාගේම එතුමාගේ සහෝදර ගරු මන්ත්‍රීතුමා. තමන්ගේ දේශපාලන නායකයා අතරමං වුණාට පස්සේ, ඔහු නැති වුණාට පස්සේ තමන් කොපමණ අසරණ භාවයට පත් වෙනවාද? ඊළඟ පියවර සඳහා තමන් කළ යුත්තේ කුමක්ද කියන එක පිළිබඳව මේ සභාව තුළ යම් යම් ප්‍රකාශ තුළින් පැහැදිලි වුණා. දැන් ඔවුන් අසරණ වෙලා ඉන්නේ? කොයිබටද අපි යා යුත්තේ කියලා මේ මාවත සොයනවා. අමාත්‍යාංශවල ප්‍රගතිය පිළිබඳව ඉදිරිපත් කරපු වාර්තා සාවද්‍යයි කියලා මම ඔබතුමාට පැහැදිලිවම කියනවා. මොකද, හේතුව අමාත්‍යාංශයක මූල්‍ය ප්‍රගතිය පිළිබඳව සංසන්දනාත්මකව තොරතුරු බලන්න වෙන්නේ, මේ මාසේ මැද භාගයෙන් එහාට ගියාට පස්සේ භෞතික ප්‍රගතියට සාපේක්ෂව. භෞතික ප්‍රගතිය පිළිබඳ වචනයක්වත් මේ සභාව තුළ කථා වුණේ නැහැ. කථා වුණේ, මූල්‍ය ප්‍රගතියේ යම් යම් අඩුපාඩුකම් ගැන විතරයි. ඒ නිසා මේක හුදෙක් ද්වේෂ සහගත විවේචනයක් බවට අද පරිවර්තනය වුණා.

ගරු සභාපතිතුමනි, මේ සභාව මීට වඩා විවේචනාත්මක සංවාදයක් තුළට ගෙන එන්න තරම් අවබෝධයක් තිබෙන මන්ත්‍රීවරු පවා අද අන්තගාමී විධියට හැසිරුණා. මම මේ පිළිබඳව කනගාටු වෙනවා. මීට වැඩිය ගුණාත්මක වශයෙන් පෝෂිත විවාදයකට අපට මුහුණ දෙන්න ලැබුණා නම්, මම හිතනවා ලබන වර්ෂය මීට වඩා සුභවාදී වෙනවා. යම් යම් දේශපාලන පක්ෂවල මති මතාන්තර තිබෙනවා. ඔවුන්ට ඒවා දරා ගැනීමේ හැකියාවේ නොහැකියාවේ ප්‍රමාණයන් තිබෙනවා. යම් යම් අමාත්‍යවරුන්ගේ හැසීම සහ ඔවුන්ගේ පෘතග්ජනභාවය පිළිබඳ ගැටළු තිබෙනවා. ඒවා අපි දකිනවා. ඒවා වෙන වෙන ප්‍රශ්න. ගරු ප්‍රධාන

[ගරු ජගත් අංගගේ ]

ඇමැතිවරයා අපේ පන්තියේ මනුස්සයෙක්. ඒ පිළිබඳව අපි දන්නවා. එතුමාගේ අඩුපාඩුකම් තිබෙන්න පුළුවන්. අමාත්‍ය මණ්ඩලයේ අඩුපාඩුකම් තිබෙන්න පුළුවන්. අඩුපාඩුකම් පිළිබඳව පෙන්වා දුන්නාම හිතුවක්කාරී විධියට හැසිරෙනවා නම්, ඒ පිළිබඳව ගත යුතු ක්‍රියා මාර්ගත් තිබෙනවා. නමුත් ඔවුන් මනුස්සයන් හැටියට සලකලා, ඔවුන්ට මේ පළාත් සභාවේ ඉදිරි පියවර ගැනීමට, මේ විවාදය සාධනීය විවාදයක් බවට පරිවර්තනය කර ගැනීම අපි කාගේත් වගකීම. මේක හුදෙක් තමන්ගේ පටු දේශපාලන අරමුණු මුදුන්පත් කර ගන්න, එහෙම නැත්නම් තමන්ගේ අනාගතය පිළිබඳව මෙනෙහි කරමින් එවා මුදුන්පත් කර ගන්න, එහෙම නැත්නම් අමාත්‍යවරුන්ගෙන් මුදල් ටිකක් ගන්න පුළුවන් නම් ඔවුන්ට ප්‍රශස්ථි ගායනා කරන විවාදයක් බවට පරිවර්තනය කර ගැනීම හුදෙක්ම පහත් ක්‍රියාවක්.

ඒ නිසා ගරු සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම කියනවා නම්, අපි කනගාටු වෙනවා. මොකද, මේ මුදල් කප්පාදුව තුළ, විශේෂයෙන්ම පුනරාවර්තන වියදම් කප්පාදුවට සාපේක්ෂව මේ තියෙන ප්‍රාග්ධන ආයෝජන කප්පාදුව. දැන් සේවක සංඛ්‍යාව ගැන බැලුවොත්, මම පසුගිය දවස්වල සෞඛ්‍ය අමාත්‍යාංශ සේවක කප්පාදුව පිළිබඳව බැලුවා. දැන් මේ ආකාරයෙන් බැලුවාම මේ අමාත්‍යාංශ කොහොමද දුවන්නේ? සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඖෂධ සංයෝජක පුරප්පාඩු ප්‍රමාණය මේ වනකොට 124 ක්. දැනට ඉන්න අනුමත සංඛ්‍යාව 197 යි. දැනට ඉන්නේ 73 යි. 124 ක් පුරප්පාඩුයි. ඖෂධ සංයෝජක ඒක ආකාරයෙන්. ඒ වාගේම රසායනාගර තාක්ෂණ නිලධාරීන් සංඛ්‍යාව 161 ක් අනුමතයි. 57 යි ඉන්නේ. තවත් 104 ක් පුරප්පාඩුයි. කොහොමද මේ ආයතන දුවන්නේ? මේවා දුවන්න බැහැ. මධ්‍යම රජයේ සෞඛ්‍ය ඇමැතිවරයා මේ ගැන ඇස් පියාගෙන ඉන්නේ ඇයි? තමන්ගේ කළුතර දිස්ත්‍රික්කයේ තිබෙන පුරප්පාඩු ගණන ගැන හිතුවොත් එහෙම මේ රෝහල් පද්ධතිය දුවන්න බැහැ. ඒ මදීවාට මුදල් කප්පාදුව. රජය මගින් ලබා දෙන පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන ප්‍රතිශය බැලුවොත්, ගියපාර බටහිර වෛද්‍ය 650 යි. මෙවර 130 යි. මේ ආයතන එහෙම කල්දාලා මුදල් ටිකක් දෙන්නම්, ලබන සුමානේ ඉඳලා ඉස්පිරිතාලේ වැඩ සුමානයක් නවත්වලා පටන් ගනින් කියලා දුවන්න පුළුවන් ආයතන නොවෙයි. අධ්‍යාපනය ගත්තොත් ගුරුවරු නැහැයි කියලා මාසයක් දෙකක් පාසල් වහලා තියන්න බැහැ. ඒ වාගේ ආයතනවලට දරුණු විධියට මේ මුදල් කප්පාදුව බලපානවා. මට කනගාටුවක් තිබෙනවා. මධ්‍යම රජය කොහොම වුණත්, විග්නේෂ්වරන් මහ ඇමැතිතුමාට සලකපු ප්‍රමාණයට ඉසුර දේවප්‍රියට සලකලා නැහැ. ඒක තමයි සත්‍යය. විග්නේෂ්වරන්ට සලකපු ප්‍රමාණයට ලංකාවේ ලොකුම පළාත් සභාව වුණු බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍යවරයාට සලකන්න මේ රජය අපොහොසත් වෙලා තිබෙනවා. මේක මහා කනගාටුදායක කාරණයක්.

ගරු සභාපතිතුමනි, අපි විවිධ දේ පිළිබඳව විවිධ විධියට දකිනවා. ඒක දේශපාලඥයින්ගේ දැනීම සහ අවබෝධය තුළ අපට විවිධ ආකාරයෙන් විවිධ දේවල් දකින්න පුළුවන්. ඒ පිළිබඳව අපට ප්‍රශ්නයක් නැහැ. නමුත් සිරිකමල් පිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා මේ වෙලාවේ නැහැ. එතුමා තේ බොන්නද කොහේද එළියට ගිහිල්ලා. එතුමා කථා කළේ මේ පළාත් සභාව යහපාලන ක්‍රියා පිළිවෙත තුළ ඉස්සරහාට යන්න ඕනෑ කියන කාරණාවයි. ඒක අපි පිළිගන්නවා. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයාට ජනතාව ඡන්දය දීලා තිබෙනවා. ඒ වාගේම එතුමා ජනාධිපතිවරයා බවට පත් වෙලා තිබෙනවා. අගමැතිවරයා පත් වීම පිළිබඳ කාරණාවේදී අපි සතුටට පත් වන්නේ නැහැ. එය ප්‍රජාතන්ත්‍රවාදී නොවන නිසා. ඒ නිසා අපි කොහොමත් දකින කාරණාව මේ පළාත් සභාව තුළ අපි වැඩ කරන කොට බල්ලාගේ නැට්ටයි, බල්ලයි ප්‍රශ්නය ඉස්සරහාට දාගෙන මේක බෙදා හදාගෙන කන්න හදනවා නම් ඒ පිළිබඳව අපටත් යම් තීන්දු තීරණ ගන්න වෙනවා. ඒක තමයි සාධාරණ ක්‍රියාව. දැන් අද උදෑසන ඉඳලා මේ අයවැය විවාදය පිළිබඳව විවිධ කරුණු කාරණා ඉදිරිපත් වුණා. නමුත් අවසානවකට ගරු සභාපතිතුමනි, මේ පළාත් සභාවක් තිබෙනවාද නැද්ද කියලා අපට ප්‍රශ්නයක් තිබෙනවා. මොකද, හේතුව? දැන් පළාත් පාලන ආයතන ටික විසුරුවා දාලා තිබෙනවා. ඊයේ මම හිරණ ප්‍රදේශයේ ඩෙංගු හැදිලා මියගිය කාන්තාවකගේ මළ ගෙදරකට සහභාගී වුණා. මොකක්ද මේ වෙලා තියෙන්නේ? පළාත් පාලන ආයතන නැහැ. පාර තොට සුද්ධ කරන්නේ නැහැ. පාරවල් පුරා කුණු කසළ. මේක මහ ජාතික අපරාධයක්. බරවා රෝග මර්දනය සඳහා ලංකාවේ විශාල ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වුණා. රුධිර පටක ලබා ගැනීම සඳහා වෙනම කණ්ඩායමක් පත් කළා. තව සුළු සේවකයන් පත් කළා. තෙල් ගහන්න පත් කළා. එක එක විධියෙන් පත් කළා. බරවා හැදිලා මැරුණු එක්කෙනෙක්වත් ලංකාවේ නැහැ. නමුත් ඩෙංගු රෝගය නිසා මෙතෙක් කීදාහක් මැරිලා

තිබෙනවාද? මොකක්ද? මේකට රජයේ තිබෙන ව්‍යාපෘතිය. මේ වාගේ අනාගතය දකින්නේ නැතුව, තමන්ගේ ජනතාවගේ ආරක්ෂාව ගැන හිතන්න දන්නේ නැති, ඒ පිළිබඳව මෙහෙයුමක් නැති ආණ්ඩුවක් මේ තුන් ලෝකෙටම මේ ආණ්ඩුව මිසක්, මම නම් වෙන එකක් දැකලා නැහැ. ඒ නිසා මේක මහා අවාසනාවක්. මේක සාධාරණීකරණය කරන්න මේ බස්නාහිර පළාත නොවෙයි. සමස්ත රටේ ජනතාවගේ ජීවිතය ආරක්ෂා කර ගන්න එදා සිදු වුණේ, ප්‍රභාකරන්ගෙන්. අද සිද්ධ වෙලා තිබෙන්නේ ඩෙංගු මදුරුවාගෙන්. ඒකවත් පාලනය කරන්න ආණ්ඩුවට තිබෙන නොහැකියාව පිළිබඳව තිබෙන තත්ත්වය ඉතාමත් අවාසනාවන්තයි.

ගරු සභාපතිතුමනි, විශේෂ ව්‍යාපෘතියක් යටතේ (බාධා කිරීමක්) අපි කරපු දේවල් මම සංඛ්‍යාත්මකව පෙන්වන්නම්. ඒක නොවෙයි, ප්‍රශ්නය තිබෙන්නේ. මම සුමිත්ලාල් මැන්ඩිස් ගරු අමාත්‍යතුමාට නොවෙයි, මේ දොස් කියන්නේ. එතුමාට කරන්න දෙයක් නැහැ. ඩෙංගු මර්දන ඒකකය විසුරුවා හැරියා. විශේෂ පුහුණුවක් තිබුණු ඩෙංගු මර්දන ඒකක විසුරුවා හැරලා, ඒ අයව රෝහල්වලට දැම්මා. රෝහල්වලට මධ්‍යම ආණ්ඩුවෙන් බඳවා ගන්න පුළුවන්. පළාත් සභාවට බඳවා ගන්න බැහැ. එතුමාට අවස්ථාව නැහැ. දැන් ඩෙංගු මර්දනය කරන්නත් මහ ආණ්ඩුවෙන් බඳවාගෙන පළාත් සභාවට 700 ක් දෙනවාලු. ඇයි පළාත් සභාවේ ඇමැතිවරයාට බඳවා ගැනීමේ අයිතිවාසිකම නැද්ද? පළාත් සභාවට ඒකට ප්‍රතිපාදන මධ්‍යම ආණ්ඩුවෙන් දීම සාධාරණ නැද්ද? තනිකර පළාත් සභාව කප්පාදු කරලා, මධ්‍යම ආණ්ඩුව තනිකර පළාත් සභාවේ බලය සියතට ගැනීමේ මහ කුඨ ව්‍යාපාරයක් හැටියට මේක කෙරෙන්නේ. ඒක නිසා මේ ඇමැතිවරු අසරණයි. මේ අයට දොස් කියලා වැඩක් නැහැ. යුක්ති ගරුක වෙන්න ඕනෑ. සාධාරණ වෙන්න ඕනෑ. හැබැයි ලැබුණු මුදල් ටික වියදම් කර ගන්න බැරි නම්, ඒ පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. ඒක කරුණාකරලා ලබන අවුරුද්දේවත් හදාගන්න. ඒවායේ අඩුපාඩු, කිළි කුණු වහන්න අපට උවමනාවක් නැහැ. ඒ අඩුපාඩු වහගෙන ලබන අවුරුද්දේ සාර්ථක විධියට මේ පළාත් සභාවේ සශ්‍රීකත්වය, එහෙම නැත්නම් හෙට දවස ගැන හිතලා කැප වෙන්න කියලා ඔබ සැමට ආරාධනා කරමින්, ඔබතුමා ලබා දුන් කාලයට ස්තුතිවන්ත වෙමින් නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 04.16]

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

ගරු සභාපතිතුමනි, ඉතාමත් කෙටි වෙලාවකදී මේ සභාව තුළ පළාත් සභා ඉතිහාසය පිළිබඳව නොයෙක් මත අද මේ උදෑසන ඉඳලා මේ දක්වා ප්‍රකාශ වුණා. ඒ හැම කථාවකම මම දැකපු දේ තමයි, පළාත් සභාවේ මුදල් කප්පාදුව පිළිබඳව තමයි දිගින් දිගටම, දිගින් දිගටම ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීතුමන්ලාත්, විපක්ෂයේ බොහෝ මන්ත්‍රීවරුත් කථා කරන්න මාතෘකාවක් වශයෙන් යොදා ගත්තේ. ඒ කියන්නේ හැම කෙනෙක්ම, හැම මන්ත්‍රීවරයෙක්ම කැමැතියි පළාත් සභාවට ලැබෙන්න නියමිත මුදල් ප්‍රමාණය තව තවත් වැඩියෙන් ලැබෙනවා නම්, පළාත් සභාව තුළ යම් සේවාවක් අපේ ජනතාවට යමක් කරන්න පුළුවන් කියන හැඟීමකින් තමයි හැමෝම වැඩ කටයුතු කරන්නේ. මට මතකයි කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමාගේ කථාවේදී විතරක් කිව්වා, ආණ්ඩුවෙන් ඕනෑතරම් සල්ලි දෙනවා. සල්ලි දුන්නා. බිලියන 750 කට ආසන්න සංඛ්‍යාවක් අධ්‍යාපනයට දුන්නා. හත්දහස් ගණනක් දුන්නා. මේවා එතුමාගේ කථාවෙන් කියාගෙන එනකොට අනෙක් පැත්තෙන් මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා කථා කරලා කිව්වා. නැහැ, අපට ලැබුණේ තුන්සිය ගණනයි කියලා. ඒක පිළිගන්න අකැමැති මන්ත්‍රීතුමන්ලාත් ඉන්නවා. නමුත් අපි දෙගොල්ලෝම මේ අවස්ථාවේදී සාකච්ඡා කරලා, කථා කරලා, පළාත් සභාවේ හඬක් නැඟිය යුතුය. ඒ සඳහා කරන්න තිබෙන එකම දේ තමයි ගරු ප්‍රධාන ඇමැතිතුමා හඬක් දැක්වූවා වාගේම, අපි ඉන්නේ කොයි පක්ෂයේද, කොයි ස්ථානයේද නැත්නම් කොයි පිළේද කියන එක නොවෙයි. පළාත් සභාව ශක්තිමත් කරන්න පළාත් සභාවට ලැබෙන්න ඕනෑ ඒ මුදල් ප්‍රමාණය ලබා ගැනීමේ අරමුණින් අපි සටන් කරන්න ඕනෑ. අපි කථා කරන්න ඕනෑ ඒ විධියට කියන එකයි මා විශ්වාස කරන්නේ.

ගරු ප්‍රධාන ඇමැතිතුමා පිළිබඳව වචනයක් කථා නොකළොත් මම හිතනවා, ඒක මදිකමක් කියලා. මොකද, අපි දැකපු දේ තමයි එතුමා මේ පල්ලෙහා පන්තියෙන් නැත්නම් පල්ලෙහා මන්ත්‍රීවරයෙක් වශයෙන් ඇවිල්ලා, දීර්ඝ කාලයක් තමන්ගේ මන්ත්‍රීකම තුළම ඉන්න පුළුවන් වුණේ, මන්ත්‍රීකමේ වටපිටාවේ ඇති වුණු යම් යම් සිද්ධීන් නිසා. අද ප්‍රධාන අමාත්‍යවරයා වුණාට පස්සේ, එතුමාට පුළුවන්කමක් ලැබුණා, ආණ්ඩු පක්ෂයේ ඉන්න මන්ත්‍රීතුමන්ලාව එක

[ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා]

මිටකට එහෙම නැත්නම් එක හඩකට ගන්න. ඒ වාගේම විපක්ෂයේ ඉන්න මන්ත්‍රීවරුන්ටත් 90% ක් සාධාරණත්වයක් ඉෂ්ට කරලා පෞද්ගලික පැත්ත බලලා, ඒ මන්ත්‍රීතුමන්ලාටත් තමන්ගේ කොට්ඨාශ තුළ තමන්ට දෙපයින් ඉන්න පුළුවන් මට්ටමකට ශක්තිමක් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් තමයි අද මම හිතන්නේ, බෙදීමකින් තොරව අයවැයක් සම්මත වෙන්න මේ කථා බහකට සූදානම් වන්නේ. ඒ කටයුත්ත කරන්න එතුමා බොහොම හිරවෙලා ඉන්නවා. එදා ලැබුණු මුදල් ප්‍රමාණය අද පළාත් සභාවට එන්නේ නැතුව මම කොහොමද සෞඛ්‍ය අමාත්‍යාංශයට සලකන්නේ? මම කොහොමද මහමාර්ග අමාත්‍යාංශයට සලකන්නේ? මම කොහොම අධ්‍යාපන අමාත්‍යාංශයට සලකන්නේ? මම කොහොමද කෘෂිකර්ම අමාත්‍යාංශයට සලකන්නේ? ඒ නිසා මම ගරු ප්‍රධාන අමාත්‍යතුමාට එක දෙයක් පෙන්වා දෙනවා. අද පළාත් පාලන ආයතන බොහෝමයක් මහජන ආයතන වෙලත් අද ඒවායේ මහජන නියෝජිතයෝ නැහැ. ඒ මහජන නියෝජිතයෝ රාශියක් එක්ක පළාත් පාලන ආයතන කරන වැඩ කොටස අද මහ ඇමැතිතුමාගේ කරපිටට ඇවිල්ලා තිබෙනවා. එතුමාගේ අවධානය සහ මහ පෙන්වීම යටතේ ක්‍රියාත්මක කරන්නට තිබෙනවා. යම් යම් අඩුපාඩුකම් ඇති. අද බොහෝ ව්‍යාපෘති ඒ පළාත් පාලන ආයතනවල ඉන්න ලේකම්වරු තමන්ගේ හිතුමතේ කිරීම තුළ ජනතා අප්‍රසාදයට පත් වෙලා තිබෙනවා.

ඒ නිසා ගරු සභාපතිතුමනි, ගරු ප්‍රධාන ඇමැතිතුමා ජනතාවගේ අදහස් ඇතුව, මහජන නියෝජිතයන්ගේ ඉල්ලීම ඇතිව ඒ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදයක් 2017 වර්ෂයේ ඉඳලාවත් හදනවා නම්, මීට වඩා පළාත් පාලන ආයතන ශක්තිමත් වෙනවා. ආලෝකමත් වෙනවා. ජනතා මතකයට කැරකැවෙනවා කියන එක මම පෙන්වා දෙනවා. ඒත් එක්කම කෘෂිකර්ම අමාත්‍යතුමා. අපි දන්නවා ගාමිණී තිලකසිරි ගරු ඇමැතිතුමා බොහොම විවෘතව වැඩ කටයුතු කරන අමාත්‍යවරයෙක් වශයෙන් තමන්ට ලැබෙන ඉතාමත්ම පොඩි මුදලෙන්, එහෙම නැත්නම් තමන්ට ලැබෙන මුදලින් සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාට කිහිප වතාවක් ආරාධනා කළා, ප්‍රායෝගික කෘෂිකර්ම ක්ෂේත්‍රය බලන්න. ප්‍රායෝගික කෘෂිකර්ම ක්ෂේත්‍රය බලන්න ඒ ඒ තැන්වලට එක්කරගෙන ගිහිල්ලා මන්ත්‍රීවරුන්ගේ ඔළුව හැදුවා මෙන්න මෙහෙමයි වෙන්න ඕනෑ, මෙන්න මේ ආකාරයෙන් නිලධාරීන්ට උදව් කරන්න කියන එක පිළිබඳව. ඒ පිළිබඳව මම බොහොමත්ම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මහ මාර්ග ඇමැතිතුමා. මෙතුමා පිළිබඳව කථා කරනවා නම් අද සමහර අය දොස් කියනවා. බණිනවා. ඒකට හේතුවක් තිබෙනවා. ඇයි? පසුගිය කාලයේ දැවැන්ත මුදල් ප්‍රමාණයක් තිබුණේ මහ මාර්ග අමාත්‍යාංශයට. දැවැන්ත මුදල් ප්‍රමාණයක්. ආර්ථික කටයුතු අමාත්‍යාංශය හරහා විශාල මුදල් ප්‍රමාණයක් ආවා. ඒක අඩු වුණාට පස්සේ අද කැපී පෙනෙන තැනකට ඇවිල්ලා තිබෙනවා. අනේ මේ අමාත්‍යාංශයෙන් එදා වාගේ අද කරන්නේ නැහැයි කියලා. එදා වාගේ අද වැඩ කරන්න බැහැ තමයි. ඒක නිසා මම හිතනවා එතුමාට පුළුවන් ශක්ති ප්‍රමාණයෙන් ඒ වැඩ කොටස කිරීම පිළිබඳවත් අපි බොහොමත්ම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම සෞඛ්‍ය ඇමැතිතුමා. එතුමාට ලැබුණු වටපිටාව තුළ එතුමාගේ ශක්ති ප්‍රමාණයෙන් සියලුම ගරු මන්ත්‍රීතුමන්ලා එක්ක සාකච්ඡා කරලා කරන්න පුළුවන් මෙන්න මේ ටික විතරයි. මම නීතිය හදලා හරි ඒ අවශ්‍ය පරිසරය සකස් කරනවා කියන දැඩි උත්සාහයක ඉන්න අමාත්‍යවරයයෙක් හැටියට සලකනවා.

අධ්‍යාපන අමාත්‍යතුමා ගැන කථා කරන්න ඕනෑ. මම මේ අවස්ථාවේ කියනවා ගරු සභාපතිතුමනි, මගේ කාලය අපතේ යනවා. ගරු සභාපතිතුමනි, මම මේ අවස්ථාවේ පෙන්වා දෙනවා. මම කියනවා ඉතිහාසයේ කවදාවත් නැති ආකාරයෙන් 2017 අවුරුද්දේ තමයි දරුවන් ඇතුළත් කිරීමේ අරගලයේ මහා පෙරළියක් වෙන්නේ කියන එක පිළිබඳව මම මේ අවස්ථාවේ සභාවට ප්‍රකාශ කරනවා. මම මෙහෙම කියන්නේ මෙතෙක් ඉතිහාසයේ දරුවන් ඇතුළත් කිරීමේ ක්‍රමවේදයක් තිබුණා. පාසල් ගුරු සංගම්, එහෙම නැත්නම් විදුහල්පතිවරු, එහෙම නැත්නම් කලාප කාර්යාල ඒකරාශී වෙලා දරුවන් ඇතුළත් කිරීමේ ක්‍රමවේදයක් තිබුණා. අද මේ අධ්‍යාපන අමාත්‍යාංශය ඉතාමත් දුර්වල මට්ටමක තිබෙනවා කියලා මා ප්‍රකාශ කරනවා. අධ්‍යාපන අමාත්‍යාංශය ඉතාමත්ම දුර්වල වෙලා තිබෙනවා. ඒ දුර්වල වීම කෙසේද කියනවා නම් සියලුම ගරු මන්ත්‍රීවරුන්ගේ කථා බහට ලක් වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. මම කිව්වේ, අධ්‍යාපන අමාත්‍යාංශයට විරුද්ධ බව 2017 වර්ෂයේ තමයි දරුවන් ඇතුළත් කිරීමට සම්බන්ධව මහ පෙරළියක්, එහෙම නැත්නම් දෙමව්පියෝ මහ අරගලයක් කරන්නේ. ඒකට හේතුවක් තිබෙනවා. මෙතෙක් ඉතිහාසයේ දරුවන් ඇතුළත් කිරීමේදී ස්ථානගත පරීක්ෂණයක් කරලා - විදුහල්පතිවරු ස්ථානගත පරීක්ෂණයක් කළා. කලාප කාර්යාලයට අපි ලියමනක් යැව්වාම, නැත්නම් අපි ඉල්ලීමක් කළාම දෙමව්පියෝ

කලාප කාර්යාලයට අභියාචනයක් ඉදිරිපත් කළාම කලාප කාර්යාලයෙන් ගිහිල්ලා ස්ථානීය පරීක්ෂණයක් කරලා දරුවන් ඇතුළත් කිරීමේ ක්‍රමවේදයක් හැදුවා. මම මේක මීට මාස කිහිපයකට කලින් මේ සභාවේ කිව්වා. නමුත් මම දන්නවා. පැහැදිලිව මගේ කලාපයේ නම් එකම ස්ථානගත පරීක්ෂණයක්වත් කරලා දරුවන් ඇතුළත් කිරීමේ කළේ නැහැ. කලාප කාර්යාලයෙන් යවපු ලියුම් සියල්ල ප්‍රතික්ෂේප කළා. ඒ ප්‍රතික්ෂේප කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් අද ළමුන් සිය ගණනක් ඉන්නවා. සැබෑ පදිංචිකාර දරුවන්ට ගෙදර ඉන්න වෙලා. ඇත ඉන්න දරුවන් පාසලට ඇතුළත් වෙලා තිබෙනවා. උප්පැන්න නැති වෙන්න පුළුවන්. තාත්තා ඒ දරුවාට ඉඩම ලියන්නේ නැති වෙන්න පුළුවන්. මෙන්න මේ වාගේ සුළු ගැටළු නිසා අද පාසල් අහිමි වුණු දරුවෝ විශාල පිරිසක් ඉන්නවා. ඒ නිසා මෙන්න මේ කාරණා කිහිපය මම පෙන්වා දෙමින් මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ගරු සභාපතිතුමාට බොහොමත්ම ස්තුතිවන්ත වෙනවා. එසේම ඔබ සියලු දෙනාටම 2017 වර්ෂයේදී මේ පළාත් සභාවෙන් මහඟු සේවාවක් කරන්න යහපත් පරිසරයක් ලැබේවා කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනාරූඪ වනවා ඇති.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා ] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

[අ.භා. 04.27]

**ගරු සුනිල් ජයමිණි - සභානායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවේ 23 වැනි අයවැය විවාදයට තමයි මම මේ සම්බන්ධ වෙන්නේ. අද මේ අවස්ථාවට විපක්ෂයේත්, ආණ්ඩු පක්ෂයේත් කථා කරපු මන්ත්‍රීවරු ඔක්කෝම ගෙවල්වලට ගිහිල්ලා. ඒක පළාත් සභාවේ සම්ප්‍රදායක් බවට පත් වෙලා තිබෙනවා. කිහිප දෙනෙක් ඉන්නවා. අපි ඒ ගැන සතුටු වෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙම පළාත් සභාවේ ඉසුරු දේවප්‍රිය ගරු ප්‍රධාන ඇමැතිතුමා යටතේ ඉදිරිපත් වන දෙවන අයවැය ලේඛනයට තමයි අපි සම්බන්ධ වෙලා ඉන්නේ. අද උදෑසන ඉඳලා මේ දක්වා විපක්ෂයේ සහ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ කථාවලින් අපට පැහැදිලි වෙන්නේ, පළාත් සභාවේ ඉදිරි වර්ෂය තුළ විශාල අරගලයක් තිබෙන බව තමයි. කොහොම නමුත් ප්‍රධාන අමාත්‍යතුමාත්, පළාත් සභාවේ ඇමැතිවරුත් බොහොම උත්සාහයක් ගත්තා යහපාලන රජය යටතේ විශාල මුදල් ප්‍රමාණයක් ලබා ගෙන මේ පළාත් සභාව තුළින් ජනතාවට විශාල සේවයක් කරන්නට. නමුත් ලබන අවුරුද්දේ අපට මහ ඇමැතිතුමාට දොස් කියන්න බැහැ. අමාත්‍ය මණ්ඩලයට දොස් කියන්න බැහැ. මොකද, මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා අද උදෑසන එතුමාගේ කථාවේදී පැහැදිලි කළා, පළාත් සභාවේ ප්‍රධාන ඇමැතිතුමාගේ වැය ශීර්ෂයෙන් රුපියල් මිලියන 182 ක් අඩු කරලා තිබෙනවා කියලා. සෞඛ්‍ය ඇමැතිතුමාගේ වැය ශීර්ෂයෙන් රුපියල් මිලියන 634 ක් අඩු කරලා තිබෙනවා කියලා. විශේෂයෙන්ම අධ්‍යාපන ඇමැතිතුමාගේ වැය ශීර්ෂයෙන් රුපියල් මිලියන 930 ක් අඩු කරලා තිබෙනවා කියලා. කෘෂිකර්ම ඇමැතිතුමාගේ අමාත්‍යාංශයෙන් රුපියල් මිලියන 209 යි. මහ මාර්ග ඇමැතිතුමාගේ අමාත්‍යාංශයෙන් රුපියල් මිලියන 186 ක්. ඒ අනුව ලබන වර්ෂයේ මේ ඇමැතිවරුන්ට තිබෙන මුදල්වලින් රුපියල් මිලියන 2141 ක් අඩු කරලා තමයි අයවැය ලේඛනය සකස් කරලා තිබෙන්නේ.

එතකොට දැන් පළාත් සභාවකට ආවට පස්සේ පළාත් සභාව සංවර්ධනය කරා ගමන් කරනවා නම්, ඒ අමාත්‍යවරු වැඩ කරන්න ඕනෑ. අර හැම මන්ත්‍රීවරයෙක්ම කිව්වා වාගේ පළාත් සභාවේ සමස්ත මුදල් ප්‍රමාණයෙන් රුපියල් මිලියන 9000 ක් මධ්‍යම රජය කපා හැරලා තිබෙනවා. අපි රුපියල් මිලියන 9000 ක් කිව්වොත් එහෙම ඒක අසාධාරණයි. මට පේන විධියට අනෙක් කපා හැරීම් යනකොට රුපියල් මිලියන 4000 කට ආසන්න සංඛ්‍යාවක් තමයි කපා දාලා තිබෙන්නේ. ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ ජනාධිපතිතුමාගේ ආරාධනයෙන් සාකච්ඡාවකට සම්බන්ධ වුණා. මම හිතන්නේ රවී කරුණානායක මුදල් ඇමැතිතුමාත් ඒකට සම්බන්ධ වුණා. අපි ප්‍රධාන ඇමැතිතුමාගෙන් ඇහුවාම, එතුමා කිව්වා. මුදල් වර්ෂය මත ලබා දෙනවා කියලා පොරොන්දු වුණා කියලා. මම නම් ඒ කථාව විශ්වාස

කරන්නේ නැහැ. මොකද, විශ්වාස නොකරන්න හේතු කිහිපයක් තිබෙනවා. දැන් අපි හදන පරිපාලන ගොඩනැගිල්ල හදන්න රජය මුදල් ලබා දෙනවා කිව්වා. මේ දක්වා රජය ලබා දීලා තිබෙන්නේ රුපියල් මිලියන 800 ක් විතරයි. දැනට පළාත් සභාව වැය කරලා තිබෙනවා තමන්ගේ ගිණුම්වලින් රුපියල් මිලියන 2781 ක්. ආණ්ඩුව සල්ලි දුන්නේ නැහැ. රජය සල්ලි දුන්නේ නැහැ. රුපියල් මිලියන 2781 ක් වියදම් කරලා තිබෙනවා. මම දැක්කා ලබන අවුරුද්දේ වැය ශීර්ෂයෙන් නව ගොඩනැගිල්ල සඳහා තව රුපියල් මිලියන දෙදහස් හයසිය ගණනක් වෙන් කරලා තිබෙනවා. ඒකෙන් පැහැදිලි වෙන්නේ, රජය මුදල් දෙනවා කිව්වාට මුදල් දෙන්නේ නැහැයි කියන එකයි.

අනෙක් පැත්තෙන් අධ්‍යාපන අමාත්‍යාංශය බලන්න. අපේ අධ්‍යාපන ඇමැතිතුමා දැන් මෙතැන නැහැ. නමුත් එතුමා හිටියා නම් හොඳයි. අධ්‍යාපන ඇමැතිතුමාගේ අමාත්‍යාංශය යටතේ ළඟම පාසල - හොඳම පාසල බවට පත් කරන්න අවශ්‍ය ගිවිසුමක් හිටපු ලේකම්තුමියත් ඇති කර ගත්තා. මුදල් ලබා දෙනවා කිව්වා. ඊයේ ලැබුණු රුපියල් මිලියන 75 ත් එක්ක මේ දක්වා ලැබිලා තිබෙන්නේ, රුපියල් මිලියන 333 ක් පමණයි. එතකොට අධ්‍යාපන ඇමැතිතුමා මේ දක්වා යහපාලන ආණ්ඩුවේ ඇමැතිවරු හරහා, මන්ත්‍රීවරු හරහා - සමහර විට අපේ අයත් එක්කත් ඉඳලා හිටලා කියනවා. රුපියල් මිලියන 5000 ක යෝජනා එවලා තිබෙනවා. ඇස්තමේන්තු එවලා තිබෙනවා. දැන් රුපියල් මිලියන 5000 ක ඇස්තමේන්තු ආවාම අධ්‍යාපන ඇමැතිතුමාට සිදු වෙනවා 20% ගෙවන්න. ගිවිසුම්ගත වුණාම. දැන් රුපියල් මිලියන 5000 ක් ගිවිසුම්ගත වෙලා තිබෙනවා. එතකොට 20% ගෙවන්න රුපියල් මිලියන 1000 ක් යනවා. කවුද ඒ සල්ලි දෙන්නේ?

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

දැන් 30% ක් කරලා.

**ගරු සුනිල් ජයමිණි - සභානායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

දැන් 30% ක් කරලා නම්, රුපියල් මිලියන 1500 ක් ගෙවන්න ඕනෑ. මධ්‍යම ආණ්ඩුව සල්ලි ගෙවලා නැහැ. ඒ නිසා ඒ සල්ලි යන්නෙත් පළාත් සභාවේ. ඒ නිසා බොහොම පැහැදිලියි. මුල්ගල් තියනවා. වැඩේ කරන්නේ පළාත් සභාවේ සල්ලිවලින්. විවෘත කරන්න ඒ අය එයි. ඇවිල්ලා ඒ අය කළාය කියලා බෝඩ් එක ගහලා යයි. මම මේ තරහට කථා කරනවා නොවෙයි. ඒ නිසා මේ වෙලාවේ ගරු ප්‍රධාන ඇමැතිතුමා මීට වඩා මේ අමාරුකම, මේ ඇතිවන භයානක ඉරණම ගැන තේරුම් ගන්න ඕනෑ. පළාත් සභාවක් හැටියට මෙවැනි උපක්‍රමවලට හසු නොවී ඉදිරි කාලයේදී කටයුතු කරන්න ඕනෑ.

අනෙක් කාරණාව අපි තමුන්නාන්සේලා මතක් කරන්න ඕනෑ, මේ පළාත් සභාවේ තිබෙන ලොකුම ප්‍රශ්නයක් තමයි පළාත් සභාවේ විදේශ ප්‍රතිපත්තිය. පළාත් සභාවේ තිබෙන දුර්වලම ප්‍රතිපත්තිය තමයි විදේශ ප්‍රතිපත්තිය. දැන් තමුන්නාන්සේලා අහයි මොකක්ද විදේශ ප්‍රතිපත්තිය කියලා. කියන්න කනගාටුයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකුට රට යන්න ලැබෙන්නේ අලුත් ප්‍රතිපත්තිය යටතේ අවුරුදු තුනකට එක පාරයි. දැන් මේ අවුරුද්දේ පළාත් සභාවේ මන්ත්‍රීවරු 37 දෙනෙක් රට ගියා. ඒක හොඳයි. ජ්‍යෙෂ්ටත්වය අනුව, පැමිණීම අනුව 37 දෙනෙක් රට ගියා. දැන් ලබන අවුරුද්දේ ඒ පදනම තුළ ගියොත් තවත් 37 කට යන්න පුළුවන්. එතකොට මන්ත්‍රීවරයෙකුට රට යන්න අවුරුදු තුනක් අවශ්‍ය වෙනවා. පළාත් සභාවේ විදේශ ප්‍රතිපත්තිය මන්ත්‍රීවරුන්ට ඒ විධියටයි. හැබැයි මම ලේකම්තුමාට ස්තුතිවන්ත වෙනවා. එතුමා විදේශ ගමන් සඳහා ලබන අවුරුද්දට මිලියන 38 ක් වෙන් කරලා තිබෙනවා. එතකොට ලබන අවුරුද්දේ සියලු මන්ත්‍රීවරුන්ට යන්න අවස්ථාව ලැබෙයි. හැබැයි කියන්න කනගාටුයි. පළාත් සභාව පාලනය කරන ආයතන තිබෙනවා. මම මේ ඒ අය යනවාට විරුද්ධව කථා කරනවා නොවෙයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගම්පහ දිස්ත්‍රික්කයේ එක්තරා සමූපකාරයක සභාපතිවරයෙක් 12 පාරක් දැනට ගිහිල්ලා තිබෙනවා. ගිය අවුරුද්දට විතරක් ඒ සභාපතිවරයා බැංකු සංගමය හරහා පස් වරක් රට ගිහිල්ලා තියෙනවා. ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ සංවිධායකතුමාත් දන්නවා. එතුමාගේ අවසාන සංචාරය යුරෝපා සංචාරය තමයි. එතකොට ග්‍රාමීය බැංකු සංගමයේ ලාභ තිබෙනවා කියලා බැංකු සංගමයේ සභාපති රට යන එකද ප්‍රතිපත්තිය? ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමා හරහා ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ අවධානයට යොමු කරනවා, ඔබතුමාට මේක පාලනය කරන්න සිද්ධ වෙනවා. ලාභ තිබෙනවා නම් රට යන එකද ප්‍රතිපත්තිය? පළාත් සභා ඇමැතිවරයෙක්,

මන්ත්‍රීවරයෙක් රට යන්න බැහැ. ආණ්ඩුවට පේන්නේ ඒකයි. ගියොත් පත්තරේ දානවා. රූපවාහිනියේ කථා කරනවා. ඒ ගැන දිගින් දිගට කථා කරනවා. දැන් ඊයේ අළුත් චක්‍රලේඛක් ඇවිල්ලා තිබෙනවා කියලා මට ආරංචියි. ආයිත් රට යනවා නම් ගරු ආණ්ඩුකාරතුමාගේත් මහ භාණ්ඩාගාරයේත් අවසරය ගන්න ඕනෑ. ජනාධිපතිතුමාගේත් අවසරය ගන්න ඕනෑ කියලා. නව රජය යටතේ. පළාත් සභාවට ඊයේ ලිපියක් එවලා තිබෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

යහපාලනයේ.

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

තමුන්නාන්සේ කලබල වෙන්න එපා. යහපාලන ආණ්ඩුවේ. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම තමුන්නාන්සේට මතක් කරන්නේ, මේ ප්‍රතිපත්තිය වෙනස් විය යුතුව පවතිනවා. ඒ නිසා ඒ පිළිබඳව අවධානය යොමු කරන්න කියන කාරුණික ඉල්ලීමත් තමුන්නාන්සේට කියනවා.

ඒ වාගේම අපි මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ, මේ පළාත් සභාව පත් වුණේ එක්සත් ජනතා නිදහස් සන්ධානය හැටියට. එදා අපි සියලු දෙනා තරග කරලා, ජනතා වරමක් අරගෙන බස්නාහිර පළාත් සභාව පිහිටෙව්වා. හැබැයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ පිහිටවපු බස්නාහිර පළාත් සභාව තවමත් ඒ ආකාරයෙන්ම ගලාගෙන යනවා. විශාල දේශපාලන හැල හැප්පීම් සිදු වුණා. කණ්ඩායම් කිහිපයක් මේ රටේ දේශපාලන වශයෙන් බෙදී ගියා. ඒක ඇත්ත. මේ කථා කරන මම ඉන්නේ, එක් කණ්ඩායමක වෙන්න පුළුවන්. ප්‍රධාන ඇමැතිතුමා, ඇමැති මණ්ඩලය වෙන කණ්ඩායමක වෙන්න පුළුවන්. නමුත් මේ පළාත් සභාවේ පැවැත්මට ඒ කණ්ඩායම්වල බෙදීම් බලපෑමේ නැහැ. අපි සහෝදරත්වයෙන් පළාත් සභාව ආරක්ෂා කරගෙන, පළාත් සභාවේ සියලු දේට අපි සහයෝගය ලබා දෙමින් අද පළාත් සභාව තුළ කටයුතු කරනවා. මේ වෙලාවේ විපක්ෂයත් තීන්දුවක් අරගෙන තිබෙනවා පළාත් සභාවට සහයෝගය දක්වලා ඉදිරි වැඩවලට සහයෝගය ලබා දෙන්න. හැබැයි ගරු ප්‍රධාන ඇමැතිතුමාට එක දෙයක් කියනවා. කවුරු මොනවා කිව්වත් බස්නාහිර පළාත් සභාව ඉදිරි කාලයේ පවතින්නෙත් එක්සත් ජනතා නිදහස් සන්ධානයේ පළාත් සභාවක් හැටියට. ඒකට අවශ්‍ය සම්පූර්ණ සහයෝගය ආණ්ඩු පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරු 56 දෙනා ලබා දෙනවා කියන සහතිකය අපි තමුන්නාන්සේට ලබා දෙනවා. ඒක වෙනස් වෙන්නේ නැහැ. ඒ නිසා ඒ බව සඳහන් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

[අ.භා. 04.36]

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවේ වර්තමාන ගරු ප්‍රධාන අමාත්‍ය ඉසුර දේවප්‍රිය මැතිතුමාගේ දෙවැනි අයවැයේ පොදු සාකච්ඡාව වෙනුවෙන් සම්බන්ධ වීමට ලැබීම ගැන මම අතිශයින්ම සතුටු වෙනවා. මම සතුටු වෙනවා කියලා කිව්වේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එකක් තමයි සමකාලීන ප්‍රාදේශීය සභාවක සභාපතිවරයෙක් හැටියට එතුමාගේ දේශපාලන ගමන් මගේ එතුමා ප්‍රායෝගික ප්‍රධාන අමාත්‍යවරයෙක් හැටියට මේ පත්වීම සම්බන්ධයෙන් සහ වැඩ කටයුතු ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් තමයි සතුටු වෙන්නේ. විශේෂයෙන් වර්තමාන ප්‍රධාන අමාත්‍යතුමාට අපි ඉතිහාසයට ගියාම මේ පළාත් සභාව නියෝජනය කරපු බොහෝ ප්‍රධාන අමාත්‍යවරුත් එක්ක ගත්තාම අද දවසේ එතුමා තිබෙන කාර්ය භාරය සුළුපටු නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම එහෙම කිව්වේ මීට පෙර හිටපු අපේ ප්‍රධාන අමාත්‍යතුමන්ලාත් එක්ක අපි වැඩ කළා. එතුමන්ලා මේ ප්‍රධාන අමාත්‍ය තනතුර ක්‍රියාත්මක කරද්දී එතුමන්ලාට මහ ආණ්ඩුවෙන්, රටේ විධායකයෙන්, ඊට පස්සේ පල්ලෙහා ප්‍රාදේශීය සභාවෙන් කිසිදු ගැටළුවක් තිබුණේ නැහැ. නමුත් වර්තමාන ප්‍රධාන අමාත්‍යතුමා විධායකය නියෝජනය කළත් පාර්ලිමේන්තුවේ බලය වෙනත් පර්ශවයක් අත තිබෙන්නේ. ඒ වාගේම ප්‍රාදේශීය සභාවලත් ගැටළු සහගත තත්ත්වයක් තිබෙන්නේ. ඒ වාගේම මේ පළාත් සභාවේ තමුන් නියෝජනය කරන පක්ෂයේම කොටස් දෙකක් ඉන්න තත්ත්වයක් තුළත් විශාල අවුල් සහගත පසුබිමක් තිබුණා වුණත් අද මේ ප්‍රධාන අමාත්‍යතුමාට හැකියාව ලැබිලා තිබෙනවා, මේ සියලු අභියෝගයන් මැඩගෙන ගිහිල්ලා මේ පළාත් සභාවෙන් මේ පළාතේ ජනතාව වෙනුවෙන්

[ගරු ගුණසිරි ජයනාත් - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක]

සේවාවක් කරන්න. සියල්ල දරාගෙන කටයුතු කරන්න පුළුවන් ශක්තිවන්ත ප්‍රධාන අමාත්‍යවරයෙක් හැටියට මම පෞද්ගලිකවම සතුටු වෙනවා. විශේෂයෙන් එතුමා මේ 2017 අයවැය ප්‍රකාශය ඉදිරිපත් කරමින් තවත් හොඳ සුවිශේෂී ක්‍රියා මාර්ගයකට ගියා. ඒ තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එතුමාගේ අයවැය කථාවේ සඳහන් කළා. මේ සභාවේ අද බොහෝ දෙනෙක් සාකච්ඡා කරපු, 2017 වර්ෂයට අපට මහ ආණ්ඩුවෙන් අඩු මුදලක් ලබා දී තිබීමේ කාරණාව ප්‍රධාන හේතුවක් හැටියට බොහෝ මන්ත්‍රීවරු කියන්න උත්සාහ කළා, මේ අමාත්‍යාංශවල තිබෙන යම් යම් අකාර්යක්ෂමතාවය තමයි ඒකට හේතුව කියලා. විපක්ෂයෙන් සඳහන් කරන්න ගත්තා. ඒ කාරණාත් එක්ක වෙන්නට ඇති එතුමා සඳහන් කළා, මේ අයවැය ප්‍රකාශයේදී සංවර්ධන කාර්යයන්වල භෞතික සහ මූල්‍ය ප්‍රගතිය ඉලක්කගත ආකාරයට, ඒ ඉලක්කයන් ජය ගන්නට එතුමාගේ අයවැය කථාවේදී තීරණ කිහිපයක් ඉදිරිපත් කළා. වෙලාව නැති නිසා මම ඒවා කියන්න යන්නේ නැහැ. ඒක ඉතාම වැදගත් ලක්ෂණයක් හා හොඳ නායකත්වයක්. මීට පෙර හිටපු කිසිඳු ප්‍රධාන අමාත්‍යවරයෙකුට ඒ වාගේ තීරණයක් ගන්න පුළුවන් හැකියාවක් තිබුණේ නැහැ. මෙතුමාගේ සුවිශේෂී නායකත්වය නිසා ඒ තීරණ ක්‍රියාත්මක කරනවා කියන කාරණාව අයවැය ඉදිරිපත් කිරීමේදී මෙතුමා සඳහන් කළා. ඒ නිසා 2017 වර්ෂයේදී එවැනි ගැටළු බොහෝ සෙයින් ඉවත් වෙලා, අපට සංවර්ධන කාර්යයන් කරා යන්නට පුළුවන් තත්ත්වයක් ඇති වෙයි කියලා මම විශ්වාස කරනවා.

ඒ වාගේම තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද අපේ පළාත් සභාවට මහ ආණ්ඩුවෙන් කුඩම්මාගේ සැලකිල්ල දක්වලා තිබෙන්නේ. මීට පෙර විශේෂයෙන් මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලය තුළදී මේ විපක්ෂයේ මන්ත්‍රීවරු එදා ප්‍රාග්ධන වියදම්, පුනරාවර්තන වියදම් මහ ආණ්ඩුවෙන් ලබා දෙන ඒවා කපද්දී ඔය විවේචනය ඔය විධියට කළා. හැබැයි අද මෙතුමන්ලා ගේන්න උත්සාහ කරනවා මේ අමාත්‍යාංශවල තිබෙන ප්‍රගතිය සාධනීය මට්ටමක නැති නිසා කැපුවයි කියන කාරණාව. ඒක නොවෙයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සත්‍ය කාරණාව. දැන් අපි ඒ කාලේ කිව්වේ, කොළඹට කිරි ගමග කැකිරි කියලා. දැන් උතුරට කිරි බස්නාහිරට කැකිරි කියන්නයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපට සිද්ධ වෙලා තිබෙන්නේ. අද මේ මහ ආණ්ඩුව නියෝජනය කරන වර්තමාන අගමැතිතුමා ප්‍රමුඛ ඒ පාර්ශවය තමයි මේ පළාත් සභා ක්‍රමය රටට හඳුන්වලා දීලා ස්ථාපිත කළේ. මේ ගෙනාපු පළාත් සභාවල බලය විමධ්‍යගත කරන්න අවශ්‍ය සහායන් දෙනවා කියලා කියන ගමන් බස්නාහිර පළාත් සභාවට ලබන වසරේ දියත් කරන්න තිබෙන සංවර්ධන කාර්යයන්වලින් රුපියල් මිලියන 9328 ක් කපා හැරලා තිබෙනවා. මෙකේ ප්‍රාග්ධන වියදම් හැටියට රුපියල් මිලියන 2451 කපා හැරලා තිබෙනවා. ඊළඟට පුනරාවර්තන වියදම්වලින් රුපියල් මිලියන 6877 ක්. බරපතළ ගැටළුව ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි සංවර්ධන කාර්යයන් කළේ නැතත්, ඊළඟ වසරේ හරි කරන්න පුළුවන් කියලා හිතාගන්න පුළුවන්. නමුත් නිලධාරීන්ට අවශ්‍ය පඩිනඩි සහ අනෙකුත් පහසුකම් ලබා දීමේදී මෙවැනි බරපතළ මුදලක් අඩු කිරීම තුළ සිද්ධ වෙන්නේ මොකක්ද කියන කාරණාව කල්පනා කරලා බලන්න සිද්ධ වෙනවා. ඒ වාගේම ගරු ප්‍රධාන ඇමැතිතුමාට ඉදිරිපත් කරපු චෝදනාවක් තමයි කාර්යක්ෂමතාවය නැහැයි කියන එක. මම කල්පනා කරන විධියට නිලධාරීන්ගේ කාර්යක්ෂමතාවය අඩු වුණා නම් ඒකට ප්‍රධාන හේතුවක් තමයි වර්තමාන යහපාලන අණ්ඩුවෙන් මේ නිලධරීන් FCID එකට යවපු එක. මේ පළාත් සභවේත් නිලධාරීන් FCID එකට වරින් වර යවමින්, ගෙන්වමින්, පරීක්ෂා කරමින් අනවශ්‍ය ආකාරයෙන් බාධාවන් සිද්ධ කළා. ඒ නිසා අද නිලධාරීන්ගේ අතේ සියයට සියයක් නිවැරැදි ලියවිල්ලක් නැත්නම් අවධානමක් අරගෙන සංවර්ධන කාර්යයකට ප්‍රවිෂ්ට වෙන්න ඉඩකඩක් නැති වෙලා තිබෙනවා. මේ පළාත් සභාවේ මේ කාර්යයන්වලට සිද්ධ කළේ, බරපතළ හානියක් කියන කාරණාව මම මතක් කරන්න කැමැතියි.

විශේෂයෙන් මහ ආණ්ඩුව බස්නාහිර පළාත් සභාවේ සල්ලි කපන්න ප්‍රධාන හේතුව මේ ආණ්ඩුවට ආර්ථිකයේ කළමනාකරණයක් නැතිකම. ඒක තමයි පැහැදිලිම සත්‍යය. දැන් මේ මහ ලොකුවට මෙතැන විපක්ෂයේ මන්ත්‍රීවරු කථා කළා. ළඟම පාසල, හොඳම පාසල් ව්‍යාපෘතිය සඳහා සල්ලි දෙනවා කියලා. එකෙනුත් අපේ පළාත් සභාවේ සල්ලි අන්තිමට වැය වෙන්න යන්නේ. හැබැයි මේ ආණ්ඩුව ආවේ දළ දේශීය නිෂ්පාදිතයෙන් 6% ක් අධ්‍යාපනයට දෙනවා කියලා. 2017 මහ ආණ්ඩුවෙන් යෝජනා කරලා තිබෙන අයවැයේ අධ්‍යාපනයට තිබෙන්නේ, දළ දේශීය නිෂ්පාදිතයෙන් 2.5% ක්. ඒ නිසා ඔය කයිවාරු ගැහුවාට මුදල් වෙන් කරලා නැහැ.

ඒ වාගේම තමයි අද මේ ආණ්ඩුව ගත්තොත් නාස්තිය ගැන කථා කළාට, මොන තරම් නාස්තියක්ද මේ ආණ්ඩුවෙන් සිද්ධ වෙන්නෙ? අද බරපතළ කැබිනට් එකක් මහ ආණ්ඩුවෙන් නඩත්තු කරනවා. අතිවිශාල පුනරාවර්තන වියදමක්. මේ ආණ්ඩුවට මේ රජය ආවාට පස්සේ මේ විශාල කැබිනට් එක නඩත්තු කිරීම සඳහා 2015 දී රුපියල් මිලියන 374 කින් පුනරාවර්තන වියදම වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම තමයි මහ භාණ්ඩාගාර බැඳුම්කර නිකතුව හරහා සිද්ධ වුණු වංචාව. රුපියල් බිලියන 145 ක්. මේ ණය උගුලක අහු වෙලා තිබෙන්නේ ඒකයි. ආර්ථිකය කඩාගෙන වැටිලා. ඩොලරයේ අගය රුපියල් 151 දක්වා වැඩි වෙලා. මහින්ද රජපක්ෂ පාලන කාලයේ ඩොලරය රුපියල් 130 ට තිබුණේ. ඒ නිසා ණය සම්බන්ධයෙන් මේ ආණ්ඩුව ඉතිහාසගත වෙනවා. මේ ආණ්ඩුව අති විශාල මුදල් කන්දරාවක් ණය අරගෙන තිබෙනවා. නමුත් සංවර්ධන කාර්යයන් මොනවාද කළේ කියන එක පිළිබඳව අපටත් ගැටළු සහගත තත්ත්වයක්. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කල්පනා කරලා බැලුවොත් අතිවිශාල ණය කන්දරාවක් මේ ආණ්ඩුව මේ මාස 18 ක් තුළ අරගෙන තිබෙනවා. අපි ඉතිහාසයේ, 48 නිදහස ගත්තාට පස්සේ ගත්තු ණයත් හරි, මේ ආණ්ඩුව ගත්තු ණය ප්‍රමාණය අතිවිශාල මුදලක් බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා ආර්ථිකයේ කළමනාකරණයක් නැති නිසා තමයි අද බස්නාහිර පළාත් සභාවේ මුදල් කපා හැරලා තිබෙන්නේ කියන කාරණාව මම මතක් කරනවා.

විශේෂයෙන් ප්‍රධාන අමාත්‍යතුමාගේ නව වැඩ පිළිවෙළ සාක්ෂාත් කර ගන්න, මේ පළාත් සභාවේ පාලන බලය 2019 වනකල් ගෙනියන්න අපි ආණ්ඩු පක්ෂය හැටියට අපේ සියලුම ගරු මන්ත්‍රීවරුන්ගේ සහයෝගය ලබා දෙනවා කියන කාරණාව මතක් කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

[අ.භා. 04.45]

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් අපි සාමාන්‍යයෙන් වෙසක් භක්ති ගීත විතරයි අහලා තිබුණේ. ඒ වාගේම පොසොන් භක්ති ගීතත් තියෙනවා. උඳුවප් භක්ති ගීත අපි උදේ ඉඳලා ඇහුවා. කැරොල් එන්න ඕනෑ. නමුත් ආවේ භක්ති ගීත. අපි දැක්කා -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

යහපාලනේ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

පොඩ්ඩක් ඉන්න කෝ? අපි ඔබතුමාට කරදර කළේ නැහැ නේ දරුවා? ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පළාත් සභාවේ මේ කථා කරන හැම මන්ත්‍රීවරයෙක්ම ඉතිහාසයේ දිවි නැඟුම හරහා පළාත් සභාව සතු බලතල උදුරා ගනිද්දී අත උස්සපු අයයි. අද මේ කථා කරන හැමෝම බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන ආදායම වුණු BTT එදා මධ්‍යම ආණ්ඩුව හොකරම් කරද්දී අත් උස්සපු කට්ටිය. ලැජ්ජ නැතුව ඇවිල්ලා බස්නාහිර පළාත් සභාවේ ආදායම් අඩු වුණාය කියලා කථා කරනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද BTT එක හරියට ආවා නම් මේ වනකොට බස්නාහිර පළාත මේ අවුරුද්දේ ඇස්තමේන්තු කරන්නේ රුපියල් මිලියන 30,000 ක්. අපි ලබන අවුරුද්දට ජාතිය ගොඩ නැඟීමේ බද්ද කියලා වෙන් කරලා තිබෙන ඇස්තමේන්තුගත මුදල රුපියල් මිලියන 22,000 ක්. ඒ අතරම රුපියල් මිලියන 8000 ක් තිබෙනවා. පුනරාවර්තන වියදම් කියලා බස්නාහිර පළාත රුපියල් මිලියන 7112 යි යන්නේ. ඒ වාගේ දෙගුණයක් මේ සභාව සතු ආදායම. ඉතිහාසයේ ගනිද්දී මම කරපු කථාව මම මේ ගරු මන්ත්‍රීවරුන්ට කියනවා. බලන්න ඔබ එදා අත ඉස්සුවේ -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ප්‍රාග්ධන. පුනරාවර්තන නොවෙයි.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

සමාවෙන්න. පුනරාවර්තන නොවෙයි. ප්‍රාග්ධන. රුපියල් මිලියන 7112 ක්. මතක තියාගන්න එදා මේ මන්ත්‍රීවරු අත ඉස්සුවේ මේ පළාත් සභාව බාල්දු කරන්න. මම මේ සභාවේ වෙන දේවල් ප්‍රසන්න රණතුංගට අහන්න හොරෙන් මොබයිල් ඔන් කරලා නැහැ. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම තමුන්නාන්සේට බොහොම වගකීමෙන් කියනවා මේ පළාත් සභා ක්‍රමය ශක්තිමත් කරන්න මේ රටේ හිටපු හොඳම දේශපාලන

[ගරු නිරෝෂන් පාදුක්ක]

නායකයා තමයි චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය. එතුමිය තමයි පළාත් සභාවේ ඉඳලා මේ රටේ රාජ්‍ය නායකයා වුණු එකම දේශපාලන නායකත්වය. හැබැයි එතුමියත් බස්නාහිර පළාත් සභාවේ ඉඳලා රටේ ජනාධිපති වුණාට පස්සේ පළාත් සභා ක්‍රමයට අත තිබ්බේ නැහැ. එදා මහින්ද රාජපක්ෂ මහත්තයා පිල්ලෙයාන්ව තියාගෙන නැගෙනහිර පළාත් සභාව තියද්දී, උම්මා දි දී තියාගෙන ඉදිද්දිත් මේ පළාත් සභා ක්‍රමය දිවි හිමියෙන් ආරක්ෂා කරලා Thirteen Plus කියද්දිත් මේ පළාත් සභාවල ආදායම් කපන කොට, මේ පළාත් සභාව රාජපක්ෂ ආණ්ඩුවට තියෙද්දී මේවායේ මුදල් අඩු කරන කොට මේ මන්ත්‍රීවරු සියලු දෙනාම කැමැත්තෙන් අත ඉස්සුවේ. ඒ නිසා අද කාටවත් අත උස්සන්න එපා. හැබැයි අපි එකක් අවබෝධ කර ගන්න ඕනෑ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මේ පළාත් සභාව ඉදිරියට ගෙනියන්න නම් හොඳ කැබිනට් මණ්ඩලයක් ඉන්නවා. ඒ පිළිබඳ ගැටළුවක් නැහැ. අලුතෙන් දකින්න ඕනෑ. අලුතෙන් හිතන්න ඕනෑ. සාම්ප්‍රදායික බැඳීම් ඇතුළේ හිර වෙලා, පළාත් සභාවේ සාම්ප්‍රදායික ඇමැති කෙනෙක් නම්, මේ පළාත් සභාව ඉදිරියට යන්නේ නැහැ. ඒ නිසා ඉතිහාසය ගන්න. ගාමිණී ජයවික්‍රම පෙරේරා ප්‍රධාන අමාත්‍යවරයාගේ චරිතය. එදා මධ්‍යම රජයට අභියෝග කරමින් වයඹ පළාතේ පරිසර අධිකාරියක් නිර්මාණය කරනවා. පළමුවැනි ප්‍රඥප්තිය. ඒ නිසා පළාත් සභාව ඇතුළේ Creative නායකයෝ අපට ඕනෑ.

අපි දන්නවා මධ්‍යම ආණ්ඩුවට ගියාම පාර්ලිමේන්තුවේ පොදු විපක්ෂය කියලා එකක් තිබෙනවා. අපි දන්නවා ඒ අය බොහොම පැහැදිලිව ඉන්නවා. ඒ අය එකම න්‍යාය පත්‍රයේ ඉන්නවා. නමුත් මේ පළාත් සභාව ඇතුළේ එහෙම නැහැ. ඒකේ ඉන්නේ මුරලිදරන් වාගේ. Doosra එකයි, off break එකයි විතරයි. හැබැයි මේකේ ඉන්නේ ෂේන් වෝන් ලා. Leg spin දානවා. Googly දානවා. උදේට ඉසුර දේවප්‍රිය මහ ඇමැතිතුමා. දවල්ට බැසිල් රාජපක්ෂ මැතිතුමා. හැන්දෑවට ආධ්‍යාත්මික නායකයා. ඒ නිසා එහෙම වෙන්න බැහැ. බස්නාහිර පළාත් සභාව විසින්, අපි එකම දෙයයි ඉල්ලන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ පළාත් සභාව ඉදිරියට ගෙනියනවා නම්, පළාත් සභාව තුළ ඉන්න මන්ත්‍රීවරු එක හඬින් ඉන්න ඕනෑ. මේක ඇතුළේ එකක් කියලා, එළියට ගිහිල්ලා තව එකක් කියන්න බැහැ. අපි විපක්ෂයේ හිටියත්, පළාත් සභාවේ බලතල අඩු කරනවා නම්, කප්පාදු කරනවා නම් ඒකට විරුද්ධව කථා කරන්න මන්ත්‍රීවරුන්ට මතයක් තියෙන්න ඕනෑ. ඒක අපි සියලු දෙනාම දන්නවා. නමුත් ඉසුර දේවප්‍රිය ගරු ප්‍රධාන ඇමැතිතුමාත් සමඟ මම මතක් කරනවා. සමහර මන්ත්‍රීවරුන් මහ ඇමැතිවරු ඔක්කොම ගිහිල්ලා, ජනාධිපතිතුමා හම්බ වෙලා, ජනාධිපතිතුමාත් එක්ක මුදල් ඇමැතිතුමාත් එක්ක වාඩි වෙලා මේ ගැන සාකච්ඡා කළා. ඒ පිළිබඳව ඔවුන් අවසාන තීන්දුවකට එනවා. ඒ නිසා මෙතැන ඉන්න මන්ත්‍රීවරුන් කරන්න හදන්නේ මොකක්ද? මේ එක්සත් ජාතික පක්ෂය ගන්න. හැබැයි, ඔවුන් බලාගන්නවා. ගෑවාම දිලිසෙන්නත් ඕනෑ. සමනල තටු වාගේ තියෙන්නත් ඕනෑ. නෝනට හරි යන්නත් ඕනෑ. මහින්ද රාජපක්ෂ ජානධිපතිතුමාව ආරක්ෂා කරන්නත් ඕනෑ. මෛත්‍රීපාල සිරිසේන මහත්තයා රිද්දන්නෙත් නැහැ. ඉසුර දේවප්‍රියට භක්ති ගීත කියන්නත් ඕනෑ. තුනක් කරන්න බැහැ.

[සභාවේ ඝෝෂා]

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ පළාත් සභාව තුළ අපි මන්ත්‍රීවරු විධියට එකහෙළා ඉන්න ඕනෑ, පළාත් සභා ක්‍රමය ආරක්ෂා කරනවා කියලා. හැබැයි එහෙම කියලා දැන් ගන්න කෝ අමාත්‍ය මණ්ඩලයේ වගකීම. දැන් කියනවා සංවර්ධන ප්‍රගතිය සහ ඉලක්ක කියලා. ගිය වසරේ අපි මේ ඉලක්කවලට ගියාද? ඒ නිසා පොදුවේ ගත්තාම පසුගිය කාලයේ උපදේශක කාරක සභා වඩාත් ඵලදායී වුණාද? ඔබ සියලු දෙනාම හෘදය සාක්ෂියට එකඟව කථා කරන්න. මේ පළාත් සභාව ඉදිරියට ගියාද? එහෙම නැතුව අපේ වැරැදි කප්පරක් තියාගෙන මධ්‍යම ආණ්ඩුවට ඇඟිල්ල දික් කරන්න එපා. එකේ නායකයා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා. ඔබ කැමැති වුණත්, අකැමැති වුණත් ඔබේ නායකයා. ඔබ පොහොට්ටුවේ නොවෙයි. ඔබ සියලු දෙනාම තවමත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සාමාජිකයෝ. ඔබ අකැමැති වුණත් ඔබේ නායකයා මෛත්‍රීපාල සිරිසේන. ඔහු තමයි මේ රටේ විධායක ජනාධිපති සහ ආණ්ඩුවේ නායකයා. ඒ නිසා ඔබ කථා කරන්න කලින් ඔබේ ක්ෂේරුකාව කුමන ස්ථානයක තිබෙනවා දැයි කියා සොයා බලන්න.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාව විධියට ආදායම් අඩු වෙනවා කියලා කියනවා. අපේ ප්‍රධාන ආදායම් අඩු වෙද්දී, මොකක්ද බස්නාහිර පළාත ගත්තු ක්‍රියා මාර්ගය. අපේ BTT ගත්තා. අද වන තුරු ගැසට්

නිවේදනයකින් අයින් කරලා නැහැ. ඕනෑම පුද්ගලයෙකුට අදත් ගිහිල්ලා BTT ගෙවන්න පුළුවන්. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ බස්නාහිර පළාත් සභාවට එන්න ඕනෑ ආදායමක් තමයි දූම් සහතිකයේ ආදායම. අපි එදත් අභියෝග කළා. තවමත් කිසිම මහ ඇමැතිවරයෙක් ගිහිල්ලා, එහෙම නැත්නම් නඩුවක් පවරලා අපේ ආදායම් වැඩි කර ගන්න කථා කරලා නැහැ. දූම් සහතිකයේ ආදායම පළාත් සභාව සතු ආදායමක්. අදායම් ඇති කරගන්න ක්‍රම නැතුව අපේ ආදායම් වැඩි කර ගැනීමේ ක්‍රම ශිල්පවේද නැතුව අපට නිකන් ඔහේ ආණ්ඩුවට සම්ප්‍රදාය -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා කථාව අවසන් කරන්න.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඊළඟ වසරේ අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමා ඇතුළු කැබිනට් මණ්ඩලයත් එක්ක සමහර සමහර කාරණාවලදී අපි එකඟ නොවුණත්, අපි පොදුවේ පළාත් සභාවක් විධියට ඉදිරියට යනවා. ඒ ගමනේදී කවුරුවත් ඇඟිල්ල දික් කරන්න එපා මධ්‍යම ආණ්ඩුව කියලා. ඔබ ඇඟිල්ලක් දික් කළොත් අනෙක් ඇඟිලි හතරම ඔබේ පක්ෂ නායකයාට ඔබ දික් කරන්නේ කියන එක මම සියලු දෙනාටම මතක් කරනවා.

[අ.භා. 04.52]

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාට ස්තුවන්ත වෙනවා කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන. ඒ වාගේම අපි මේ කථා කරන්නේ, 28 වැනි අයවැයට. ඒ වාගේම මම කථා කරන 18 වැනි අයවැය. තවත් අයවැය දෙකක කථා කරන්න අපට පුළුවන්කම තිබෙනවා. මම හිතන්නේ මෙහෙම වෙලාව දුන්නාම සැලසුම් කරගත්තු කථාව කරගන්න බැරුව යනවා. අපි 18 ක් කථා කරන කොට, අපිව ගෙවෙනවා කියලා හිතෙනවාද දන්නේ නැහැ, මේ වාගේ වෙලාව අඩු කරලා දෙන්නේ. කොහොම නමුත් අපි සතුටු වෙනවා අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමා ඉදිරිපත් කරපු අයවැය වෙනුවෙන් කථා කරන්න අවස්ථාව දීම ගැන. ගුණසිරි ජයනාත් ආණ්ඩු පක්ෂයේ ගරු සංවිධායකතුමා කිව්වා වාගේම එතුමා දක්ෂයෙක්. අත්දැකීම් තිබෙන කෙනෙක්. ප්‍රායෝගික කෙනෙක්. එතුමා ඉදිරිපත් කරපු අයවැය - ගෙදරත් බේරගෙන, අපවත් බේරාගෙන, එතුමාගේ ශරීර සෞඛ්‍යත් බේරාගෙන එතුමා අයවැය ඉදිරිපත් කළා. ඒ අයවැය ඉදිරිපත් කරද්දී එතුමා ජාතික අයවැයේ ආදර්ශයත් අරගෙන තිබුණා. ජාතික අයවැය ඉදිරිපත් කරද්දී ගරු ඇමැතිතුමා සිංහල තේරෙන අයට සිංහල භාෂාවෙනුත්, සිංහල නොතේරෙන අයට ඉංග්‍රීසි භාෂාවෙනුත් අයවැය කියෙව්වා. අපේ මහ ඇමැතිතුමාත් බස්නාහිර පළාතේ සිංහල තේරෙන අයට සිංහලෙනුත්, සිංහල තේරෙන්නේ නැති අයට ඉංග්‍රීසියෙනුත් අයවැය කථාව කිව්වා. හැබැයි එතුමා ඉංග්‍රීසියෙන් කියපු ටික මේ පොතේ දාලා නැහැ. මම විශ්වාස කරනවා ඉංග්‍රීසියෙන් කියන්න ඇත්තේ අයවැය කථාව ඉවර වෙලා බලා ගමු කියලා වෙන්න ඇති කියලා. මොකද, එතුමා මධ්‍යම රජයේ මුදල් ඇමැතිවරයාට විරුද්ධව යුද්ධය ප්‍රකාශ කරලා තිබෙනවා. අපි ඉතාම සතුටු වෙනවා. මෙපමණ කල් එහෙම නොකරපු නිසා තමයි අපට මේ සන්තෑසිය සිද්ධ වුණේ කියලා මා විශ්වාස කරනවා.

විශේෂයෙන්ම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අයවැයක් විග්‍රහ කර ගන්න පුළුවන් ආර්ථික විද්‍යාත්මක දෘෂ්ට කෝණයකින්, සමාජ විද්‍යාත්මක දෘෂ්ටි කෝණයකින් එහෙම නැත්නම් දේශපාලන විද්‍යාත්මක දෘෂ්ටි කෝණයකින්. ඒකේදී මට මතක් වෙනවා ඇත්තටම සමාජ විද්‍යාත්මක දෘෂ්ටි කෝණයෙන් බලද්දී, අපි කල්පනා කරන්න ඕනෑ, අයවැය සමාජය මත කරන බලපෑම කොයිතරම් ප්‍රමාණයක්ද කියන කාරණය. එය තමයි අපි විග්‍රහ කර ගන්න ඕනෑ. අයවැයේ අවසාන තේරුම ඒකයි. අයවැයක් දාලා ඊට පස්සේ සමාජයට ඒ අයවැයෙන් වන බලපෑම ගැන තමයි කථා කරන්න තියෙන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට මගේ සැලසුම් කරපු කථාව කරගන්න බැරි නිසා මම මතක් කරලා දෙනවා 2003 අයවැය ඉදිරිපත් කරන වෙලාවේ එනම් මීට අවුරුදු 13 කට කලින් එවකට විපක්ෂය වෙනුවෙන් පළමුවැනි කථාව කරපු පස්සේ කාලයක ලංකාවේ මහ බැංකුවේ අධිපතිවරයා වුණු අජිත් නිවාඩ් කබ්රාල් මැතිතුමා කියාපු කථාවක්. එතුමා විපක්ෂය වෙනුවෙන් මේ කථාව කිව්වේ.

[ ගරු මහේෂ් අල්මේදා]

පස්සේ කාලයක මහින්ද මහත්තයාගේ ආණ්ඩුව කාලයේ මධ්‍යම රජයේ මහ බැංකුවේ අධිපතිවරයා බවට පත් වුණා. එතුමා කියනවා, ප්‍රධාන ඇමැතිතුමා පිළිගත යුතු එක පැහැදිලි කරුණක් නම් මධ්‍යම රජය පළාත් සභාවට මුදල් ලබා දෙන්නේ නම්, ඔවුන්ට එම මුදල් ලබා ගැනීමට සිදු වන්නේ ජනතාවගෙන් බවයි. මිනිස්සුන්ගෙන් ගන්න සල්ලි තමයි පළාත් සභාවලට දෙන්න යන්නේ. මේ සම්බන්ධයෙන් මගේ මතකයට එන්නේ ඇලන් බී. ක්ලයිනර්ගේ වචනයයි. ඔහු කියා සිටියේ The Government can give to the People only what it has previously taken from them, minors the cost of the administration. එනම් රජය ජනතාවට ලබා දිය හැක්කේ ඊට පෙර ජනතාවගෙන් ලබා ගත් මුදලින් පාලන තන්ත්‍රය නඩත්තු කිරීමට අඩු කළ පසුව ඉතිරි වන මුදල් ටික තමයි දෙන්නේ. ජනතාවගෙන් ගන්න සල්ලි ආණ්ඩුව නඩත්තු කරලා ඊට පස්සේ ඉතුරු වන ටික තමයි අනෙක් ආයතනවලට බෙදා දෙන්නේ. එසේ නම් ජනතාව වෙනුවෙන් වැඩි -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා අවසන් කරන්න.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මට තව විනාඩියක් දෙන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අවසන් කරන්න. තව විනාඩි කිහිපයයි තියෙන්නේ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

විනාඩියක් දෙන්න ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මුදල වියදම් කිරීමට නම් අපි එක්කෝ ජනතාවගෙන් වැඩිය ලබා ගත යුතුයි. එහෙම නැත්නම් පාලනය වඩා කාර්යක්ෂම කරගත යුතුයි. රටක ආර්ථිකයක් මන්දගාමී තත්ත්වයට පත්ව ඇති අවස්ථාවක ජනතාවගෙන් බදු හරහා ලබා ගත හැකි මුදල අඩුවීම ස්වභාවිකයි. මේ ආණ්ඩුවට අද කාර්යක්ෂමතාවයක් නැහැ. ඒ නිසා ආණ්ඩුවට බදු විධියට ලබා ගන්න පුළුවන් මුදල ඉතාම අඩු වෙලා තිබෙනවා. මම හිතන්නේ, කාර්යක්ෂමතාවය ඇති කර ගන්න පුළුවන්කමකුත් නැහැ. හොරා කන ආණ්ඩුවකට ආයෝජනය කරන්න විදේශීය ආයෝජකයෝ එන්නේ නැහැ. ඒ නිසා මේ රටේ ආයෝජන සංවර්ධනය වෙන්නේ නැහැ. වෙනත් කර්මාන්ත සංවර්ධනය වෙන්නේ නැහැ. ඒ නිසා රජයට වැටෙන මුදල අඩු වනකොට අපට හම්බ වන මුදල -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අවසන් කරන්න.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

අඩු වෙනවා. ඒ නිසා මේ රටේ ආර්ථිකය සමස්තයක් විධියට වෙනස් කරන්නේ නැතුව අපට හම්බ වන මුදල වැඩි කර ගන්න බැහැ. ඒ නිසා මේ ක්‍රමය වෙනස් කර ගන්න කාලය ඇවිල්ලා තිබෙනවා කියලා තමයි කියන්න වෙන්නේ. ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා විනාඩි 02 ක කාලයක් ලබා දීම ගැන.

[අ.භා. 04.56]

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අයවැය විවාදයේදී විවිධ අදහස් සහ යෝජනා පළ වුණත්, පැහැදිලිව කියන්න ඕනෑ රජය විසින් බස්නාහිර පළාත් සභාව ඇතුළු සියලුම පළාත් සභාවල ප්‍රතිපාදන කපා හැර තිබුණත් විශේෂයෙන්ම ශක්තිමත් පළාත් සභාවක් හැටියට රජයෙන් ලබා දෙන ප්‍රාග්ධන මුදල් අඩු වුවද, පළාත් සංවර්ධන සැලැස්ම යටතේ සංවර්ධනයට යොදවන මුදල අපි වැඩි කරලා තිබෙනවා. ඒ අනුව කල්පනා කරලා බැලුවාම 2016 වෙන් කළ මුදල රුපියල් මිලියන 1230 ක් වුණු අතර, 2017 වර්ෂය සඳහා අපි රුපියල් මිලියන 2379 ක් වෙන් කරලා තිබෙනවා. ඒ අනුව රුපියල් මිලියන 1149 ක් අපි වැඩියෙන් වෙන් කරලා තිබෙනවා. ඒ නිසා කුහකකමක්, කුඩුකේඩුකමක් නැති මේ පළාත් සභාව ගැන මා විසින් ඉදිරිපත් කර තිබෙන අයවැය පිළිබඳව නිවැරැදි මනසකින් බලන්න පුළුවන් මන්ත්‍රී කෙනෙක් ඉන්නවා නම් ඔහුට මේ අයවැය විවේචනයට ලක් කරන්න පුළුවන්කමක් නැහැ. අපට රජයෙන් ලැබෙන සහ අපේ ආදායමෙන් ලැබෙන උපරිම දේ, ප්‍රාග්ධනය වශයෙන් පළාතේ සංවර්ධනයට යොමු කරලා තිබෙනවා.

ඒ වාගේම මේ විවාදයට එක් වෙමින් සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා කිව්වා මුළු අයවැයෙන් ප්‍රාග්ධන වියදම 11% ක් බව. කථාව ඇත්ත. නමුත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ පළාත් සභාව පිහිටවූ දා සිට අද දක්වා 10% ත් 15% ත් අතර තමයි තිබිලා තියෙන්නේ. හැබැයි අපි සතුටු වෙනවා. රජයේ ප්‍රාග්ධනය මිලියන දෙදහස් ගණනක් අපට අහිමි වෙලත්, අපට ප්‍රාග්ධන වියදම 11% ක මට්ටමක පවත්වාගෙන යන්නට ලැබීම පිළිබඳව.

ඒ වාගේම තමුන්නාන්සේලා දන්නවා. මේ අයවැයෙන් අපට රජය විසින් ලබා දීලා තිබෙන විධියට මන්ත්‍රීවරයෙකුට ලබා දෙන්න පුළුවන් මුදල තමයි ලක්ෂ 24 ක මුදල. නමුත් මම පළාතේ ප්‍රධාන ඇමැතිවරයා හැටියට එතැන ඉන්න සූදානම් නැහැ. ඒ අනුව මම හිතන්නේ නැහැ, මේ අයවැය පහත්, වුත්ත විධියට විවේචනය කරන්න කිසිම මන්ත්‍රීවරයෙකුට අයිතියක් තිබෙනවා කියලා. එහෙම මේක විවේචනය කරනවා නම්, මම කියන්න ඕනැ. මේ පළාත් සභාවේ අපි ඉදිරිපත් කරලා තිබෙන හොඳම අයවැය. මේක පැහැදිලිව කියන්න ඕනැ. ඉදිරිපත් කරලා තිබෙන හොඳම අයවැය. ලක්ෂ 24 ක් රජයෙන් දීලත්, මන්ත්‍රීවරුන්ට යමක් කරන්න පුළුවන් මට්ටමට ගෙන එන්න අපට ශක්තියක් තිබෙනවා නම් මම හිතන්නේ මේක විවේචනය කරන්න බැහැ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඒ වාගේම අපි දන්නවා ළඟම පාසල - හොඳම පාසල යටතේ අපට දැන් රුපියල් මිලියන 7000 ක් ඇවිල්ලා තිබෙනවා. ඒ වාගේම රජයේ අයවැයෙන් ඉදිරිපත් කරලා තිබෙනවා රුපියල් මිලියන 139,905 ක්. එතකොට මේකෙන් ඉතා විශාල මුදලක්, විශේෂයෙන් උසස් පෙළ දරුවන්ට ලැබෙන වරප්‍රසාදත් එක්ක ලැබෙන කොට මේකෙන් බස්නාහිර පළාතට විශාල ප්‍රතිලාභයක් ලැබෙනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඉතින් ඒ අනුව අපට අනෙක් පැත්තෙන් ප්‍රාග්ධනය අහිමි වුණත් විශේෂයෙන්ම අපේ දරුවන්ගේ අධ්‍යාපනය ක්ෂේත්‍රය පැත්තෙන් බැලුවොත් අපට විශාල ප්‍රතිඵලයක් මේ අයවැයෙන් එකතු වෙනවා. ඒ වාගේම දැන් අපි රජයට බණින්න අවශ්‍ය නැහැ. අපි රජය විවේචනය කරන්න අවශ්‍ය වෙන්නේ නැහැ. මේ රජයේ මූලා පාලනය කරන අයත් සමඟ දේශපාලන වශයෙන් ප්‍රශ්නයක් තිබෙන බව ඇත්ත. හැබැයි අපි ඒගොල්ලන්නට බැණ බැණ ඉන්නවා වඩා - ඔබතුමා දන්නවා මම ප්‍රායෝගික මිනිහෙක්. මම යමක් හිතනවාට වඩා කරන්න කැමැති කෙනෙක්. මම තව කෙනෙක්ට චෝදනා කරනවාට වඩා, යමක් කථා කරනවාට වඩා යමක් කරන්න කැමැති කෙනෙක්. මම ඒක ඔප්පු කරපු කෙනෙක්. ඒ අනුව මම හිතනවා අපට වගකීමක් තිබෙනවා. 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් මේ පළාත් සභාව පිහිට වනකොට අපට ලැබිලා තිබෙන බලතල අනුව, අපේ තිබෙන ආදායම් අපි වැඩි කරගෙන, අපේම ආර්ථික හයියක් අපි මේ පළාත් සභාව තුළ ඇති කරගන්න ඕනැ. ඒ නිසා මම මේ පළාත් සභාවට ආදායම් එකතු කිරීම සඳහා අපි අපේ සියලුම දේශපාලන පක්ෂවලින් කණ්ඩායමක් පත් කරලා තිබෙනවා. මම හිතන්නේ, ඒ අයට මම භාර දෙනවා. ඒ වගකීම භාර දෙන්න. අපට කොන්ද කෙළින් තියාගෙන බස්නාහිර පළාත හැටියට නැඟී සිටින්න පුළුවන් ආර්ථිකයක් අපට උදා කරලා දෙන්න කියලා මම ඒ කමිටුවේ මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා. ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සමාවෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමනි. සභාවේ කාලය දීර්ඝ කර ගැනීමට අවශ්‍යයි. ගරු සභානායකතුමාට අවස්ථාව.

## රීති අංක 30 යටතේ යෝජනාව
## MOTION UNDER RULE NO : 30

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, "*දැන් මෙම සභාවේ කාලය විනාඩි 05 කින් දීර්ඝ කළ යුතු යැයි*" යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඒ වාගේම මම හිතනවා මේ ගරු මන්ත්‍රීවරුන් දේශපාලනයට ප්‍රවිෂ්ට වීම නිසා, මේ අයට උසස් අධ්‍යාපනයක් ලබන්න නොහැකි වුණා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ හුඟක් මන්ත්‍රීවරු තමන්ගේ තරුණ අවදියේදී උසස් අධ්‍යාපනයක් ලබන වයසේදී තමයි දේශපාලනයට පිවිසුනේ. දැන් අපට වුණෙත් ඒකයි. අපිත්

ඉතාම ලාබාල වයසේ දේශපාලනයට එකතු වුණේ. ඒ නිසා මම හිතනවා අපි කොළඹ විශ්ව විද්‍යාලයත් එක්ක සාකච්ඡා කරලා තිබෙන පරිදි ලබන වර්ෂයේදී අපේ උසස් ඩිප්ලෝමා පාඨමාලාවට, විශේෂයෙන් අපේ පළාත් සභාවේ ප්‍රතිපාදන යොදවලා සියලුම ගරු මන්ත්‍රීවරුන්ට ඒ ඩිප්ලෝමාව කරන්න අවශ්‍ය පරිසරයක් අපි හදන්න ඕනෑ. ඒ සඳහා මේ අයවැයෙන් අපි ප්‍රතිපාදන වෙන් කරන්න එකඟ වෙනවා. ඒ වාගේම මෙතැනදී මන්ත්‍රීවරයෙක් කිව්වා, ඇමැතිවරුන්ව ගොන්නුන්ට අන්දන්න පුළුවන් කියලා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ පළාත් සභාවේ ඉන්න ඇමැතිවරුන්ව නිලධාරීන්ට ගොන්නුන්ට අන්දන්න බැහැ. ඒක පැහැදිලිව කියන්න ඕනෑ. අපව ගොන්නුන්ට අන්දන්න බැහැ. මොකද, නිලධාරීන් දන්නවා ප්‍රායෝගික මහ ඇමැතිවරයෙක් සහ මන්ත්‍රීවරුන් ඉන්නවා කියලා. අප අතර අඩුපාඩුකම් තිබෙන්න පුළුවන්. නමුත් අපව ගොන්නුන්ට අන්දන්න බැහැ.

ඒ වාගේම විශේෂයෙන්ම කියන්න ඕනෑ ත්‍රිකුණාමලයේ අපි කරපු සාකච්ඡාව. අපි ත්‍රිකුණාමලයේ කරපු සාකච්ඡාව මම හිතන්නේ පළාත් සභා ඉතිහාසයේ ඉතාමත් සාර්ථක සාකච්ඡාවක්. මම දැක්කා, මේ මන්ත්‍රීවරු ස්වයං රැකියා සම්බන්ධයෙන් ප්‍රතිපාදන වෙන් කිරීම ගැන විවේචනයට ලක් කළා. හැබැයි ඒක කරන්න බැහැ. මධ්‍යම රජයේ මුදල් ඇමැතිවරයා කරපු කාරණාව නිසා ගිය සැරේ ස්වයං රැකියාවලදී අපට ගැටළුවක් ඇති වුණු එක ඇත්ත. හැබැයි අපි මෙවර පළාත් සභාව හැටියට තීන්දුවක් අරගෙන තිබෙනවා. ඊළඟ සැරේ එවැනි ප්‍රශ්නයක් මතු වෙන්නේ නැහැ. ඒ ස්වයං රැකියා ආධාර බෙදා දීමේදී මන්ත්‍රීවරුන්ගේ අපේක්ෂාවන් ඉෂ්ට වන විධියට අපි අයවැය කථාවට එකතු කරලා තිබෙනවා. ඒකත් අපි ලබපු ජයග්‍රහණයක්. අනෙක් එක ත්‍රිකුණාමලයේ ගිහිල්ලා මන්ත්‍රීවරු ඔක්කෝම සතුටින් ආවේ. කාටවත් දොස් කිව්වේ නැහැ. අපි බෙදුණේ නැහැ. අපි පැහැදිලිව කියන්න ඕනෑ පාර්ලිමේන්තුවේ ජාතික ආණ්ඩුවට වඩා, පාර්ලිමේන්තුවේ තිබෙන යහපාලනයට වඩා අපේ ශක්තිමත් පදනමක් තිබෙනවා. අපේ පාලක පක්ෂයේ මන්ත්‍රීවරයෙක් කවදාවත් විපක්ෂයට ප්‍රතිපාදන දෙන්න එපා කියලා මට විරුද්ධව කථා කළේ නැහැ. දැන් මේ මන්ත්‍රීවරු පුන පුනා කිව්වා, අපට ප්‍රතිපාදන හම්බ වුණා කියලා. නමුත් අපේ මන්ත්‍රීවරයෙක් ඒකට කවදාවත් - දේශපාලන කාරණාවකට ඇරෙන්න ප්‍රතිපාදන දුන්නා කියලා අපේ පාලක පක්ෂයේ මන්ත්‍රීවරයෙක් විරෝධතාවය ප්‍රකාශ කළේ නැහැ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඒක විවේචනය කළේ නැහැ. මේ විපක්ෂයේ මන්ත්‍රීවරු දේශපාලන ඉතිහාසයේ ලබා නොගත්තු මුදල් මගෙන් ලබා ගත්තා. ඒක නැහැයි කියන්න බැහැ. මේ මන්ත්‍රීවරු 104 දෙනා මගේ ළඟට ඇවිල්ලා මගෙන් මොනවාද ඉල්ලුවේ? මම ඒ හැමදේම දීලා තිබෙනවා. මම එකක්වත් ප්‍රතික්ෂේප කරලා නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ශ්‍රීනාත් මන්ත්‍රීතුමාගේ -

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඔබතුමාගේත් අනුමත කරලා තිබෙනවා නේ? දැන් අපි දන්නවා. රජය ගියවර ඉදිරිපත් කළාට වඩා හොඳ අයවැයක් අඩුපාඩු තිබුණත් මෙවර ඉදිරිපත් කරලා තිබෙනවා. හැබැයි මගේ අත්දැකීම් පදනම් කරගෙන පළමු වර්ෂයේ අයවැයට වඩා ඉතා හොඳ ප්‍රායෝගික අයවැයක් අපි 2017 දී ඉදිරිපත් කරලා තිබෙනවා. අනෙක් එක අමාත්‍යාංශවල ප්‍රගතිය බලන්න. අපි කම්ටු පත් කරලා තිබෙනවා. කවුරු මොනවා කිව්වත් - මම දන්නවා මගේ අමාත්‍යාංශයේ අපි සියයට සියයක් වැඩ කරලා ඉවරයි. මේ මන්ත්‍රීවරු කරලා ඉවරයි. දෙසැම්බර් 31 වනකොට ඒ ටික ඉවරයි. රජය අපට ඉතුරු ප්‍රතිපාදන මුදල් දෙසැම්බර් 10 දෙන්නේ. ඒ නිසා දෙසැම්බර් 31 වැනිදාට අපේ කිසිම අමාත්‍යාංශයක අඩුවක් හිටින්න විධියක් නැහැ. මුලදී අඩුපාඩුකම් තිබුණා. සාමාන්‍යයෙන් අපේ රටේ පුරුදු වෙලා තිබෙන්නේ, දෙසැම්බර් 31 වැනිදාට ප්‍රගතිය පෙන්වන්න. ඒ වාගේම අපි අලුත් දේකට අත ගහනවා. සාමාන්‍ය පෙළ සමත් වන සහ උසස් පෙළ සමත් වන හෝ අසමත් වන සියලුම දෙනාටම වෘත්තීය පුහුණුවක් අනිවාර්ය කිරීමෙන් සැලසුමකට අපි බස්නාහිර පළාත හැටියට එන්න සූදානම් වෙනවා. ඒ වාගේම පාසල් 1000 ව්‍යාපෘතිය යටතේ අපෙන් කැඩිලා ගිය ප්‍රාථමික පාසල්, ද්විතීක පාසල් - අපි එම පාසල්වල ව්‍යාපෘති නැවත ක්‍රියාත්මක කරන්න කටයුතු කරලා තිබෙනවා. ඉදිරියේදී ඒවා ක්‍රියාත්මක කරනවා.

ඒ වාගේම අතිගරු ජනාධිපතිතුමාගේ එළැඹෙන වර්ෂයේ දිළිඳුකම පිටුදැකීම වෙනුවෙන් විශේෂ ව්‍යාපෘති අපි ඇති කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා අපි සැලසුම් කරලා තිබෙනවා. ඩෙංගු කාරණයේදී මම කියන්න ඕනෑ පළාත් පාලන ආයතනවල - මම මේ සභාවේ ඕනෑම

මන්ත්‍රීවරයෙකුට අභියෝග කරනවා. පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරුන් ඉන්න කාලයේ සිදු වුණු මරණවලට වඩා අඩු මරණ සංඛ්‍යාවක් තමයි පසුගිය කාලයේ සිද්ධ වුණේ. පැහැදිලිව කියන්න ඕනෑ. අපේ සෞඛ්‍ය අමාත්‍යාංශයට කාටවත් අත තියන්න බැහැ. අපි ඩෙංගු ප්‍රශ්නය සම්බන්ධයෙන් මාධ්‍යවල මොනවා ප්‍රචාරය කළත් අපි ඒක මර්දනය කරලා තිබෙනවා, මැඩ පවත්වලා තිබෙනවා කියන එක අපි පැහැදිලි කියන්න ඕනෑ. තවත් ගොඩක් කාරණා තිබෙනවා කථා කරන්න. කාල වේලාව නොමැති නිසා මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

***අ.භා. 05.05 ට පොදු සාකච්ඡාව අවසන් විය.***
*General discussion came to a close at 05.05 p.m*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම ස්තුතියි ගරු ප්‍රධාන අමාත්‍යතුමනි. 2017 අයවැය සම්බන්ධව පොදු සාකච්ඡාව සඳහා ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් 34 දෙනෙක් හොඳ අදහස් මේ සභාවට ඉදිරිපත් කළා. 2017 වර්ෂය සාර්ථකත්වයට ගෙනියන්න මම හිතනවා ඒවා බොහෝ ඉවහල් වෙයි කියලා. කාල වේලාව අවසන් වී ඇති බැවින් සභාව -

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

පළාත් පාලන ආයතනවල 2014 යටතේ ඒ සල්ලිත් අපට මෙවර අයවැයෙන් අනුමත වෙලා තිබෙනවා.

# කල් තැබීම
## ADJOURNMENT

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

*"දැන් මම මෙම සභාව කල් තබනවා."*

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 05.06 ට, 2016 දෙසැම්බර් මස 07 වන දින පූ.භා. 09.00 වන තෙක් කල් ගියේය.***
*Accordingly, the Provincial Council was adjourned at 05.06 p.m till 09.00 a.m, on 07.12.2016.*